දක්වනලද සිඛිනම් සම්බුදුරජාණන්වහන්සේ මේකල්පයට එක්නිස් වන කප පහළවූසේක, ඔබවද ශ්‍රාවකසන්නිපාත තුනෙක්ම්ය, එයින් ප්‍රථම සන්නිපාතයෙහි ලක්ෂයක් භික්ෂූන්වහන්සේය, දෙවෙනිව අසූදහසෙක; තුන්වෙනිව සැත්තෑදහසෙක, එකල අපමහ බෝසතාණෝ අතිසුමන නම් රජ්ජුව ඉපිද බුදුන් ප්‍රමුඛකොට ඇති සංඝයාව සිව්වැදෑහිතවූ මහදන් පවත්වා සප්තරත්නයෙන් පුනි මණ්ඩිතවූ ගෘහරිත්නයක් පුදු ඇතුළට කපපිය භාණ්ඩදන්දී. ඒ බුදුන් කෙරෙහුදු විවරණලත්සේක, ඒ භගවන්හුගේ භ්‍රාතෘර අරුණවතිනම්වෙයි, අරුණනම්රජෙක් පියවූය, ප්‍රභාවතිනම් බිසෝ කෙනෙක්මවවූය, අගිසුය සම්භවය යන තෙරදෙනමෙක් අග්‍රසව්වූසේක, ක්ෂේමංකරනම් තෙරකෙනක් අග්‍රඋපස්ථායක්වූහ; මඛිලාය පදුමාය යන ථේරිදෙනමෙක් අග්‍රශ්‍රාවිකාවූසේක, පුණ්ඩරික නම් රුකෙක් බොධිවිය, බුඩශරීරය උස සත්තිස්රියනෙක, ශරීරප්‍රභාව තුන්යොදුනක් තැන්පැතිර සිටියේය, සත්තිස් දහසක් අවිරුදු සත්හට දම්දෙසා පිරිනිවිසේක,

ක්ෂේමංකෝ.

සිඛිස්සාපි තයෝ සාවක සන්නිපාතා පඨමඤ්ඤාතිපාතෙ භික්ඛූ සතසහස්සං අහෝසි, දුතියෙ අසීතිසහස්සානි තතියෙයෙතතති තදා ඉඛ්වාකිසත්තෝ අරිඤ්ජමෝ නාමරාජා භූත්වා බුඩපමුඛස්ස සංඝස්ස සවිවරංමහාදානං පවත්තෙත්වා සත්තරතනපරිමණ්ඩිතං ගන්ධරතනං දත්වා ගන්ධපමාණං කත්වා කපපිය භණ්ඩං අදාසි; සොපි නං ඉතො එකතිංසෙ කපෙ බුඩ්ඪෝ භවිස්සසීතිවාකාසි, තස්ස පන භගවතෝ අරුණවතී නාම නගරං අහොසි අරුණෝ නාමඛත්තියෝ පිතා පභාවතී නාමමාතා අභිභූව යම්හවෝව අග්ගසාවකා ඛෙමඞ්කරෝ නාමුපඨාකෝ මඛිලාව පදුමාව අග්ගසාවිකා පුණ්ඩරික රුක්ඛෝ බොධි සරීරං සත්තතිංසහත්ථුබ්බිධං අහොසි සරීරප්පභා යොජනත්තයං ඵරිත්වා අට්ඨාසි, සත්තතිංසවස්ස සහස්සානි ආයු-යි.

ඒ සිඛිනම් සම්බුදුරජාණන්වහන්සේට මෑතභාගයෙහි දෙවන අතුරු කප-

තදෙව මණ්ඩකපපම්හි අසමෝ අප්පටිපුග්ගලෝ,
වෙස්සභූ නාම නාමෙන ලොකෙ උප්පජ්ජි සොභිතෝ-යි;

දක්වනලද වෙස්සභූනම් සම්බුදුන්වහන්සේ ලෝකයෙහි ප්‍රාදුර්භූතවූසේක, ඔබවදාළ ශ්‍රාවක සන්නිපාත තුනෙක්විය ප්‍රථම සන්නිපාතයෙහි අසූලක්ෂයක් ශ්‍රාවකයන්වහන්සේය දෙවෙනිව සැත්කෑ ලක්ෂයක් භික්ෂූන්වහන්සේය තුන්වෙනිව සැටලක්ෂයක් භික්ෂූන්වහන්සේය එකල අප මහබෝසතාණෝ සුදර්ශන නම් රජෙක් වශ්‍යපද බුදුපාමොක් මහසඟනට විවරයගිත මහදන්දී ඒ බුදුන් සමීපයෙහි පැවිදිව ආචාරගුණයෙන් සමන්විතව බුඩිරත්නයෙහි චිත්‍රිකාර ප්‍රතිබහුලවූසේක, ඒ සම්බුදුන්වහන්සේද බෝධිසත්වයන්ට මතු එක්නිස්වන කප බුදුවෙතියි විවරණ දෙවා වදාළසේක, ඒ භාග්‍යවන්හු උත්තුංගවර අනෝපම නම්වෙනි පියමහරජානෝ සුපතිත නම්වෙයි මැනියෝ යසවති නම්වෙති අගසව්දෙනම සොභිත උත්තරය යන නම්වෙති උපස්ථායක මහතෙරහු උපසන්ත නම්වෙති අග්‍රශ්‍රාවිකා-දෙනම ධම්මාය සමාලාය යන නම්වෙති බෝධිවූසේ සල්රුකෙක බුඩශරීරය උසසැටරියනෙක සැටදහසක් හවුරුදු සතුන් නිවන්දක්වා පිරිනිවිසේක,

කිසේමානෝ.

තස්ස අපරභාගෙ වෙස්සභූ නාමසත්ථා උදපාදි තස්සා'පි තයෝ සාවකසන්නිපාතා පඨමසන්නිපාතෙ අසීතිභික්ඛුසතසහස්සානි අහෙසුං දුතියෙ සත්තති තතියෙ තදු බොධිසත්තෙනා සුදස්සනො නාම රාජාහුත්වා බුඩපමුඛස්ස සංඝස්ස සවිවරං මහාදානං දත්වා තස්ස සන්තිකේ පබ්බජිත්වා ආචාරගුණසම්පන්නතාය බුඩරතනෙ චිත්තීකාර පිතිවහුලො අහොසි, සෝ'පි තං භගවා ඉතෝ එකනිංසකපෙ බුඩෝ භවිස්සසී'ති ව්‍යාකාසි, තස්සපන භගවතො අග්ගුපමං නාමනගරං අහොසි, සුජාතිතො නාමරාජා පිතා යසවතිනාම මාතා සොභනොව උත්තරාව අග්ගසාවිකා උපසන්තො නාමුපඨාකො ධම්මාව සමාලාව අග්ගසාවිකා සාලරුක්ඛා බොධි සරිරං සඝිහජ්ඣබබධා අහොසි සත්තිවස්සසහස්සානි ආයු-යි.

ඒ වෙස්සභූනම් සම්බුදුන්වහන්සේට මෑතභාගයෙහි-

වෙස්සභුස්ස අපරෙන සම්බුඩො දිපදුත්තමෝ,
කකුසන්ධො නාම නාමෙන අප්පමෙය්‍යො දුරාසදෙ-යි.

දක්වනලද කකුසඳනම් සම්බුදුන්වහන්සේ මේකල්පයෙහි පළමුවෙනි අතුරුකප පහළිවූසේක, ඒ සම්බුදුන්වහන්සේට සත ළිස් දහසක් පමණ එකග්‍රාවකසන්නිපාතයෙක්විය එකල අපමහබෝසතාණෝ ක්ෂේමනම්රජක්ව ඉපද බුදුපාමොක් මහසඟනට පාසිවරාදිය දන්දී අදුන් බඹතෙත් ආදිය දන්දී බණ අසා පැවි

දිවූසේක, බුදුරජානන්වහන්සේද බෝධිසත්වයන්ට බුඩබවයට විවරණ දෙවා වදාළසේක, ඒ **කකුසඳනම්** භගවත්හු උපන්නාවර පෙම්ම නම්වෙයි පියවූයේ අග්ගදත්ත නම් බ්‍රාහ්මණොත්තමයෙන මැනිවූයේ විසාඛානම් බ්‍රාහ්මණ්‍යාදර්ශකයෙනක අනසව දෙනම විදුරය සඤ්ජීවය යනනම්වෙති උපස්ථායක මහතෙරහු බුඩිජ නම් වෙති අග්‍රශ්‍රාවිකා යුගළි සාමාය වම්පකාය යන නම්වෙති බෝධිවූසේ මහාසිරිය නම්රුකෙක බුඩශරීරය උස සතළිස්රියනෙක සතළිස් දහයක් හවුරුදු සත්තට දම්දෙසා පිරිනිවිසේක,

කිසේමැනෝ.

කකුසඤ්ඡස්ස භගවතො එකොසාවක සන්නිපාතො තත්ථ චත්තාළීස භික්ඛුසහස්සානි අහෙසුං තදු බොධිසත්තො ඛෙමං නාමරාජා හුත්වා බුඩපමුඛස්ස සංඝස්ස සපත්තවිවරං මහාදානංවෙව අදාසිනානි හෙ සජ්ජානිවෙව දත්වා සත්ථු ධම්මදෙසනං සුත්වා පබ්බජි සොඑපි තං සත්ථා ව්‍යාකාසි, කකුසඤ්ඡස්ස පන භගවතො ඛෙමං නාමනගරං අහොසි අග්ගදත්තො නාම බ්‍රාහ්මණො පිතා විසාඛානාම බ්‍රාහ්මණී මාතා විධුරොච සඤ්ජීවොච අග්ගසාවකා බුඩිජෝ නාමුපඨාකො සාමාව වම්පකාව අග්ගසාවිකා මහාසිරිස රුකෙඛාබොධි සරීරං චත්තාළීස හත්ථුබෙඛධං අහොසි චත්තාළිස වස්සසහස්සානි ආයු-යි,

ඒ **කකුසඳනම්** බුදුන්ට මැතභාගයෙහි මෙමකල්පයෙහිම වෙනි අතුරුකප—

කකුසඤ්ඡස්ස අපරෙන සමය්හිඩො දිපදුත්තමො,
කොණාගමනො නාමජිනො ලොකජෙට්ඨො නරාසභො-යි,

දක්වනලද **කොණාගමන**නම් සම්බුදුරජාණන්වහන්සේ ලෝකයෙහි ප්‍රාදුර්භූතවූසේක, ඔබවද නිස්දහස්පමණ එක්ශ්‍රාවකයන් නිපාතයෙක්විය, එකල අපමහබෝසතාණන් **පර්වත**නම් රජක්ව අමාත්‍යගණයා පිරිවරා බුදුන්සමීපයට ගොස් දම්දෙසුම් අසා බුදුපා මොක් මහසංඝයාට නිමන්ත්‍රණයකොට මහදන් පවත්වා පත්තුණුණ්ණ වින පට්ට කොසෙය්‍ය කම්බල දුකුල සාණිණ පට්ටක දන්දී බුදුන් සමීපයෙහි පැවිදිව ඒබුදුන් කෙරෙහුත් විවරණලත්සේක, ඒ බුදුන් උපන් නුවර සොභවතී නාම්වෙයි යඤ්ඤදත්ත නම් බ්‍රාහ්මණොත්තමයෙක් පියවූය, උත්තරාභම් බ්‍රාහ්මණියනක්ෂත්‍රාමෝ මවවූය, භියොසභ උත්තරය යන තෙරසහලෙක් අග්‍රසවවූසේක, සොභිත නම් තෙරනමෙක් උපස්ථායකවූසේක, සමුද්‍රාව උත්තරාය යන ශ්‍රාවිකා යුගළියෙක් අග්‍රශ්‍රාවිකාවූසේක, උදුම්බර නම් රුකෙක් බෝධිවිය බුඩශරීරය උස නිස්රියනෙක නිස්දහසක් හවුරුදු වීනෙස ජන බන්ධුන්ට නිවන් අමා අනුභවකරවා පිරිනිවිසේක;—

කිසේමැනෝ.

තස්ස අපරභාගෙ කොණාගමනො නාම සත්ථා උදපාදි තස්සා 'පි එකො සාවක සන්නිපාතා තත්ථ භික්ඛුසහස්සානි අහෙසුං තදා බොධිසත්තො පබ්බතො නාම රාජා හුත්වා අම්බවණ්ණපරිවුතො සත්තුසන්නිකා ගන්ත්වා ධම්මදෙසනා සුත්වා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝ නිමන්තෙත්වා මහාදානං පවත්තෙත්වා පාතුණ්ණං චීනපට්ටංකොසෙ යාං කම්බලං දුකූලානි චෙව සුවණ්ණපට්ටකඤ්ච දත්වා සත්ථාරන්තිකෙ පබ්බජි. සොපි තං ව්‍යාකාසි තස්ස භගවතො සොභවති නාම නගරං අහොසි යඤ්ඤදත්තා නාම බ්‍රාහ්මණො පිතා උත්තරා නාම බ්‍රාහ්මණි මාතා භියේ‍යොසා ව උත්තරො ව අගසාවකා සොපි ජෝ නාම්‍රුපඩාකො සම්බුද්ධ ව උත්තරා ව අගසාවිකා උදුම්බරරු කෙඛා බොධි සරීරං නිංස හත්ථබ්බබ්ධං අහොසි තිංසවස්සසහස්සානි ආයු-යි

ඒ **කොණාගමන** නම් බුදුරජානන්වහන්සේට මෑතභාගයෙහි මේකල්පයෙහි තුන්වෙනි අතුරුකප—

කොණාගමනස්ස අපරෙන සම්බුඩො දිපදුත්තමො,
කස්සපො නාම සො ජිනො-ධම්මරාජාපභඞ්කරො-යි,

දක්වනලද **කාශ්‍යප**නම් සම්‍යක්සම්බුදුන්වහන්සේ ලෝකයෙහි ප්‍රාදුර්භූතවූසේක, ඔබට විසිදහසක් පමණ එකම ශ්‍රාවකසන්නිපාතයෙක්විය එසමයෙහි අපමහබෝසතාණෝ **ජෝතිපාල**නම් මාණවකව ත්‍රිවේදයෙහි පරතෙරදක හුම්යෙහිද ආකාශයෙහිද ප්‍රකටව ඍර්ධිකාරනම් කුම්භකාරයන්හට මිත්‍රව ඔහුහා සමග බුදුන්කරා එලබ බණඅසා පැහැදිව ආරබ්ධවීර්‍යඇතිව හෙවත් නොපසුබස්නාලද වීර්‍යඇතිව පිටකත්‍රය ඉගෙණ වත්පිළිවෙතින් බුදුසසුන්හොබවා ඒ බුදුන්කෙරෙනුත් විවරණලන්සේක, ඒ භගවන්හුගේ උපන් නුවර බරණැස නම්විය පියාණෝ ඛ්‍රහ්මදත්තනාම්වූ බ්‍රාහ්මණොත්තමයෙක මෑනියෝ ධනවතී නම්බ්‍රාහ්මණිකෙනෙක අග්‍රශ්‍රාවක දෙනම නිස්සය හාරවාජය යන තෙරසහලෙක උපස්ථායකවූයේ සබ්බමිත්ත නම් තෙරණකෙනෙක අග්‍රශ්‍රාවිකාවූයේ අනුලාය උරුවෙලාය යන ඵේරී යුගළෙක බෝධිවෘක්ෂය න්‍යග්‍රොධ නම්රුකෙක බුදගරිරය උස විසි රියනෙක විසිදහසක් හවුරුදු ව්‍යෙතය ජනබන්ධූන්ට නිවන් අමා අනුභව කරවා පිරිනිවිසේක,

කිසේමැනෝ.

තස්ස අපරභාගෙ කස්සපො නාම්සම්බො ලොකෙ උදපාදි තස්සා'පි එකොව සාවකසනිපාතො තස්ස ව්‍යනිභික්ඛුසහස්සානි අහෙසුං

තදා බොධිසත්තො ජෝතිපාලො නාම මාණවෝ හුත්වා තිණ්ණං වෙදානං පාරගූ හුත්වාව අනන්තලිඛිතේ පාඨකවෝ සට්ඨිකාරස්ස බ්‍රාහ්මණස්ස මිත්තො අහොසි සෝ නෙගමඤ්ච සාර්ථවාහං උපසංකමිත්වා ධම්මකථං සුත්වා පබ්බජිත්වා ආරඛවිරියෝ තීණිපිටකානි උග්ගහෙත්වා වත්තාවත්තසම්පත්තිං යා බුද්ධසාසනං සොභෙසි සෝපි තං සත්ථා ව්‍යාකාසි තස්සභගවතෝ ජාත නගරං බාරාණසි නාම අහොසි බ්‍රහ්මදත්තො නාම බ්‍රාහ්මණෝ පිතා ධනවතී නාම බ්‍රාහ්මණීමාතා නිස්සෝ භාරවාජෝව අගග්‍රසාවකා සබ්බමිත්තා නාම්‍රපඨකෝ අනුලාව උරුවෙලාව අග්‍රසාවිකා නිග්‍රොධරුක්ඛෝ බෝධි සරීරං වීසතිහත්ථුබ්බේධං අහොසි වීසතිවස්සසහස්සානි ආයු-යි;

යම් **කල්පයෙක්හි** වනාහි **දීපඞ්කර** බුදුහු ප්‍රාදුර්භූතවූ **සේක්ද** ඒ කල්පයෙහි **තණ්හඞ්කරය මේධඞ්කරය සරණඞ්කරය** යන බුදු වරයෝ තුන්නමක් ප්‍රාදුර්භූතවූසේක්ලායැ; ඔවුන්වහන්සේලා කෙරෙන් බෝධිසත්වයෝ නියතව ගත් විවරණෙක්නැත, එසේමය යින් ඔවුන්වහන්සේලා මේ නිදානයේ දැක්වූයේ නැත, අවුත්වා කථා වෙහි වනාහි ඒ කල්පය පටන් සියලු බුදුවරයන් දක්වනලිණිය—

තණ්හඞ්කරෝ මේධඞ්කරෝ අථෝපි සරණඞ්කරෝ,
දීපඞ්කරෝව සබ්බඤ්ඤූ කොණ්ඩඤ්ඤෝ දීපදුත්තමෝ;
මඞ්ගලෝව සුමනෝව රේවතෝ සොභිතෝ මුනි,
අනොමදස්සී පදුමෝ නාරදෝ පදුමුත්තරෝ;
සුමේධෝව සුජාතෝව පියදස්සී මහායසෝ,
අත්ථදස්සී ධම්මදස්සී සිද්ධත්ථෝ ලොකනායකෝ;
තිස්සෝ ඵුස්සෝව සබ්බඤ්ඤූ විපස්සී සිඛි වෙස්සභූ,
කකුසන්ධෝ කොණාගමනෝ කස්සපෝ‘පිනායකෝ;
එතෙ අහෙසුං සබ්බඤ්ඤූ විනරාගා සමාහිතා,
සතරංසි‘ව උපපන්නා මහාතම විනොදනා,
ජලිත්වා අග්ගික්ඛන්ධෝ‘ව නිබ්බුතා තෙ සසාවකා—යි;

යනුවෙන් දක්වනලදි.

දූරෙ නිදානයෙහිද මේ දක්වන්නට කිම.

යස්මිං පන කප්පෙ දීපඞ්කර දසබලෝ උදපාදි තස්මිං අඤ්ඤෝ‘පි තයොබුද්ධා අහෙසුං‘ඉති සංඛ්‍යානිකාමබාධිසත්තස්ස ව්‍යාකරණං න ලභි තස්මා තෙ ඉධ නදස්සිතා, අඛ්කථායම්පන තම්හා කප්පා පඨාය සබ්බ බුද්ධෙ දස්සෙතුං ඉදං වුත්තං;

එහි අපමඛබෝපතාහෝ දීපංකරාදි සුවිසි බුදුන්ගේ සමීපයෙහි විවරණ ලබනසේක්, කල්ප ගතසහස්‍රයක්හා සතරඅසංඛ්‍යයක්

ආසේක, කාශ්‍යප බුදුන්ට මහාභාග්‍යයෙහි මේ බුදුන්හැර අන්බුදුකෙනෙක් උපන්නේ නැත—

කිඤ්චාපනා.

තව්ව අධිකාකං බොධිසත්තානා දිපඞ්කරාදීනං චතුවීසතියා බුද්ධානං සන්තිකෙ අධිකාරං කරොන්තා කප්පසතසහස්සාධිකානි චත්තාරි අසංඛ්‍යානි ආගතා කස්සපස්ස පන භගවතො ඔරභාගෙ ඨපෙත්වා ඉමං සම්මාසම්බුද්ධං අඤ්ඤෙ බුද්ධා නාම නත්ථි.

මෙසේ දිපඞ්කරාදි සුවිසි බුදුන්ගේ සමීපයෙහි ලදවිවරණ ඇති බෝසතුන්විසින්—

මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති හෙතුසව්හාර දස්සනං,
පබ්බජ්ජා ගුණ සම්පත්ති අධිකාරොච ඡන්දතා,
අට්ඨඞ්ග සමොධානා අභිනීහාරෝ සමිජ්ඣති—යි,

යනමේ අෂ්ටාඞ්ගයෙන් සමන්විතව දීපංකර පාදමූලයෙහි කතා ඇති නීහාරඇතිව—

"භද්‍ර බුඩකරෙ ධම්මෙ, විවිණ්ණම් ඉතොවිතතා,,—යි; යනුවෙන් උත්සාහකාර—"විවිණ්ණනෙතා තදදක්ඛිං පඨමං දානපාරමිං,,—යි යනුවෙන් මේ දානපාරමිතාදි බුඩකාරක ධර්ම්ය අධිෂ්ඨාන කළ සේක්ද ඒ බුඩකාරක ධර්ම්යන් පූරණය කරණසේක් වෙස්සන්තර රාජ්‍ය්‍යභාවයට ආසේක; මේ වෙසතුරු අත්බැව් දක්වා අපමණ බෝසතානෝ—

එවං සබ්බඞ්ගසම්පන්නා බොධියා නියතා නරා,
සංසාරං දීඝමඩ්ධානං කප්පකොටි සතෙඝිපි;
අවීචිම්හි නඋපජ්ජන්ති තථා ලොකන්තරෙසුච,
නිජ්ඣාම තණ්හා බ්‍යප්පිපාසා නහොන්ති කාලකඤ්ඤකා;
නහොන්ති බුදුකා පාණුඋපජ්ජන්තා'පි දුග්ගතිං;
ජායමානා මනුස්සෙසු පච්චන්ති නහවන්තිහෙ,
සොත වෙකලතා නත්ථි නහවන්ති මූගපක්ඛිකා,
ඉත්ථිභාවං නගච්ඡන්ති උභතොව්‍යඤ්ජන පඬකා,
නහවන්ති පරියාපන්නා, බොධියා නියතා නරා;
මුත්තා ආනන්තරියෙහි සබ්බඤ්ඤුබුද්ධගොචරා,
මිච්ඡාදිට්ඨිං නපෙවන්ති කම්මකිරිය දස්සනා;
වසමානා'පි සඞ්ඝස්ස අභබ්බා නඋපජ්ජරෙ,
සුඛාවාසෙසු දෙවෙසු හෙතුනාමන විජ්ජති;
නෙඛම්ම නිහතා යපුරිසා විසංයුත්තා භවා භවෙ,
චරන්ති ලොකාඤ්චරියාය පූරෙන්තා සබ්බපාරමි-යි;

යනු නියත විවරණලත් සියලු බෝධිසත්වයන්විසින් නොපැමිණියයුතුවූ සත්‍යානුබෝධයෙන් අවීචිමහානරකයෙහිත් නුපන්සේක, ලෝකන්තරික නරකයෙහිත් නුපන්සේක, ක්ෂුත්පිපාසයෙන් පීඩිතවන නිජ්ඣාමතණ්හිකා නම්වූ ප්‍රේතලෝකයෙහිත් නුපන්සේක, කාලකඤ්ඤික අසුරයෝනියෙහිත් නුපන්සේක් තිරිසන් යෝනියෙහිත් උපදිනත් වටු කුරුලුවන්ව ඝුඩාවන් නුපන්සේක් මනුෂ්‍යත්ව උපදනේද ජාතියෙන් අන්ධනොවූසේක, ජාතියෙන් බිහිරිනොවූ සේක, ජාතියෙන් ගොලුනොවූසේක, සත්‍රීව කොවුපන්සේක, උභතොබ්‍යඤ්ජනකව නොවුපන්සේක පණ්ඩකව නොඋපන්සේක මාතෘඝාතක නොකළසේක පිතෘඝාතක නොකළිසේක අරහන්තඝාතක නොකළසේක ලෝහිතුප්පාදක නොකළිසේක සංඝභේද නොකළසේක සැමතැන්හිම පිරිසිදුවූ අදහස්ඇතිසේක නියත මිථ්‍යාදෘෂ්ටි නොගත්සේක කම්වාදී ක්‍රියාවාදී සම්‍යක්දෘෂ්ටිඇතිසේක කාමාවචරයෙහි මාරදිව්‍යරාජ්‍යව නොඋපන්සේක රූපාවචරයෙහි අසංඥතලයෙහි නොඋපන්සේක පඤ්චසුද්ධාවාසයෙහි අනාගාමීන්ම උපදනා බැවින් එහිත් නොඋපන්සේක මේ ආදිඅභව්‍යස්ථානය කරා නොපැමිණ බෝධිසත්ව චරිතය නොඇර. අතීතීබ්‍රාහ්මණ කාලයෙහි සංඛබ්‍රාහ්මණකාලයෙහි ධනඤ්ජයරාජකාලයෙහි මහාසුදර්ශනකාලයෙහි මහාගෝවින්දකාලයෙහි නිම්මිතරාජකාලයෙහි චන්ද්‍රකුමාරකාලයෙහි විසයහසිවුකාලයෙහි සිවිමහරාජකාලයෙහි වෙස්සන්තරකාලයෙහි ඔයි මේ ආදි නොයෙක්ජාති කොවිසහස්‍රයෙහි දානපාරමිතාව පිරූපරිදි පමණක් නම්නැත්;

කියේමැනෝ.

නෙ ආනිසංසෙ අධිගන්ත්වා ආගතා පාරමියො පුරෙන්තස්ස වස්ස අකිත්තිබ්‍රාහ්මණකාලෙ සංඛබ්‍රාහ්මණකාලෙ ධනඤ්ජයරාජකාලෙ මහාසුදස්සනකාලෙ මහාගොවින්දකාලෙ නිම්මිතරාජකාලෙ චන්ද්‍රකුමාරකාලෙ විසයහසිවිකාලෙ සිවිරාජකාලෙ වෙස්සන්තරකාලෙ'ති දානපාරමිතාය පුරිතත්ත භාවානං පරිමාණං නාමනත්ති-සී;

එසේමසිලවනාගරාජකාලයෙහි චම්පෙය්‍යනාගරාජකාලයෙහි භූරිදත්තනාගරාජකාලයෙහි ඡද්දන්තනාගරාජකාලයෙහි ජයද්දිස රජහුගේ පුත්‍රවූ අලීනසත්තු කුමාරකාලයෙහියයි මේආදිතන්හි සීලපාරමිතාවගේ පිරූපරිදි පමණක්නැත්;

කියේමැනෝ.

තථාපි සීලව නාගරාජකාලෙ චම්පෙය්‍ය නාගරාජකාලෙ භූරිදත්තනාගරාජකාලෙ ඡද්දන්ත නාගරාජකාලෙ ජයද්දිස රාජස්ස

පුත්තඅලිනසහතුඛුමාරකාලේ'නි සීලපාරමිතාය පූරිතත්තභාවානං පරිමාණං නාමනත්ථි;—එසේම සොමනස්ස කුමාරකාලයෙහි හත්ථිපාල කුමාරකාලයෙහි අයොඝර පණ්ඩිතකාලයෙහි යයි මේආදි තන්හි මහාරාජ්‍යය හැර නෛෂ්ක්‍රම්‍යපාරමිතාවගේ පිරුපරිදි පමණක්නැත්:

කියේ මැනෝ.

තථා සොමනස්ස කුමාරකාලෙ හත්ථිපාල කුමාරකාලෙ අයොඝර පණ්ඩිත කාලේ'නි මහාරජ්ජං පහාය නෙක්ඛම්මපාරමිතාය පූරිතත්තභාවානං පරිමානං නාමනත්ථි

එසේම විදුරපණ්ඩිතකාලයෙහි මහාගොවිඳපණ්ඩිත කාලයෙහි කුඤ්ඣලපණ්ඩිත කාලයෙහි අරකපණ්ඩිත කාලයෙහි ඛෝධි පරිබ්‍රාජක කාලයෙහි මහෞෂධපණ්ඩිත කාලයෙහි යයි මේආදි තන්හි ප්‍රඥාපාරමිතාවගේ පිරුපරිදි ප්‍රමාණයෙක්නම් නැත්.

කියේමැනෝ.

තථා විධුර පණ්ඩිත කාලෙ මහාගොවිඳපණ්ඩිත කාලෙ කුඤ්ඣල පණ්ඩිත කාලෙ අරකපණ්ඩිත කාලෙ ඛෝධිපරිබ්බාජක කාලෙ මහෞෂධ පණ්ඩිතකාලේ'නි පඤ්ඤාපාරමියා පූරිතත්තභාවානං පරිමාණං නාම නත්ථි.

මෙසේ දක්වනලද ක්‍රමයෙන් බෝධිසම්භාර ධර්මයන් පුරමින් අවුත් වෙස්සන්තරාත්මභාවයෙහි සිටසිත්පිත් නැගි මහාපෘථිවිය සත්වරක් කම්පාකරවා මහදන් දුන්හේක.

එසින් වදුලහ.

අවෙතනා'යං පුථවී අවිඤ්ඤය සුඛං දුඛං,
සා'පි දානබලා මය්හං සත්තඤක්ඛත්තුං පකම්පථ-සී''

මේ ලෝකයෙහි බොහෝසෙයින් දානාදි මහ පින්කම් කොට ඉහලෝකෘෂභිව මහත් ඉසුරට පැමිණි සත්වයෝ ඇත. ඔහු කවිරුදයන්? සුමනමාලාකාරයෝය, එකසාටකබ්‍රාහ්මණයෝය, පූණී නම් බැලයෝය, මල්ලිකාදෙවීය, ගවපාලමාතාවෝය. සුජාත නම් උපාසිකාවෝය, පූණ්ණ නම් දාසිය යන මොවුන් අතුරෙහි කිසිවක් හුගේ දානයෙහිත් එක්වරක් හෝ දෙවරක් හෝ කිපවාරයක් හෝ පෘථිවිය කම්පාවූ තැන් දක්නට නැත.

මෙම කියේමැනෝ මිලිඳුපැනයෙහි

සූයති නුඛෝ මහාරාජ එතරහි ජිනසාසනෙ කතාධිකාරානං දිඨධම්මසුඛවෙදනීයං කම්මංඛීණනිව යෙසං අබ්භුහගතා දෙවමනුස්සෙසූ'ති ආමහන්තෙ! සූයති එතරහි ජිනසාසනෙ

කතාධිකාරානං දිඨධම්මසුඛවෙදනීයං කම්මංකිත්තිව යෙසං අඛ්භු ගතා දෙවමනුසෙසු යත්තතෙ ජනා'නි කොව කොව මහාරාජා'නි? සුමනා ව භනෙත මාලාකාරෝ එකසාටකෝ ව බ්‍රාහ්මණෝ පුණ්ණා ව භතකෝ මල්ලිකා ච දෙවී ගොපාලමාතා ව දෙවී සුපියා ව උපාසිකා පුණ්ණා ව දාසී'නි ඉමෙසත්ත දිඨධමෙ සුඛවෙදනීයා සත්තා කිත්තී ව ඉමෙසං අඛ්භුගතා දෙවමනුසෙසු—යි.

සෙසුත් ගුත්තිල නම්ගාඤ්ඡියෝය, සාධීනනම් මහරජාෘනාය, නිම්මහරජානෝය, මහාමඛාතුරජානෝය යන මොහු මනුෂ්‍යශරීරයෙන් නිදසභවනයට ගිය බැවි අසනුලැබෙයි, ඔවුන් අතුරෙහිද කිසිවක්හුගේ දැනයෙහිත් පෘථිවිකම්පාවූකැන් දක්නට නැත්.

භෙද කියේමැනෝ එම මිලිඳුපැනසෙහි

අපරෝපි සූයනහිනුඛෙ අනීතෙ මානුසකෙනෙ'ව සරීරදෙහෙන නිදසභවනං ගතා'නි? ආමභනෙත! සූයනහීති කොව කොව මහාරාජා'නි? ගුත්තිලොව ගඤ්ඡබ්බා සාධීනොව රාජා නිමි ව මහාරාජා මඛාතා ව රාජා'නි, ඉමෙ චතුරොජනා සූයනහි තෙනෙ'ව මානුසකෙන සරීරදෙහෙන නිදසභවනංගතා'නි සුචිරං'පි කතං සූයති සුකතදුක්කතං—යි.

මේ මතුනොවෙයි, කාලත්‍රයෙහිම වෙසතුරු අත් බැව් හැර කිසිවක්හුගේ දැනයෙහිත් පෘථිවි කම්පාවූ නැන් දක්නට නැත්

භෙද කියේමැනෝ එහිම

සුනපුබ්බං පන තයා මහාරාජ අතීතෙ වා අඛානෙ වත්ත මානෙ වා අඛානෙ ඉත්ථනාමස්ස දුනෙ දියමානෙ සකිං වා මික්ඛිත්තුං වා නික්ඛත්තුං වා මහාපඨවි කම්පිතා'නි?। නහි භනෙත'නි! අත්ථි මෙ මහාරාජ ආගමෝ අධිගමෝ පරියත්ති සවණං සික්ඛාබලං සුසසුසා පරිපුච්ඡා ආචරියුපාසනං මයා'පි නසුතපුබ්බං ඉත්ථනාමස්ස දුනෙ දියමානෙ සකිං වා මික්ඛිත්තුං වා නික්ඛිත්තුං වා මහාපඨවිකම්පිතා'නි. ඨපෙත්වා වෙසසන්තරස්ස රාජවසභස්ස දුනවරං භගවතෝ ච මහාරාජ කස්සපස්ස භගවතෝ ච සක්‍යමුනිනොනි, මහාං බුඛානං අන්තරෙන ගණනපථං වීතිවත්තා වස්සසතකොටියෝ අනික්කන්තා තත්'පි මෙසවණං න්ත්‍රී ඉත්ථන්නාමස්ස දුනෙ දියමානෙ සකිං වා මික්ඛිත්තුං වා නික්ඛත්තුං වා මහාපඨවිකම්පිතා—යි.

වෙසසන්තර මහරජහුගේ දැනයෙහි ඔහුගේ ගුණධර්මය අතිහරිතාවිය කරණකොටගෙණ ධරන්නට අසමර්ථව මහාපෘථිවි වලනා දියවිය ගම්සේ භාණ්ඩයෙහි අතිභාරයෙන් සකැටෙහි නොඑදද

නෙමියද අඤ්ඤයද බිඳේද එපරිද්දෙන්ම වෙසතුරු මහරජහුගේ ගුණධර්මය සහිතවූ දැනබලයෙන් පෘථිවිකම්පාවිය යම්සේ අහස වැත ජලවෙගාදිය පිණිස ශබ්ද පවත්වා ගර්ජනාකෙරේද, එපරිද්දෙන්ම වෙසතුරුමහරජහුගේ ගුණධර්මය හේතුකොටගෙණ පෘථිවිකම්පාවිය.

කියේමැනෝ එම මිලිඳුපැනයෙහි

න මහාරාජ තාවතකෙන විරියෙන තාවතකෙන පරක්කමෙන මහාපඨවිකම්පති. ගුණභාරභරිතා මහාරාජ සබ්බසොවෙය්‍යකිරිය ගුණභාරභරිතා ධාරෙතුං නවිසහන්ති මහාපඨවිවලති කම්පති පවෙධති යථා මහාරාජ සකටස්ස අනිභාරභරිතස්සනාභියොව නෙමියොව ඵලන්ති අක්ඛොභිජ්ජති එවමෙවඛො-පෙ-යථාවාපථා මහාරාජ ගගනං අනිලජ්ජලවෙගසඤ්ඣාදිතං උස්සන්නතා ජලභාරභරිතං අතිවාතෙන පූරිතත්තා නදති රවති ගලගලායති එවමෙව ඛො මහාරාජ මහාපඨවි රක්ඛෙඤ්ඤ වෙස්සන්තරස්ස දානබලවිපුලඋස්ස න්නභාරභරිතා ධාරෙතුං නවිසහන්ති චලති කම්පති පවෙධති—සී.

තවද වෙසතුරු මහරජානන්ගේ සිත රාග වසයෙන් නොපැවැත්තේය, මෙලවශයෙන් නොපැවැත්තේය, මොහවසයෙන් නොපැවැත්තේය, මානවසයෙන් නොපැවැත්තේය, දෘෂ්ටිවශයෙන් නොපැවැත්තේය, කෙලශවශයෙන් නොපැවැත්තේය, විතර්කවශයෙන් නොපැවැත්තේය, අරතිවසයෙන් නොපැවැත්තේය, බොහෝ සෙයින් දානවසයෙන් සිත පැවැත්තේය, කිමෙක්ද යාචකයෝ මා සමීපයට කෙසේ නම් එලඹෙත්ද එලඹි ඇලඹි යාචකයෝ කෙසේ නම් අභිමතාර්ථවස්තු ලැබී සතුටුවෙත්ද යනාදීන් දානයෙහි පැවැති බලවත් ශ්‍රද්ධාව ඇතිසේක දමය සමය ඛන්තිය සංවරය යනාදී දශසථානයක පැවැති සිත් ඇතිසේක කාමෙෂණාදිය ප්‍රහීණකළ සේක බ්‍රහ්මචරියෙෂණාදියෙහි උත්සාහයට පැමිණිසේක කිමෙක්ද මේ සියලු සත්වයෝ කෙසේනම් නිදුක්නිරොගි වෙත්ද සමගවෙත්ද කෙසේනම් දීඝායු වෙත්ද යනාදීන් සමෘක් අධ්‍යාසය බහුලව පැවැත්තේය.

මේකරුණු විස්තරවසයෙන් වදාළහ නාගසේන මහ තෙරහු මිලිඳුපැනයෙහි—

නහි මහාරාජ රක්ඛෙඤ්ඤ වෙස්සන්තරස්ස චිත්තං රාගවසෙන පවත්තති දෙසවසෙන නප්පවත්තති මොහවසෙන නප්පවත්තති මානවසෙන නප්පවත්තති දිට්ඨිවසෙන නප්පවත්තති කිලෙසවසෙන නප්පවත්තති විතක්කවසෙන නප්පවත්තති අරතිවසෙන නප්පවත්තති අථ ඛො දානවසෙන බහුලං පවත්තති කින්ති අනාගතා යාචකා මමඤ්ඤන්තිකං ආගච්ඡෙය්‍යුං ආගතාව යාචකා යථාකාමං ලභිත්වා අත්තමනා ලභෙය්‍යුන්ති සතතං සමිතං දානංපතිමානසං ඨපිතං හොති රක්ඛෙඤ්ඤ මහාරාජ වෙස්සන්තරස්ස සතතං සමිතං දස

සු ඤානෙසු මානසං ඨපිතං හොති දමෙ සමෙ බ්‍රහ්මචරියෙ යමෙ නියමෙ අඤ්ඤාඩෙ අවිහිංසායං සචෙව සොවෙය්‍යෙ රඤ්ඤෙ මහා රාජ වෙස්සන්තරස්ස කාමෙඝනාපහිණා භවෙඝනා පවිපස්සඬා බ්‍රහ්මචරියෙඝනායෙව උස්සුක්කං ආපනෙනා රඤ්ඤෙ මහාරාජ වෙස්සන්තරස්ස අන්තරක්ඛා පහිණා පරාරක්ඛාය උස්සුක්කං ආප නෙනා කි'න්ති අඛා ඉමෙඝත්තා සමඟා අස්සු අරොගා සඛනා දිඝායුකා'නි බ්‍රහ්මලංයෙව මානසං සංවත්තනි-සී.

තවද දන්දෙනුලබන්නාවූ වෙස්සන්තර මහරජානෝ ඒ දානය භවසම්පත්තියක් පිණිසත් නුදුන්සේක ධනයක් පිණිසත් නුදුන් සේක ප්‍රතිදානයක් පිණිසත් නුදුන්සේක කීර්ති පිණිසත් නුදුන් සේක. වණ්ණනා පිණිසත් නුදුන්සේක සැප පිණිසත් නුදුන්සේක පුත්‍රයින් පිණිසත් නුදුන්සේක. ධීතෘන් පිණිසත් නුදුන්සේක යම් ඥානඤානය පිණිසම මෙබඳුඅතුල්‍යවූ දානය දුන්සේක.

මේදවඳුළහ. මිලිඳුමහරජහට නාගසේනමහතෙරහු.

දදමානො ව මහාරාජ වෙස්සන්තරො රාජා තං දානං න භවස මපත්ති හෙතුදෙනි න ධනහෙතුදෙනි න පටිදානහෙතුදෙනි න උප ලාපහෙතුදෙනි න ආයුහෙතුදෙනි න වණ්ණහෙතුදෙනි න සුඛහෙ තුදෙනි න බලහෙතුදෙනි න යසහෙතුදෙනි න පුත්තහෙතුදෙනි න ධීතුහෙතුදෙනි අථ ඛො යබ්බඤ්ඤාතඤ්ඤ රතනසඤ්ඤාරණා එවරූපෙ අතුලවිපුලානුත්තරෙ දානවරෙ අදාසි-සී.

බුදුන් විසිනුදු වදාළේ මැනෝ.

ජාලිං කණ්හාජිනං ධීතං මද්‍රිදෙවිං පනිබ්බිතං
වජමානො න විඤ්ඤාසිං බොධියායෙව කාරණා-සී.

ඒ වෙස්සන්තරමහ රජානෝ ක්‍රොධසත්වයන් ක්‍රොධ නොකි රීමෙන් ජයගත්සේක අඝාධ්‍රජනයන් ඝාධ්‍රභාවයෙන් ජයගත්සේක කදරීන් දානයෙන් ජයගත්සේක සත්‍යවචනයෙන් ජය ගත්සේක අකුසල්‍ය කුසලයෙන් ජයගත්සේක මෙබඳුගුණයෙන් යුක්තව ධම්මානුගතව ධම්මසීසකව දන් දෙන්නාහුගේ විපුලවියී බල විහාරයෙන් යට මහාවාතයෝ වඩලවීම් ආදින් පාවිචිකම්පාවී.

මේද විස්තරවසයෙන් වදාළහ මිලිඳුරජහට නාගසේන මහ තෙරහු.

වෙස්සන්තරො මහාරාජරාජා අඤ්ඤෙන කොධං ජිනානි අඝා ධ්‍රං ඝාධ්‍රා ජිනානි කදරියං දානෙන ජිනානි අලිකවාදිනං සචෙව න ජිනානි සබ්බං අකුසලං කුසලෙන ජිනානි තස්ස එවං දදමානස්ස ධම්මානුගතස්ස ධම්මසීසකස්ස දානනිස්සන්දෙ බලවිපුල විහාරෙන හෙඨා මහාවාතා සඩලනති සනිකං සනිකං සකිං ඔකිං ඇකුලාකුලා

වායන්ති ඔණමන්ති උන්නමන්ති විනමන්ති සීඝපවත්තා වාදපා පපතන්ති ගුම්බා ගුම්බං වලාහකා ගගනෙ යඤ්ඤවන්ති රජොසංවිත්තා වාතා දුරුණා භොන්ති ගගනං උපපීළිතං වාතා වායන්ති සඝසා ධමධමා යන්ති මහන්තිමහාභීමෝ සඤ්ඤ නිච්ඡරති තෙසු වාතෙසු කුපිතෙසු උදකං සන්තිකං සන්තිකං වලති උදකෙවලිතෙ බුබ්ඛන්ති මච්ඡකච්ඡපා ජායන්ති යමක යමකා ඌම්මියෝ තසන්ති ජලවරා සත්තා ජලවිවිසු ඝනඛොවත්තති විවිනාදෙ පවත්තති භොරා බුබ්බුලා උඤ්ඤන්ති ඵෙණමාලා භවන්ති උත්තරති මහාසමුද්දෙ දිසාවිදිසං ධාවති උදකං උසෙසාතපපිසොතමුබා සන්දන්ති සලිලධාරා තසන්ති අසුරා ගරුළා නාගා යක්ඛා උබ්බිජ්ජන්ති කිනන්නුඛො කථන්නුඛො සාගරෝ විපරිවත්තති'ති? ගම්භනපථමෙසන්ති භීතවිත්තා බුහිතෙ ලුලිතෙ ජලධරෙ පකම්පති මහාපථවි සනාගා සසාගරා පරිවත්තන්ති සිනෙරුගිරිසුට සෙලසිඛරෙ විනම්මානෙ හොති විමනා හොන්ති අහි නකුල බිළා රකොත්ථුක සූකර මිග පක්ඛිනෙ රුදන්ති යක්ඛා අපෙපසක්ඛා භය න්තියක්ඛාමගෙයක්ඛා කම්පමානාය මහාපථවියා-ති.

මෙසේ කම්පාවන පෘථිවිය කෙසේ කම්පාවීදයන්? යම්සේ මහත් සැලෙක දිය පුරා සාලෙන් ආකිණ්ණකොට උදුනෙහි තබා අධො භාගයෙන් මහත්කොට ගිනි දැල්වූකල්හි ප්‍රථමයෙන් භාජනය තත්තවෙද භාජනය රත්වූකල්හි ජලය රත්වේද. ජලය රත්වූකල්හි සහල් රත්වේද සහල් රත්වූකල්හි සහල් ඉපිලේද ගැලේද බුබුළු නැඟේද පෙණමල් ඉතිරේද එපරිද්දෙන්ම වෙසතුරු මහරජානෝ දුන් අන්කිසිවක්හුවිසින් දී ගතනොහැනිවූ සප්තසතක මහාදාන යාගේ බලයෙන් යව මහාවාතය ධරාගන්ව අසමඤ්ඤව කුපිතවිය වාතය කුපිතවූකල්හි ජලපොළොව කුපිතවිය ජලපොළොව කුපිතවූ කල්හි මහාපෘථිවිය කම්පිතවිය මෙසේ එසමයෙහි මහාවාතයද ජලයද පෘථිවියද යන තුන්දෙන එක්සිත්ව සයදගත්තාක් මෙන් මහාදානයෙහි ආනුභාවයෙන් කම්පිතවිය සෙස්සන්ගේ දානයෙක්හි මෙසේ ඇත්තේ නොවේ.

එසින් වදලහ නාගසේන මහනෙරහු මිලිඳු රජහට,

යථා මහාරාජ මහතිමහාපරියොගෙ උඩනගතෙ උදකසම්පු ණෙණ ආකිණ්ණතඛ්ඛලෙ හෙඨතො අග්ගිජ්ජලමා නෝ පඨමං තාව පරියොගං සන්තාපෙති පරියොනෙසනතෙතෙ උදකං සන්තාපෙති උදකං සන්තතතං තඛ්ලං සන්තාපෙති තඛ්ලංසන්තතතං උම්මුජ්ජති නිමුජ්ජති බුබ්බුලකජාතං හොති. ඵෙණමාලි උත්තරති එවමෙව ඛො මහාරාජ වෙස්සන්තරො රාජා යං ලොකෙ දුච්චජං තං චජි තස්ස තං දුච්චජං චන්තස්සදානස්ස සභාව නිස්සන්දෙන හෙට්ඨාමහා

වාතා ඕරෙතුං නවිසහන්තා පරිකුපිංසු මහාවාතෙසු පරිකුපිතෙසු උදකංකම්පි උදකෙ කම්පිතෙ මහාපඨවි කම්පි ඉති තදා මහාවාතොව උදකංව පඨවිවා'නි ඉමෙතයෝ එකමනාවිය අහෙසුං මහාදුන නිස්සඤ්ඤන විපුලබලවිරියෙන තථේ'දිසෝ මහාරාජ අඤ්ඤස්ස දුනානුභාවෝ යථා වෙස්සන්තරස්ස රඤ්ඤෝ මහාදුනානුභාවෝ-සි.

තවද යම්සේ ඉන්‍ද්‍රනීල ජෝතිරසඛ වෙළුරිය සිරිසපුෂ්ප මනොහර සූර්‍යකාන්ති චන්‍ද්‍රකාන්ති වජ්‍රාදි සියලු මාණික්‍යයන්ම ඉක්ම සක්විති මහරජහුගේ භාත්පසින් යොදනක් තැන් ආලෝක පැති රෙන මාණික්‍යයම අග්‍රයයි කියතු ලැබේද, එපරිද්දෙන්ම අසදෘශ මහා දුනාදි සම්භාසි දුනයෙක් ලෝකයෙහි විද්‍යමානවීද ඒ සියලුම දුනයට වඩා වෙසතුරු බෝසතානන්ගේ දුනය අග්‍රවේ, වෙසතුරු මහරජානන්ගේ දුනයෙහි මහපොළොව සත්වරක් කම්පාවී-

මෙයද වදලහ නාගසේන මහතෙරහු,

යථා මහාරාජ මනිගා බහුවිධා මණිඥා විජ්ජන්ති සෙය්‍යථිදං ඉන්‍ද්‍රනීලෝ මහානීලෝ ජෝතිරසෝ වෙළුරියෝ උම්මාපුප්ඵෝ සිරිස පුප්ඵෝ මනොහරෝ සුරියකන්තෝ චජිරෝ කඡ්ජාපකඤ්ඤමකෝ* ඵුස්සරාගෝ ලොහිතංකෝ මසාරගල්ලෝ එතෙ සබ්බෙ අභිකඤ්ඤම චක්කවත්තිමණි අඟමඤ්ඤායති චක්කවත්තිමණි මහාරාජ සමන්නා යොජනං ඔභාසෙති එව'මෙව ඛෝ මහාරාජ යංකිඤ්චි ඔභියා දුනං විජ්ජති අපි අසදිසදුනං පරමං නංසබ්බං අභිකඤ්ඤම වෙස්සන්න රස්ස රඤ්ඤෝ මහාදුනං අඟ'මඤ්ඤායති වෙස්සන්තරස්ස මහා රඤ්ඤෝ මහාදුනෙ දියමානෙ සත්තකඛත්තුං මහාපඨවි කම්පිතා-සි.

බුදුන් විසිතුදු වදලේ මැනෝ.

අවෙතනා'යං පඨවි අභිඤ්ඤාය සුබං දුබං
සා'පි දුනබලා මයහං සත්තකඛත්තුං පකම්පථ-සි.

මෙසේ දක්වනලද සත්වරෙක මහිකම්පා කිරීම පෙරදැරිකොට ඇති මහදන්දී ශ්‍රද්ධා නැමැති පෘථිවියෙහි පිහිටි "බුඩ්ධො භවෙය්‍යං" යනාදි ප්‍රණිඥ නැමැති බිජුවට ඇති ප්‍රඥ නැමැති තොතැනි ඇති කරුණා නැමැති ජලනිසෙකයෙන් වඩනාලද මෛත්‍රී නැමැති කඳ ගෙණ වැඩි ත්‍රිවිධ බොධිසත්ත්වඅක්ෂ නැමැති ශාඛාවෙන් විශාලවූ පඤ්ඤා පරිත්‍යාග නැමැති පලුව පත්‍රයන් ඇති සමත්‍රිංශත් පාර මිතා නැමැති විකසිත පුෂ්පයන් ඇති බොධිසම්භාර නැමැති උතුම්වූ කල්පවෘක්ෂයෙහි සම්භාෂනය නැමැති අමෘත ඵලගන් වනු කැමැතිව ඒ වෙස්සන්තරාත්ම භාවයෙන් චුතව ගොස් තුෂිත දිව්‍යලෝකයෙහි ශ්වේතකෙතු නම් දිව්‍යපුත්‍රයන්ව උපන්සේක.

---

* ඛජ්ජා පකඤ්ඤ මකෝ'සි සමකර.

එසින් කිහ මහාබොධිවංශයෙහි,

වෙස්සන්තරත්තභාවේ'යෙව ඨත්වා යත්තකඛත්තුංවසුධාතලවලන පුරස්සරං මහාදානං දත්වා සඩ්වලායංපතිඨිතෙ පටිඤ්ඤුබ්‍රාපේපඤ්ඤ, ලවාලයෙ කරුණාජ්ඣාසෙකසංවඩ්ඪිතෙ මෙත්තාභාවනිඩ සංරුළෙහ චරියාසාඛාවිසාලෙ මහාපරිච්චාගපලලවෙ පාරමිකුසුම සමපුලෙල බොධිසම්භාර කපපතරුවරෙ සඛඤ්ඤුතඤ්ඤණාමතඵලං ගණිහා පෙතුකාමෝ තතෝ චවිත්වා තුසිතපුරෙනිඛ්බත්තී-යි.

දුරෙනිදානයෙහිදු කියේ මැනෝ,

එවං මහාපඨවිකම්පනානි මහාපූඤ්ඤානි කරිත්වා ආයුපරියොසානෙ තතෝ චුතෝ තුසිතභවනෙ නිබ්බත්තී-යි

මෙසේ දීපංකර පාදමූලයෙහි පටන් ක්‍රමයෙන් අවුත් යම් කලෙක තුසිතපුරයෙහි උත්පත්තියෙක් ඇද්ද ඒතාක් පැවැති මෙපමණ කාරණය **දුරෙනිදාන** නමැයි කියත්.

එම දක්වන්නට කිහ.

ඉති දිපඞ්කරපාදමූලතෝ පඨාය යාව අයං තුසිතපුරෙනිබ්බත්තති එත්තකං ඨානං දූරෙනිදානං නාමාති වෙදිතබ්බං-යි.

මෙසේ දීපඞ්කර පාදමූලයෙහි පටන් කාශ්‍යප බුදුන් දක්වා උප්පන්න් බුදුන් නොවරදවා නොයෙක් ලෙසින් පුදා විවරණ ලැබ තුසිතපුරයෙහි උත්පත්තියදක්වා සමන්ත්‍රිංශත් පාරමී ධර්මයන් පුරණ ලෙස්කුත් අන්තිමි කාරණයක් පිණිස නොපිරුණේක. ලොවිතුරා බුඩකිය පිණිසම පිරුණේක. එසේ පූරණය කොට ක්‍රමයෙන් ඉගාස් බෝමැඩෙහි වැඩහිද අභිඤ්ඤෙය්‍යාදි වසයෙන් චතුරාර්‍ය සත්‍යධර්මයන් දත්හෙයින් බුඩනම් වනසේක.

එහෙයින් වදලහ.

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤුතං-භාවෙතබ්බං ච භාවිතං,
පහාතබ්බං පහීණං'ති තස්මා බුඩෝ'ස්මි බ්‍රාහ්මණ-යි.

මෙතෙකින් මේ **සාරාර්ථසංග්‍රහ** නම් ප්‍රකරණයෙහි
කොණ්ඩඤ්ඤදිතෙවිසි බුදුන් කෙරෙන් ලද

දෙවන සාමාන්‍යාභිනීහාර කථා නම්වූ

තුන්වන පරිච්ඡේදය

නිමි.

අභිසමෙධාධි කථා නම්වූ

4 වෙනි පරිච්ඡේදය.

තවද මේ **සාරත්ථසඞ්ග්‍රහයෙහි අභිසමෙධාධි කථා** නම් කවර යත්? හේ දූරෙනිදුනාවසානයෙහි **පවන්** කියනු ලැබේ. **කෙසේ** දයත්? තුසිතපුරයෙහි බොධිසත්වයන් වහන්සේ වයම්න් සිටීයදීම බුඩහලා හලිනම් කොලාහලයෙක් පහළවිය. ලෝකයෙහි වනාහි කල්ප කොලාහලය බුඩකොලාහලය චක්‍රවර්ත්ති කොලාහලයයි කොලාහල තුනෙක්වන්නේය.

කියේමැනෝ.

තුසිතපුරෙ වසනෙතයෙව පන බොධිසතෙන බුඩ හළාහළං නාම උදපාදි ලොකසමිං ගි නීනි හළාහලානි උපපජ්ජන්හි කපපහලා හලං බුඩ හළාහළං චක්කවත්ති හලාහලං-සි.

ඒ ත්‍රිවිධ කොලාහළයන් අතුරෙන් හවරුදුලක්‍ෂයක් ඉකුත්කල කල්පවිනාසය වන්නේයැයි ලොකබ්‍යූහනම් කාමාවචර දෙවතාකෙනෙක් අවමගුල්වෙසක් ගෙණ හිසකේ මුදු විසුරුවන ලදුව හඬන මුහුණුඇතිව යුවලනින් කඳුළු පිස පිස රත්පිළි හැඳ පෙරව ඉතා විරූපවූ වෙස්ඩරා මනුෂ්‍යපථ යෙහි ඇවිදිනාහු නිදුකිනි නිදුකිනී? මෙයින් හවුරුදු ලක්‍ෂයක් අතික්‍රාන්තවූ කල කල්පවිනාශය වන්නේය, මේ සමුද්‍රයද වියලෙන්නේය, මේ මහා පෘථිවියහා මහා මෙරුපර්‍යන්තයද දවන්නේය බඹලොවදක්වා ලොව නස්නේය එහෙයින් නිදුක්වූ සත්වයෙනි? මෛත්‍රිභාවනා කරව්, කරුණා මුදිතා උපෙක්‍ෂා භාවනා කරව්, මවුන්ට උපස්ථානකරව්, පියන්ට උපස්ථාන කරව්, කුලදෙටුවන්ට උපස්ථාන කරවියයි මෙසේ කියා ඇවිදිනි මේ කල්පකොලාහළය නම් වන්නේය;

කියේමැනෝ.

තඤ්ච වස්සසතසහස්සස්ස අච්චයෙන කප්පුඨානං භවිස්සතී'ති ලොකබ්‍යූහා නාම කාමාවචරදෙවා මුත්තාසිරා විකිණ්ණකෙසා රුදමම්මුඛා අස්සුනි හත්ථෙහි පුඤ්ඡමානා රත්තවත්ථනිවත්ථා අනිය විරූපවෙසධාරිනෝ හුත්වා මනුස්සපථෙ විචරන්තා එවං ආරොං

වෙන්නී මාරිසා මාරිසා? ඉතෝ වස්සසතසහස්සස්ස අච්චයෙන කප්පුට්ඨානං භවිස්සති අයං ලොකෝ විනස්සිස්සතිමහාසමුද්දෝපි සුස්සිස්සති අයංච මහාපඨවී සිනෙරුච පබ්බතරාජා උඩ්ඩයිස්සතීති යාව බ්‍රහ්මලෝකා ලොකවිනාසෝ භවිස්සතී'ති මෙත්තං මාරිසා භාවෙථ කරුණං මුදිතං උපෙක්ඛිං මාරිසා භාවෙථ මාතරං උපට්ඨහථ පිතරං උපට්ඨහථ කුලෙජේට්ඨාපචායිනෝ හොථා'ති ඉදං කප්පභලාභළං නාම-යි,

අවුරුදුදහසක් අනික්‍රාන්තවූකල සඒඤකෙනෙකුන් වහන්සේ ලෝකයෙහි උපදිනාසේකැයි ලෝකපාලදෙවියෝ නිදුකිනි? මෙයින් අවුදුරුදහසක් අනික්‍රාන්තවූ කල ලොවුතුරා බුදුකෙනෙකුන් වහන්සේ ලෝකයෙහි උපදනා සේකැයි හඬහා කියමින් ඇවිදිනි මේ බුඩකොලාහළ නම්වේ.

කියේමැනෝ.

වස්සසහස්සස්ස අච්චයෙන පන සබ්බඤ්ඤුබුඩ්ඩෝ ලොකෙ උප්පජ්ජිස්සතී'ති, ලොකපාලදෙවතා ඉතෝ මාරිසා වස්සසහස්සස්ස අච්චයෙන බුඩ්ඩෝ ලොකෙ උප්පජ්ජිස්සති'ති, උග්ඝොසෙන්තා ආහිණ්ඩන්ති ඉදං බුඩ්ඩභලාභළං නාම-යි,

අවුරුදු සියයක් අනික්‍රාන්තවූකල චක්‍රවර්ත්තී රජ්ජුරුකෙනෙක් උපදනාහුයයි දෙවතාවෝම නිදුක්නි? මෙයින් මතු අවුරුදු සියයක් ඇවැමෙන් චක්‍රවර්ත්තී රජ්ජුරුකෙනෙක් උපදිනිසි උග්ඝොසනය කොට ඇවිදිනි මේ චක්‍රවර්ත්තී කොලාහළ නම් වෙයි මේ ත්‍රිවිධ කොලාහලියෝ ලොකයෙහි මහත්ෂවත්.

ඡේද කියේමැනෝ.

වස්සසතස්ස පන අච්චයෙන චක්කවත්තිරාජා උප්පජ්ජිස්සතී'ති දෙවතා යෙව ඉතෝ මාරිසා ?වස්සසතච්චයෙන චක්කවත්තිකොරාජා ලොකෙ උප්පජ්ජිස්සති'ති, උග්ඝොසෙන්ති යෝ ආහිණ්ඩිත්ති ඉදං චක්කවත්තිභලාභළංනාම. ඉමානිතීනි භලාභලානි මහන්තානි හොන්ති-යි.

මේ ත්‍රිවිධ කොලාහලයන් අතුරෙන් බුඩ කොලාහල ශබ්දය අසා සකල දශසහස්‍රී චක්‍රවාලයෙහි දෙවියෝ එකතැනට රැස්ව අස වල් නම් යක්ෂයෙක් බුදුවන්නේයයි දැන ඔහුකරා එළඹ යාඤකරන් නාහුය. එසේ යාඤකරන්නාහුදපඵුජීනිමිත්තන සමහවූ කල්හිම යාඤකරන්නාහුය. එසමයෙහිත් සියලුම දෙවියෝ එකෙකී යක් වලෙක වාතුම්භාරාජික ශක්‍ර සුයාම සන්තුෂිත සුනිර්මිත වශවර්ත්ති මහා බ්‍රහ්මයන් හා සමග මේ එක් යක්වලට රැස්ව තුසිත භවනයෙහි වසන බෝධතුන්කරාළඹ නිදුකානන් වහන්ස, දැනාදී දස

පෙරුම් පුරන්නාවූ නුඹවහන්සේ විසින් ශක්‍ර සම්පතක් හෝ මාර සම්පතක් හෝ බ්‍රහ්ම සම්පතක් හෝ චක්‍රවර්ති සම්පතක් හෝ ප්‍රාර්ථනා කෙරෙමින් පිරූයේක් නොවෙයි. ලොවසතුන් සසරදුකින් මුදන පිණිස සම්බුදුඤාණය ප්‍රාර්ථනා කෙරෙමින්ම දශපාරමී ධර්මයන් පුරණලද්දේය. දැන්වූ කලී නුඹවහන්සේට ඒ පාරමිධර්මයෝ සම්පූර්ණවූහ. එහෙයින් නිදුකානන් වහන්ස! බුදුවීමට කල් වන්නේය. නිදුකානන් වහන්ස! බුදුවීමට සමය වන්නේයයි කියා යාච්ඤාකලාහුය.

කිසේමැනෝ.

බුඩගලාභලාභදං සුත්වා සකලදසසහස්සවක්කවාලෙ දෙවතා එකතො සන්නිපතිත්වා අසුකො නාම සත්තො බුඩො භවිස්සතී'ති, සුත්වා තං උපසංකම්ත්වා ආයාචන්ති ආයාචමානා ව පුබ්බනිමිත්තෙසු උප්පන්නෙසු ආයාචන්ති නදී පන සබ්බං'පි තා එකෙකචක්කවාලෙ වාතුම්මහාරාජ සක්‍ක සුයාම සන්තුසිත නිම්මානරති පරනිම්මිතවස වත්ති මහාබ්‍රහ්මෙති ඈඩි. එකවක්කවාලෙ සන්නිපතිත්වා තුසිතභවනෙ බොධිසත්තස්ස සන්තිකං ගන්ත්වා මාරිසා? තුම්හෙහි දසපාරමියො පූරෙන්තෙහි න සක්‍කසම්පත්තිං න මාර න බ්‍රහ්ම න චක්‍කවත්තිසම්පත්තිං පත්ථෙන්තෙහි පූරිතා ලොකනිය්‍යානත්ථාය පන සබ්බඤ්ඤුතං පත්ථෙන්නාහි පූරිතා සො වො දානි කාලො මාරිස! බුඩත්තාය සමයො මාරිස! බුඩත්තාය'ති යාචිංසු-යි.

ඉක්බිත්තෙන් මහ බෝසතාණන් දෙවියන්ට ප්‍රතිඥ නොදීම-

කාලං දීපංච දෙසංච-කුලංමාතර මෙවච
එතෙ පඤ්ච විලොකෙත්වා-උප්පජ්ජන්ති තථාගතා.

යනුහෙයින් කාල දීප දෙස කුල ජනෙත්ති ආයුපරිච්ඡේද වශයෙන් පවමහා විලෝකන නම්වූ විලෝකනයක් කළමස්ක.

කිසේමැනෝ.

අථ මහාසත්තො දෙවතානං පටිඤ්ඤං අදත්වාව කාල දීප දෙස කුල ජනෙත්ති ආයුපරිච්ඡේද වශෙන පවමහාවිලෝකනං නාම විලොකෙසි-යි.

ඒ පඤ්චමහාවිලෝකනයන් අතුරෙහි මේ බුදුවන්ට කල්දේ නොකල්දේ හෝයි ප්‍රථමයෙන් කාලවිලෝකනය කළසේක. එහි අවුරුදු ලක්ෂයකින් මත්තෙහි වැඩි සිටි ආයුඇති කාලය කල් නම් නොවෙයි, කුමක්හෙයින්දයත්? එසමයෙහි සත්ත්වයන්ට ජරා මරණ නොපෙණෙන්නේය. සත්ත්වවරයන් වහන්සේගේ ධර්මදේශ

නාව නම් අනිත්‍යය දුඃඛය අනාත්මය යන ත්‍රිලක්ෂණයෙන් විනිර්මුක්තාවන්හෙන් නොවයි, අනිත්‍යාදිය මනාකොට ඉගෙන සන්සියන්ට ඒ ලක්ෂණත්‍රය ප්‍රකාශකොට ධර්මදේශනාකර වදරණකල්හි මුන්වහන්සේලා මේ කියන්නේ කිමෙක්දැයි වදාරනාවූ ධර්මය අසන්වත් නොසිතති නොකැමැතිවෙත් එසේකල්හි මාර්ගාධිගමය නොවන්නේය මාර්ගඵලයට පැමිණීම නැතිකල්හි බුදුන්ගේ අවවාද අනුශාසනා සඟයන් නිවණට පමුණුවන්නේ නැත එසේහෙයින් ශාසනය අනෙකයන්තිකය වෙයි. මේ කාරණයෙන් ලක්ෂයක් අවුරුද්දෙන් වැඩුනාවූ ආයුෂ ඇති කාලය බුදුවන්ට කල් නොවන්නේය.

මේද කිඟ.

වස්සසතසහස්සතෝ උඩං වඩිඨිත ආයුකාලෝ කාලෝනාම න හොති කස්මා? තදහි සත්තානං ජාතිජරා මරණානි න පඤ්ඤායන්ති බුද්ධානඤ ධම්මදේසනා තිලක්ඛණමුත්තා නාම නත්ථි තෙසං අනිච්චං දුක්ඛ'මනත්තා'ති කථෙන්තානං කිත්තාමෙ'තං කථෙන්ති'ති, නෙ'ව සොතබ්බං න සද්ධාතබ්බං මඤ්ඤන්ති තතෝ අභිසමයෝ න හොති තස්මිං අසති අනිය්‍යාණිකං සාසනං හොති තස්මා සෝ අකාලෝ-යි.

අවුරුදු සියයකින් අඩුවූ ආයුෂ ඇති කාලයත් බුදුවන්ට කල් නම් නොවන්නේය. කුමක්හෙයින්ද යත්? එසමයෙහි සත්වයෝ උත්සන්නවූ ක්ලේශයන් ඇත්වන්නාහ උත්සන්න ක්ලේශයන් ඇති සත්වයන්ට දුන්නාවූ අවවාදය අවවාද ඝාතනයෙහි නොපිහිටයි දියෙහි දඩකින් ඇදි ඉරක්මෙන් වහාම නසියි ඒ කාරණයෙන් අවුරුදු සියයකින් අඩුවූ ආයුෂය ඇති කාලයත් බුදුවන්ට කල්නම් නොවන්නේය. අවුරුදු ලක්ෂය පටන් අවුරුදු සියගදක්වා මේ කාලය බුදුවන්ට කාලයනම් වන්නේය. එසමයත් සියක් අවුරුද්දට ආයුෂඇති කාලය බැවින් මහ බෝසතාණෝ මේ බුදුවන්ට කාලයයි කියා කාලවිලෝකනය කළාහුය.

මේද කිඟ.

වස්ස සතතෝ ඌනආයු කාලෝ'පි කාලෝ න හොති කස්මා? තදා සත්තා උස්සන්නා කිලෙසා හොන්ති උස්සන්නකිලෙසානඤ්ච දිනෙනාවාදෙ ඔවාදකාරෙ න තිට්ඨති උදකෙ දණ්ඩරාජීව්‍ය ඛිප්පං විගච්ඡති තස්මා සෝ'පි අකාලෝ වස්සසතසහස්සතෝ පන පඨාය හෙට්ඨා වස්සසතතොපට්ඨාය උඩං ආයුකාලෝ කාලෝනාමතදුච්ච වස්ස සතකාලෝ අථ මහාසත්තෝ නිබ්බත්තිතඛකාලෝ'ති පස්සි—යි,

ඉක්බිත්තෙන් දීපවිලෝකනය කරන්නාවූ මහ බෝසතාණෝ පිරිවර සහිතවූ සතරමහදිවයින බලා තුන්දිවයිනෙක බුදුවරයෝ ක්‍රූපදනාහ ඡඹුම්පදයෙහි උපදනාහයි දීපවිලෝකනය කළසේක.

කියේමැනෝ.

තතෝ දීපං විලොකෙනෙතා යපරිවාරෙ වතතාරෝ දීපෙ ඔලෝ කෙත්වා තිසු දීපෙසු බුඩා තනිබබතතෘනි ජම්බුදීපෙ'යෙව නිබබතත නතී'නි දීපං ව පසසි—යි.

ඉක්බිත්තෙන් ජම්බුවිපය නම් ඉතාමහත දසදහසක් පමණ යොදුන් ඇත්තේය. කවර ප්‍රදෙශයක සම්බුදරයෝ උපදිනාසේක් ද්‍රෝණෝසි බලනාසේක් මධ්‍යදෙශය දුටුසේක.

කියේමැනෝ.

තතෝ ජම්බුදිපොනාම මහා දසයොජන සහසස පරිමාණං තත රසමිං නුඩා පදෙසෙ බුඩා නිබබතතනතී'නි, ඔකාස'මපි වීලොකෙ නෙනා මජඣිමදෙසං පසසි—යි.

මධ්‍යදෙශය නම් කෙසේදයත්? පැදුම්දෙසෙහි කජඟල නම් නියම්ගමය අගනිදෙසෙහි සලලවතී නම් ගඟය, දකුණුදෙසෙහි සෙතකණණිකා නම් නියම්ගමය පැලදෙසෙහි සූණා නම් බමුණු ගමය උතුරුදෙසෙහි උසිරඩවජ නම් පබතය යන මොවුන්ගේ මධ්‍ය යෙහිවූ දෙශය මධ්‍යදෙශ නම්වේ.

එසින් කිහ බොධිචංශයෙහි

කජඩගල සලලවති සෙතකණණිකථූනෝ'සිරඩජාභිධානානං නිගම නදි නිගමනාම පබබතානං මෙඣි--යි.

චිනසෙහිදු කිහුමැසි.

මජඣිමදෙසෝ නාම පුරත්ථිමදිසාය කජඩගලං නාම නිගමෝ තස්ස අපරෙන මහාසාලෝ නතෝපරං පවවනතිමා ජනපදෝ ඔරතෝ මජඣෙ, පුබබ දක්ඛිණාය දිසාය සලලවති නාම නදී තතෝපරං පවවනතිමා ජනපදෝ ඔරතෝ මජඣෙ, දක්ඛිණාය දිසාය සෙත කණණිකං නාම නිගමෝ තතෝපරං පවවනතිමා ජනපදෝ ඔරතෝ මජඣෙ, පච්ඡිමාය දිසාය ථූනං නාම බ්‍රාහමණගාමෝ නතෝපරං පවවනතිමා ජනපදෝ ඔරතෝ මජඣෙ, උත්තරාය දිසාය උසිරඩජෝ නාම පබබතෝ තතෝපරං පවවනතිමා ජනපදෝ ඔරතෝ මජඣෙ-යි.

මෙසේ දක්වනලද මධ්‍යදෙශය නම් දිගින් තුන්සියයක් යොදුන පුළුලින් දෙසියපණස් යොත්තෙක වටින් නවසියයක් යොදුන මේ ප්‍රදෙශයෙහි බුඩප්‍රත්‍යෙකබුඩ අග්‍රශ්‍රාවක මහාශ්‍රාවක අශීති මහා ශ්‍රාවක චක්‍රවර්ත්ති රජදරුවන් හා අනිකුදු මහානුභාවසම්පන්න ක්ෂත්‍රිය බ්‍රාහමණ ගෘහපති මහාසාලාදිහු උපදනාහ, මෙබඳු මධ්‍යදේශ

ඵලයෙහි කපිලවස්තු නම් නුවරේ ක්ෂත්‍රියන්ගේ ඵහි මාවිසින් ඉපැදුදු සුතුසැයි නිසැකවට පැමිණිසේක.

මෙම හිහ අවිදූරෙනිදානයෙහි,

එවං විනයෙවුත්තෙහා පදෙසෝ සෝ ආයාමතෝ තීනි යොජන සතානි විත්ථාරතෝ අඩ්ඪතිය යොජනසතානි පරික්ඛිපතෝ නව යොජනසතානි'ති එතස්මිං පදෙසෙ බුඩා පවෙචකබුඩා අග්ගසාවකා මහාසාවකා අසිති මහාසාවකා චක්කවත්ති රාජා අඤ්ඤෙව මහෙ සක්‍යා ඛත්තිය බ්‍රාහ්මණ ගහපති මහාසාලා උපපජ්ජන්ති ඉදඤ්චේ කපිලවත්ථුකං නාම නගරං තස්ථ මයා නිබ්බත්තිතබ්බ'න්ති නිඤ්ඤ 'ගමාසි—යි.

ඉක්බිත්තෙන් ඉපැදුසුතුකුලය බලන්නාවූ මහ බෝසතානෝ සම්භවරයෝ නම් වෛශ්‍යකුලයෙහි හා ක්ෂුද්‍රකුලයෙහිත් නුපදනාහ. ලොකප්‍රසිඩවූ පූජ්‍යවූ ක්ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහි හෝ යනමේ දෙකුලයෙහිම උපදනාහ. දැනුදු ක්ෂත්‍රියකුලය ලොකසම්ම තය එහි උපදිමි සුඩොදන නම් රජානෝ මට පිය වන්නාහයි කුලය බැලූසේක.

මේද හිහ.

තතෝ කුලං විලොකෙත්වා බුඩානාම වෙස්සකුලෙවා සුද්ද කුලෙවා නනිබ්බත්තන්ති ලොකසම්මතෙ පන ඛත්තියකුලෙවා බ්‍රාහ්මණකුලෙවා'ති ඕසුයෙව කුලෙසු නිබ්බත්තන්ති ඉදානිව ඛත්තිය කුලංයෙව ලොකසම්මතං තස්ථ ර් බ්බත්තිස්සාමි සුඩොදනො නාම රාජා මෙ පිතා භවිස්සති'නි කුලං පස්සි—යි.

ඉක්බිත්තෙන් මාතෘවිලොකනය කරන්නාවූ මහබෝසතානෝ බුඩමාතාවෝ නම් පූරුෂලොලත්වයක් නැත්තාහ. සුරාධුතී නොවත්තාහ. කප්ලක්ෂයක් මුළුල්ලෙහි පුරණලද පාරමිතාවන් ඇත්තාහ. උපන්තැන් පටන් අඛණ්ඩවූ පඤ්චශීලය රක්ෂාකරන්නාහ. මේ මහාමායා දේවිද වනාහි එබඳු ගුණධර්මයන් ඇත්තිය එහෙයින් මේ මහාමායා නම් දේවි මට මව් වන්නිය ඒ දේවින්ට ආයුෂය කෙපම ණෙක්දෝහෝයි පරීක්ෂාකොට බලා දසමසකින් මන්තෙහි සත්දව සක් ආයුෂය දුටුසේක.

කියේමැනෝ.

තතෝ මාතරං විලොකෙත්වා බුඩමාතා නාම ලොලා සුරා ධුත්තා න හොති කපසතසහස්සං පන පූරිතපාරමී ඤාණතෝ පඤ්ච අඛණ්ඩපඤ්චසීලායෙවහොති අයංච මහාමායා නාම දෙවී එදිසී

අයංච මෙ මාතා භවිස්සති'ති ඛිත්තකං පඤ්ඤායන්ති දසන්නං මාසානං උපරිසත්තදිවසානි පස්සි-යි.

මෙසේ මහ බෝසතාණෝ මේ පස්බැලුම් බලා නිදුක්නි! බුදුවීමට කල්වන්නේයැයි දෙවියන්ට සංග්‍රහ කෙරෙම්න් ප්‍රතිඥදි තෙපි හැම දෙන යවයි දෙවියන් යවා තුෂිත දිව්‍යලෝකයෙහි දෙවියන් විසින් පිරිවරණ ලදුව හැම දෙවලොවම නන්දනවන ඇතිවන බැවින් නන්දන වනයට වැද එහි දෙවියන් විසින් මෙයින් චුතවූ නුඹ වහන්සේ සුගතිසඞ්ඛ්‍යාතවූ මනුෂ්‍යලොකයට ගියමැනව මෙයින් චුතවූ නුඹවහන්සේ සුගතිසඞ්ඛ්‍යාතවූ මනුෂ්‍යලොකයට වැඩියමැන වැයි සූළිජන්මාන්තරවල කරණලද කුශලකර්මයට අවසර සිහිකර වමින් ඇවිදිනාහුය, මෙසේ කුශලකර්ම සිහිකරවන්නාවූ දෙවියන් විසින් පිරිවරණලද ඒ මහ බෝසතාණෝ ඒ නන්දනොද්‍යානයෙහි ඇවිදිමින් සිටම චුතව මහාමායා දේවීන්ගේ කුක්ෂියෙහි ප්‍රතිසන්ධි ග්‍රහණය කළසේක.

මෙදිනය.

"ඉති ඉමං පඤ්චමහාවිලොකනං විලොකෙත්වා කාලෝ මේ මාරිසා! බුද්ධභාවායා'ති දෙවතානං සංගහං කරොන්තා පටිඤ්ඤං දත්වා ගච්ඡථ තුම්හෙ'ති තා දෙවතා උය්‍යොජෙත්වා තුසිතදෙවතාහි පරිවුතො තුසිතපුරෙ නන්දනවනං පාවිසි සබ්බ දෙවලොකෙ සු හි නන්දනවනං අග්ගි'යෙව තත්‍රනං දෙවතා ඉතොචුතො සුගතිං ගච්ඡ ඉතොචුතො සුගතිං ගච්ඡා'ති පුබ්බෙ කත කුසලකම්මෝ'කා සං සාරයමානා විචරන්ති සො එවං දෙවතාහි කුසලං සාරය මානාහි පරිවුතො තස්ථ විචරන්නො චවිත්වා මහාමායාය දෙවියා කුච්ඡිසමිං පටිසන්ධිගණ්හි-යි.

එහි විස්තර මෙසේ දතයුතු. එසමයෙහි වනාහි කපිලවස්තු පුර යෙහි උතුරුසල නැකතලද ඇසළ මස මැදි පොහොයෙහි කරණ ලද ඇසළකෙළි නම් මහත්වූ උත්සව කෙළියෙක් පලමු සත්වෙනිදා පටන්විය මහජනයෝ ඉස්සොදු නහා හැඳපැලඳ නැකැත්කෙළි කෙළිනි මහාමායා දෙවි පළමු සත්දවස පටන් නකත්කෙළි සිරිවිඳි මින් සත්වන දවසෙහි උදැසන්හිම සුවඳපැනින් ඉස්සෝදු නහා සාරලඤ්ඡයක් විසදම්කොට මහ දන් දී සම්පූර්ණාභරණ විභූෂිතව උතුම් භොජනය අනුභවකොට පෞෂඨාඛ්‍යයන් අධිෂ්ඨානකොට අලංකෘත කොට පිළියෙළ කරණලද ශ්‍රී යහන්ගබඩාවට ප්‍රවිෂ්ටව ශ්‍රී යහන්හි නිපනනව නිද්‍රොපගතවූ තැනැත්තී මේ සිහිප්නය දුටුවාය. සතර වරම් මහ රජදරුවෝ බිසවුන් හොත් යහන හා සමග ඔසවාගෙණ හිමවතට ගෙණගොස් සැටයොදුන් සිරියෙල් ගල්තෙලෙහි සත්සයා දුන් මහ ගල්රුක්මුල තබා එකත්පසෙක සිටියාහුය. ඉක්බිත්තෙන්

ඒ වරම් රජදරුවන්ගේ අගමෙහෙස්හු අවුත් දේවීන් අනවතප්ප විලට නෙණහොස් මිනිස්ගඳහරණ පිණිස නහවා දිවපිළි හඳවා දිවගඳ විලවුන් ගල්වා දිවමල් පලඳවා එයින් නුදුරුතෙන රිදී පවී තයෙක් ඇත එහි පිහිටි රන්පායක් ඇත එහි පත්වීමදිගට සිරසලා සැතපෙන ලෙසට දිවසහනක් පණවා ඒ දේවීන් එහි සතපුවාහුය. ඉක්බිත්තෙන් බොධිසත්වයෝ උතුම් ශ්වේතඡත්‍රවිලාසයක්ව එයින් නුදුරුතෙන එක් ස්වර්ණමය පවීතයෙක් ඇත එහි ඇවිද එයින් බැස රිදීපවීතයට නැඟි උතුරුදෙසෙන් අවුත් රිදී දමක්වන් සොඬින් ශ්වේතපද්මයක්ගෙණ කුක්ෂිනාදකොට රන්වීමනට ප්‍රවිෂ්ටව බිස වුන් හොත් යහන තුන්වරක් ප්‍රදක්ෂිණාකොට දක්ෂිණපාර්ශ්වයෙන් ඝර්ණයකොට කුක්ෂියට ප්‍රවිෂ්ටවුනාක්මෙන් විය. මෙසේ ඇසළමස උතුසළ නැකතින් ප්‍රතිසන්ධිග්‍රහණය කලසේක.

මෙම කිහ දුරෙනිදුනයෙහි,

"තදුකිර කපිලවත්‍ථුනගරෙ ආසාළහි නක්ඛත්තං ඝුට්ඨං අහොසි මහාජනො නක්ඛත්තං කීළති මායාදෙවී පුරෙපුණ්ණමාය සත්තම දිවසතො පඨාය විගතසුරාපානං මාලාගන්ධ විභූති සම්පන්නං නක්ඛ ත්තකීළං අනුභව මානා සත්තමදිවසෙ පාතොව උට්ඨාය ගන්ධොද කෙන නහායිත්වා චත්තාරිසතසහස්සානි විස්සජ්ජෙත්වා මහාදානං දත්වා සබ්බාලංකාර විභූසිතා වරභොජනං භුඤ්ජිත්වා උපොසථඞ්ගානි අධිට්ඨාය අලඞ්කතපටියත්තං සිරිගබ්භං පවිසිත්වා සිරිසයනෙනි පන්නා නිද්දං ඔක්කමමානා ඉමං සුපිනං අද්දස චත්තාරොකිර නං මහාරාජානො සයනෙ 'ගනව සඞ්ඛ උක්ඛිපිත්වා තිමවන්තං නොත්වා සත්ත යොජනිකෙ මනොසිලාතලෙ සත්තසොජනිකස්ස මහාසාලරුක්ඛ ස්ස හෙට්ඨා ඨපෙත්වා එකමන්තං අට්ඨංසු අථනෙසං දෙව්යො ආගන්ත්වා දෙවිං අනොතත්තදගංනෙත්වා මනුස්සමලහරණත්ථං නහාපෙත්වා දිබ්බවත්ථං නිවාසාපෙත්වා ගන්ධෙහි විලිම්පාපෙත්වා දිබ්බ පුප්ඵානි පිලන්ධාපෙත්වා තතො අවිදූරෙ රජත පබ්බතො තස්ස අන්තෙනා කණ්ණිකවිමානං අත්ථි තත්ථ පාචිනසිඛරං දිබ්බසයනං පඤ්ඤපෙත්වා නිපජ්ජාපෙසුං-අථ බොධිසත්තො ඝසවරවාරණෙ හුත්වා තතො අවිදූරෙ එකොසුවණ්ණපබ්බතෙ තත්ථවරිත්වා තතො ඔරුයහ රජත පබ්බතං අභිරුහිත්වා උත්තරාදිසතො ආගම්ම රජතදාමවණ්ණාය සොණ්ඩාය සෙතපදුමං ගහෙත්වා කුක්ඛිනාදං නදිත්වා කණ්ණිකවිමානං පවිසිත්වා මාතුසයනං තික්ඛත්තුං පදක්ඛිණං කත්වා දක්ඛිණපස්සං ඵාලෙත්වා කුච්ඡිං පවිඨසදිසො අහොසි එවං උත්තරාසාළහ නක්ඛ ත්තෙන පටිසන්ධිං ගණ්හි-සී,

පිබ්දුනාවූ දෙවෙනි දවස් ඒ සවප්නය රජහට දන්වූකල සුද වුන් මහ රජානෝ වෙදයෙහි දක්ෂවූ සිවිසැටක් පමණ උතුම් බමු

ඇතුන් ගෙන්වා හරිතු පාත්‍රයෙහි ලාජාදින්කෑන මඩිගල සත්කාර දැනිව මහවත් කාලපිරිබඩ ඇතිව විලඳ සුන්සාල් සිදුහතු සමන් කැකුළු ගිතෙණ යන මෙයින් කරණලද මඩුගලසත්කාර ඇති භූමියෙහි මාහැකි අසුන් පණවා බමුණන් එනි හිදුවා සපපි මධු ශර්කරාහි සංස්කෘත පැන්නුමුසු කිරිබත් පිරූ රන්රිදී තලි සිවිසැටක් එසේම රන්තලි රිදිතලි සිවිසැටකින් වඩා බමුණන්ට දන්දී පෙසුත් අගත වස්ත්‍ර කහිලවන් දෙතුන් ආදීන් දී ඔවුන් ඈතුවුකරවා බිසවුන් දුටු සඩප්නය කියා විවාලාහුය. බ්‍රාහ්මණයෝ කියන්නාහු මහ රජ්ජුරුවන් වහන්ස ! ඔබගේ දේවීන් කුස දරුගැබ්ගය පිහිටියේය. හෙද වනාහි පුරුෂගහියෙක සස්ත්‍රීගහියෙක් නොවෙයි ඔබට වූයේ පුත්රුව නෙක මහනෙම ඉදින් ගෘහවාසයෙහි විසුවහොත් සක්විති රජවෙයි ඉදින් හිණිඟන් නික්ම පැවිදිවුවහොත් ලොවුතුරා බුදුවෙතියි කීවාහුය.

කිරිමැනෝ.

පුන දිවසෙ පබුඩා දෙවී නං සුපිනං රඤ්ඤ ආරොචෙසි රාජා චතුසටහිමත්තෙ බ්‍රාහ්මණපාමොක්ඛ පකෙකාසංපෙහ්වා හරිතු පත්තාය ලාජාදිහි කත මඩගලසක්කාරාය භූමියා මහාරහානි ආසනානි පඤ්ඤපෙහ්වා තඤ්ච නිසින්නානං බ්‍රාහ්මණානං සපපිමධු සක්කරාහි යංඛතස්ස වරපායාසස්ස සුවණ්ණ රජත පාතියො පූරෙත්වා සුවණ්ණරජත පාතීහියෙව පටිකුජ්ජිත්වා අදාසී අඤ්ඤතිව අහතවඤ් කපිලගාවිදුකාදිහි නෙ සන්තපෙපසි අථ නෙසං සබ්බකාමෙහි සන්තපපිතානං සුපිනං ආරොචාපෙත්වා කිං භවිස්සතී'ති පුවජි බ්‍රාහ්මණා ආහංසු. මාවිනතයි මහාරාජ! දෙවියා තෙ කුචඡිම්හි ගබ්භොපනිඞීතො සොව ඛො පුරිසගබ්ඛො න ඉත්ථි ගබ්ඛො පුත්තො තෙ භවිස්සති සො සඛව අගාරං අජ්ඣාවසිස්සති රාජා භවිස්සති චක්කවත්තී සවෙ'අගාරාතික්ඛම්ම පබ්බජිස්සති බුම්ඩිභවිස්සති-යි,

මෙසේ බොධිසත්ත්වයන් මවුකුස පිළිසිඳගැන්ම හා සමග එකපැහැර සියලු දසදහසක් චක්වළ ඌර්ධවදිශාභාගයට යෙමින් කම්පා වූවාය පෞරාණ්‍යාදි සිව්දිගට යෙමින් කම්පාවූවාය කුලාල චක්‍රයක් සෙයින් භ්‍රමනයවූවාය වෙවුළුවාය දෙනිස්මහා පුළි නිමිත්තද පහලවිය සියලු දසදහසක් චක්වළ සියලු ප්‍රදීපයන්ගේ සියලු රත්නයන්ගේ සියලු දිව්‍ය විමානයන්ගේ සියලු තාරකාවන්ගේ සියලු චන්ද්‍ර සූර්‍යයන්ගේ ශක්‍රාදි සියලු දෙවියන්ගේ මහා බ්‍රහ්මාදි සියලු බ්‍රහ්මයන්ගේ ආලෝකයක් ඇද්ද ඒ සියල්ල හිරු උදෙසි කනමැදිරි ආලොකයක් සෙයින් මැඩපවත්වා අප්‍රමාණවූ ආලොකයෙක් ප්‍රාදුර්භූතවි.

එයින් කිහ අම්දුරෙනිදනයෙහි,

බොධිසත්තස්ස පන මාතුකුච්ඡිම්හි පටිසන්ධිගහණක්ඛණේ එකපහාරේ'නෙව සකලදසසහස්සීලෝකධාතු සංකම්පි සම්පකම්පි සම්පවෙධි චත්තිංස පුඛ්ඛ නිමිත්තානි පාතුරහේසු දසසුවක්කවාල සහසෙසු අපපමාණෝ ඔභාසෝඵරි-සී,

තුසිතපුරයෙන් චුතව මවකුස උපදින කල්හි පෘථිවි කම්පාවීම සියලු දසදහසක් චක්වල ආලෝක පැතිරීම දෙනිස්මහා පුළිහිමිති පහළවීම් ආදිය සියලු බොධිසත්වවරයන්ගේ ධම්තාවෙකි,

එයින් වදුලහ දික්ඝනිය මහාවගිය මහාප්‍රදාන සූත්‍රයෙහි-

"ධම්මතාඑසා භික්ඛවේ යදා බොධිසත්තෝ තුසිතාකායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමති අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අප්පමාණෝ උළාරෝ ඔභාසෝ පාතුභවති අතික්කම්මදෙවානං දෙවානුභාවං යා'පි තා ලොකන්තරිකා අසා අසංවුතා අන්ධකාරා අන්ධකාර තිම්සා යත්ථ'පි 'මෙවඤ්ඩිමසුරියා එවං මහිද්ධිකා එව මහානුභාවා ආභාය නානුභොන්ති තත්ථ'පි අප්පමාණෝ උළාරෝඔභාසෝ පාතුභවති අතික්කම්මෙම'ව දෙවානං දෙවානුභාවං යේ'පි තත්ථ සත්තා උපපන්නා තෙ'පිතෙනෙනා'භාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති අඤ්ඤං'පි කිර භො සන්තිසන්තා ඉධූ'පපන්නා'නි අයංව දසසහස්සීලෝකධාතු සංකම්පති සම්පකම්පති සම්පවෙධති අප්පමාණෝව උළාරෝ ඔභාසෝ ලොකෙ පාතු භවති අතික්කම්මෙම 'ව දෙවානං දෙවානුභාවං"-සී

මේ ලෙඛවශ්‍යි දක්නට කැමැත්තවුන්මෙන් අඛියෝ නෙත්‍ර ලඥුහුය, ජානියෙන්ම බිහිරි සත්වයෝ ගීතිකා ශබ්දාදී ශබ්ද ඇසුවාහුය ජානියෙන්ම කථාකරන්ට අසමර්ථ සත්වයෝ සැපසේ කථා කළාහුය. කුදුවූ සත්වයෝ සෘජුවූ ගාත්‍ර ඇතිවූවාහුය පිළිවූ සත්වයෝ පයින් ගමන්ගත්තාහුය. බන්ධනාගත සියලු සත්වයෝ අඤ්ඣබන්ධන සංඛලිකබන්ධන රජ්ජුබන්ධනාදීන් මිදුනාහුය සියලු නරකයෙහිමි ගිනි නිවිගියේය ප්‍රෙතලොකයෙහි දුකින්මඩනාලද සියලුඝතුන්ගේ ක්ෂුධාපිපාස සංසිඳුනේය. තිරිසනුන්ට භය නැතිවිය සියලු සත්වියන්ගේ රෝග සංසිඳුනේය සියලු සත්වයෝ ප්‍රියතෙපුල් කියන්ට වන්හ මිසුරුහඬින් අශ්වයෝ හෙසාරව පැවැත්වූහ හස්තීහු කුඤ්චනාද පැවැත්වූහ කිසිවක්හු විසින් නොසොල්වනලද වීණාවෙණු ආදීවූ සියලු තූර්‍යභාණ්ඩයෝ යහකිය නාද පැවැත්වූහ මනුෂ්‍යයන් විසින් නොසොල්වනලද ඔවුන් ඇඟ * පැලඳසිටි ආභරණයෝ තුමූ තුමූම ඝණකිය නාද පැවැත්වූහ සියලු දසදික් විශෙෂයෙන්

* ඇඳ. ඇතැම්

ප්‍රසන්නවිය සන්සන්දේව සැප උපදවන්නාවූ මොළොක් සිහිල්පවන් හැමූසේය නොකල් වැසිවව පොළොව පලාගෙණ ජල උද්ගතව චතුරැ නංගේය සියලු පක්ෂීහු ආකාශයෙහි ගමන්නැරියහ සියලු ගහා ජලයෝ යටියංබලා චතුරැ නොමනාස් ඇතිලිය පුරාඑ පැන් පරිද්දෙන් නිශ්චලව සිටියාහුය සියලු සමුද්‍රයෙහි ලවණ ජලය මිහිරි පැන්මය සියලු ජලතලය පස්වණක්පියුමෙන් ගැවසි ගත් තේය දියෙහි නොබෙහි පිපෙන සියලු මල් එකපැහැර පිපිනියේය සියලු වෘක්ෂයන්ගේ කඳෙහි කඳපියුම්ද අග්ගෙහි අතුපියුම්ද ලතා යෙහි ලතාපියුම්ද පිපිනියේය පොළොව පලාගෙණ මතුමත්තෙහි සතක් සතක්ව දඹකපද්මනම් සත්බුම්මහ පියුම් පිපිනියේය ආකා ශයෙහි ඔලම්බකපද්මනම් පියුම් එලවිසියේය හාත්පසින් මල්වැසි වැස්සේය, ආකාශයෙහි දිව්‍යවූ පඨාකික තූර්‍යනාද පැවැත්තේය සියලු දසදහසක්වලි වව ඉකාව ලාදමාලූ මල්පටක්මෙන්ද තර කොට හපුරුවා බදනාලද මල්මිටියක්මෙන්ද සරහා පිළියෙළ කර ණලද මල්අෂ්නක්මෙන්ද එකම්ලාවෙන් ගැවසීගත්තේය තෙවුනාවූ චල්විදුනාවෙන් දසදිගින් බැබලි සිටියේය පුෂ්පධූපගන්ධයෙන් එක සුගන්ධිවිය වෙයේ සියලු දසදහසක්වලි උතුම්වූ ශ්‍රී සෞභාග්‍යයී යෙන් අග්‍රප්‍රාප්තවී.

මෙම දක්වන්නට කිහ,

"නස්‍ස තං සිරිං දට්ඨුකාමාවිය අඬා චකඛූනි පවිලඟිංසු බධිරා සද්දං සුණිංසූ මූගා සමාලප්ංසුඛුජ්ජා උජුගත්තා අහෙසුං පඟුලා පදසා ගමනං පවිලඟිංසු බඛිනාතතා සබ්බසත්තා අඤ්ඤමඤ්ඤනාදිහි මුච්චිංසු සබ්බ නරකෙසු අග්ගිනිබ්බායි පෙත්තිවිසයෙ ඛුප්පිපාසාවූපසම්සු තිරච්ඡානානං භයංනාහොසි සබ්බසත්තානං රොගා විූපසම් සබ්බ සත්තා පියංවද අහෙසුං මධුරෙනා කාරෙන අඤ්ඤා හසිංසු වාරණා ගජ්ජිංසු සඛතුරියානි සකසකනිනාදං මුඉිංසු අසවිනානි යෙ'ව මනුසානං හත්ථූපගාදිනි ආභරණානි පිරළිංසු සබ්බදිසා විප්ප සන්නා අහෙසුං සත්තානං සුඛං උප්පාදයමානා මුදුසීතලෝ වාතෙ වායි අකාලමෙඝෝ පවස්සි පඨවිතොඋදකං උබ්භිජ්ජිත්වා විස්සන්දි පඛ්ඛිනෙ ආකාසගමනං විජහිංසු. නදියෙ අනුසන්දමානා අඩංසු මහා සමුද්දෙ මධුරං උදකං අහොසි සබ්බඵකමෙව පවවණෙණි පදු මෙහි සඤ්ඤාතමලා අහොසි ඵලජ්ජලජාදිනි සබ්බපුඵානි පුප්ඵිංසු රුකඛානං බඤ්ඤු බඤ්ඤපදුමානි සාඛාසු සාඛා පදුමානි ලතාසු ලතා පදුමානි පුපඵිංසු ඵලෙසිලාතලානි නිඤ්ඤිඛා උපරූපරිසන්ත සත්තා හුත්වා දණ්ඩකපදුමානි නාම නිඛඛිම්සු ආකාසෙ ඔලම්බක පදු මානි නාම නිබ්බත්තිංසු සමන්තතෙතා සූ වස්සා වසිංසු ආකාසෙ දිබ්බතුරියානි වජ්ජිංසු සකලදසසහස්සි ලොකධාතුං වවෙවනා

විසාඛ මාලාකුලංචිය උපපිලෙන්ඩා බඩ මාලාකල්‍යාපොචිය අලඞ්කත පටියත්තනං මාලාසනංචියච එකමාලමාලිනී විපඨුරත්‍යනාවාලවිජනී පුප්ඵඡත්‍රපගණ්ඩි පරිවාසිතා පරම සොභග්‍යාපපත්තා අහොසි–යි,

ඒ මහ බොධිසත්වයන්ගේ ප්‍රතිසන්ධිග්‍රහණයෙහි පටන් බොධි සත්වයන්ටද මෙසේ ගන්නාලද පිළිසඳඇති බොධිසත්ව මාතාවන් ටද උපද්‍රව වලකනු පිණිස සතරවරම් රජදරුවෝ සතරදිග ශ්‍රී යහන්ගබඩාවෙහි කඩුගත් අත්ඇතිව රැකවල් ගත්තාහුය, හූදක් ඒ සතරදෙන මතුනොවෙයි වැලි කවුරු රැකවල් ගත්තුදයත්? දසදහ සක් සක්වළින් එකොකි සක්වළෙක වරම්රජදරුවෝ සතර සතර දෙන බැගින් සතළිස් දහසක් වරම් රජදරුවෝ ගහ්මාර ප්‍රාසාද මාර නගරමාරයෙහි පටන් සක්වළගල දක්වා භාන්පසින් කඩුගත් අත් ඇතිව රැකවල් ගත්තාහුය. බොධිසත්ව මාතාවන්ව පුරුෂයන් කෙරෙහි රාගචිත්තයෙක් නොවුපන්නේය දෙළඳුක් ආදී කිසි පීඩා වකින් නොමිරිකි සතුටු සිහින් බොධිසත්වයන් ඇතුළකුස උන් තැ නැත්තන් විශෙෂයෙන් ප්‍රසාහාවූ ජොතිරහමාණික්‍යයක අවුහාන ලද රත්පලස්හුයක්මෙන් බොධිසත්ව මාතාවෝ දක්නාහ. යම්හෙය කින් බොධිසත්වයන් විසු මවුකුස ද කරඬුවක් හා සමානවේද එබැ වින් අන්කිසි සත්වයක්හු විසින් වසන්ටත් ප්‍රයොජන විදින්ටත් නොපිළිවන්වේද ඒ කාරණයෙන් බොධිසත්ව මාතාවෝ බොධිසත්ව යන් උපන් සත්දවසින්ම කාලඤ්‍රියාකොටතුසිතපුරයෙහි උපද නාහ යම්සේ අන්‍ය සත්හු දස මසකට නොපැමිණත් දසමසක් ඉක්ම වාන් වදදද ගිදිමින් සැතපෙමින් වදඳ බොධිසත්වමාතාවෝවූ කලි එසේනොවදන්නාහ බොධිසත්ව මාතාවෝ බොධිසත්වයන් දසමසක් මුළුල්ලෙහි කුසින් පරිහරණයකොටසිටම වදන්නාහ මේබොධිසත්ව මාතාවන්ගේ සුවභාවවූ ධර්මතාවෙකි.

එසින් කිහ අවිදූරෙනිදානයෙහි,

"එවං ගහිතපටිසන්ධිකස්ස බොධිසත්තස්ස පටියත්තෙ පඨාය බොධිසත්තස්සවෙව බොධිසත්තමාතුයාව උපද්දව නිවාරණත්ථං ඛග්ගහත්ථා චත්තාරෝ දෙවපුත්තා ආරක්ඛං ගණ්හිංසු බොධිසත්ත මාතු පුරිසෙසු රාගචිත්ත නුපපජ්ජි ලාභග්ගයසග්ගපත්තාව අහොසි සුඛිනි අකිලන්තකායා බොධිසත්තොව අත්තානාකුච්ඡිගතං විපස සනෙන මණිරතනෙ ආවුත පඬු සුත්තංචිය පස්සතුයිසති. යසමාව බොධිසත්තෙන වසිතකුච්ඡි නාම චෙතිය ගබ්භසදිසා න සක්‍යතා හොති අඤ්ඤෙන ආවසිතුං වා පරිභුඤ්ජිතුං වා තස්මා බොධිසත්ත මාතා සත්තාහජාතෙ බොධිසත්තෙ කාලංකත්වා තුසිතපුරෙ නිබ්බ

තානි යථාව අක්ඛාති ඉන්ද්‍රියෝ දසමාසෙ අපජනිංපි අභිඤ්ඤාංපි නිසින්නාංපි නිපජනාංපි විජායනති න එවං බොධිසත්ත මාතා, සාපන බොධිසත්තං දසමාසෙ කුච්ඡිනා පරිහරිත්වා ඨිතාව විජායති අයං බොධිසත්ත මාතු ධම්මතා-යි,

මෙම විස්තර වශයක් දක්වන්නට වදලිහ. දික්සහිය

මහාප්‍රදාන සූත්‍රයෙහි—

"ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තෝ මාතුකුච්ඡිං ඔක්කමති චත්තාරෝ නං දෙවපුත්තා චතුද්දිසං රක්ඛාය උපගච්ඡන්ති මා නං බොධිසත්තං වා බොධිසත්ත මාතරං වා මනුස්සෝ වා අමනුස්සෝ වා කොචි වා විහෙඨෙසී'ති අයමෙත්ථ ධම්මතා ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තෝ මාතුකුච්ඡිං ඔක්කමතෙතෝ හොති පකතියා සීලවතී බොධිසත්තමාතා හොති විරතා පාණාති පාතා විරතා අදින්නාදානා විරතා කාමෙසුමිච්ඡාචාරා විරතා මුසා වාදා විරතා සුරාමෙරය මජ්ජපමාදට්ඨානා අයමෙත්ථ ධම්මතා. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තෝ මාතුකුච්ඡිං ඔක්කමතෝ හොති න බොධිසත්ත මාතු පුරිසෙසු මානසං උපපජ්ජති කාමගුණූපසංහිතං අනතික්කමනීයාව බොධිසත්ත මාතා හොති කෙනචි පුරිසෙන රක්ඛිතා තෙනන අයමෙත්ථ ධම්මතා ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තෝ මාතුකුච්ඡිං ඔක්කමතෝ හොති ලාභිනී බොධිසත්ත මාතා හොති පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගිභූතා පරිචාරෙති අයමෙත්ථ ධම්මතා ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තෝ මාතුකුච්ඡිං ඔක්කමතෝ හොති න බොධිසත්ත මාතු කොචි දෙව ආබාධෝ උපපජ්ජති. සුඛිනී බොධිසත්ත මාතා හොති අකිලන්ත කායා බොධිසත්තංච බොධිසත්ත මානා නිරොකුච්ඡිගතං පස්සති සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං සෙය්‍යථාපි භික්ඛවෙ මණි වෙළුරියෙ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ අවෙධිං විපස්සන්නෝ සඛාකාර සම්පන්නෝ තත්‍රාසුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා ඔදාතං වා පඬුසුත්තං වා තං චක්ඛුමා පුරිසෝ හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය අයං බෝ මණි වෙළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ අවෙධිං විපස්සන්නෝ සඛාකාර සම්පන්නෝ තත්‍රාසුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා ඔදාතං වා පඬුසුත්තං වා'ති එවමෙව බෝ භික්ඛවෙ යදා බොධිසත්තෝ මාතුකුච්ඡිං ඔක්කමතෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ අවෙධිං විපස්සන්නෝ සඛාකාර සම්පන්නෝ තත්‍රාසුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා ඔදාතං වා පඬුසුත්තං වා'ති එවමෙව බෝ භික්ඛවෙ යදා බොධිසත්තෝ මාතුකුච්ඡිං ඔක්කමතෝ අහීනින්ද්‍රියං අයමෙත්ථ ධම්මතා ධම්මතා. එසා භික්ඛවෙ යත්තා බොධිසත්තෝ බොධිසත්ත මාතා කාලංකරොති තුසිතං කායං උපපජ්ජති අයමෙත්ථ ධම්මතා ධම්මතා එසා භික්ඛවෙ යථා අක්ඛාති ඉන්ද්‍රියා. නව වා දස වා මාසෙ ගබ්භං කුච්ඡිනා පරිහරිත්වා විජායනති න හෙවං බොධිසත්තං බොධිසත්ත මාතා විජායති දසෙ'ව මාසානි බොධි

සත්තෝ බොධිසත්ත මාතා කුච්ඡිනා පරිහරිත්වා විජායති අයමෙව ධම්මතා ධම්මතා එසා භික්ඛවෙ යථා අඤ්ඤා ඉත්ථිකා නිසින්නා වා නිපන්නා වා විජායන්ති න හෙවං බොධිසත්තං බොධිසත්ත මාතා විජායති ඨිතාව බොධිසත්තං බොධිසත්ත මාතා විජායති අයමෙව ධම්මතා-යි,

මහාමායා දේවිද පුරවනලද පෙල්පාත්‍රයක්සේ දසමාසයක්මුළුල් ලෙහි බොධිසත්වයන් කුසින් පරිහරණයකොට පූර්ණවූ ගර්භය ඇතිව දෙවිදහ නුවරට යනු කැමතිව සුදොවුන් මහරජාණන්ට එපවත් දන්වූකල්හි ඒ ඇසූ සුදොවුන් මහරජාහෝ යශෝධරාදේවි සතුටුව කපිලවස්තු පුරයෙහි පටන් දෙවිදහනුවර දක්වා මාර්ගය සමකරවා පූර්ණඝට ධජපතාකාදීන් අලංකෘතකොට සරහා දේවීන් රන්සිවි ගෙයක හිඳුවා අමාත්‍යයන් දහසක් හා සමග මහත් පිරිවරින් දෙව දහනුවරට නමන්කළාහුය. දෙවිදහනුවරට අතුරෙහි සපු හෝ පඵ්නා ඌඹ කීණ දඹ මිදෙල් සදුන් ආදිවූ වෘක්ෂලතාවෙන් සැදුම්ලද් දැවූ ලුම්බිනී නමිවූ මහුල් සල්ලැයනෙක් ඇත එසමයෙහි මූලඵලවත් අතදක්වා සුපුෂ්පිතවූ නිලාදී පඤ්චවර්ණ භෘඞ්ගයන් විසින් අතුපත් මල් අතුරු ආදියෙහි ස්කන්ධාරණය කරන්නාවූ නොයෙක් මත් මොණර කොවුලු කෙවිලි ආදිවූ සිසගණන් පක්ෂිසමූහයා විසින් රැව් පිළිරැව් දෙනලද්දවූ දෙවලොවින් බිලිගි බිමවැටීහිය දිවැලයනක් වැනිවූ මහානුභාව සම්පන්න රජ්ජුරුකෙනෙකුන්ට මහාකොට පිළියෙල කරණලද ආපානමණ්ඩලයන් වැනිවූ ඒ උයනදුටු මහාමායා දේවීනාමෝ සල්වෙනෙහි උද්‍යානභූමි කරණුකැමතිවූය අමාත්‍යයෝ අභිප්‍රායානුකූලවූලෙසටම මහුල්උයනට දේවීන්වඩාඑන්න. මහාමායා දෙවී සුපිෂ්පිත සල්රුකක් මූලට ගොස් අත්තක් අල්වනු කැමතිවූය එකෙණෙහි ඉවූ වේගඅඛඩක් සෙයින් ශාඛාව නැමී දේවියගේ හස්තයට උපනත්විය. ඒ ශාඛාබාහුව දකුණතින් ගෙණ නැගෙණ හිරිසාව බලා සිටියදීම බොධිසත්වයෝ ප්‍රසූතවූහ. යම්සේ අන්‍ය සත්වයෝ මවුකුසින් ප්‍රසූත වන්නාහු පිළිඅුල්වූ ලලමූත්‍රාදීන් ගැවසී ගත් ශරීර ඇතුව ප්‍රසූත වෙද්ද මහබෝසතාණෝ එසේ ප්‍රසූත නොවූහ. මහබෝසතාණෝවූකලී ධර්මාසනයකින් බිහිනා මහා ධර්මකථික කෙනකුන්වෙන් දික්කරණලද හස්තාපාදයන් ඇතිව කිසිවක්හු සෙයක්හි නඹනලද ජාතිරඞ්ගමණිකායයක්මෙන් පිරිසිදුවූශරීර ඇතිව ප්‍රසූතවූහ බුදුවන ජාතියෙහි මවුකුසින් ප්‍රසූතවනා සියලුම බොධිසත්වරයන්ගේ මේ ධර්මතාවෙහි, මේද විස්තාරවශයෙන්

වදුලඟ දික්සඟිය මහාසූදන සූත්‍රයෙහි-

"ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තා මාතුකුච්ඡිස්ස

නිකඛමනි දෙවා පඨමං පවිගණ්හන්ති පච්ඡාමිනුස්සා අයමෙව ධම්මතා ධම්මතා එසාභික්ඛවෙ යදු බොධිසත්තා මාතුකුච්ඡිසමා නිකඛමති අපපමත්තාවා බොධිසත්තොහු පඨවිං හොති වත්තාරෝ නං දෙවපුත්තා පරිගණ්හෙත්වා මාතුපුරතො ඨපෙන්ති අත්තාසිනාදෙවී හොති මහසත්තෙඛා තෙ පුත්තෙතා උපපරිනහා'නි අයමෙව ධම්මතා ධම්මතා එසා භික්ඛවෙ යදු බොධිසත්තා මාතුකුච්ඡිසමා නිකඛමති විසදෙවනි ඛඛමනි අමක්ඛිතො උදෙදන අමක්ඛිතා සෙම්හෙන අමක්ඛිතා රුහිරෙන අමක්ඛිතා කොනව් අසුචිනා සුඛා දසදෙ සෙය්‍යථාපි භික්ඛවෙ මණිරතනං කාසිකෙ වත්ථෙ නික්ඛිත්තං නෙ'ව මණිරතනං කාසිකං වත්ථං මක්ඛෙති නපි කාසිකං වත්ථං මණිරතනං මක්ඛෙති තං කිස්සහෙතු උභිනනං සුඛත්තා එව'මෙව ඛො භික්ඛවෙ යදු බොධිසත්තෙතා මාතුකුච්ඡිසමා නිකඛමති විසදෙව නිකඛමති අමක්ඛිතා උදෙදන අමක්ඛිතා සෙම්හෙන අමක්ඛිතා රුහිරෙන අමක්ඛිතා කෙනව් අසුචිනා සුඛා විසදෙ අයමෙව ධම්මතා'-යි.

ඉක්බිත්තෙන් ප්‍රගිණ්හ කාමරාගයන් ඇති සුඛාවාසබ්‍රහ්මලොක යෙහි වසන්නාවූ මහා බ්‍රහ්මරාජයෝ සතරදෙනෙක් රන්දැලින් බොධිසත්වයන් පිළිගෙණ මායාදේවීන් ඉදිරියෙහි තබා දෙවිති! සතුටුසිත් ඇතිවම මහානුභාවසම්පන්න පුත්‍රකෙනකුන් නොපව උපන්නේවෙදැයි කිවාහුය ඒ මහාබ්‍රහ්මරාජයන් අතින් වරම්රජ දරුවෝ උතුම්වූ සුවපහස් ඇති අදුන් දිවිසම්හි පිළිගත්තාහුය. ඒ වරම්රජදරුවන් අතින් අමාත්‍යයෝ දුහු ඳ සුඹුලකින් පිළිගත්තාහුය මේද හැම බෝධිසත්වවරයන්ගේ ධම්මතාවෙකි, මෙද නිර්දිෂ්ට පෙළින් හැඟේ, ඉක්බිත්තෙන් බොධිසත්වයෝ ඔවුන් අතින් බැඹ සම පත්ලෙන් භූමියෙහි පිනිවා නැඟෙණහිරදිග බලමින් සිටියහ එකෙණෙහි පිරිසිදුවූ ශරීරඵැති මහබොධිසත්වයන්ට හා මහමායා දේවීන් වද සත්කාර පිණිස ආකාසයෙන් ස්ඵටිකමාණික්‍යවන් ජලධාරා වෝ දෙදෙනෙක් අවුත් දෙදෙනාගේ ශරීරයෙහි උතුරුගඟණය කිරීමෙන් යතුටු කළහ, මේද හැම බෝධතුන්ගේ ධම්මතාවෙකි,

එසින් වදුලහ.

ධම්මතා එසා භික්ඛවෙ යදු බොධිසත්තෙතා මාතුකුච්ඡිසමා නිකඛමති මෙ උදකධාරා * අනතලික්ඛා පාතුභවන්ති එකා සීතස්ස එකා උණ්හස්ස යෙන බොධිසත්තස්ස උදකකිච්චං කරොන්ති මාතුච්ච අයමෙව ධම්මතා-යි,

මෙපමණක් මතුනොවෙයි දෙයිස් මහා පුවී නිමිත්තද පහළ වෙමින් සිටියදී සුප්‍රතිෂ්ඨිත පාදතලයෙන් ධරණීතලය පවිත්‍ර කළ සේක, එම විස්තර වශයෙන් දක්වන්නට කිහ;

---

* උදකසඬධාරා— ඇතැම්

මහාබෝධිවංශයෙහි-

එකපහාරෙනෙව දසසහස්සීලෝකධාතූසු කම්පමානාසු අනි
කාරනිරන්තරෙසුපි ලොකන්තරෙසු උළාරවිපුලොභාසසු ඵර
නෙසු සකලදසදිසාසු විපසන්නාසු රජනීකරසුරියතාරාගණේසු
අතිරෙකතරංවිරොචමනෙසු නභොභුම්ගතරුක්ඛනෙසු පරිපුලනෙසු
සුගන්ධමුදුසීතලමාරුතෙසු වායමනෙසු ථාතුඤ්ඵගත ජලධරමාලාසු
වස්සමානාසු මෙඝවනී සලිලවාහිනීසු අසඤ්ඤමානාසු සන්තකලෙලාල
ජලනිධිසු මධුරසලිලකලිලෙසු විමදසගතාසු නාවාසු සදසං සීඝ
මාගච්ඡන්තීසු කාමකොලූකසු සඛචරන්‍යෙසු සොණ්ඩරිඝණසු සඛ
කීළනෙසු අනෙකසු තවතවරසොපතං සලිලං පඛුලනවවංපස්ස
මානසු බධිරසු යත්තසරෝ'පතං සගාමරාගංමූඝගීතිකං සුණමා
නෙසු සකලනිඝ්ඛිතාපාය දහනනරකමණ්ඩලෙසු මධුරජලකමල
සඛමඤ්ඤනසු පෙතසු දිබ්බාජ්ජනිලං උගඝරන්නසු සඛුණසු
ගගන තලගමනං පහාය අවනිතල'මාවරන්නසු සත්තසු විනතභය
රොනසිසිරපරිලාහෙසු ඡිනනාස සකලසංඛලිකාසු හිඛුවනභවන
චාරකවාටෙසු සයං'යෙවච්චවෙසු අසෙසජනතුසු පියංවදනෙසු
තුරගෙසු මධුරහසාරවං කරාහනෙසු කුඤ්ජරෙසු අභිගජ්ජනෙ
සු කෙසරිසු අභිනදනෙසු අවාදිතතුරියෙසු සකසකනිග්ගාදං
මුඛනෙසු අසචිත්තසරිරාහරණෙසු මධුරරවංවිරවනෙසු දෙව
නාසු දිබ්බසංගීතං කුරුමානාසු සුඵුල්ලසු තරුලතාගුම්බෙසු ජලථල
සිලාතලානිභිඤ්ඡිත්වා උපරුපරිසත්තසත්ත භූමිසු විවිත්තපවවණණ
පදුමෙසු නික්ඛමන්නසු අංඛාමුඛකමලෙසු පදුමවිතානනසු පවන
පථෙ විතතෙසු සමන්තතො දිබ්බපුප්ඵසු වස්සමානෙසු ආකාසෙ
දිඛ්ඛතුරියෙසු වජ්ජමානෙසු සකලලොකහදයානන්දකාරී සුපපතිඨිත
පාදතලෙහි ධඤ්ඤතරං ධරණිතලමකාසි,-යි.

මෙහි එකපැහැර දශසහස්‍රී ලොකධාතු කම්පිතවනු සම්භූතා
ඥන ප්‍රතිලාභයට පූර්වනිමිත්තය ලොකන්තර නරකෘයෙහි අන්ධකාර
විධ්වංසනවනු අවිද්‍යාන්ධකාර විධමනුවවපූර්වනිමිත්තය, සියලු දශ
''අධිගතෝ බෝ ම්‍යායං ධම්මෝ පඨවිසඤ්ඤාරක උදකකඛඤ්ඤා විය හම්පිරෝ, පබ්බතෙන පටිච්ඡාදෙත්වා ඨපිතා විය දුද්දසා, දුද්දසත්තායෙව දුරන්ගමත්තා, නිබ්බූතසබ්බපරිළාහත්තා සන්තා, සාධුරසහොජනම්ව අභිත්තිකරණෙන පණීතා, න තක්කෙන අවචරිතබ්බත්තා අත්තසංවෙදෙරා, සතධා හිනනාසස වාලසස කොටි විය අණු,* බාලානං අවිසයත්තා පණ්ඩිතවෙදනියෝ, මයා ගි ඉමං ධම්මං පටිවිජ්ඣිතුං වායමනෙන්න ආගතානනානං යාචකානං අලඤ්ඣකතපටිඤ්ඤා සිසං කඤ්ඤිත්වා ගලලොහිතං නීහරිත්වා සුඅජ්ජානි අකඛිහි උපාහනිත්වා කුලවංසපදිපකා පුත්තා මනා පවාරිණිං හරියං දෙනෙන්න මයා අදිනනං දනං නාම නත්ථි. සබ්බපාලාදිසු අත්තනාවෙසු ජීවිතපරිච්චාගං හිණලවම්ව කරොනෙන්න සිලවිනිකකමං පඨවිමුබ්බහනනාම්ව මඤ්ඤමානෙන අරකඛිතං සීලං නාම නත්ථි, චූළසුතසොමාදිසු අත්තභාවෙසු මනුසඤ්ඤං විහුනිං පරිවජ්ජනෙන ඛන්තිවාදිපභුතිසු අත්තභාවෙසු ජෙජ්ජිගෙය්‍යාදිනි පාපුණනෙන්න අපූරිතා කාචි පාරමී නාම නත්ථි, තසස මෙ වායමසඞ්ඛයා මාරබලං විධමෙන්නසසාපි පඨවි නකම්පිත්ථ, පඨමයාමෙ පුබ්බනිවාසං අනුසසරණසසාපි මක්ඛිමයාමෙ දිබ්බචක්ඛුං විසොධෙන්නසසාපි න කම්පිත්ථ, පච්ඡිමයාමෙ පන පටිචචසමුප්පාදං පටිවිජ්ඣන්නසෙව මෙ දසසහසසී ලොකධාතු අයදණ්ඩක ආකොටිතකංසතාලං විය විරාවසතං විරාවසහසසං මුච්මානා වාතාහතෙ පදුමිණිපණ්ණෙ උදකබින්දු විය පකම්පිත්ථ, ඉති මාදිසසාපි නිකඛිත්තුණෙන කිවෙජ්ජනොවායං ධම්මෝ පටිවිඣබ්ධ, තං ඉමෙ ලොකියමහාජනා කිඤ්චාපුණ්ණලාබු විය තක්කහරිත වාරි විය වසාතෙලෙහි පරිපිතපිලාපිකා විය අජ්ජතනකඛන්ත හවෙව විය ච කිලෙසහරිතා අතිසංකිලිට්ඨා රාගරත්තා දොසදුට්ඨා මොහමුළහා අවිජ්ජාරාසිනා අජ්ඣොත්ථටා, නෙ සක්‍යනාම පටිවිජ්ඣිසසන්ති කො අජ්ජ දෙසිතෙනා'ති සත්ථාරං සසානෙහා''සි—යනාදින් මහාබොධිවංශයෙහි ආ ක්‍රමයෙන්ද ධම්මදේශනා කිරීමෙහි මහෙත්සාහවවට පැමිණියේක.

කෙසේදයත්? මාවිසින් පැමිණෙනලද මේ නිවීණධම්මයතෙම පොලොව දරාසිටි උදකසකඛියක් සෙයින් අතිගම්භීරවන්නේද, පථවී

* නිපුමණා.

තයකින් වහා තුබූ දෙයක්සෙයින් කිසිතකණෙකුන්විසින් නොදක්
නහැක්කේය, නොදක්නහැකිබැවින්ම අවබොධය කොට ගත
නොහැක්කේය, නිවියවූ සියලුකෙලෙසපරිදහ ඇතිබැවින් ශාන්ත
වන්නේය, මධුරරසඇතිභොජනයක් සෙයින් භාග්‍යසම්පන්නයකට නො
පැමිණෙන කාරණයෙන් ප්‍රණීතය, ආයුෂ්ඥානයෙන් මිස සෙ
සන්ගේ කල්පතායෙන් තකිණිය කොට ගතනොහැකිබැවින්
අතක්කිවිවරය, සියක්වර පලහලද අග්‍රලාම්අනක්ඛමන් ඉනාවූ
සැමබැවින් නිපුණය, ධාතීයතහ ප්‍රත්‍යයාකාර කාරණාකාරණ
සඛ්‍යාත චතුර්විධඤාණලක්ෂණයෙන් යුක්ත පණ්ඩිතජනයන්විසින්
දැනගතයුතුබැවින් පණ්ඩිතවෙදනීය වන්නේය, එසේවූ මේ ධම්
ය ප්‍රතිවෙධකරණපිණිස උත්සාහකරන්නාවූ මාවිසින් වනාහි
පැමිණිපැමිණි යාචකයන්ට මිණිඔටුහුආදීන් සරහා පිළියෙලක
රණලදුවූ ඉස්කපා දන්දීමෙන්ද ගලලොහිතය දීමෙන්ද මනා
කොට අදුන්නා සරහනලද ඇස්උපුටාදීමෙන්ද කුලවංශයට ප්‍රදි
පයක්වැනිවූ පුත්‍රයන්හා මෙනවඩවන්නාවූ භායස්ත්‍රීන් දන්දීමෙන්ද
නුදුන්නාවූ දනයෙක්නම් නැත්තේය, සංඛපාලජාතකාදිවූ ආත්ම
භාවවල්හි ජීවිතපරිත්‍යාගය නාණලවයක්මෙන් කරන්නාවූද ශිල
ව්‍යතික්‍රමය පොළව පෙරලිමක්මෙන් සිතන්නාවූද මාවිසින් නො
රක්නාලද ශිලයෙක්නම් නැත්තේය, චූලසුතසෝමදිවූ ආත්මභා
වවල්හි මනොඥවූ සම්පත්තිය පරිත්‍යාගකරන්නාවූ මාවිසින්ද
ක්ෂාන්තිවාදදි ආත්මභාවවල්හි ඡේද්‍යභෙද්‍යාදියට පැමිණෙන්නාවූ
මාවිසින්ද නුපුරණලද කිසිපාරමිතාවෙක්නම් නැත්තේය, මෙබ
දුවූ මා සවස්වේලෙහි මාරභයනාව විධ්වංසන්ය කරන්නාහවත්මහි
කම්පාව නොකෙළේය, ප්‍රථමයාමයෙහි පූර්වේනිවාසානුස්සතිඥා
නය සමධිගමය කරන්නාහටද මධ්‍යමයාමයෙහි දිව්‍යංචක්ෂුර්ගතිඥා
නය උපදවන්නාහටද පශ්චිමයාම
යෙහි වනාහි විදර්ශනාඛ්‍යප්‍රතිපත්‍යසම්මසනඥානය අනුලෝමප්‍රතිලෝම වශ
යෙන් ප්‍රතිවෙධය කරන්නාවූ මවම දසදහසක්සක්වළ යදණ්ඩ
කින් ප්‍රහාරලන් ලොහොතලියක්සෙයින් සියදහස්ගණන් ධ්වනි
පවත්වමින් පවනින් පහරණලද පියුම්පතෙක්හි ජලබිඳුවක්
මෙන් කම්පා කලාය.

මෙසේ මෙබදුවූ නීසණ ප්‍රඥාඇත්තාවූ මාවිසිනුදු මේ ධම්ය
දුකසේ ප්‍රතිවෙධය කරණලද මේ ලෞකිකමහජනයෝ කාඛ්‍යයකි
කියනලද කලකැඳින් පුරණලද ලබුඵලයක්සෙයින්ද නක්‍රයයකි
කියනලද මෝරුපිරුණු සැලක්මෙන්ද වඩාතෙල්යකි කියනලද
ඔස්තෙලින් රඳනාලද රෙදිකඩක්මෙන්ද අදුන්වීකිසිය හැත

යක්මෙන්ද සොළඟයෙන් හරිතයහ, ඉතා සංක්ලිෂ්ටයහ රාගයෙන් රක්තයහ ද්වේෂයෙන් දුෂ්ටයහ චතුස්සත්‍යාදීන් නොදක්නා අවිද්‍යාරාගයින් මැඩ මිරිකාපියනලදහ, එසේවූ සත්වයෝ මෙසේවූ ගැඹුරු ධර්මය කෙසේනම් ප්‍රතිවේධකරේද්ද එසේවූකල ධර්මදේශනාව කිරීමෙන් ප්‍රයෝජනකවරේදැයි ධර්මදේශනාවට උපන්නාවූ මහේශාඛ්‍ය ඇතිසේක් ඒ පරිවිතර්කය දුටු සඟපිත්මහාබ්‍රහ්මයාවිසින්:—

"නස්සන්ති වත භෝ ලොකෝ විනස්සති වත භෝ ලොකෝ යත්‍ර හි නාම යථාභූතස්ස අරහතෝ සම්මාසම්බුද්ධස්ස අපායසුග්ගතාය විත්තං නමති නෝ ධම්මදේසනාය"-යි.

යනුවෙන් දසසහස්‍රලෝකධාතුව එකනින් නාදකෙළෙමින් මහත්සවිරයක් විහිද මහාබ්‍රහ්මරාජතෙම දසදහසක් සක්වළ සපිරිවරවූ දසදහසක් මහාබ්‍රහ්මයන්හා එසෙසින්ම සපිරිවරවූ දසදහසක් පරනිර්මිත දිව්‍යරාජයන් හා දසදහසක් සුනිර්මිත දිව්‍යරාජයන් හා දසදහසක් තුෂිතදිව්‍යරාජයන් හා දසදහසක් සුයාමදිව්‍ය රාජයින් හා දසදහසක් ශක්‍රදිව්‍යරාජයින්හා සතළිස් දහසක් වරම් රජදරුවන් හා සමඟ:—

"සෙය්‍යථාපිනාම බලවා පුරිසෝ සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමේවං බ්‍රහ්මලෝකා අන්තරහිතා භගවතෝ පුරතෝ පාතුරහොසි"-යි.

දක්වනලද ක්‍රමයෙන් බුදුන්ගේ අභිමුඛයව ප්‍රාදුර්භූතව උතුරු සළුව එකාංශකොට දකුණු දනමඬල බිම හැන්න දෙහොත් මුදුනෙහි තබා:—

"දෙසෙතු භන්තෙ භගවා ධම්මං දෙසෙතු සුගතෝ ධම්මං සන්තීධ සත්තා අපරජක්ඛජාතිකා අස්සවණතා ධම්මස්ස පරිහායන්ති භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරෝ-යි.

යනුවෙන් ධර්මදේශනාවට යාචඤ්ඤකළේය. පුරාපුර මුනිමනුජ වන්දනීයවූ සම්ඵඤ්ඤවහන්සේත් බුඩවඤ්ඤසින් ලොවබලා වදුරා බ්‍රහ්මාරාධනාව පිළිගෙණ මම කවරක්හට ධර්මදේශනා කෙරෙම්ද කවරෙක් නම් මාගේ ධර්මය වහා පිළිගන්නට සමර්ථවේදෝහෝයි බලා ආළාරකාලාමයන් හා උද්දකාරාමපුත්‍රයන් කළුරියකළ නියාව දැන කප්ලක්ෂයක් මුළුල්ලෙහි අග්‍ර දහම් පිළිගන්ට කරණලද ප්‍රාර්ථනාඥානී අඤ්ඤාකොණ්ඩඤ්ඤාදී පස්වග මහණුන්වහන්සේ දැක කසි පුරයට වඩනාසේක් අතරමගදී උපකානම් ආජීවකයන්හට වනාවැඩ ඤක භූමියෙන් වැඩ ඔහුව සුදුසු අනුකම්පාකොට දිව්‍ය මනුෂ්‍යයන් හා අතරමග දුටු මෘගපක්ෂීන් ද තුටුවූකරවමින් අවලෝකයොදුන් ලීඝ

ගෙවා බ්‍රහ්මයෙ ඉසිපතනාරාමයට වැඩියේක. ප්‍රතීත්‍යසමුත්පාද ධර්ම සාගර වීලෝලිත ඥානමෙරුමත්වූ සර්ව්ඥ රාජෝත්තමයානන්වහන්සේ වඩනා බැව් දුටු පස්වග මහණුන්නාන්සේ ශ්‍රමණභවත් ගෞතමයෝ දුෂ්කරාභ්‍යාසා හැර තමන් රජකුලෙහි උපන්හෙයින් සුඛිත යන විසින් දෙනලද රසමසුලෙන් සුසංස්කෘත මධුරාහාරය අනුභව කොට ශරීරවර්ණ ලදින් රන්කඳක්සේ දිලිහි දිලිහි බුදුව ගත නොහි අපකරා දැන් එහි, රජකුලෙහි උපන්හෙයින් හිඳිනා අසුන් පමණක් දෙනබවමුත් වඳනාමනාදියක් නොකරම්හයි කව්කා කලහ, ඝනරාමරලොකයාගේ සාකල්‍යාඛ්‍යාඝය දක්නා ඥානනැමැති කැටපතින් ප්‍රභාමිදරුවානෝ ඒ නිස්සූත්වහන්සේගේ අඛ්‍යාඝය දක සියලු සත්ත්වයන් කෙරෙහි පතලාවූ මහාකරුණාව ඒ පස්වග මහණුන් වහන්සේ කෙරෙහිද පවත්වා වදාළසේක. එකල් ඕලුවතුරෙන් ගුප්ලෙන පරඩලාපත්සේ හුනස්නේ හිඳගතනොහි පස්වගමහණුන් වහන්සේ නැගි බුදුන්ගේ ශ්‍රීපාදමූලයෙහි වැද පෙරළි පාසිවුරු අතින්ගෙණ සියලු ආගන්තුකවත් සපයා බුදුවූ බැව් නොදැන සම සමයන්සේ ආවුසොවාදයෙන් කථාකෙරෙමින් සිටිකල්හි "මාභික්ඛවෙ තථාගතං නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරථ අරහං භික්ඛවෙ තථාගතො සම්මාසම්බුද්ධො"–යි.

යනුවෙන් තමන්වහන්සේ සම්බුදුවූ පරිදි හඟවා ඇසළමසපුණු පොහොයදිනයෙහි උත්සළතැනකින් මහා ප්‍රාඃවල්යෙහි කියනලද ක්‍රමයෙන් දෙහිස්මහා ප්‍රතිනිමිත්ත ප්‍රාදුර්භූතවෙමින් සිටියදී හැම බුදුන්දම්සක්පැවතුම්සූත්‍රදේශනාවට වැඩහුන් ස්ථානයෙහිම ප්‍රඥප්තා වරබුද්ධාසනයෙහි යුගදරුමුදුනෙහි දසදිග අදුරු විදහා දිලිහෙන ලක්ෂ්මඬලක්සේ නිලපීතලෝහිතාවදාත මාංජිෂ්ඨප්‍රභාශ්වර්ය යන ෂට්වර්ණඝණබුද්ධරශ්මිමාලායෙන් සියලු ලොව එකෙලි කෙරෙමින් වැඩසිද තමන්වහන්සේගේ පාරමිතා නැමැති ජලයෙන් සම්පූර්ණවූ බුද්ධඥාන නමැති අසිසිරකාන්තියෙන් ප්‍රබෝධවූ අනිරුද්ධතවූ ජීවිතාධාතු නැමැති කඤ්චුකාඃනි දන්තධාතු නමැති කෙසුරාඃනි සුරක්ෂාවූ දන්තාවරණ නමැති පතුඃනි දෙශනාධර්ම නමැති මධුබිංදුඃයන් ශ්‍රවණජන නමැති භාඬඟයන් පිණවන පිණිස:—

"වෙමෙ භික්ඛවෙ අනනා සඛඛජිනෙන න සෙවිතබ්බා"

යනාදින් දම්සක්පැවතුම් සූත්‍රදේශනාවට පටන්ගත්සේක, මේ ධර්මචක්‍රය පැවැත්වීමනම් ලොකයෙහි රජපැමිණි සියලු රජදරුවන් විසින්ම දුරියයුතු මුක්තාහාරයක් සෙයින් සවිනේ ගෙවා දත් සියලු සර්ව්ඥවරයන්ගේම ධර්මාවෙනි.

ඒ එසේමය, සර්ව්ඥයන්වහන්සේ ලොකයෙහි ප්‍රාදුර්භූතවූ කල්හි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම්යෝ සතරඅදහසක් ප්‍රාදුර්භූතවෙන්, එකිනෙක් වදුළහ:—

"තථාගතස්ස භික්ඛවෙ අරහතෝ සම්මාසම්බුද්ධස්ස පාතුභාවා චත්තාරෝ අච්ඡරියා අබ්භුතා ධම්මා පාතුභවන්ති, කතමෙ චත්තාරෝ? ආලයරාමා ඛෝ භික්ඛවෙ පජා ආලය රතා ආලය සම්මුදිතා, සා තථාගතෙන අනාලයෙ ධම්මෙ දෙසියමානෙ සුස්සූසති සොතං ඔදහති අඤ්ඤුවිත්තං උපඨපෙති, තථාගතස්ස භික්ඛවෙ අරහතෝ සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං පඨමෝ අච්ඡරියෝ අබ්භුතා ධම්මෝ පාතුභවති, මානාරාමා භික්ඛවෙ පජා මානරතා මානසම්මුදිතා, සා තථාගතෙන මානවිනයෙ ධම්මෙ දෙසියමානෙ සුස්සූසති සොතං ඔදහති අඤ්ඤුවිත්තං උපඨපෙති තථාගතස්ස භික්ඛවෙ අරහතෝ සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං දුතියෝ අච්ඡරියෝ අබ්භුතා ධම්මා පාතුභවති, අනුපසමාරාමා භික්ඛවෙ පජා අනුපසමරතා අනුපසමසම්මුදිතා, සා තථාගතෙන ඔපපාතිකෙන ධම්මෙ දෙසියමානෙ සුස්සූසති සොතං ඔදහති අඤ්ඤුවිත්තං උපඨපෙති, තථාගතස්ස භික්ඛවෙ අරහතෝ සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං තතියෝ අච්ඡරියෝ අබ්භුතා ධම්මා පාතුභවති, අවිජ්ජාගතා භික්ඛවෙ පජා අබ්භුතා පරියොනද්ධා; සා තථාගතෙන අවිජ්ජාවිනයෙ ධම්මෙ දෙසියමානෙ සුස්සූසති සොතං ඔදහති අඤ්ඤුවිත්තං උපඨපෙති, තථාගතස්ස භික්ඛවෙ අරහතෝ සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං චතුත්ථෝ අච්ඡරියෝ අබ්භුතෝ ධම්මෝ පාතුභවති; තථාගතස්ස භික්ඛවෙ අරහතෝ සම්මාසම්බුද්ධස්ස පාතුභාවා ඉමෙ චත්තාරෝ අච්ඡරියා අබ්භුතා ධම්මා පාතුභවන්ති"යි.

මාගේ ධර්ම්ප්‍රතිරණය සාරාර්ථසඞ්ග්‍රහයෙහුත් ත්‍රිපිටකයෙහුත් ප්‍රගුණකොට වූ පරිද්දෙන් චතුරාර්ය්‍යසත්‍යාදි සාරාර්ථයන් ගෙණ මේ බුද්ධබඳෙහි සඞ්ග්‍රහ කෙරෙම්හි කියා කළ ප්‍රතිඥාව මුදුන පිණිසත් 'බොධෙතා පජායානි බුඩෙ" යන පදයටම යොග්‍යවූගහයිහුත් මෙ තැන්හි සිටු නියඟින් ගෙණහැර දක්වන මහාපෘථිවිය පස් සේ එක දෙශයකින් දම්සක්පැවතුම් සූත්‍රයෙහි අෂ්ට ගෙණහැර දක්වම්, ඒ මාර්ගයින් ප්‍රකාශකරන්නාවූ ධර්ම්චක්‍රයෙහි අෂ්ට සින්හි ලා මනාකොට දැසියයුතු.

වෙමෙ භික්ඛවෙ යන තන්හි සප්තධර්ම් කෙණෙහුත් හිනා කාලගෙයින් භික්ෂූනම් වේ.

ඒකියන් වදුලහ,

"සත්තහාහං භික්ඛවෙ ධම්මෙහි හීනාහාතා භික්ඛු හොති, කතමෙසං සත්තන්නං? සක්කායදිට්ඨි හීනා හොති විචිකිච්ඡා හීනා හොති සීලබ්බතපරාමාසෝ හීනෝ හොති රාගෝ හීනෝ හොති දොසෝ හීනෝ හොති මොහෝ හීනෝ හොති මානෝ හීනෝ හොති, ඉමෙසං ඛෝ භික්ඛවෙ සත්තන්නං ධම්මානං හීනා භික්ඛු හොති"යි.

සාමාන්‍යයෙන් සඟරෙහි භය දක්නා අර්ථය ගෙණ "සංඝාරෙ භයං ඉක්ඛතීති භික්ඛූ"යි කියා විගුබ්මාගීයෙහි කිහු-ඡින්නාභින්නා පව දරණහෙයින් භික්ෂුයයිකියා අභිධම්අටුවාවෙහිකිහු-"භික්ඛවෙ" යනු "ලතො වොකාරොච" යන කාත්‍යායන සූත්‍රයෙහි වග්‍රහණ යෙන් හෝ "පුමාලපනෙ වෙවො" යන මොද්ගල්‍යායන සූත්‍රයෙන් හෝ "වෙ" යනු ආදෙශවූ ආමන්ත්‍රණයෙහි ප්‍රථමායි. නොයෙක් දිව්‍ය බ්‍රහ්මයන් විද්‍යමානවූව කවර හේතුවකින් භික්ෂූන්ම ආමන්ත්‍රණය කළසේක්දයත්?—ඔවුන් ජ්‍යෙෂ්ඨහෙයිනුත් ශ්‍රෙෂ්ඨහෙයිනුත් සදාසනනිහිතහෙයිනුත් ආමන්ත්‍රණය කළෝ.

ඔහු ප්‍රථමොත්පන්නවා බැවින් ජ්‍යෙෂ්ඨයහ, සකල ශාසනප්‍රතිග්‍රාහක වන බැවින් ශ්‍රෙෂ්ඨයහ, තථාගත සම්පවත්තී වන බැවින් සදාසනනිහිතයහ. ඒ හෙතුවෙන් "භික්ඛවෙ"යි කරුණාවිස්තාර සෞම්‍යහෘදය සන්නිපාතවූ ප්‍රසිද්ධගම වචනයෙන් සඟුන්ගේම ආමන්ත්‍රණය කළෝයයි කියා බොධිවංශ ග්‍රන්ථිපද විවරණයෙහි කිහු.

මෙසේ පවත්වන්ද ආරම්භකළ ධම්මචක්‍රය ශ්‍රද්ධාවත් කුලපුත්‍රයන්ට දර්ශනීයවූ චතුර්විධ කාරණයන් අතුරෙන් එක්කාරණයෙකි.

එසින් වදලහ මහාපරිනිබ්බාණ සූත්‍රයෙහි ආනන්දස්ථවිරයන්ට,

"චත්තාරිමානි ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි සංවෙජනීයානි ඨානානි, කතමානි චත්තාරි? ඉධ තථාගතො ජාතොනි ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං, ඉධ තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොනි ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං, ඉධ තථාගතෙන අනුත්තරං ධම්මචක්කං පවත්තිතන්නි ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං, ඉධ තථාගතො අනුපාදිසෙසාය නිබ්බාණධාතුයා පරිනිබ්බුතොනි ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං, ඉමානි ඛො ආනන්ද චත්තාරි සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි සංවෙජනීයානි ඨානානි"යි.

මෙසේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළාවූ සම්බුදුහුතම භික්ෂුවෙ මහණෙනි; නිහතා, ලාමකවූ (මහවත් නිවණට මෙහෙයනලද සිත් නැත්තාවූ සඟරෙහි කරණලද ඇලුම් ඇත්තාවූ නිවයන්වම සුදුසු හෙයින් නිවවූ) ගෘහ්‍යා, ග්‍රාම්‍යවූ (මහවත් පඤ්චස්කන්ධයකින් ලැබෙන ඇලිකිය යුදුරකු හෙයින් නිවන්සැපයෙහි ආලයහැර පඤ්චකාමයෙහිම ආලයකළ ගිහිගෙයි වැසෙන්ගේම ස්වභාවධර්මයවූ); පෘථග්ජනිකා, අන්ධබාලප්‍රාග්ජනයන්! විසින් පුරුදුකරණලද (මහවත් දුගීඛාශුවි ප්‍රතිමාංශාදිය හෙවුනා නිලමක්ෂිකාදීන් හෙයින් පවකාමයෙහි ලොභීවූ මොහෝයන් මුළාවූ බාලප්‍රාග්ජනයන් විසින් භාවනය කරණලද්දාවූ);

අනරියෝ, අනාර්‍යවූ (හෙවත් බුද්ධප්‍රත්‍යේකබුද්ධ අග්‍රශ්‍රාවක මහාශ්‍රාවකාදි ආර්‍යයන් විසින් ආගිවිඅයක්සේ උච්චාරප්‍රස්‍රාවයන්සේ නිදැකොට හරණලද බැවින්ද අඥානජනයන් විසින් රූපයෙහි ආශාවෙන් ගින්නෙහිවැටී නස්නා පලඟැටියන්සේ ශබ්දයෙහි ආශාවෙන් මිණිපන්දමෙන් නස්නා මෘගයන්සේ සුගන්ධයෙහිආශාවෙන් ඇතුන් කණවැදි නස්නා හාඬගයන්සේ රසයෙහි ආශාවෙන් මහාඝොදුරුයි සිතා බිලියෙහි ඇවිණී නස්නා මත්ස්‍යයන්සේ ස්පර්ශයෙහි ආශාවෙන් වනයෙහි ගොසිට ඇතින්න කෙරෙහි බැඳි ගමට අවුත් මිනිසුන් කෙරෙන් අනෙකවධයට පැමිණී හස්තීන්සෙයින් ක්‍රීඩාවට සුදුසු වස්තුවෙකැයි සිතා දිලිඟෙන අඟරු අල්වා නස්නා ලදරුවන් සෙයින් වර්ණයෙන් ගන්ධයෙන් ආකාරයෙන් රසයෙන් අඹැනි කිව්පහතම් විෂඵල අනුභවකොට නස්නා සත්වයන් සෙයින් සේවනය කරණහෙයින්ද එබඳු අඥාන ජනයන් විසින් භජනය පර්‍යුපාසනය කරණලද බැවින්ද අනාර්‍යවූ උතුම් නොවන්නාවූ); අනර්‍යසංහිතා, බුධාදි මහාත්තමයන්ට සෙයින් හිතසැප ඵලවන ලෝකොත්තර සැපතින් පිරිහුණු හෙයින් හිතසැප ඵලවන කාරණය ආශ්‍රය නොකළාවූ හෙවත් අවැඩම ආශ්‍රය කළාවූ; කාමෙසු, වසතුකාම්යෙහි; යොවායං, යම්මේ; කාමේසුබල්ලිකානුයොගෝ, කෙලෙශකාම සැපයාගේ යෙදීමක් ඇද්ද; (හෙද) දුක්ඛා, දුඃඛයට කාරණාවූ (හෙවත් කණ්ටකාපඤ්ඣායනාදිවූ ආත්මබාධක දුඃඛය ඵලවින්නාවූ); අනරියෝ, ආර්‍යයන් සතුවූනොවූ; අනත්ථසංහිතෝ, අනර්‍ථකවූ; යොවායං, යම්මේ; අත්තකිලමථානුයොගෝ, අත්මක්ලමථයෙහි යෙදීමක් ඇද්ද; (යන) ඉමෙවෙ අනන්ත, මේ කොඩාශවය හෙවත් මේ දෙකාරණයෝ; පබ්බජිතෙන, ගෘහසාබන්ධිනය ඡේදනකොට ප්‍රව්‍රජිතභාවයට ඵලඹියාවූ තොපවිසින්; නසෙවිතබ්බා, වල ජනය නොකට යුත්තාහ හෙවත් නොසෙවිය යුත්තාහයි වදාළ සේක.

යථොක්ත අර්ථවයෙන් "කාමසුඛල්ලිකානුයොගෝ" යන තන්හි සුඛල්ලිකානුයොගය වනාහි අනෙකවිධවේ.

එසින් වදාළහ දිග්ඝනිකෙහි.

"ඨානං ඛෝ පනෙතං ච්‍රන්ද විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං සුඛල්ලිකානුයොගමනුයුත්තා සමණා සක්‍යපුත්තියා විහරන්ති'ති, එවං වාදිනො ච්‍රන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා, කතමෝ සෝ ආවුසෝ සුඛල්ලිකානුයොගෝ සුඛල්ලිකානුයොගාපි හි බහූ අනෙකා විවිධා නානප්පකාරකා"ඒ.

එයින් ගිනවූ යහාවඇති පෘථග්ජනිකවූ එහෙයින්ම උතුම් නොවන්නාවූ උතුම් නොවන බැවින් අනවිමිශ්‍රවූ එහෙයින්ම නිර්වෙදන විරාග නිරොධූපසමාභිඥ සම්බොධ නිර්‍වාණසම්‍වර්තනියපය පිණිස නොපවත්නාවූ සතරෙක්වේ. කවරනම් සතරෙක්දයත්?:-

මේ ලොකයෙහි හෝ සත්තෙහි හෝ ඇතැම්කෙණෙක් ප්‍රාණින් නසනසා ජීවත්වෙමින් තමාට සැපනැයි සිතා සතුටුවෙති, මේ ප්‍රථම සුබල්ලිකානුයෝගය නම්වේ-ඇතැම්කෙණෙක් එසේම අදත්තාදුන්නා යෙන් සතුටුවෙති, මේ දෙවෙනි සුබල්ලිකානුයෝගය නම්වේ— ඇතැම්කෙණෙක් අභූතවචනසම්‍ප්‍රයුක්ත මුසාවාදය කියා තමා සැප තෙහි යොදා සතුටුවෙති, මේ තුන්වෙනි සුබල්ලිකානුයෝගය නම් වේ-ඇතැම්කෙණෙක් රූපශබ්දගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යසම්‍ප්‍රයුක්ත පඤ්ච කාමගුණයෙන් තමාසතුටුකරවති, මේ සතරවැනි සුබල්ලිකානු යෝගයයි මේසතර සුබල්ලි කානු යෝගයෝ බාලයන්විසින් සෙවනාදියකරණලදබැවින් නිර්‍වාණයපි ණිසනොපැමිණෙත්.

එයින් වදළහ·

"වත්තාරෝ ඛෝ භික්ඛවේ සුඛල්ලිකානුයෝගා හීනා ගම්මා පෝථුජ්ජනිකා අනරියා අනත්ථසංහිතා න නිබ්බිදාය නවිරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය නනිබ්බාණාය සංවත්තන්ති, කතමේ චත්තාරෝ? ඉධ භික්ඛවේ එකච්චෝ පාණෙ වධිත්වා වධිත්වා අත්තානං සුඛෙති පීණෙති අයං පඨමෝ සුඛල්ලිකානුයෝගෝ, පුනච පරං භික්ඛවේ ඉධෙකච්චෝ අදින්නං ආදියිත්වා අත්තානං සුඛෙති පීණෙති අයං දුතියෝ සුඛල්ලිකානුයෝගෝ. පුනච පරං භික්ඛවේ ඉධෙකච්චෝ මුසාභණිත්වා අත්තානං සුඛෙති පීණෙති අයං තතියෝ සුඛල්ලිකානුයෝගෝ, පුනච පරං භික්ඛවේ ඉධේ කච්චෝ පඤ්චහි කාමගුණෙහි සමප්පිතෝ සමඞ්ගිභූතෝ පරිචාරෙති අයං චතුත්ථෝ සුඛල්ලිකානුයෝගෝ ඉමේ ඛෝ භික්ඛවේ චත්තාරෝ සුඛල්ලිකානුයෝගා හීනා ගම්මා පෝථුජ්ජනිකා අනරියා අනත්ථසංහිතා න නිබ්බිදාය නවිරාගාය නනිරොධාය නඋපසමාය නඅභිඤ්ඤාය නසම්බොධාය නනිබ්බාණායසංවත්තන්ති:—

එකාන්තනිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස කෙලෙසව්‍යවසමය පිණිස සත්‍ය ප්‍රතිවේධය පිණිස ඔවුන්මේම අවබොධය පිණිස නිර්‍වාණය පිණිස පවත්නාවූ සුඛල්ලිකානුයෝගයෝ සතරදෙනෙක් වෙත්:—

ඔහු කවරහුදයත්?—මේ ශාසනයෙහි භික්ෂූන්මේ කාමයන් එකෙරෙන් වෙන්ව අකුශලධර්මයන්එකෙරෙන් වෙන්ව විතර්කසහිතවූ

විචාරසහිතවූ විවේකයෙන් උපන්නාවූ ප්‍රීතිසැපඇති ප්‍රථමධ්‍යාන යට පැමිණ වෙසේද 'මේ කුශලපක්‍ෂයෙහි ප්‍රථම සුඛල්ලිකානු යොගය නම්වේ.

විතර්කවිචාර දෙදෙනාගේ සංසිදීම හේතුකොටගෙණ ද්‍වයසන්නා නය විශෙෂයෙන් පැහැදීමකරන්නාවූ චිත්තයාසඔබ්බව එකඟ බවඇති විතර්කරහිතවූ විචාරරහිතවූ සමාධියෙන්උපන්නාවූ ප්‍රීති සැපඇති ත්‍රීතියධ්‍යානය උපදවා වෙසේද මේ එහි දෙවෙනිසුඛල්ලි කානුයොගය නම් වේ.

ප්‍රීතිවිරාගය හේතුකොටගෙණ උපෙක්‍ෂාඇත්තේද සමෘති ඇත්තේද සම්ප්‍රජානකාරිවූයේද වෙසන්නේය, ආර්‍යයෝ යම්බදුවූ ඔහට උපෙක්‍ෂාඇත්තේය සමෘතිසම්පන්නය සැපවූ විහරණයන් ඇත්තේයයි කියද්ද එබදුවූ සැපයද කයින් විඳිනේය, ඒ තෘතීය ධ්‍යානයට සමවැද වෙසන්නේය. මේ එහි තුන්වෙනි සුඛල්ලිකානු යොගනම් වන්නේය.

නැවත සැපයාගේ ප්‍රහාණිය හේතුකොටගෙණද දුක්‍ඛයාගේ ප්‍රහාණිය හේතුකොටගෙණද සොමනස්‍සදෙමනස්‍සයන්ගේ පළමු විනාශය හේතුකොටගෙණද දුක්නැති සැපනැති උපෙක්‍ෂාස්මෘති පාරිසුද්ධිඇති චතුර්ත්‍ථධ්‍යානයට සමවැද වෙසේද මේ එහි සතර වැනි සුඛල්ලිකානුයොගය නම්වේ. මේ සුඛල්ලිකානුයොගයෝ සතරදෙන වනාහි නිර්‍වාණයපිණිස පවත්නාහුයි. එයින් වදළහ:—

"චත්තාරොමෙ චුන්‍ද සුඛල්ලිකානුයොගා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්‍ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති, කතමෙ චත්තාරො? ඉධ චුන්‍ද භික්‍ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති අයං පඨමො සුඛල්ලිකානුයොගො, පුනච පරං චුන්‍ද භික්‍ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති අයං දුතියො සුඛල්ලිකානුයොගො, පුනාවපරං චුන්‍ද භික්‍ඛු පීතියා ච විරාගා උපෙක්‍ඛකො ච විහරති සතො සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්‍ඛන්ති උපෙක්‍ඛකො සතිමා සුඛවිහාරී'ති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති අයං තතියො සුඛල්ලිකානුයොගො, පුනච පරං චුන්‍ද භික්‍ඛු සුඛස්‍ස ච පහාණා දුක්‍ඛස්‍සච පහාණා පුබ්බෙව සොමනස්‍සදෙමනස්‍සානං අත්‍ථඞගමා අදුක්‍ඛං අසුඛං උපෙක්‍ඛාසතිපාරිසුද්ධිං චතුත්‍ථජ්ඣානං උපසම්පජ්ජ විහරති, අයං චතුත්‍ථො සුඛල්ලිකානුයොගො; ඉමේ ඛො චුන්‍ද චත්තාරො සුඛල්ලිකානුයොගා එකන්ත

නිබ්බිදාය විරාගාය නිරෝධාය උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තන්තී''ති.

මෙයින් ප්‍රථමයෙන් දැක්වූ සුඛල්ලිකානුයෝගයෝ සතරදෙන අනෙකප්‍රකාරයෙන් අධමවත්, දෙවෙනිව දැක්වූ ප්‍රථමධ්‍යානාදි සුඛල්ලිකානුයොගයෝ සතරදෙන ප්‍රවරවෙත් (උතුම්වෙත්.) හෙද මතුදක්වන පාලික්‍රමය බලා සැකදුරුකටයුතු:

"වෙමානි භික්ඛවෙ සුඛානි, කතමානි වෙ? ඔහිසුඛං ච පබ්බජ්‍යාසුඛං ච, ඉමානි ඛො භික්ඛවෙ වෙ සුඛානි; එතදග්ගං භික්ඛවෙ ඉමෙසං චතුන්නං සුඛානං යදිදං පබ්බජ්‍යාසුඛන්ති.

වෙමානි භික්ඛවෙ සුඛානි, කතමානි වෙ? කාමසුඛං ච නෙක්ඛම්ම සුඛං ච, ඉමානි ඛො භික්ඛවෙ වෙ සුඛානි; එතදග්ගං භික්ඛවෙ ඉමෙසං චතුන්නං සුඛානං යදිදං නෙක්ඛම්මසුඛන්ති.

වෙමානි භික්ඛවෙ සුඛානි, කතමානි වෙ? උපධිසුඛං ච නිරුපධි සුඛං ච, ඉමානි ඛො භික්ඛවෙ වෙ සුඛානි; එතදග්ගං භික්ඛවෙ ඉමෙසං චතුන්නං සුඛානං යදිදං නිරුපධිසුඛන්ති.

වෙමානි භික්ඛවෙ සුඛානි, කතමානි වෙ? සාසවං ච සුඛං අනාසවං ච සුඛං, ඉමානි ඛො භික්ඛවෙ වෙ සුඛානි; එතදග්ගං භික්ඛවෙ ඉමෙසං චතුන්නං සුඛානං යදිදං අනාසවං සුඛන්ති.

වෙමානි භික්ඛවෙ සුඛානි, කතමානි වෙ? සාමිසංව සුඛං නිරාමිසං ච සුඛං, ඉමානි ඛො භික්ඛවෙ වෙ සුඛානි; එතදග්ගං භික්ඛවෙ ඉමෙසං චතුන්නං සුඛානං යදිදං නිරාමිසං සුඛන්ති.

වෙමානි භික්ඛවෙ සුඛානි, කතමානි වෙ? අරියසුඛං අනරිය සුඛං ච, ඉමානි ඛො භික්ඛවෙ වෙ සුඛානි; එතදග්ගං භික්ඛවෙ ඉමෙසං චතුන්නං සුඛානං යදිදං අරියසුඛන්ති.

වෙමානි භික්ඛවෙ සුඛානි, කතමානි වෙ? කායිකං ච සුඛං චෙතසිකං ච සුඛං, ඉමානි ඛො භික්ඛවෙ වෙ සුඛානි; එතදග්ගං භික්ඛවෙ ඉමෙසං චතුන්නං සුඛානං යදිදං චෙතසිකං සුඛන්ති.

වෙමානි භික්ඛවෙ සුඛානි, කතමානි වෙ? සපීතිකං ච සුඛං නිපීතිකං ච සුඛං, ඉමානි ඛො භික්ඛවෙ වෙ සුඛානි; එතදග්ගං භික්ඛවෙ ඉමෙසං චතුන්නං සුඛානං යදිදං නිපීතිකං සුඛං''ති.

තෙත්‍රෙලොකාචාර්‍යවූ සම්බුදුන් වහන්සේ පළමුකොටම කුමක් හෙයින් කාමසුඛල්ලිකානුයොගයයි කියනලද විසතුකාමකෙලෙස

කාමය පැවිදිවුවන් විසින් නොපෙවියයුතුයයි කියා ප්‍රතිඝෙප කොට වදුලේක්දයත් ? පඤකාමගේවනය කරන්නාහට බොහෝ අකුසල් වඩනා හෙයිනි. ඒ පඤකාමයෝනම් කවුරුදයත් ?

ඇසින් දක්නා රූපය, කණින් අසන්නාවූ ශබ්දය, නාසයෙන් ආඝ්‍රාණය කරන්නාවූ සුගන්ධය, දිවින් විඳිනාවූ රසය, කයින් විඳිනාවූ ඵාසඛ්‍ය, යන පසයි. එහි නෙත්‍රඝඤන් දක්නා සුපුවූ වසතු සියල්ලම රූපඝයහි ඇතුලත්වුවද ස්ත්‍රීරූපය හැර පුරුෂයන්ගේ සින් ගන්නා අන්කිසි රූපයෙක්නම් නැත්. එසින් වදුලහ:—

"නාහං භික්ඛවෙ අඤඤං එකරූපම්පි සමනුපසසාමි යං එවං පුරිසසස චිත්තංපරියාදාය තිඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථිරූපං ඉත්ථි රූපං භික්ඛවෙ පුරිසසස චිත්තං පරියාදාය තිඨති"යි.

කණින් අසන්නාවූ සියලුම ශබ්දය ශබ්දයෙහි ඇතුලත්වුවද ස්ත්‍රීන්ගේ වචනශබ්දය ගායනාශබ්දය ආභරණවලනාදශබ්දය යන මේ හා සමානවූ පුරුෂයින්ගේ සිත්ගන්නා අන්කිසි ශබ්දයෙක් නම් නැත්. එසින් වදුලහ :—

"නාහං භික්ඛවෙ අඤඤං එකසද්දම්පි සමනුපසසාමි යං එවං පුරිසසස චිත්තං පරියාදාය තිඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථිසද්දෝ, ඉත්ථිසද්දෝ, භික්ඛවෙ පුරිසසස චිත්තං පරියාදාය තිඨති"යි.

නාසිකාවෙන් ආඝ්‍රාණයකරන්නාවූ සියලුගන්ධය ගන්ධයෙහිඇතුලත්වුවද ස්ත්‍රීන්ගේ ශරීරසුගන්ධය හා සමානවූ පුරුෂයන්ගේ සිත් ගන්නා අන්කිසි ගන්ධයෙක් නම් නැත්—එසින් වදුලහ.

"නාහං භික්ඛවෙ අඤඤං එකගන්ධම්පි සමනුපසසාමි යං එවං පුරිසසස චිත්තං පරියාදාය තිඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථිගන්ධෝ, ඉත්ථිගන්ධෝ භික්ඛවෙ පුරිසසස චිත්තං පරියාදාය තිඨති"යි.

දිවින් විඳිනා සියලු රසය රසයෙහි ඇතුලත්වුවද ස්ත්‍රීන්ගේ දන්නාවරණ ස්ත්‍රීන්විසින් අනුභවකලි තාම්බූලකවවරාදි ස්ත්‍රීරසයහා සමානවූ පුරුෂයන්ගේ සිත්ගන්නා අන්කිසි රසයෙක් නම් නැත්. එසින් වදුලහ:—

"නාහං භික්ඛවෙ අඤඤං එකරසම්පි සමනුපසසාමි යං එවං පුරිසසස චිත්තං පරියාදාය තිඨති යථයිදං භික්ඛවෙ ඉත්ථිරසසෝ, ඉත්ථි රසෝ භික්ඛවෙ පුරිසසස චිත්තං පරියාදාය තිඨති"යි.

ශරීරයට සුවපහස් ඵලවන්නාවූ මෘදුමෝලොක් මල්අතුල අසුන් කන්වයින් සිහින් ඇතිරිලි ආදිය ප්‍රඥප්තිවූවද ස්ත්‍රීන්ගේ ශරී

රය වැළඳගන්නා සපශිය හා සමානවූ පුරුෂයන්ගේ සිත් ගන්නා අන්කිසි සපශියෙක් නම් නැත්. එයින් වදාළහ:—

"නාහං භික්ඛවේ අඤ්ඤං එකඵොඨබ්බම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවේ ඉත්ථී ඵොඨබ්බෝ ඉත්ථී ඵොඨබ්බෝ භික්ඛවේ පුරිසස්සචිත්තං පරියාදාය තිට්ඨති"යි.

ස්ත්‍රීන්ගේ සිත්ගන්නා රූපාදී පසකුන් පුරුෂ රූපාදියෙන් සෙසු නැත්. එයින් වදාළහ:—

"නාහං භික්ඛවේ අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවේ පුරිසරූපං, පුරිස රූපං භික්ඛවේ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති.

නාහං භික්ඛවේ අඤ්ඤං එකසද්දම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවේ පුරිසසද්දෝ, පුරි සසද්දෝ භික්ඛවේ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති.

නාහං භික්ඛවේ අඤ්ඤං එකගන්ධම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවේ පුරිසගන්ධෝ, පුරිසගන්ධෝ භික්ඛවේ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති.

නාහං භික්ඛවේ අඤ්ඤං එකරසම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවේ පුරිසරසෝ, පුරිස රසෝ භික්ඛවේ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති.

නාහං භික්ඛවේ අඤ්ඤං එකඵොඨබ්බම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවේ පුරිසඵොඨ බ්බෝ පුරිසඵොඨබ්බෝ භික්ඛවේ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති"යි.

මෙසේ ගුථයන් හා එක්වෙන ගුථයසේ මූත්‍ර හා එක්වෙන මූත්‍ර සේ සොරුන්හා සමග එක්වෙන සොරුන්සේ අතීතාදී කාලත්‍රයෙ හිම අනිත්‍යාදියෙහි නිත්‍යාදිකල්පනා ඇති අසුද්ධසභාවයෙන් යුක්තවූ කාමුක ස්ත්‍රී පුරුෂයෝ ඔවුනොවුන් හා සමග එක්වෙන්.. කුමක්හෙයින් ස්ත්‍රීන් කෙරෙහි තෘෂ්ණාව විසිඳියත්? ඉන්ද්‍රියසංවරයක් නැතිහෙයිනි, ඒ එසේමය; අසුද්ධයෝ අසුචිපිඩක් වැනිවූ ශරීරයා ගේ වර්ණමාත්‍රයක්ම දුක සදහවූ හිසිවක් නොලදින් පියුම් ආදින් හා සදෘශකොට එක්වැනියයි යොදත්.

එයින් කිහ, සබ්බෝපාසනාසෙහි:—

"දිස්වා අසුචිපිණ්ඩස්ස වණ්ණමත්තෙනවෝ බාලියා
අලබ්භා සාදියං කිම්හි යොජෙන්ති පදුමාදිකි"-යි.

පයොධරය රන්කරඬුවක් වැන්නැයි කියාද මුහුණ පුල්පියුමක් වැන්නැයි කියාද නෙත්‍රනිල්මහනෙල්පෙති වැන්නැයි කියාද දන්තයන් විසින් මුතුපෙල පරදවන ලදැයි හෝ තත්සදෘශයයි හෝ යොදත්. **එසින් කිහ:**—

"එතා සොණ්ණසමුග්ගහාහා මුඛං ථුල්ලඵ්ඵලූපෝපමං
නෙත්තා නීලඵ්ඵලූජනිභා මුත්තා දන්තෙහි නිජ්ජිහා"යි.

අනිඤ්ජිතවූ ඇඟ ඇත්තියගේ (උතුම්තුනුවහ ඇත්තියගේ) ශරීරය අනඛයා ඇල්ලුම්වඩන්නේයයිද මේ ආදින් සිතන්නාහු තමන් සිත් කිලිටු කෙරෙත්. **එසින් කිහ:**—

"අඛං අනිඤ්ජිතඞ්ගාය අනඛාසඞ්ගවඩ්ඪනං
ඉච්චේවමාදී චින්තෙත්වා චිත්තං දූසෙන්ති අත්තනෝ"යි.

මේසේ ශුභවශයෙන් සිත්මෙන් මොහයෙන් මුළාවමේ ශරීර යෙහි කරණලද ඇල්මහාමැහි මලින් වෙළනලද්දාහු තමන් වරදවා සිතාගත් විපරිත කල්පනාවෙන් සොරවූ අනයව්‍යසනයට පැමිණෙත්. **එසින් කිහ:**—

"තතෝ මොහවසෙනෙව සඞ්ඝපාසෙන වෙඨිතා
අනයව්‍යසනං ඝොරං පපජ්ජන්ති පරිකප්පිතා"යි

අමේධ්‍යයෙන් කලු පොතලුරුවක්බඳු මේශරීරය ස්වභාවයෙන් දක්නට තුනිවූශුභිමාත්‍රයෙන් * මුළාකරණලද පෘථග්ජනයෝනොහැකිවෙත්. **එසින් කිහ:**—

"අමේධ්‍යපොත්ථකාකාරං නත්‍රුවිඡ්ඡවිවෙහිතා
දේහං සභාවතෝ දට්ඨුං නසක්කොන්ති පුථුජ්ජනා"යි.

නථාගත ශ්‍රාවකයන් කෙරෙන් පිටත් අන්හු තමන්සිත්හි වන කෙලහදෙහියන් රැඟෑකරන්නට නොහැකිව තමන්ගේ ඉන්ද්‍රියයන් කෙලසහි පෙලති, සම්‍යක්ශ්‍රාවකයෝ වනාහි ඉන්ද්‍රියයන් හා ආලම්බනයන් කෙරෙහි ඇලුම් වලකත්. **එසින් කිහ:**—

"ඉන්ද්‍රියානි නිගූහන්ති දෙසෙ සංරක්ඛිතුං පරෙ
ඉන්ද්‍රියෙසුපි සම්භා තු වාමරන්ති ජිනසාවකා"යි.

සිහියම ආරක්ෂාකොට ඇති සිහියම රැකවල්කොටඇති මහණ තෙම ඉදුරන් හා ඉන්ද්‍රියගොචරයෙහි අනිත්‍යය දුඃඛය අනාත්මය යන ත්‍රිලක්ෂණය විශෂයෙන්(නොමෙක් පරිද්දෙන්)දන්නේ ඇල්ම කටයුතුවූ දෙයක් නොමදනි. **එසින් කිහ:**—

---

* ශුභිත්‍රයෙන්.

"සත්තාරකෙඛා හි සමණෙ ඉඤ්ඡිඤ්ඡිතගාවරෙ
අනිවත්තිදිං විපස්සනෙත්තා සඤ්ඤනියං න පස්සති"යි.

මේ ලොකයෙහි දෙවියන් අසුරයන් රාක්ෂයන් සහිතවූ ජනතෙම ඉන්ද්‍රියයන් නමැති නොහික්මුණු අශ්වයන් විසින් නොමග ගෙණ යන ලදුයේ හිතමාගීශයන් දුරුකොට දම්මඟලදී එසින් කිහ.

"ඉන්ද්‍රියෙසෙහි දුන්නිත්තො දූපතො හිතමග්ගතො
අප්පත්තිඩො ජනෙ ලොකෙ සදෙවා සුර රක්ඛසා"යි.

අහිඛණ්ඩබ්බාපම සූත්‍රාදියෙහි දක්වා වදරණලද ත්‍රිවිධයෙන් නොඇසියහැකිවූ නොසිතියහැකිවූ දුක්ඛදායකවන බැහින්ද කාම විතර්කී ව්‍යාපාදවිතර්කී විහිංසාවිතර්කී සඞ්ඛ්‍යාත ත්‍රිවිධ විතර්කියන් මඩ නාලද භික්ෂුන්ට බොහෝකාලයක් අපායාදියෙහි ප්‍රමාණනිර්ත්‍රාණත දුක් විඳ වෙහෙසෙන බැහින්ද ලොකනාථවූ බුදුරජාණන්වහන්සේවිසින් ලෝකයාකෙරෙහි කරුණාවෙන් සම්බුද්ධඥානයට්පැමිණ එම සම්බුද්ධඥානයෙන් ලොකයාහට වනසුවදුක්ද ඒ සුවදුකට කාරණාවූ කුශලාඛුශලයන්ද ප්‍රත්‍යක්ෂයෙන්දැන ප්‍රථමයෙන් කාමසුඛල්ලිකානුයොගය හා පචතාපනාදියෙන් ආත්මක්ලමථය හිරීමය යන මේ අන්තවයට හික්ෂූන්විසින් නොපැමිණෙන ලෙසට:—

"වෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන නසෙවිතබ්බා යො වා යං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනා ගම්මා පොථුජ්ජනිකා අනරියා අනත්ථසංහිතා"යි—යන පාලිය වදළසේක.

මෙසේ අන්තවය ප්‍රතික්ෂෙපකොට මත්තෙහි මධ්‍යම ප්‍රතිපදා වෙහි පිහිටුවන පිණිස ලොකාලොකදේවාකරවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ:—

"එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, කතමා ච සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථිදං? සම්මාදිට්ඨි සම්මාසංකප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි"යි,

ඉන මේ පාලිය වදළසේක.

එහි අභිප්‍රායනම්—මහණෙනි නොපවිසිත් මා ප්‍රතික්ෂෙප කළ මේ අන්තවයට නොපැමිණ ප්‍රඥාචක්ෂුස විශුද්ධකරණ පිණිස හෙවත් පැණඇස් පිරිසිදුකරණ පිණිස මොහාන්ධකාරය දුරීභූතකොට ඥාව

ණෑස් කරණ පිණිස කෙලෙසප්‍රශ්‍රබ්ධිය දුරුකරණ පිණිස අභිඥා සංඛ්‍යාත සත්‍යප්‍රතිවේධය කරණු පිණිස ඔවුන්ගේම අවබෝධය පිණිස නිවන් පසක් කරණු පිණිස පවත්නාවූ යම් මධ්‍යමප්‍රතිපදාවක් තොමෝ තථාගතබුදු කාරණයෙන්සුකතාවූ සම්‍යඤ්ඤාන්වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂ කරණලද්දේද, මහණෙනි ඥානාදිය නිසා පවත්නාවූ සම්‍යඤ්ඤාන් වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂකරණලද ඒ මධ්‍යම ප්‍රතිපදාතොමෝ කවරක්වන්නිද? මේ ආර්‍යාෂ්ටාඞ්ගික මාර්ගය මැයි. ඒආර්‍යාෂ්ටාඞ්ගික මාර්ගයෝනම් කවුරුදයත්? මිථ්‍යාදෘෂ්ටිආදියෙන් පහවූ සම්‍යක්දෘෂ්ටි ආදියය, මේම ආර්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය වන්නේයයි වදාළසේක, යන අභිප්‍රායයි. මේ මෙහි සංක්ෂේපාර්‍ථයි, විස්තරාර්‍ථය වනාහි කුහුඹුවන් විසින් සෙල්විය නොහැකි මහමෙරසේ සම්බුදුන් යන් සම්මාසම්බුදුරයෙන් දත් බුදුන්වමුත් අන්කිසිවක්හට අගොචරය එහෙයුදුවුවත් පෙළඳවූවාවූහි දුටුලෙසකින් මාගේ ප්‍රඥාශක්තියවූ පරිද්දෙන් එකදෙශයකින් වණ්නාකෙරෙමි. හේකෙසේදයත්?

මේ ආර්‍යාෂ්ටාඞ්ගිකමාර්ගයට විපරීතවූ අනාර්‍යාෂ්ටාඞ්ගික මාර්ගය අධම්ම නමුදු මෙයි අනාර්‍යමුදු වේ. ආර්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය ධම්මනමුදුවේ අරිය්‍යමුදු වේ. **එසින් වදළහ:—**

"අධම්මෝ ච භික්ඛවෙ වෙදිතබ්බෝ ධම්මෝ ච අනත්ථෝ ච වෙදිතබ්බෝ අත්ථෝ ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච අත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මඤ්චයථා අත්ථොතථා පටිපජ්ජිතබ්බං. කතමොච භික්ඛවෙ අධම්මෝ? කතමොච අනත්ථෝ? මිච්ඡාදිට්ඨි භික්ඛවෙ අධම්මෝ සම්මාදිට්ඨි ධම්මෝ යෙච මිච්ඡාදිට්ඨි පච්චයාඅනෙකෙ පාපකා අකුසලා ධම්මාසම්භවන්ති අයංඅත්ථෝ, සම්මාදිට්ඨිපච්චයා ච අනනෙකෙ කුසලාධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති අයං අත්ථෝ, මිච්ඡාසංකප්පෝ, භික්ඛවෙ අධම්මෝ සම්මාසංකප්පෝ ධම්මෝ, මිච්ඡාවාචාභික්ඛවෙ අධම්මෝ සම්මාවාචා ධම්මෝ, මිච්ඡාකම්මන්තා භික්ඛවෙ අධම්මෝ, සම්මාකම්මන්තා ධම්මෝ, මිච්ඡාආජීවෝ භික්ඛවෙ අධම්මෝ සම්මා ආජීවෝ ධම්මෝ, මිච්ඡාවායාමෝ භික්ඛවෙ අධම්මෝ සම්මාවායාමෝ ධම්මෝ මිච්ඡාසති භික්ඛවෙ අධම්මෝ සම්මාසති ධම්මෝ, මිච්ඡාසමාධි භික්ඛවෙ අධම්මෝ සම්මාසමාධි ධම්මෝ" යි.*

---

* මිච්ඡාඤාණං භික්ඛවෙ අධම්මෝ සම්මාඤාණං ධම්මෝ මිච්ඡාවිමුත්ති භික්ඛවෙ අධම්මෝ සම්මාවිමුත්ති ධම්මෝයෙච මිච්ඡාවිමුත්තිපච්චයා අනෙකෙ පාපකා අකුසලාධම්මා සම්භවන්ති අයංඅත්ථෝ සම්මාවිමුත්ති පච්චයා අනෙකෙකුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති අයංඅත්ථෝ අධම්මෝච භික්ඛවෙ වෙදිතබ්බෝ ධම්මෝ ච අනත්ථෝ ච වෙදිතබ්බෝ අත්ථෝච අධම්මඤ්චවිදිත්වා ධම්මඤ්ච අත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච යථාධම්මෝ යථා අත්ථොතථා පටිපජ්ජිතබ්බං- ඉපාත්ති.

තවද මේ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයට විපරීතවූ අනාර්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය ඔරිම තීරනම් වේ. ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය පාරිම තීරනම් වේ—එසින් වදාළහ එතර මෙනර විවාළ **සඞ්ගාරවනම් බ්‍රාහ්මණ** යාගය:—

"මිච්ඡාදිට්ඨි ඛො බ්‍රාහ්මණ ඔරිමං තීරං සම්මාදිට්ඨි පාරිමං තීරං මිච්ඡාසඞ්කප්පො ඔරිමං තීරං සම්මාසංකප්පො පාරිමං තීරං, මිච්ඡා වාචා ඔරිමං තීරං සම්මාවාචා පාරිමං තීරං, මිච්ඡාකම්මන්තො ඔරිමං තීරං සම්මාකම්මන්තො පාරිමං තීරං, මිච්ඡාආජීවෝ ඔරිමං තීරං සම්මාආජීවෝ පාරිමං තීරං, මිච්ඡාවායාමෝ ඔරිමං තීරං සම්මාවායාමෝ පාරිමං තීරං, මිච්ඡාසති ඔරිමං තීරං සම්මාසති පාරිමං තීරං, මිච්ඡාසමාධි ඔරිමං තීරං සම්මාසමාධි පාරිමං තීරං, මිච්ඡාඤාණං ඔරිමං තීරං සම්මාඤාණං පාරිමං තීරං, මිච්ඡාවිමුත්ති ඔරිමං තීරං සම්මා විමුත්ති පාරිමං තීරං, ඉදං ඛො බ්‍රාහ්මණ ඔරිමං තීරං ඉදං පාරිමං තීරං"යි.

තවද මේ අනාර්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයෙහි විභාග හා ආර්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයෙහි විභාග මෙසේ දතයුතුයි. කෙසේදයත්?

මිච්ඡාදිට්ඨියන තන්හි මිථ්‍යාදෘෂ්ටිකම් කිමයත්? විපරීතදර්ශනය මිථ්‍යාදෘෂ්ටිනම් වේ. හෙවත් යමෙක් දුන් දනෙහි විපාක නැතැයි කියාද කළ කුශලයෙන් ලැබියයුතු සුගතියකුත් නැත්තේය, එසේම කරණලද අකුශලයෙන් ලැබියයුතු දුගතියකුත් නැත්තේය, මව් පියන් ගුරුන් සිල්වතුන් ඝාතනය කිරීම අනාදරයෙහි අකුසල් නැත, බුදුන් නැත, දහම් නැත, සඟුන් නැත, මෙලොව නැත, පරලොව නැත, සත්වතම මරණින් මන්නෙහි නුපදනේය, යනාදීවශයෙන් ඇතිලෙස තබා නැතිලෙස සිතා දෘෂ්ටිගණිනම් හේ මිථ්‍යාදෘෂ්ටිනම්වේ. මේ හැමතන්හි ඇතිදෙය **ඇතිලෙසින්ද** නැතිදය නැතිලෙසින්ද ඍජුකොට දක්නා දෘෂ්ටිය සම්‍යක්දෘෂ්ටිනම් වේ. යමක් කරණකොටගෙණ නොඋපන් අකුශලධර්මයෝ උපදිද්ද, උපන් අකුශලධර්මයෝ විපුලත්වයට යෙද්ද එබදු දෙයක් මේ මිථ්‍යාදෘෂ්ටිය හා මනාම දක්නාලැබෙයි. මිථ්‍යාදෘෂ්ටිකවූ පුද්ගලයාහට නොඋපන් අකුසල් උපදින්, උපන් අකුසල් විපුලත්වයට යෙත්-**එසින් වදාළහ.**

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි; මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නාවෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ච අකුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති"යි.

යමක් කරණකොටගෙණ නොඋපන් කුශලධර්මයෝ නුපදිද්ද උපන් කුශලධර්මයෝ පිරිහෙද්ද, එබදු දෙයකුදු මේ මිථ්‍යාදෘෂ්ටියහා තෝම දක්නාලැබෙයි. විපරීත දෘෂ්ටිඇති පුද්ගලයාහට නොඋපන් කුශලධර්මයෝ නොඋපදිත්, උපන් කුශලධර්මයෝ පිරිහෙත්. **එසිත් වදළහ:—**

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා නුප්පජ්ජන්ති උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නාවෙව කුසලා ධම්මා නුප්පජ්ජන්ති උප්පන්නා ව කුසලා ධම්මා පරිහායන්ති"යි.

යම් ධර්මකොණකුන් කරණකොටගෙණ නොඋපන් කුශල ධර්මයෝ උපදිද්ද උපන් කුශල ධර්මයෝ විපුලත්වයට යෙද්ද එබදු ධර්මයෙක් මේ සම්‍යක් දෘෂ්ටිය හා නොමදක්නා ලැබෙයි. සම්‍යග්දෘෂ්ටිකවූ පුද්ගලයාහට නොඋපන් කුශල ධර්මයෝ උපදින්, උපන් කුසල ධර්මයෝ විපුලත්වයට යෙත්-**එසිත් වදළහ:—**

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උපජ්ජන්ති උප්පන්නා වා කුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති යථයිදං භික්ඛවෙ සම්මාදිට්ඨි, සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නාවෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ව කුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති"යි-

යම් ධර්මකොණකුන් කරණකොටගෙණ නොඋපන් අකුශල ධර්මයෝ නුපදිද්ද උපන් අකුශල ධර්මයෝ පිරිහෙද්ද එබදු ධර්මකොණකුන් මේ සම්‍යග්දෘෂ්ටිය හා නොම දක්නා ලැබෙයි, සම්‍යග්දෘෂ්ටික පුද්ගලයාහට නොඋපන් අකුශල ධර්මයෝ නොඋපදින්, උපන් අකුශල ධර්මයෝ පිරිහෙත්-**එසිත් වදළහ:—**

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා නුප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ සම්මාදිට්ඨි; සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නාවෙව අකුසලා ධම්මා නුප්පජ්ජන්ති උප්පන්නා ව අකුසලා ධම්මා පරිහායන්ති"යි.

යමෙක් අනුවණින් යෙදි කාරණාකාරණා නොදන්නා අඥාන භාවයෙන් යුක්තව වසන්නේ වීනම් ඕහට්නෝ උපන් මිථ්‍යාදෘෂ්ටිය උපදියි, උපන් මිථ්‍යාදෘෂ්ටිය වර්ධනයට යෙයි-**එසිත් වදළහ:—**

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා මිච්ඡාදිට්ඨි උප්පජ්ජති උප්පන්නා වා මිච්ඡාදිට්ඨි පවඩ්ඪති, යථයිදං භික්ඛවෙ අයොනිසො මනසිකාරෝ; අයොනිසො භික්ඛවෙ මනසිකාරෝතො අනුප්පන්නාවෙව මිච්ඡාදිට්ඨි උප්පජ්ජති උප්පන්නා ච මිච්ඡාදිට්ඨි පවඩ්ඪති"යි.

යමෙක් කාරණා කාරණා දන්නා නුවණින් යුක්තවිනම් ඔහුට නො උපන් සම්‍යග්දෘෂ්ටිය උපදියි, උපන් සම්‍යග්දෘෂ්ටිය වැඩියට යෙයි. **එසින් වදාළහ:—**

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා සම්මාදිට්ඨි උප්පජ්ජති උප්පන්නා වා සම්මාදිට්ඨි පවඩ්ඪති, යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරෝ යොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නාවෙව සම්මාදිට්ඨි උප්පජ්ජති උප්පන්නාව සම්මාදිට්ඨි පවඩ්ඪති"යි

මේ ලොකයෙහි යමෙක් මිථ්‍යාදෘෂ්ටි වීනම් හෙතෙම කාබුන් මරණින් මත්තෙහි අපාය දුගතිය විනිපාත සංඛ්‍යාත නරකයෙහි උපදී—**එසින් වදාළහ:—**

"නාහං භික්ඛවෙ අඤ්ඤං එක ධම්මම්පි සමනුපස්සාමි යෙනෙවං සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි මිච්ඡාදිට්ඨියා භික්ඛවෙ සමන්නාගතා සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති"යි.

මේ ලොකයෙහි යමෙක් සම්‍යග්දෘෂ්ටිවිනම් හෙතෙම කාබුන් මරණින් මත්තෙහි සුගති සවර්ගසංඛ්‍යාත දිව්‍යලොකයෙහි උපදී. **එසින් වදාළහ:—**

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙනෙවං සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, යථයිදං භික්ඛවෙ සම්මාදිට්ඨියා භික්ඛවෙ සමන්නාගතා සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති"යි.

තවද මිථ්‍යාදෘෂ්ටික පුද්ගලයා විසින් කරණලද යම් කායකර්මයක් වචීකර්මයක් මනඃකර්මයක් ඇද්ද සමාදන්වනලද යම් චෙතනාවක් ඇද්ද, යම් ප්‍රාර්ථනාවක් ඇද්ද, යම්ප්‍රණිධියෙක් ඇද්ද, ඒසියල්ලම ඔහුට අනිෂ්ටයට අකාන්තයට අමනාපයට අහිතයට දුක්ඛයට වැටෙන්නේය, ඊට කාරණා නවරේද? විපරීත දෘෂ්ටියෙන් සමන්විත හෙයිනි. යම්සේ කොඤ්ඔ ඕජු හෝ කොඤාතකී බිජු හෝ හෙවත්

නිත්ත වැටකොළු බිජු හෝ නිත්තකලාබු බිජු හෝ තෙත් භූමියෙහි දමනුලබන්නේපෘථිවිරසය ආපොරසය එයවඑක්වෙන්නේය. බිජුවටය නිත්තහෙයින් ඒ සියල්ලත් නිත්තයට කටුකයට අසාත යට පැමිණෙන්නේද, ඊට කාරණා කවරේද? පවිටු බිජුවට හෙයිනි, එපරිද්දෙන්ම ඕඝාත්‍යදෘෂ්ටියෙන් යුත්තවූ පුද්ගලයා මියින් කරණ ලද සිහල්ලම ඔහුට අහිතාදියට පැමිණෙන්නාහ ඊට කාරණා කව රේද පවිටු දෘෂ්ටිය හෙයිනි. **එසිත් වදළහ**:—

"මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ පුරිසපුග්ගලස්ස යං වෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං යං ච වචිකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං යං ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා යා ච පත්ථනා යො ච පණිධි යෙව සංඛාරා සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති, තංකිස්සහෙතු? දිට්ඨි හි භික්ඛවෙ පාපිකා, සෙය්‍යථාපි භික්ඛවෙ නිම්බ බීජං වා කොසාතකිබීජං වා සිත්තකලාබුබීජං වා අල්ලාය පථවියං නික්ඛිත්තං යථෙව පථවිරසං උපාදියති යං ච ආපොරසං උපාදියති සබ්බන්තං තිත්තකත්තාය කටුකත්තාය අසාතත්තාය සංවත්තති තං කිස්සහෙතු? බීජං භික්ඛවෙ පාපකං, එවමෙව ඛො භික්ඛවෙ මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යං වෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං යං ච වචිකම්මං යං ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං යා ච චෙතනා යා ච පත්ථනා යො ච පණිධි යෙ ච සංඛාරා සබ්බ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති, නං කිස්සහෙතු? දිට්ඨි හි භික්ඛවෙ පාපිකා"ති.

යමෙක් සම්‍යග්දෘෂ්ටි වීනම් ඔහුවිසින් දෘෂ්ටානුගතිකව කරණලද යම් කායකර්මයෙක් වචීකර්මයෙක් යම් මනඃකර්මයක් සමාදන්වනලද චේතනාවෙක්යම් ප්‍රාර්ථනාවෙක් යම් ප්‍රණිධියෙක් ආද්ද ඒ සියලු සංස්කාර ධර්මයෝ ඔහුට ඉෂ්ටයට කාන්තයට මනාපයට හිතයට සුඛයට පැමිණෙන්නාහුය. ඊට කාරණා කවරේද? දෘෂ්ටිය යහපත් හෙයිනි, යම්සේ ඉක්ෂු බිජු හෝ සාලි බිජු හෝ ඵලදෘඩා බිජු හෝ අලලභූමිසඞ්ඛ්‍යාත තෙත් භූමියෙහි නික්ෂිප්ත කරණු ලබන්නේ යම් පෘථිවිරසයක් ආපොරසයක් ඒ ඉක්ෂු ආදියෙහි එක්වීමෙන් ඒ රසයද මධුරත්වයට ස්නිග්ධත්වයට ආසෙවකත්වයට පැමිණෙන්නේද, ඊට කාරණා කවරේද? බිජුවට යහපත් හෙයිනි, එපරිද්දෙන්ම සම්‍යග්දෘෂ්ටික පුද්ගලයා විසින් යම් කායකර්මයක් වචීකර්මයක් මනඃකර්මයක් සම්‍යග්දෘෂ්ටි වශයෙන් කරණලදද හේ ඔහුට ඉෂ්ටයට කාන්තයට මනාපයට හිතයට සුඛයට පැමිණෙන්නේය, ඊට කාරණා කවරේද? ඔහුගේ දෘෂ්ටිය යහපත් හෙයිනි. **එසිත් වදළහ**:—

"සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ පුරිසපුග්ගලස්ස යං වෙච කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං යං වෙච වචීකම්මං යංච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං යා ච චෙතනා යා ච පත්ථනා යො ච පණිධි යෙ ච සංඛාරා, සබ්බ තෙ ධම්මා ඉෂ්ටාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති, තං කිස්සහෙතු? දිට්ඨි හි භික්ඛවෙ හදුජිකා; සෙය්‍යථාපි භික්ඛවෙ උච්ඡුබීජං වා සාලිබීජං වා මුදුජිකා බීජං වා අල්ලාය පඨවියා නික්ඛිත්තං යං වෙච පඨවිරසං උපාදියති යං ච ආපොරසං උපාදියති සබ්බන්තං මධුරත්තාය සාතත්තාය ආපෙච කප්පතාය සංවත්තති, තං කිස්සහෙතු? බීජං හිභික්ඛවෙ හදුජිකං, එව මෙව බො භික්ඛවෙ සම්මාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යං වෙව කාය කම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං යං ච වචිකම්මං යංච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නා යා ච චෙතනා යා ච පත්ථනා යා ච පණිධි යෙ ච සංඛාරා සබ්බ තෙ ධම්මා ඉෂ්ටාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති, තං කිස්සහෙතු? දිට්ඨි හි භික්ඛවෙ හදුජිකා"යි.

තාවද මේ ලොකයෙහි එක්පුද්ගලයෙක් උපදින්නේ දිව්‍ය මනුෂ්‍යයන් සහිතවූ බොහෝ ජනයාහට අහිතයට අසුඛයට අනර්ථයට කාරණාව උපදනේය, කවරනම් එකපුද්ගලයෙක්දයත්? යමෙක් මිථ්‍යාදෘෂ්ටි සංඛ්‍යාත විපරීත දෘෂ්ටිඇත්තේ වීනම් ඒ පුද්ගලතෙම බොහෝ ජනයන් සඩ්මියෙන් උගුලුවා අසඩ්මියෙහි පිහිටුවන්නේය. එහෙයින් හෙතෙම ලොකයෙහි උපදින්නේ දිව්‍යමනුෂ්‍යයන් සහිතවූ බොහෝ ජනයන්ට අහිත දුකාදියට කාරණාව උපදනේය, **එසින් වදලහ:—**

"එකපුග්ගලෝ භික්ඛවෙ ලෝකෙ උපජ්ජමානෝ උපජ්ජති බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනෝ ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං, කතමෝ එකපුග්ගලෝ මිච්ඡාදිට්ඨිකෝ හොති විපරීතදස්සනෝ, සෝ බහුජනං සඩ්මා උපෙසෙති අසඩ්මෙ පනිධාපෙති, අයං බො භික්ඛවෙ එකපුග්ගලෝ ලොකෙ උපජ්ජමානෝ උපජ්ජති බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනෝ ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං"යි.

එහෙයින්ම ලෝකයෙහි එක්පුද්ගලයෙක් උපදින්නේ දිව්‍ය මනුෂ්‍යයන් සහිතවූබොහෝජනයන්ට හිතසැප පිණිස උපදනේය, කවරනම් පුද්ගලයෙක්දයත්? යම් පුද්ගලයෙක් සම්‍යක්දෘෂ්ටිකම් අවිපරීත දෘෂ්ටිඇතිහෙයින් හෙතෙම බොහෝජනයන් අසඩ්මියෙන් උගුලුවා සඩ්මියෙහි පිහිටුවන්නේය, එහෙයින් සම්‍යක්දෘෂ්ටික පුද්ගලතෙම ලොකයෙහි උපදින්නේ දිව්‍යමනුෂ්‍යයන් සහිතවූ බොහෝ

හෝජනයන්ට හිතයට සුඛයට අනීයට කාරණාවඋපදනේය,**එසින් වදලහ:—**

"එකපුනහලෝ භික්ඛවේ ලොකෙ උපපජ්මානෝ උපපජ්ති බහුජ්නහිතාය බහුජ්නසුඛාය බහුනෝ ජනසස අත්ථාය හිතාය සුඛාය දෙවමනුසසානං, කතමෝ එකපුගහලෝ සම්මාදිඨිකොහොති අවිපරිතදසසනෝ. සෝ බහුජ්නං අසඛම්මා වුඨාපෙත්වා සඛම්ම පතිඨාපෙති අයං බෝ භික්ඛවේ එකපුගහලෝ ලොකෙ උපපජ්මානෝ උපපජ්ති බහුජ්නහිතාය බහුජ්නසුඛාය බහුනොජ්නසස අත්ථාය හිතාය සුඛාය දෙවමනුසසානං"යි.

මේ ලොකයෙහි මහත් සාවද්‍යයක් ඇද්ද හෙවත් වරදක් ඇද්ද ද ඒ සියලු සාවද්‍යයන් අතුරෙහි යම් මේ මිථ්‍යාදෘෂ්ටියෙක් ඇද්ද ඒ මිථ්‍යාදෘෂ්ටිය හා සමවූ සාවද්‍යයෙක් වරදෙක් නැත්, **එසින් වදලහ:—**

"නාහං භික්ඛවේ අඤඤං එකධම්මම්පි සමනුපසසාමි යං එවං ඔහාසාවජ්ජං යථයිදං භික්ඛවේ මිච්ඡාදිඨි; මිච්ඡාදිඨි භික්ඛවේ පරමා නි වජ්ජානි"යි.

යමෙක් මිථ්‍යාදෘෂ්ටිවිනමි ඕහට දෙගතියක් අතුරෙන් එක්තරා ගතියක් වෙයි, හේ කවරේදයත්; නරක ගතිය හෝ තිරශ්චින ගතිය නෝ යන මේ දෙගතියෙන් එක් ගතියෙකි. **එසින් වදලහ:—**

"මිච්ඡාදිඨිකසස භික්ඛවේ මිනනං ගතිනං අඤඤතරා ගති පාටි කඞඛා නිරයෝ වා තිරච්ඡානයොනිවා"යි.

යමෙක් සම්‍යක්දෘෂ්ටිවිනමි ඕහටද දෙගතියකින් එක් ගතියෙක් වෙයි, හේ කවරේදයත්? දිව්‍යගතිය හෝ මනුෂ්‍යගතිය හෝ යන දෙ ගතියෙන් එක් ගතියෙයි. **එසින් වදලහ:—**

"සම්මාදිඨිකසස භික්ඛවේ විනනං ගතිනං අඤඤතරා ගති පාටි කඞඛා දෙවා වා මනුසසා වා"යි

"සම්මාසංකපපා"යන තන්හි සම්‍යක්සංකල්පනාවට විරුඬවූ මිථ්‍යාකල්පනාව හා සම්‍යක්කල්පනාව යන දෙදනාගේ වීහාග කෙසේදයත්? රූපාදී පඤ්චකාමයෙන් විනිර්මුක්තව අභිනිෂ්ක්‍රමණය කෙරෙමි යන කල්පනාවද සත්වයන් කෙරෙහි ව්‍යාපාද වසයෙන් නසවයි නොහිතා පවත්නා අව්‍යාපාද කල්පනාවද සත්වයන්ට හිංසා නොකෙරෙමියි පවත්නාවූ අවිහිංසා කල්පනාවද යන මේ ත්‍රිවිධ කල්පනාව සම්‍යක් කල්පනාව නම් වෙයි. එසින් වදලිහ, **මහාසති පඤ්ඤා සූත්‍රයෙහි:—**

"කතමෝ ච භික්ඛවෙ සම්මාසංකප්පෝ නෙක්ඛම්මසංකප්පෝ අව්‍යාපාදසංකප්පෝ අවිහිංසා සංකප්පෝ අයං වුච්චති භික්ඛවෙ සම්මා සංකප්පෝ"යි.

ත්‍රිවිධ කුසල විතර්කයෝත් කාමාදිහුමැයි. එයින් වදාළහ, දම් සෙමෙනවි සැරියුත් මහතෙරහු

දීඝනිකායෙකිව්‍ර සංගිති සූත්‍රයෙහි

"තයෝ අකුසල විතක්කා කාමවිතක්කා ව්‍යාපාදවිතක්කා විහිංසා විතක්කා"යි.

ත්‍රිවිධ කුසල විතර්කයෝත් අව්‍යාපාදාදිහුමැයි, හෙද වදාළේ මෙසේ එහිමය:—

"තයෝ කුසල විතක්කා නෙක්ඛම්මවිතක්කා අව්‍යාපාද විතක්කා අවිහිංසාවිතක්කා"යි.

ත්‍රිවිධ අකුසල සංකල්පයෝත් කාමසංකල්පාදිහුමැයි, මේ වදාළේ මෙසේ:—

"තයෝ අකුසල සංකප්පා කාමසංකප්පෝ ව්‍යාපාද සංකප්පෝ විහිංසා සංකප්පෝ"යි.

ත්‍රිවිධ කුසල සංකල්පයෝද නෛෂ්ක්‍රම්‍ය සංකල්පාදිහුමැයි, හෙද වදාළේ මෙසේ:—

"තයෝ කුසල සංකප්පා නෙක්ඛම්ම සංකප්පෝ අව්‍යාපාද සංකප්පෝ අවිහිංසා සංකප්පෝ"යි.

ත්‍රිවිධ අකුසල සංඥාවෝද කාමසංඥාදිහුමැයි. **එයින් වදාළහ**:—

"තිස්සො අකුසලසඤ්ඤායො කාමසඤ්ඤා ව්‍යාපාදසඤ්ඤා විහිංසා සඤ්ඤා"යි

ත්‍රිවිධ කුසල සංඥාවෝද නෛෂ්ක්‍රම්‍ය සංඥාදිහුමැයි. **එයින් වදාළහ**:—

"තිස්සො කුසලසඤ්ඤායො නෙක්ඛම්මසඤ්ඤා අව්‍යාපාදසඤ්ඤා අවිහිංසා සඤ්ඤා"යි.

ත්‍රිවිධ අකුසල ධාතූහුද කාමධාතු ව්‍යාපාදධාතු විහිංසාධාතු යන මොහුමැයි-**එයින් වදාළහ**:—

"තිස්සො අකුසලධාතුයො කාමධාතු ව්‍යාපාදධාතු විහිංසා ධාතු"යි.

ත්‍රිවිධ කුසල ධාතූහුද නෛෂ්ක්‍රම්‍යධාතු අව්‍යාපාදධාතු අවිහිංසාධාතු යන මොහුයි—**එයින් වදාළහ**:—

"තිස්සො කුසලධාතුයො නෙක්ඛම්මධාතු අව්‍යාපාදධාතු අවි

කිංසාධාතු''යි.

මේ යුගල පාඨවතුස්කය දික්සඟියෙහි දම්සෙනෙවි සැරියුත් මහ තෙරුන්වහන්සේ විසින් දෙසූ සංගීති සූත්‍රයෙන් සඞ්ග්‍රහකළ පාඨයෝයි. තවද ධම්නුකුලව මාගේ ප්‍රඥාවෙන් දක්නාලද ක්‍රමය කුදු මෙහි සඞ්ග්‍රහ කෙරෙමි, හේ කෙසේදයත්?

යම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙක් අසවල් සත්‍රියගේ රූපය යහපත් වන්නේය ඇගේ කථාව යහපත් වන්නේය ඇගේ ශරීරගන්‍ධය යහපත් වන්නේය ඇගේ හස්තයෙන් කරණලද සූපව්‍යඤ්ජන හෝ ඇමගේ තාම්බූල කවවරාදිය හෝ රස ඇත්තේය ඇගේ ශරීර සුඛශීය යහපත් වන්නේයයි කියා හෝ මෙබඳු කාමයක් පෙර මාවිසින් පරිභෝගකරණ ලද්දේයයි කියා හෝ මෙබඳු කාමයක් මතු කෙසේ ලබම්දැයි කියා හෝ අසවල් රජ යුවරජ ඇමති ආදිහු මෙබඳු පඤ්ච කාමයක් අනුභව කෙරෙතියි කියා හෝ කාමාස්වාද වශයෙන් සිතන්නේ විනම් මේද නිර්‍වාණයට විරොධව පෙණෙන බැවින් මිථ්‍යා කල්පනාවෙහි ඇතුළත්කොට හඟිමි.

තවද යමෙක් පැවිදිවීම නම් කකිඝවන්නේය දැලි හිසකෙස් බැහැමෙන් කඩකඩ කොට කපනලද රෙදි කඩින් වැසූ ශරීරයෙන් යුසි අශයක් නැත්තාවූ පණස දමුන ආදිවූ කසට දිසෙන් රුදී හෙයින් යහපත් වණීයක් නැත්තාවූ සිවුරු දරීමත් කකිඝවන්නේය, යපය කබලකින් හෝ මැටිපය කබලකින් හෝ දෙර දෙර සිට සිට සිහා ලද මුසු අහරින් ජීවත්වීමත් කකිඝවන්නේය, හෙද බ්‍රඹ්මාදි මහොත්තමයන් විසින් පිරුහෙයිනුත් මෙහැර අන්‍යයිසි පිළිවෙතකින් නිවණට නොපැමිණිය හැයි හෙයිනුත් උතුම්වූවද මා මෙබඳු උතුම්වූ කුලයෙහි ඉපද මෙබඳු සැපතින් වැඩි දෙරට අවුත් ඉල්වූවන්ට දුන්බවවුත් යමක්හුගේ දෙර සිට කිසිකලෙකත් කිසිවක් නොසිහා දුන් කෙසේනම් කබලක් ගත් අත් ඇතිව දෙරදෙර සිට් සිහමද, යහපත් සුවපහස් ඇති මාගමුන් හා සමග සුවදමල් අතුරණලද යහන් ඇති ගයි වැස කෙසේනම් අරණ්‍යයෙහි වෙසෙම්ද, පාකබලක් පිට බැඳගෙණ කෙසේනම් තනිව හැව්දිම්ද, අභිනව කථානෙක කලි ලදරුවෙකුසේ නොකිලන්වී කෙසේනම් යෙක් නොඉල්වා අල් පෙත්තාවෙන් දවස් යවම්ද, මාගේ මේ පචකාම සැපත හැර මෙබඳු කකිඝ පිළිවෙත් කෙසේනම් පුරම්දැයි යනාදි වශයෙන් නිහිගෙයි සිට කාමයෙන් නොමිදීමට සිතන්නේවිනම් හෙද නිර්‍වාණගාම්ණී පිළිවෙතට විරොධව පෙණෙන බැවින් මිථ්‍යාකල්පනාවෙහි ඇතුලත්කොට හඟිමි.

තවද යමෙක් ගෘහස්ථභාවයෙන් මිදී පැවිදිවුවද ආරණ්‍යවාසී මූලාදියට හියද මකුළුවන් යන මග නොකඩවන මකුළුහුයසේ

සිහිත් නොතබා පවකාමයෙහි පැවති කාමවිතර්කයෙන් යුක්තව වසන්නේවීනම් මේද නිවීණයට විරොධව පැණෙන බැවින් මිථ්‍යා කල්පනාවෙහි ඇතුලත්කොට හඟිමි.

තවද යමෙක් තුන්‌රුවන්ට කෙසේනම් අයස අකීර්ති අලාභ කෙරෙම්ද තුන්‌රුවන් සතු වැනුව කෙසේනම් සිද බිද ගණිම්ද දෙමව්පිය ගුරුවරයන්ට කෙසේනම් අයස අකීර්ති අලාභ කෙරෙම්ද රජ යුවරජ ඇමති ආදීන්ට කෙසේනම් අනාථ කෙරෙම්ද ඔවුන් ගේ ඉසුරෙන් කෙසේනම් පිරිහෙලම්ද, මාගේ සතුරුවූ අසවලාගේ අඹුදරුවන් ග්‍රාමක්ෂෙත්‍ර ගවමහිෂාදිහු කවරකලක නසිද්ද, ඔවුන් නසා කවරකලක සුවපත් වෙම්ද මාගේ සතුරුවූ අසවල්හුගේ ශිල්ප ශාස්ත්‍ර කෙසේ නසිද කවරකලක නසම්ද ඔහු මෙනම් ආයුධ යකින් මෙනම් විෂයකින් මෙනම් මන්ත්‍රයකින් මෙනම් ප්‍රයෝගය කින් කවරකලෙක නසම්දැයි යනාදී වසුයෙන් විතර්කණය කරන් නේවීනම් හෙද නිවීණයට විරොධව ඉපණෙන බැවින් මිථ්‍යා කල් පනාවෙහි ඇතුලත්කොට හඟිමි.

තවද යමෙක් අභොරාත්‍රියෙහි ඕපද චතුස්පදදීන්ට අසවල් වෘක්ෂයෙහිදී අසවල් කඳුරැළියෙහිදී අසවල් මාර්ගයෙහිදී මලසඳමියි කියා හෝ බොරුවලි කනමියි කියා හෝ විෂ කවමියි කියා හෝ දුන් සඳමියි කියා හෝ නිස ගල් ගෙලමියි කියා හෝ යනාදිවශයෙන් සිතන්නේ වීනම්ද, මෙරමා සතු වසතු සොරසිතින් ගණිමියි කියා හෝ මිථ්‍යාවාරයෙහි හැසිරෙමියි කියා හෝ මුසාවාදය කියමියි කියා හෝ රහමෙර බොමියි කියා හෝ යනාදිවසයෙන් සිතමින් නැවත නැවත විතර්කණය කරන්නේවීනම් හෙද මිථ්‍යාකල්පනා වෙහි ඇතුලත්කොට හඟිමි.

මේ ආදිවසයෙන් යි නොකි සියලුම යම් කල්පනාවෙක් දහමින් පිටත්ද ඇතී මොක්ෂයට බාධකද එබදු කල්පනාව මිථ්‍යාකල්ප නාවෙහි ඇතුලත්ව සැබෑ මොක්ෂයට බාධාවෙයි එබැවින් ඒ දුරු කටයුතු, යම් ගෘහස්ථයෙක් මේ ගෘහවාසයෙහි මාගේ විසීම නුසුදුසු වන්නේය, ඊට කාරණා කවරේද, ගෘහවාසයෙහි සිත එකඟකොට කුශලධර්මයට යොමුකොටගත නොහැක්කේය. කවර කාරණයක් හෙයින්දයත්? සඟරෙහි අක්මුල් නැත්තාවස් ගිහිගෙයිදු ෂක්මුල් නැති ක්‍රියාව ඇත්තේය. අඥානකවිධ අකුශලයට අවකාශව තිබෙන් නේය. මෙසේ අකුශලයට අවකාශ ඇති ගෘහවාසයෙහි කෙසේනම් වෙසෙම්දැයි යනාදින් ගිහිව සිරිමෙහි ආදීනව නුවණැසින් දකිමින් බඹසර්‍යාගාරයකින් නික්මෙන්නට සිතස්නක්හු මෙන් නැවත නැවත විතර්කණය කරන්නේවීනම් මෙබදු කල්පනාවද නිවීණයට

අවිරෝධව මාර්ගීයවිපෙණෙනබැවින් සම්‍යක්කල්පනාවෙහි ඇතුළත් කොට හනිමි.

තවද යම්කෙණෙක් අනුන්ගේ ග්‍රාමක්ෂේත්‍ර දාසිදාසාදි සම්පත් හා අනුන්ලබන ලාභසත්කාර වන්දනමානනාදිය දැකසතුටුවූ ඔවුන් විසින් පූර්ව්‍යාභියෙහි මනාකොට කරණලද සුචරිතයෙහි පිණින් ලද්දේය, මේ සම්පත්තීහු නොපිරිහී පුරපැළුවියෙහි වඩනා සඳහෙයින් වැඩෙන්වායි යනාදිවසයෙන් කල්පනාකරන්නේවිනම් මෙබඳු කල්පනාවද නිර්ක්ෂයට අවිරෝධව පෙණෙනහෙයින් සම්‍යක් කල්පනාවෙහි ඇතුළත්කොට හනිමි.

තවද යමෙක් බුද්ධාදි රත්නත්‍රයෙහි කෙසේනම් සරණ යෙමිදැයි කියා හෝ දැඟිබි මහබෝ පෙහිපිළිම කෙසේනම් කෙරෙමිද කරවම් දැයි කියා හෝ සඝයන් පවත්නා පිණිස පිටකත්‍රය කෙසේනම් ලියම්ද ලියවම්දැයි කියා හෝ ප්‍රාර්ථනා විහාරාදිය දැක කෙසේනම් මෙහි ප්‍රාර්ථනා ඉරවා යහපත් කෙරෙමිදැයි කියා හෝ දැනගිලාදිවූ දඟ පුණ්‍යක්‍රියා වස්තූන් කෙසේනම් පුරම්දැයි කියා හෝ බුද්ධාදි මහොත්තමයන් හළ අඝාසල් කෙසේනම් හරිම්දැයි කියා හෝ ඒ මහොත්තමයන්ගේ පිළිවෙතට කෙසේනම් ඇතුළත් වෙම්දැයි කියා හෝ පෙර බුද්ධාදි මහාභාග්‍යමයන් භජනය පර්‍යුපාසනය නොකළ හෙයින් අද දක්වා සසර සිටියෙම් දැන් කවර තරම් කුශලබලය කින්ද්‍රේ සුසුන් පවත්නා කාලයෙහි උපනිම්, යහපත්ව ලත්ම්නියත් බව සඵලකෙරෙම්යි කියා හෝ කෙසේනම් බොහෝ අවැඩට කාරණාවූ අසත්පුරුෂ සමාගමයෙන් දුරුවෙම්දැයි කියා හෝ කෙසේනම් බොහෝ වැඩට කාරණාවූ සත්පුරුෂ සමාගමයට එක්ව කුසල් රැස් කෙරෙම්දැයි කියා හෝ කවර උපායකින් දැන් මාකෙරෙහි පවත්නා ලොභචෙත මොහාදි අකුසල් නසම්දැයි කියා හෝ නැසූ අකුසල් කවර උපායකින් මාකරා නැවත වැද්ද නොදෙම්දැයි කියා හෝ කවර උපායකින් නොකළ කුසල් රැස්කෙරෙම්දැයි කියා හෝ රැස් කරණලද කුශලධර්ම්යන් කවර උපායකින් නොනස්නා පරිද්දෙන් රක්‍ෂාකොට ගණ්ම්දැයි කියා හෝ මාගේ දෙමව්පිය ගුරුවරයෝ මට නොමයක් උපකාර කලෝය, ඔවුන්ට කෙසේනම් මම සිත්සේ උපකාර නෙරම්දැයි කියාහෝ මාගේ ඥාතාඥාත මධ්‍යස්ථ සියලු සතුන්ට නෙසේනම් ඓහලෞකික පාරලෞකික සම්පත් සාදදි සුවපත් කෙරෙම්දැයි කියා හෝ මට උපකාරකල සත්වයන්ට කෙසේනම් ප්‍රත්‍යුපකාර කෙරෙම්දැයි කියා හෝ යනාදිවසයෙන් යම් යම් කල්පනාවක් තමහට හෝ පරහට හෝ ඉහලෝකයෙන් පරලෝකයෙන් අවැඩට අනර්ථයට නොවැවේද යම් කල්පනාවක් ඉහලෝක පර

ලෝක දෙකින් ආත්මාභිමානයට පරාභවයට වැටෙද එබදු කල්පනාව සම්‌ගීමොක්ෂයට මාර්ග පෙණෙන බැවින් සම්‌යක් කල්පනාවෙහි ඇතුළත්කොට දැක්කයුතු.

සම්මාවාචා යනාතන්හි සම්‌යක් වචනයට විරෝධවූ මිථ්‍යා වචනය හා සම්‌යක් වචනය යන දෙදෙනාගේ විභාග කෙසේදයත්? යමක් මුසාවාදයෙහි බියනැතිව ඇතිදෙය් නැතිලෙසකාට කීමත්හා නැතිදෙය ඇතිලෙසකාට කීමත්ද දුටුවා, නුදුටුම් නුදුටුවා දුරිම් යනා දිවසයෙන්ද මුසාවාද කියන්නේවීනම් අවිශ්වාසව වසන්නවුන් නැවතත් විශ්වාස නොවන ලෙසට හා විශ්වාසවූවන් හෙදවන ලෙසටත් මේ ආදීවසයෙන් පෛශුන්‍ය වචන කියන්නේ විනම්ද කණීයට කකිහවූ එරුෂ වචන කියන්නේවීනම්ද, හෙවත් තාෂේ මවි පියන්ගේ නම්ගහාත් මෙසේය ඔවුන් කෑ පි ලෙස මෙසේය මෙනම් කුලයක් දැරූය යනාදීන් එරුෂවචන කියන්නේවීනම්ද වෙහලෙහි ක පාරලෞකික අර්ථයව නැත්නාවූ සම්ඵප්‍රලාප දෙඩන්නේවීනම් මේද සඟිගීමොක්ෂයට බාධක වනබැවින් මිථ්‍යාවචන නම්වේ.

තවද යමක් බුබාදී රත්නත්‍රයෙහි අයුක්ති කියාද, ඉදමවිපිය ගුරුවරුන්ගේ අයුක්ති කියාද සත්‍යයන්ට ප්‍රාණඝාතාදී අකුශලයෙහි හැසිරෙණ ලෙසට අවවාද කෙරේද, කුසලධර්මයෙහි පිහිටි සත්වයන් එයින් පිරිහෙනලෙසට උපදෙස් කියාද, ශ්‍රද්ධාවන්තයන් අශ්‍රද්ධාවන්ට සුදුසු බස් කියාද, වීර්‍යවන්තාවූවන් අලසවනසේ කියාද සුශීලයන් දුශ්ශීල වනසේ කියාද යනාදීන් විසින් යම් යම් වචනයක් ආනාර්‍ය පරාභව නසා උභයලෝක උභයාගතට දායකවේද එබදු වචනය මිථ්‍යාවචනයෙහි ඇතුළත්වේ, යමෙක් මුසාවාදයෙන් දුරුව සත්‍ය වචන කියාද කේලාමෙන් දුරුව අසමගිවූවන් සමගිවනලෙසට සමගිවූවන් නොබිඳෙනලෙසට සුදුසුකොට කියාද, එරුෂවචනයෙන් දුරුව යම් වචනයක් කීකල සතුයන්ට නිර්දෝෂ හෙයින් කණීයට සුවද ප්‍රේම උපදවාද හෘදයඞ්ගමද සිවුමැලිද බොහෝ ජනයාට ප්‍රිය මනාප වේද එබදු වචනයක්ම කියාද, සම්ඵප්‍රලාපයෙන් දුරුව අර්ථාන්විතවූ ධර්මාන්විතවූ විනයාන්විතවූ වචනයක් කියාද මෙබඳු වචනය සඩගී නවාඝ ඝල්පත් සාදුදෙන හෙයින් සම්‌යක් වචනයයි වෙයි.

තවද යමෙක් බුදුහු අර්හත්ස්වභාව සම්‌යක්සම්බුද්ධ නෙයාර්ථකථා සංඝයා සුප්‍රතිපන්නයැයි යනාදීන්විසින් රත්නත්‍රයෙහි ගුණ කියාද, දෙමව්පියන් හා ගුරුවරයන්ගේ ගුණ කියාද දුටුදුටු සත්වයන්ව රත්නත්‍රයෙහි සරණ යනසේ කියාද, පඬුකුශවරිතයෙහි දශකුසලයෙහි ආනිසංසයන් කර්මයෙහි ආදීනව කියා එයින් සත්වයන් මුදා දුක්ඛාදී

කුශලධර්මයෙහි අනුගස් කියා එහි යමෙක් දන් කරවාද, ශ්‍රද්ධානැස්සවී යන් ශ්‍රද්ධාවෙහි පිහිටනසේ ප්‍රඥානැති කරවන්නේ ප්‍රඥාවෙහි පිහිටනසේ ඉන්ද්‍රියන් ශීලයෙහි පිහිටනසේ උපන් අකුසල් නැත්නාසේ නොවී පන් අකුසල් නූපදනාසේ නොවූපන් කුසල් උපදනාසේ උපන් කුසල් ථාවර වනසේ අසන්තසමාගමයෙන් දුරුවනසේ සන්තසමාගම යට පැමිණෙනසේ බාලයන් නොදකිනාසේ ප්‍රඥාවන්තයන් දකින්නාසේ අවවාද අනුශාසනා වශයෙන් කියාද, යම් වචනයක් කීකල ඇසුවන්හේ සිත්හි තුබූ බලවත් ලොභ බලවත් මොහ බලවත් මාන බලවත් මද මාන මාන්සයාදී අකුසල් ගුණි වේද, නමාගේ ලොභාදියන් මැඩපවතිද යම් වචනයක් කීකල ඇසුවන්ගේද තමාගේද අලොභ අදෝසාදී ගුණ සහස්‍රයන් වඩිද මේවදු වචන කීම තමන් වද අනුන්වද සිහි මොකෂයට මාගිව පෙණෙන බැවින් සම්‍යක් වචනයෙහි ඇතුළත්කොට දැක්කසුතු. වදුලේ මෙනෝ **සම්‍යක් වචනා** යෙහි විභාග මහාසතිපඨානෙ සූත්‍රයෙහි:—

"කතමා ච භික්ඛවෙ සම්මාවාචා මුසාවාදා වෙරමණී පිසුනා වාචා ඵරුසාවාචා වෙරමණී සම්ඵප්පලාපා වෙරමණී අයං වුච්චති භික්ඛවෙ සම්මාවාචා"යි.

සම්මාකම්මන්තෙනා යනහන්හි සම්‍යක් කර්‍මාන්තයට විරුද්ධවූ මිථ්‍යාකර්‍මාන්තයෙහිද සම්‍යක්කර්‍මාන්තයෙහිද විභාග කෙසේදයත්?

යමෙක් ප්‍රාණවධ කෙරේද, අදත් ආදින කෙරේද, කාමමිථ්‍යාචාරයෙහි හැසරේද, මේ මිථ්‍යාකර්‍මාන්ත නම්වෙයි. යමෙක් ප්‍රාණවධයෙන් විරති වේද, අදත් ආදිනඅයන් විරති වේද, කාමමිථ්‍යාචාරයෙන් විරති වේද, මේ සම්‍යක්කර්‍මාන්ත නම්වෙයි. **වදුලේ මෙනෝ**:—

"කතමෙ ච භික්ඛවෙ සම්මාකම්මන්තා පාණාතිපාතා වෙරමණී අදින්නාදානා වෙරමණී කාමෙසු මිච්ඡාචාරා වෙරමණී අයං වුච්චති භික්ඛවෙ සම්මාකම්මන්තා"යි.

සම්මාආජීවා යනහන්හි සම්‍යක් ආජීවයට විරුද්ධවූ මිථ්‍යා ආජීවය හා සම්‍යක් ආජීව යන දෙදෙනාගේ විභාග කෙසේදයත්?

සම්‍යක් ආජීවයතම් මිථ්‍යා ආජීවයෙන් දුරුව වියහීවශයෙන් පුරණ සම්‍යක් ආජීවයයි, මිථ්‍යා ආජීවයෙන් දුරුව වියහීවශයෙන් පුරන්නේ සම්‍යක් ආජීවයයි කියා සංඝේපවශයෙන් කීහයින් අනම බහුශ්‍රැතන්වයක් නැත්නවුන්ට යථාවබොධ නොවන්නේය එබැවින් මිථ්‍යාආජීවය හා මිථ්‍යාආජීවයෙහි ආදීනවද සම්‍යක් ආජීවය හා සම්‍යක්ආජීවයෙහි අනුසස්ද මෙහි යෙකවින් සංඛ්‍ය කෙරම්. කෙසේදයත්?

මිථ්‍යාආජීවයට ප්‍රත්‍යයවන්නේ වියදී වැඩීම් කුසීතබවය, හෙද අවවැදැරුම් වේ, භගවත් තිස්සුන්ට භාග්‍යාභාග්‍යයවූ කුසීතවයනු අනවක්මවි. කෙසේදයත්?

මේ සස්නෙහි භික්ෂූන් විසින් දැනැඹ මහඹෝ ආදියෙහි භෝ ආචාර්‍ය උපාධ්‍යායයන් හිලන් මහඵ ආදීන් කෙරෙහි භෝ කැවිනි ක්‍රියාවක් කළයුතු වන්නේය. කුසීතයන්ට එය සම්ප්‍රාප්තවූ කල්හි මෙබඳු සිහිවිල්ලෙක් වන්නේය. කෙසේදයත්:—

මාවිසින් මෙබඳු කර්මාන්තයක් කටයුතු වන්නේය කර්මාන්ත කරන්නාවූ මාගේ මේ ප්‍රඛුවාලවූ ශරීරය කලාන්ත වන්නේය, එහෙයින් මම සැතපෙමි කියා හෙතෙම සැතපෙන්නේය, අප්‍රාප්ත ගුණ ධර්මයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගත ගුණධර්මයාගේ අධිගමය පිණිස අසාක්ෂාත්කාත ගුණධර්මයාගේ සාක්ෂාත් ක්‍රියාව පිණිස වීර්‍යාරම්භ නොකරන්නේය, මේ ප්‍රථම කුසීත වස්තුවය, එයින් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් ඇමතූහ:—

"ඉධාවුසෝ භික්ඛවෝ භික්ඛුනා කම්මං කත්තබ්බං හොති තස්ස එවං හොති කම්මං බෝ මේ කත්තබ්බං භවිස්සති කම්මං බෝ පන මයා කත්තස්ස කායෝ කිලමිස්ස ති හඤ්ඤං නිපජ්ජාමී'ති සෝ නිපජ්ජති න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය ඉමං පඨමං කුසීතවත්ථුං"යි.

නැවත එසේම සම්ප්‍රාප්තවූ කර්මාන්තයක් කළහොත් ඒ කුසීත භික්ෂුහට මෙබඳු සිහිවිල්ලෙක් සිතෙන්නේය කෙසේදයත්? මේ වනාහි මෙබඳු දුෂ්කර කර්මාන්තයක් කොළුමි එසේ කරණලද කර්මාන්තඇති මාගේ ශරීරය කලාන්තවිය එහෙයින් මම සතප්පනමිසි කියා වීර්‍යාරම්භ නොකරන්නේය. මේ මිත්‍යාකුසීතවසතුවය එයින් වදුළහ.

පුනවපරං ආවුසෝ භික්ඛවෝ භික්ඛුනා කම්මං කතං හොති තස්ස එවං හොති අහං බෝ කම්මං අකාසිං කම්මං බෝ පන මේ කරොන්තස්ස කායෝ කිලමෙත්ථා හඤ්ඤං නිපජ්ජාමී'ති සෝ නිපජ්ජති න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය ඉදං දුතියං කුසීතවත්ථුං"යි.

නැවත එසේම මාගියෙකි යායුතුතැනෙක් සම්භවන්නේය එහිල්හි ඒ කුසීත භික්ෂුහට මෙබඳු සිහිවිල්ලෙක් සිතෙන්නේය කෙසේදයත්? මාවිසින් මාගියෙක යායුතු ගමනක් සම්ප්‍රාප්තවිය, මාගියෙහි ගවන්යන්නාවූ මාගේ ශරීරය වනාහි කලාන්ත වන්නේය එසේ හෙයින් මම සතප්පමි කියා සතප්පන්නේය වීර්‍යාරම්භ නොකරන්නේය මේ තෘතීය කුසීත වැතුවය.

ප්‍රනඃපරං ආවුසෝ භික්ඛූනා මඉඝා ගන්තබ්බා හොති තඤ්ඤ
එවං හොති මඉඝා බෝ ගන්තබ්බා භවිඤ්ඤති මඉඝං මඛා පන මේ
ගඡ්ඡන්තඤ්ඤ කායෝ යිලම්ඤ්ඤති හඤ්ඤං නිපඡ්ඡාම්'නි සෝ නිපජ්ජ
ති න විරියං ආරභති අප්පත්තඤ්ඤපත්තියා අනධිගතඤ්ඤ අධිගමාය
අසච්ඡිකතඤ්ඤ සච්ඡිකිරියාය ඉදං පඨමං සුඛිතවත්ථුං''යි.

නැවත එසේම මාඝයෙක ගමනක් ගියකල්හි මෙබඳු සිතිවිල්
ලක් සිතෙන්නේය කෙසේදයත්? මම වනාහි මෙබඳු දුෂ්කර
ගමනක් ගියෙමි දැන් එසේනොයින් මාගේ ශරීරය කලාන්තවිය විය
කොටි ගසාහෝ හෙමියි කියා සතප්පේය වීර්‍යාරම්භ නොකරන
නේය මේ සතරවැනි සුඛිතවඤ්ඤවය එසින් වදුළහ.

ප්‍රනඃපරං ආවුසෝ භික්ඛූනා මඉඝා ගන්තා හොති තඤ්ඤ එවං
හොති අහං බෝ මඉඝං අගමාසිං මඉඝං බෝ පන මේ ගඡ්ඡන්තඤ්ඤ
කායෝ යිලන්තා හඤ්ඤං නිපඡ්ජාම්'නි සෝ නිපජ්ජති න විරිය
ආරභති අප්පත්තඤ්ඤපත්තියා අනධිගතඤ්ඤ අධිගමාය අසච්ඡිකා
ඤ්ඤ සච්ඡිකිරියාය ඉදං චතුත්ථං සුඛිතවත්ථුං''යි.

නැවත ග්‍රාමයක හෝ නිගමයෙක හෝ පිඬුපිණිස හැසිරෙ
මේ යැපෙනලෙසට ලැබුවු හෝ ප්‍රණීතවූ හෝ භොජනයක් නොල
බන්නේය එකල්හි ඒ සුඛිත භික්ෂුවට මෙබඳු සිතිවිල්ලෙක් සිතෙ
නේය කෙසේදයත්? මම වනාහි ග්‍රාමාදියෙහි පිඬුපිණිස හියෙමි ලැබි
හෝ ප්‍රණීතවූ හෝ භොජනයක් යැපෙන පමණ නොලදිමි එම
යින් මාගේ ශරීරය කලාන්තවියයි කියා සතප්පේය වීර්‍යාරම්භ
නොකරන්නේය මේ පස්වැනි සුඛිතවඤ්ඤවය, එසින් වදුළහ.

ප්‍රනඃපරං ආවුසෝ භික්ඛූනා ගාමංවා නිගමංවා පිණ්ඩාය
නෙතා නලහති ලූඛඤ්ඤවා පණීතඤ්ඤවා භොජනඤ්ඤ යාවදත්ථං ප
පූරං තඤ්ඤ එවං හොති අහං බෝ නාමංවා නිගමංවා පිණ්ඩාය
නෙතා නාලත්ථං ලූඛඤ්ඤවා පණීතඤ්ඤවා භොජනඤ්ඤ යාවදත්ථං ප
පූරං නඤ්ඤ මේ කායෝ යිලඤ්ඤා අතම්මඤ්ඤං හඤ්ඤං නිපජ්ජ
යනුහෙයින් රූපස්කන්ධය පෙණපිඬකට බඳුවූ උපමා ඇත්තේය වේදනාස්කන්ධය දියබුබුලකට බඳුවූ උපමා ඇත්තේය සඤ්ඤස්කන්ධය මහඅවවෙහි පෙණෙන මිරිඟුදියට බඳු උපමා ඇත්තේය සංස්කාරස්කන්ධය කෙහෙල්කඳකට බඳු උපමා ඇත්තේය විඤ්ඤාණස්කන්ධය ඉඳුජාලයකට බඳුවූ උපමා ඇත්තේයි. රූපස්කන්ධය පෙණපිඬක් වැනිවූයේ කෙසේද? යම්සේ පෙණපිඬයි කිසි ප්‍රාර්ථනයක් නැත්තේද එසේ පාත්‍රයක් හෝ තලුඇටියක් හෝ චිත්පලින් ආදීවූ කිසිවක් හෝ කරමහි ඇරගත නොහැක්කේද ගත්තේ එබදු වැඩක් සිදෙන්නොකොට බිඳියන්නේද එමෙන් රූපස්කන්ධයද නිත්‍යයයි කියාවත් ධ්‍රුවයයි කියාවත් මමය මාගේය කියාවත් නුවණින් සිතාගත නොහැක්කේවේ, තවද යම්සේ පෙණපිඬ සිදුරුවී නොයෙක් සැඩදක්වා බොහෝ දියබරණ ඇටමැඩි කොඩයින් ආදිවූ නොයෙක් ප්‍රාණීන් ලඟිනා තැන්වේද එපරිද්දෙන්ම රූපස්කන්ධය මුඛනාසිකාදි කුඩාමහත් සිදුරුහා නොයෙක් අඟට නුහර සැඩ ගැලවී තක්කාටකය ගණ්ඩූපාදය තාලඟීරකය සුවි මුඛය පටතන්තුසූත්‍රය යනාදිවූ අසූකුල

සක පණුවන්ට ලකිහා ගේත්වේද දරුවදනාගේත් වේද වැසිකිළි යත්වේද නානගෙයත්වේද ගිලනගෙයත් වේද සුසානයත් වේද යම්සේ පෙණපිඩක් ආදියෙන් දඩබරගඩියක් පමණ ඇතිව අනුක්‍රම යෙන් ගඟාවයිහිවූ සමුද්‍රාදියෙහි පළිසකුට පමණින් මහත්වේද එප රිද්දෙන් රූපස්කන්ධයද පලමුවෙන් මාතෘකුක්ෂියෙහි හිමාලයෙහි ඝ්‍රාණපුපුටු නම් ප්‍රාණියක්හුගේ උදරරෝමයක් ප්‍රසන්න තලතල ගලා සත්විටක් ගැසූකල සත්වෙනි වාරයෙහි රොමාග්‍රයෙහි සිටි තෙල්බිඳු පමණවූ කලල රූපයක් ඇතිවේ. ඒ කලල රූපයෙහි ප්‍රතිසන්ධිවිඤ්ඤාණයත් අවගනී මෙසේ හටගත් ඒ ප්‍රතිසන්ධි විඤ්ඤාණය අනුක්‍රමයට හවාඟ සිත් තුදුසෙක් පහළවේ ඊට අනන්තරව මනොද්වාරාවජ්ජනය පහළවේ ඊට අනන්තරව ජවනයෙහි සත් කොළ උපදවමින් ආත්මග්‍රහණය කරවමින් ලොභසහගත සිත්පහළවෙ මෙසේ ඇතිවූ පහන් තලතෙලිත්තක් වැනිවූ ඒ පූර්වොක්තවූ කලලරූපය ක්‍රමයෙන් වැඩී සතියක් ගියකල්හි මස් දෙවි දියතතක් වැනිවූ අර්බුදවස්ථාවට පැමිණේ. දෙසතියක් ගිය කල්හි මේ අර්බුදවස්ථාවෙන් පෙරලී බොල්කොට පපු ලතුදිය තතක් වැනිපෙහි අවස්ථාවට පැමිණේ. තුන්සතියක් ගියකල්හි මේපෙහි අවස්ථාවෙන් පෙරලී මුරුතමල් කැකුලක්වැනි ඝණ අවස්ථාවට පැමිණේ, සිවසතියක් ගියකල්හි ශේදූමස් කැරියකැඟිලි පස්පොලක් වෙන් දෙඅත දෙපය ඉසතේරී ප්‍රශාඛාවස්ථාවට පැමිණේ ඉක්බිති පස්වෙනි සතියෙහි පටන් එකොළොස්වන සතිය දක්වා මෙදැතුරෙහි අතුල් පතුල් ඇඟිලි ඇස්මුඛ කන්නාසා කිස මඟ වසමග ආදියද ඉතාසුක්ෂමවූ ඇවිද ඉසකෙස්ද වෙරලොම්ද හටගෙණ ක්‍රමයෙන් වැඩී සම්පූර්ණවූ බඹයක් පමණවේ ගවමහිස හස්ත්‍යස්වාදීන්ගේ ශරීරවශයෙන් පණිතකුට ප්‍රමාණවේ මහමුහුදු මස් කැසබන්ගේ වශයෙන් තොයෙක් සියගණන් යොදුන් පමණවේ. තවද යම්සේ පෙණපිඬ හටගන් තොමැඟිත් නැසෙන්නාද මදක්නැන් හාසිනුත් නැසෙන්නාද මුහුදට ගිඳුනාල් ඒ කාණාවෙන්ම නැසෙන්නේද එමෙන් රූපස්කන්ධයද කලලාවස්ථාවෙහිත් නැසෙන්නේය. අර්බුදවස්ථාවෙහිත් නැසෙන්නේය පෙණි අවස්ථාවෙහිත් නැසෙන්නේය ඝනඅවස්ථාවෙහිත් නැසෙන්නේය ප්‍රශාඛාදි අවස්ථාවෙහිත් නැසෙන්නේය මවුකුසින් බිහිවූකලහිත් නැසෙන්නේය මන්දදසකයෙහිත් නැසෙන්නේය ක්‍රීඩාදසකයෙහිත් නැසෙන්නේය වණ්ණදසකයෙහිත් නැසෙන්නේය බලදසකයෙහිත් නැසෙන්නේය ප්‍රඥදසකයෙහිත් නැසෙන්නේය භාවන දසකයෙහිත් නැසෙන්නේය ප්‍රාග්හාර දසකයෙහිත් නැසෙන්නේය ප්‍රවිකාරදසකයෙහිත් නැසෙන්නේය මොළුහදදසකයෙහිත් නැසෙන්

නේය සුඛා දුඛතෝයෙහිත් නැතෙන්නේය මේඅතර නොනැසී සිටියේවී නමුත් සතාගුප්කයන්ගේ රූපය අවුරුදු සියයක් පිරුණුකල ඒකාන්තයෙන් බිඳේ මරුමුඛයට පැමිණ සුණුවිසුණුවේ එහෙයින් බුදුහු රූපස්කන්ධය පෙණපිඬකට බඳුවූ උපමා ඇත්තේයයි වදාළ සේකි. වේදනාස්කන්ධය දියබුබුලක් බදුවූයේ කෙසේද? දැම්සේ දිය බුබුල කිසි සාරත්වයක් නැත්තේ දුම්ලද ඇරගත නොහැක්කේද එයින් ඵලකයක් හෝ ආසනයක් හෝ අතුලි මුද්‍රිකාවක් හෝ කණි හූණක් හෝ කොටනත නොහැක්කේවේද එමෙන් වේදනාවද අසාරය දුම්ලිය නිත්‍යය ධ්‍රුවයයි සිතාගතනොහැක්කේවේ ගතත් එලස ස්ථිරව නොසිටී, තවද යම්සේ ඒ දිය බිඳුවෙන් නැංගාවූ බුබුල එතන එතනම නැසෙන්නේද බොහෝකලක් සිටින්නේ නොවෙයි එපරිද්දෙන් එක අසුරුසනක් පමණ කල්හි නොයෙක් සතලක්ෂණයන් සුඛදුඃඛාපෙක්ෂා වේදනා පහළව නැසෙන්නේ වේ, තවද යම්සේ දියබුබුල දිගපිටනැඟී ධූලිමල දියබිඳු දියරොම් එකතැන්කොට දැවැන්නාකාරවූ පියනක්මෙන් වටකොට ගන්නා වාතුව යයි යන කාරණා ඇතරකින් ඇතිවේද එපරිද්දෙන්ම වේදනාවද චක්ෂුඃස්පර්ශාදිද වේතුවය රූපාදි ආලම්බනය-ලෝභාදි කෙලසමලය චක්ෂුඃ ස්පර්ශාදි සපර්ශ ඝට්ටනය යන ඇතරකාරණයන් නිසා පහළවේ එහෙයින් බුදුහු වේදනාස්කන්ධය දියබුබුලක් හා සදෘශයයි වදාළ සේකි. සංඥස්කන්ධය මිරිගුදිය හා සදෘශවූයේ කෙසේද? යම්සේ ග්‍රීෂ්ම කාලයෙහි මහ අවුවෙහි පෙණෙන මිරිගුදිය වවලව් මහවතු රක රළි ගසන්නාසේ පෙණේද එමෙන් නිල්පැහැය රත්පැහැය යනාදීන් සලකුණුගන්නා සංඥාවද අනුභව පිණිස පොපිනී, තවද යම්සේ මිරිගුදිය පිරුණු පොකුණක්මෙන් පෙණී පිපාසාවෙන් පීඩිතවූ මෘගයන් වඩාකෙරේද එමෙන් මේ නිල්වන් රූපය මේ රන්වන් රූපය මේ යම්වන් රූපය සුඛය මනාපය සැපය නිත්‍යයයි ප්‍රශංසා කරවා සත්ත්වයන් වඩාකෙරෙයි, එහෙයින් බුදුහු සඥස්කන්ධය මිරිගුදිය හා සමානයයි වදාළසේකි, සංස්කාරස්කන්ධයද අසාර නිස්සාරාදීසෙයින් කදලිස්කන්ධයක් හා සදෘශවේ යම්සේ කෙහෙල් කඳින් කිසිවක්ෂණ ගොනැස් පලහන් පට්ටිකාදීවූ කිසි ශාඛ කම්මනාදියක් කොටගත නොහැකිවේද ගතත් ස්ථිරව නොසිටීද එපරිද්දෙන් සංස්කාරයෝද නිත්‍යය ධ්‍රුවය මමය මාගේයයි ග්‍රහණය කටයුත්තාහු නොවෙන්, තවද යම්සේ කදලිස්කන්ධය බොහෝ පතුරු දැසි සමූහවේද එපරිද්දෙන් සංස්කාරස්කන්ධය බොහෝ ධර්මරාශියෙක්වේ, තවද යම්සේ කදලිස්කන්ධයෙහි පිටපතුරු වෙන පැහැයක් වේද ඇතුළු පතුරුත් ක්‍රමයෙන් වෙනවෙන ආකාර ඇති

වේද, එපරිද්දෙන් වෙඤා සඳහිදි නානා යවහාව ඇති සමජඤ්ඤ ධම්මයෝ එක්ව සංස්කාරඤ්කඤ්ඛනම්වේ එහෙයින් බුදුහු සංස්කාරස්කඤ්ඛය කදලිස්කඤ්ඛයක්හා සදෘශයයි වදළසේකි. විඤ්ඤස්කන්ධයද අසාරඤ්ඡයෙන් ඉඤ්ජාලයක් වැනිවේ, හේ මකසේද යම්සේ ඉඤ්ජාලය මදකල් පැවත ඉතා ශීඝ්‍රව නැතිවේද ඊටවඩා ඉතාසඟහුගුණයෙන් විඤ්ඤයම ස්වල්පකාලයක් පැවත නැසෙන්නේවේද එකම විඤ්ඤයෙන් පුරුෂයා ආගච්ඡය ගිහේය සිවිඤ්ඤය උත්පන්නයයි වැටහෙන්නේය එනකල්හි වෙනසිතෙක්වේ යනකලිහි වෙනසිතෙක් වේ, සිවිනකල්හි වෙන සිතෙක්වේ හිඳිනා කාලාදියෙහිද වෙන වෙන සිත්වෙත්, තවද යම්සේ ඉඤ්ජාලය ඤඤජනයාව විඝිනමකාට කැටකැබිලිනි ආදී හිසිවක් රන්රිදී ඔණ්ඩුතුයයි ග්‍රහණය කරවාද එපරිද්දෙන් මේ විඤ්ඤස්කන්ධය නම්වූ විඤ්ඤයත් එකම විඤ්ඤයෙන් ආවාක්මෙන් ගියාක්මෙන් සිටියාක්මෙන් උපන්නාක්මෙන් සඤ්ඤයන් වඤාතෙරේ, එහෙයින් බුදුහු මේ විඤ්ඤස්කන්ධය ඉඤ්ජාලයකට බදු උපමා ඇත්තේයයි වදළසේකි.

තවද—රාශිවත් සාඤ්ඤවෙවව චක්‍රවත් මුඤ්ඤ චත්තඨා
සඤ්ඤෙඤ්ඤ පඤ්ඤ ප්‍රාණෙඤ රාතම ශබ්දඃ ප්‍රගීයතෙ.

කියා ෂට්ඛඤ්ඤ සංග්‍රහ නම්වූ බෞඩ තන්ත්‍රයෙහි කී ඛැරින් රාශිවත් ධාන්‍යරාශිය යවරාශිය මුද්ගරාශියයි කීකල ධාන්‍ය යව මුද්ගයන් හැර අන් රාශියක් නැත්තාක්මෙන්ද සාඤ්ඤවත් ඥංඤසාඤ්ඤය සඤ්ඤ සාඤ්ඤයයි කීකල හැල් ගොන් බඤ්ඤ පොදි වණික්ජනයාහැර අන්ක් සාඤ්ඤයයි යන ඳදයක් නැත්තාක්මෙන්ද චක්‍රවත් අලාතචක්‍රය රථ චක්‍රය කුලාලචක්‍රයයි කීකල මණ්ඩලාකාරයෙන් වලල්ලක්මෙන් වට ගිය ගිනිපෙනෙල්ල පෝරුකඩවිනා අන්චක්‍රයයි යන දෙයක් නැත්තාක්මෙන්ද මුඤ්ඤවත් මිටයයි කීකල අකුඵවාඝත්කල ඇඟිලිපසට මිටයයි යන ව්‍යවහාර මුත් ඇඟිලිහැර මිටයයි යන අන්වඤතුවක් නැත්තාක්මෙන්ද ස්කන්ධෙඤ්ඤ පඤ්ඤ රූපවෙදනා සඤ්ඤසංඤාර විඤ්ඤාණය යන පඤ්කඤ්ධයෙහි ආත්මඤ්ඤශබ්දඃ ආත්මඤ්ඤශබ්දය යන ව්‍යවහාර ශබ්දමාත්‍රයෙක් ප්‍රාණෙඃ ත්‍රුවණුත්තන් විසින් ප්‍රගීයතෙ, කියන්නා ලැබේ හෙවත් ව්‍යවහාර කරණ්ඤ ලැබේ, එහෙයින් මෙසේ සඩහාව. ධම්මරාශි මාත්‍රවූ ආත්ම ආත්මීය ශූන්‍යවූ ස්කන්ධපඤකයෙහි ඕමය මාඝය්ය යන විපරීත ග්‍රහණය නොකටයුත්තේයයි සම්මාඝවිකෝ දනි විභඞ්ගාඨකථා නම්වූ අටුවායෙහි කියනලදමැයි.

කිඤ්ඤඝය්

තත්‍ර රූපාදීනං ඵෙණපිණ්ඩාදිනි එවං ඤදිසතා වෙදිතබ්බා යථාහි ඵෙණපිණ්ඩා නිස්සාරෝවි එවං රූපම්පි නිච්චසාර ධ්‍රුවසාර අත්තසාර

විරහෙන නිස්සාර මෙව, යථා ච සො ඉමිනා පහතං වා ථාලකං වා කරිස්සාමා'නි ගහෙතුං නාසක්‍යා ගහිතොපි තමත්ථං නාසඩෙනි හිජ්ජ නෙව එවං රූපමිති නිච්චන්නි වා ධුවන්නි වා මමන්නි වා ගහෙතුං න සක්‍යා ගහිතමපි න තථා හිඩති අනිච්චං දුක්ඛං අනත්තා අසුභසඤ්ඤ ඛහොතී'නි එවං ඵෙණපිණ්ඩසදිසමෙව හොති, යථාවා පන ඵෙණපිණ්ඩො ජිරුදු වජිරුදු අනෙකසඤ්ඩ ඝපිතො බහුපායං උදකසපාදිනං පාණා නං ආවාසො එවං රූපඉපි ජිරුදු වජිරුදං අනෙකසඤ්ඩඝපිතං කුලව සෙනෙ වෙළු අසීනි සිම්කුලානි වසන්නි තදෙවතෙසං සුනිඝරම්පි වඩුවකුරුපි ගිලාතඝාලාපි සුසානම්පි. නතෙඅඤ්ඤත්‍ර ගණහා ගඛහ වුඝාතාදීනි කරොන්නි එවම්පිඵෙණපිඩ සදිසං.යථාව ඵෙණ පිණ්ඩා ආදිතොව බදරපත්තකමත්තානුභවා පුන අනුපු බ්බෙන පබ්බත කුව මත්තොපි හොති එවංරූපම්පි ආදිතො කලලමත්තං හුත්වා අනුපුබ්බෙ න ව්‍යාමමත්තමම්පි ගොමහිඝ ගජාදීනං වසන අඛ්ඛතකුටමත්ත මපි හොති මවඡකවඡඝාදිනං වසෙන අනෙකයොජනසතපපමා ණම්පි එවම්පිඵෙණපිඩසදිසං යථාවඵෙණපිණ්ඩා උත්තමතෙනා හිජ්ජති ඵථාකං ගණහිවා. සම්මදං පත්වා පන අවස්සඛමෙව හිජ්ජ නි එවමෙව රූපම්පිකලලභාවෙ හිජ්ජති අබ්බුදදිභාවෙපි අනතරා පන අභිජ්ජමානමපි වස්සසතායුකානං වස්සසතපරා අවස්සමෙව හිජ් ජති මරණමුඛෙ වුණණ විවුණණං හොති එවම්පි ඵෙණපිඩසදිසං' ය ථාපන බුබ්බුලා අසාරා එවං වෙදනා පි යථාව සො අඛඛලා අගඤ්ඤපගා න සක්‍යා තං ගහෙතුං ඵලකංවා ආසනං වා කාතුං, ගහිතගහිතොපිහිජ්ජතෙව එවං වෙදනාපිඅඛලාඅගඤ්ඤපගා නසක් කා නිච්චා'නි වා ධුවාතිවා ගහෙතුං ගහිතාපි න තථා හිඩති එවං අගඤ්ඤපගතායපි වෙදනා බුබ්බුලසදි සායථාපන තස්මිං තස්මි උදකබිඳුම්හි බුබ්බුලා උපජ්ජන්ති වෙවනිරුජ්ඣනිව න විරතිති කො හොති එවං වෙදනාපි උපජ්ජන්ති වෙව නිරුජ්ඣති ව නවිරති නිච්චා හොති එකවිත්තරාක්ඛණං කොටිසතසහස්ස සංඛා උපපජ්ජි ත්වා නිරුජ්ඣති, යථාව බුබ්බුලෝ උදකබිඳුංඋදකජලලකං ඛංකඩිත්වා පුථංඛත්වා ගහණාවානවා'නි චත්තාරිකරොජ්ඣානි පටිවඋපජ්ජ නි, එවං වෙදනාපි වජ්ජං ආරම්මණං කිලෙස ජාලං එස්ස ඛංඝටිව ඛාති චත්තාරි කාරණානි පටිවඋ උපජ්ජ;නි එවම්පි වෙදනා බුබ්බු යදිසා. සඤ්ඤාපි අසාරකඨෙන මරීචිකා සදිසා නඛි සක්‍යා. තං ගහෙතුං පිඛිතුං වා භාජනං වා පූරෙතුං තථා අගඤ්ඤපගඨෙන තදු ඛයම්පි වෙදනාසදිසමෙව අපිච යථා මරීචි විප්ඵන්දති සංජානුම්වෙ ගොවිය ඛායති එවං නීලසං ඝඤ්ඤාදිභෙද ඝඤ්ඤාපි නීලාදි අනුභව නත්ථාය එඳහි විප්ඵඳති යථාව මරීචි මහාජනං විපලම්භෙති පරි

ප්‍රණෙ වාපිචිය පරිපුණ්ණනදිවියදිසතීනි වදෙපති එවං සඤ්ඤපි විපල්ලෙමෙනි ඉදං නිලකං සුභං සුඛං නිච්චන්‍ති වදෙපති පීතකාදි සුපි එසෙවනයෝ එවං විපල්ලෙමෙනාපි මරිචි සදිසා. සඞ්ඛාරාපි අසාරකඤෙන කදලිඛඞ්ඛසදිසා තථා අගය්හූපගඤෙන යථෙවහි කදලිඛඞ්ඛතෝ කිචි ගහෙතුං නසක්‍යතා ගොපානසී ආදිනං අත්ථාය උපනෙතුං උපනීතම්පි න තථා හොති එවං සඞ්ඛාරාපි නසක්‍යතා නිච්චාදිවසෙන ගහතුං ගහිතාපි න තථා හොන්ති යථාව කදලි ඛඞ්ඛතෝ බහුවට්ටි සමොධානතා හොති එවං සංඛාරඛඞ්ඛොපි බහු ධම්මසමොධානතා යථාවකදලිඛඞ්ඛතෝ නානාලක්‍ඛණෝ අඤ්ඤසු සෙවහි බාහිරාය පත්තවට්ටියා වණ්ණා අඤ්ඤසු තතෝ අඛ්‍යන්ත රඛන්ධානං එවමෙව සංඛාරඛඞ්ඛොපි අඤ්ඤදෙව ඵස්සස්ස ලඛ්ඛණං අඤ්ඤං වෙතනාදිනං සමොධානෙත්වා පන සංඛාරඛඞ් ඛොත්වෙව වුච්චති'නි එවමපි සංඛාරඛඞ්ඛතෝ කදලිඛඞ්ඛ සදිසෙ විඤ්ඤණම්පි අසාරකඤෙන මායාසදිසං තථා අගය්හූ ඤෙන යථාව මායා ඉත්තරා ලහු පච්චුපඨානා එවං විඤ්ඤණං තංහි තතෝ පි ඉත්තරතරං වෙව ලහු පච්චුපඨානතරං ච තෙනෙව හි විත්තෙන පුරිසා ආගතෝ විය ගතෝ විය නිසිදන්‍තා විය හොති අඤ්ඤදෙ වෝ ගමනකාලෙ විත්තං අඤ්ඤං ගමනකාලාදිසු එවංපි විඤ්ඤණ මායාසදිසං මායාව මහාජනං වඤෙති යංකිඤ්චිදෙව ඉදං සුවණ්ණ රජතං මුත්තාමණිපි ගාහාපෙති විඤ්ඤණම්පි මහාජනං වඤෙති තං නෙව විත්තෙන ආගච්ඡන්තං විය ගච්ඡන්තං විය ඨිතංවිය නිසින්නං විය කඤ්ඤා ගහාපෙති අඤ්ඤදෙවව ආගමනෙ විත්තං අඤ්ඤංගම නාදිසු එවම්පි විඤ්ඤණං මායා සදිසං.

තවද මේ පඤ්චක්ඛන්ධයෝම සියලු සංසාර දුක්ඛයට පිහිටව සිටිත්; ඒ එසේමය දුවිමෙන් දරට ගහම කරණ ශ්‍රන්තක්මෙන් ආයුධ ප්‍රහාරයට ලක සෙයින් ඛංසමකසාදී පිඩාවට පිහිටවූ ගාරුප සෙයින් නිම්පනන සත්‍යලාභයන්ට අක්ෂත්‍රය සෙයින් ග්‍රාසාතක යන්ට ග්‍රාමය සෙයින් පඤ්චුපාදානක්ඛන්ධයෝම දුක්ඛයට පිහිටවෙන් ජාත්‍යාදීහු නානාප්‍රකාරයෙන් විබාධනය කරන්නාහු භූමියෙහි තෘණලතාදීන් සෙයින් වෘක්ෂයන් සෙරෙහි පුෂ්පඵලපල්ලව සෙ යින් උපාදානස්කන්ධයන්වද ජාතිය ආදි දුක්ඛය වේය ජරාව මධ්‍ය දුඃඛ වෙයි මරණ පරියොසානදුක්ඛ වෙයි මරණාවසානාභයහිවූ දුක් පහරින් පරිදහන වසයෙන් සොකදුක්ඛ වෙයි. ඒ අසහනවසයෙන් අනිසයින් විප්‍රලාපවසයෙන් පරිදෙවදුක්ඛ වෙයි. ඉක්බිත්තෙන් චිත්තාවෙන්වූ ශරීරඋහය ඉසාසය රුජාය යන මොවුන් කරණ ධාතුසංක්ෂොභය සංස්කාරය අනිෂ්ට ප්‍රාප්තව්‍ය සම්මෝහයාගයෙන් කයට

ආබාධනදුක්ඛය වන්නේය. ඒ දුක්ඛයෙන් බාධියමානවූ පෘථක්ජන යන්ට ඒ ප්‍රත්‍යයොත්පන්නවශයෙන් බාධනාකවූ දුක්ඛය දෙවැනි ත්‍යය නම්වේ; සොකාභිවාධියෙන් ජනිතවූ විසාදනසංඛ්‍යාත බැඟෑ බව ඇතුවුන්ගේ අනෙකානිජ්ඣායන දුක්ඛය උපායාසනම්වෙයි, මනොරථ විඝාතප්‍රාප්තියන්ට උපදනා ඉච්ඡාවිඝාත දුක්ඛය ඉච්ඡි තාලාභ දුක්ඛනම් වෙයි, මෙසේ නානාප්‍රකාරයෙන් උපපරික්ඛය මාතවූ උපාදානස්කන්ධයෝම දුක්ඛයයි කියන්නේ අක්ඛිරොග කණ්ණි රොගාදි වශයෙන් එකක් එකක් වර්ණනා කරතැබෙන්නේ නිරවශෙෂයෙන් වර්ණනාකිරීමට කාලයක් කල්පකොටි ගතවුවත් නිදු උසස් හ කලින් නොනිමිවන ඒ කාරණයෙන් සිඟලුම දුක්ඛය එක ජලබින්දුවක රස දක්වූකල්හි සියලු සමුද්‍රජල රසයන් මෙබඳු යයි හැඟෙන්නාසේ යම්කිසි පච්චක්ඛකරණක් ඇද්ද ඒ සියල්ලෙ හිම පැවති දුක්ඛයන් සාමාන්‍ය නිර්දෙසයෙන් සංඛේපනයකොට දක්වන්නාට සංඛේපයෙන් පඤ්චුපාදානක්ඛන්ධයෝ දුක්වන්නාහුයයි භාග්‍යවත්වූ සර්ඥ රාජරාජාත්තමයානන් වහන්සේ විසින් වදාරණ ලද්දේයයි යනුදු දක්වන්නට වදාළහ,

බුඛඝොෂ මහතෙරහු විශුද්ධිමාර්ගයෙහි

තථාහි ඉන්ධාම්ව පාවකො ලක්ඛම්ව පහරණානි ගොරූපම්ව ඛංගමකසාදයො ඛෙත්තම්ව ලායකා ගාමං විය ගාමඝාතකා උපාදාන ක්ඛන්ධපඤකමෙව ජාති ආදයො නානප්පකාරෙ බාධාමයනා නිණ්ණ නාදීනි විය භූමියං පුප්ඵඵල පල්ලවාදීනි විය රුක්ඛෙසු උපාදානක්ඛ න්ධෙසු යෙව නිබ්බත්තන්ති උපාදානක්ඛන්ධානඤ ආදි දුක්ඛං ජාති මත්ථකදුක්ඛං ජරා; පරියොසානදුක්ඛං මරණං, මරණන්තිකදුක්ඛ ඡායනෙන පරිඩය්හමානදුක්ඛං සොකො; තදුභයනතො ලාලප්පන දුක්ඛං පරිදෙවො. තතො ධාතුක්ඛොභ සංඛාත අනිඤ්ඤොඤඛ සමාගමාදිතො වෙදනා කායස්ස ආබාධනදුක්ඛංදුක්ඛං තෙන බාධිය මානානං පුථුජ්ජනානං තත්ථ පරිඤ්ඤත්තිතො බාධනදුක්ඛං දෙම නස්සං; සොකාභිවුඩ්ඩියා ජනිත විසාදනං අඤ්ඤතර දුක්ඛං උප, යාසං; මනොරථ විඝාතපත්තානං ඉච්ඡාවිඝාතදුක්ඛං ඉච්ඡිතා ලාභාති එවං නානප්පකාරතො උපපරික්ඛියමානා උපාදානක්ඛන් ධාව දුක්ඛානි යදෙතං එකමෙකං දස්සෙතුං වුච්චමානං අනෙක ගිරි කප්පෙහි නාසක්කා අනවසෙසතො වත්තුං; තං සබ්බම්පි දුක්ඛං එකජ්ජලබින්දු මත්තකල සමුද්දජ්ජලරසං විය යසසුකෙසුචි පචසුඋපාද නක්ඛන්ධසු සංඛිපිත්වා දස්සෙතුං සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛානි භගවා අවොචාසි.

මේ පවත්කතිඹයහි විනිශ්චයයි දුක්ඛසත්‍යවිනිශ්චය මෙතෙකින් දතයුතු. සමුදයනිර්දේශයහි වනාහි යම් මේ තෘෂ්ණාවක් තොමෝ පුනර්භවය කරන්නීද රූපශබ්ද ගන්ධරසාදී ඒ ඒ අරමුණහි ලග්නවන්‍යාවූ නන්දිරාගයෙන් යුක්තවන්නීද නන්දිරාගය හා සමඟ පවත්නීද ඒ ඒ භවයෙහි ඇල්ම පිපාසාවයෙන් තොසය කරන්නීද ඒ තෘෂ්ණා තොමෝ කවරක්වන්නීද කාමාස්‍රවදෘෂ්ටියන් පැවති කාමතෘෂ්ණාවය අටලොස් ප්‍රභේදයක් ඇති ශාස්වතදෘෂ්ටිය හා එක්වූ පැවති භවතෘෂ්ණාවය සුප්‍රසිද්ධ ප්‍රභේදයක්ඇති උච්ඡේදදෘෂ්ටිය හා එක්ව පැවති විභවතෘෂ්ණාවය යනමේ ත්‍රිවිධ තෘෂ්ණාව සමුදයසත්‍යනමින් වන්නේය. මේ සමුදය සත්‍යයෙහි නන්දිරාගය මස්වැදුල්ලක්සේකොට කියන්ට කාරණා ඇත්තේය. ඒ කවර අර්ථයකින් දයන්? මස්වැදුල්ල රජ බමුණු වෙළඳ ගොවි ආදිවූ බොහෝ සත්ත්වයන් විසින්ද කාන සොණ සිඟාලාදී නිරශ්වීනය යන බොහෝ සත්ත්වයන් විසින් ප්‍රාර්ථනා කරණ ලද්දීය. අවිද්‍යාමදයෙන් මත්වූ එසේම සත්ත්වයෝ රූපශබ්දාදීවූ ඒ ඒ අරමුණහි ඇලෙන්‍යාවූ නන්දිරාගයට පැමිණ භවප්‍රාර්ථනාකරනනාවූ යම්සේ මස්වැදුල්ල තිබ්නිබ්බිතැන ඇලේද එපරිද්දෙන් නන්දිරාගයෙන් සත්ත්වයන් භවයෙහි ලග්න වන්නාහ. දුකටපැමිණද උකටලි නොවෙන්නාහ. එහෙයින් නන්දිරාගයට මස්වැදුල්ලයයි කියනුලැබේ. එයින් වදලහ, කුමාරකාශ්‍යප ආර්ය්‍යරයන් වහන්සේට

විභංගසූත්‍රයෙහි

මංසපේසිනිඛා භික්ෂූ නන්දිරාගසඝාතං අධිවචනංයි. මෙයින් විනිශ්චයකරණලද්දේ සමුදයසත්‍යයයි දතයුතුයි. දුක්ඛනිරෝධ සත්‍යයට යොතක්සාඅයව තණ්හාය අසෙසවිරාග නිරෝධා ඝනාදීන් සමුදයනිරෝධයම කියනලද්දේය. කුමක්හෙයින්ද යත්? සමුදය නිරෝධවූ කල්හි දුක්ඛනිරෝධයවෙයි අන්පරිද්දෙකින් වන්නේය.

යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හා
පීතෙනාපි රුක්ඛෝ පුනරෙවරුහති
එවම්පි තණ්හානුසයෙ අනුහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනංයි.

යනුහෙයින් යම්සේ පණුවන් විදිමි සැත්පෑහැරීමි ආදිවූ උපද්‍රව රහිත කල්හි එහෙයින්ම ස්ථිරකල්හි ශාඛාදි ඡේදනයෙන් ඡින්නවූ වෘක්ෂය නොනැසුනු සෙයින් නැවතත් උපදිද එහෙයින්ම කාමරාගානුසය භවරාගානුසය සංඛ්‍යාතවූ තෘෂ්ණානුසය නොනා

කල්හි මේ දුක්ඛයද නැවත නැවත උපදනේය. මෙසේ යම්හෙයකින් සමුදය නිරෝධයෙන්ම දුක්ඛනිරෝධය වේද ඒ කාරණයෙන් දුක්ඛනිරෝධය දෙශනා කරන්නාවූ සම්බුදයන්වහන්සේ සමුදයනිරෝධයෙන් දෙශනාමකාට වදාළසේක. එසින් කිහ.

ඉනි යසමා සමුදයනිරෝධෙනෙව දුක්ඛං නිරුජ්ඣනි තසමා භගවා දුක්ඛනිරෝධං දෙසෙෂනතා සමුදයනිරෝධෙන දෙසෙසි.

ඒ එසේමය සිංහතෙමේ යමක්හු විසින් ශරය තමා කෙරෙහි විදුනාලදද ඔහු කෙරෙහිම නමාගේ බල දක්වයි, ශරයෙහි නොදක්වයි එසේම බුදුහු කාරණයෙහිම පිළිපදිති, ඵලයෙහි පිළිනොපදිති යනමේ අර්ථය දක්වනපිණිස 'සිහසමානවුත්තිනොනිතථාගතා තෙ දුක්ඛං නිරොධෙනතා දුක්ඛනිරොධව දෙසෙනතා මඤ්ඤි පරිපජ්ජනි න ඵල, යනු දක්වන ලදි. යම්සේ සුනඛයනමේ කිසි වක්හු විසින් කැරින් පහර දුන් කල්හි බුරමින් කැද මැඩගෙයි ප්‍රහාරදයකයා කරා නොදිවේ එසේම අන්‍ය තීර්ථකයෝ දුක්ඛය නිරුඛකරණ්ඣ කැමැත්තාහු කායකලමථයෙහිම යෙදෙති, කෙලෙස නිරොධයෙහි නොයෙදෙති යන මේ අර්ථය දක්වන පිණිස "සුවාන වුත්තිනයාපන අඤඤතිත්තියා" තෙ දුක්ඛං නිරොධෙනතා දුක්ඛ නි, රොධව දෙසෙනතා අත්තකිලමථානුයොග දෙසනාදිහි ඵලෙපවිපජ්ජනති නහෙතුමහි යනු දක්වනලදි. මෙසේ දුක්ඛනිරොධයට සමුදයනිරොධවසයෙන් දෙශනාකිරීමෙහි ඵප්‍රයොජනය වෙදිතව්‍යයි මේ වනාහි අර්ථයි. යො තසසායෙව තණහාය යතෙනාහි තාණණාව නාම පොනොභවිකයයි කියා කාමතාණණාදිවශයෙන් විභාගකල තාණණාවගේ විරාගයයි කියනු ලැබෙයි.

තසසායෙව තණහාය'නි තසසපොනොභවිකාහි වසා කාමතණහාදි වශෙන විභතතතණහාය විරාගො වුච්චති මගෙහා විරාගා විමුච්චනී නිහි වුත්තං විරාගෙනා නිරොධො විරාග නිරොධො අනුසයසමුග්ඝා තතො අසසවිරාගෙන නිරොධා අසස විරාග නිරොධො අථවා විරාගෙනි පහානං වුච්චති තසමා අසසසා විරාගා අසසසා නිරොධොනි එවමපඤ්ඤ යොජනා දඨබබා අඤ්ඤතෝපනසබබානෙව එතානි නිබබාණසස වෙවච්චනානි පරමත්ථතානි දුක්ඛනිරොධං අරි යසච්චනනි නිබබාණංවුච්චති යසමාපන තං ආඝම්ම තණහාවිරජ්ජනි වෙව නිරුජ්ඣනි ව තසමා විරාගොනිව නිරොධොනිව වුච්චති යසමාචත දෙවත:සසවාගාදයො හොනතී කාමගුණාලයෙසු වෙච්ඡ එකොපි ආලයො නතී තසමා වාගො පටිනිසසගගා මුතතී අනාල යෝ වුච්චතියි.

යනුවෙන් කල් විනිශ්චයද දතයුතුයි. ඒ මේ නිර්ණය සවිදුකඹ ඥානනියට ප්‍රත්‍යය වන බැවිනුදු සියලු කෙලෙස සන්තාප නැතිබැවි නිදු ඥානාලක්ෂණ ඇත්තේය. හඟ නැතිබැවින් නොගිලියෙන රස ඇත්තේය. හෙවත් අඩුනි බව කෘත්‍යයකොට ඇත්තේය. රසය කෘත්‍යය යනු එකාර්ථයි. මෙහද නොගිලිහෙන සම්පත් ඇත්තේය යන අර්ථයි අනාදිමත් සසර සිතිනෙනුදු නොදක්නාලද වීරූප බැවිනුදු දුටුකෙණහිම හය නොකරයි, කියනබඳුව අස්වය් කෙරෙයි, කෘත්‍යාර්ථයෙන් අස්වස්කරණ කෘත්‍යය ඇත්තේය. සකති නිමිත්ත නැතිබැවිනුදු රාගාදිනිමිත්ත නැතිබැවිනුදු අනිමිත්තෙහි වැටහෙන්නේයි. රාගාදි සමිප්‍රපව ව්‍යපගමනයට නිමිත්තබැවින් නිස්ප්‍රපව බව ඵලවත්නේය, එසිත් කිහ.

නයිදං සන්තිලක්ඛණං අට්ඨි නිරසං අසාසකරණරසං වා අනිමිත්තපට්ඨානං නිප්පපඤ්චපට්ඨානං වා-යි.

මේ මෙහි සංක්ෂේපය විස්තරය වනාහි විශුද්ධිමාර්ගයෙහි නිරෝධ සත්‍ය නිර්දෙශ කථාවෙන් බලා දතයුතුයි. දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපදාර්ය සත්‍යයෙහි චතුස්සත්‍යය ප්‍රතිවේධය පිණිස ප්‍රතිපන්නා යෝගීහුගේ නිවන් අරමුණු කොට ඇති අවිද්‍යානුශය සමුච්ඡේද කරණුවු ප්‍රඥාවක්‍රුප සම්‍යක්දර්ශනය නම්වේ, ඒ සම්‍යක්දර්ශී තොමෝ අවිපරීත වසයෙන් මනාකොට දුක්මලක්ෂණකොට ඇත්තීය තත්ත්වයෙන් ප්‍රකාශකරණ බව කෘත්‍යයකොට ඇත්තිය අවිද්‍යානාමැති අන්ධකාරය විධ්වංශනය කිරීම ප්‍රත්‍යුපස්ථාන සංඛ්‍යාත වැටහීම්කොට ඇත්තීය, එසිත් කිහ.

චතුසච්චපටිවෙධාය පටිපන්නසසයොගිනො නිබ්බාණාරම්මණං අභිඤානුසයසමුග්ඝාතකං පඤ්ඤාවුච්චති සම්මාදිට්ඨි සා සම්මාදස්සන ලක්ඛණා තපපකාසනරසා අවිජ්ජන්ධකාරවිධංසන පච්චුපඨානා-යි.

එසේම සම්‍යක් දෘෂ්ටින් සම්පූර්ණවූ දෘෂ්ටිඇතියහුගේ ඒ සම්‍යක් දර්ශනය හා සමප්‍රයුක්තවූ නාමඛන්ධාදි මිථ්‍යාසංකල්පයන් සමුච්ඡේදය කරණ සිත්හු නිවන්දකාටස්හි ආරොපනය සම්‍යක්කල්පනා නමිවෙයි, ඒ සම්‍යක් කල්පනා තෙමේ සිත්හු නිවන් අරමුණෙහි නැඹිව ලක්ෂණකොට ඇත්තේය අපීණයයි කියනලද නිවන් අරමුණෙහි මාගීසිත්හු අල්වන කෘත්‍යය ඇත්තේය. මිථ්‍යාසංකල්පනා වගේ ප්‍රහාණකිරීම වැටහීම්කොට ඇත්තේය, එසිත් කිහ.

තථා සම්පහාදිඛීනො තං සම්පයුත්තං මිච්ඡාසංකප්පසමුග්ඝාත වෙතසො නිබ්බාණං පටිපදාහිනිරොපනං සම්මාසංකප්පොසෝ සම්මා විතක්කාහිනිරොපන ලක්ඛණාඅපණා රසා මිච්ඡාසංකප්පපහාණ පච්චුපඨානොා-යි.

එසේමසම්‍යක්දෘෂ්ටියෙන් බලන්නහුගේද ඒ සම්‍යක්සංකල්ප නාමවෙන් සිත්හු නිවන් අරමුණෙහි ආරෝපනය කරණුවහුගේද සම්‍යක්දෘෂ්ටි සම්‍යක්සංකල්ප දෙදෙනා හා සම්ප්‍රයුක්තවූ චතුර්විධ වාක් දුශ්චරිතයන් සමුච්ඡේදකරණුවූ මිථ්‍යාවචනයෙන් විරති නොමෝ සම්‍යක්වාචා නම් වෙයි, ඒ සම්‍යක් වාචිතොමෝ විසංවාදනාදි කෘත්‍යය ඇති බැවින් රුක්ෂවූ අපරිග්‍රාහකවූ මුසාවාදීන්ට ප්‍රතිපක්ෂ බැවින් සහිත්ධර්මයෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් පරිග්‍රහකරණ ලකුණු ඇත්තීය. මිථ්‍යාවචනයෙන් වලක්නාබව කෘත්‍යයෙකොට ඇත්තීය. මිථ්‍යාවචනය ප්‍රහාණකිරීම ප්‍රත්‍යුපස්ථානකොට ඇතතීය **එසින් කිහ.**

නථාපසසතො විනකකයතො ච තං සම්පයුත්තානාච වච්දුච්චරිත සමුග්ඝාතිකා මිච්ඡාවාචාවිරති සම්මාවාචානාම සා පරිග්‍රහලකඛණා විරමණරසා මිච්ඡාවාචා පහානපච්චුපඨානා-යි.

ඒ මිථ්‍යා වචනයෙන් විරමණය කරන්නහුට ඒ සම්මාවාචාව හා සම්ප්‍රයුක්තවූ ප්‍රාණවධාදි මිථ්‍යාකර්මාන්තයන්ගේ සමුච්ඡේදයවූ ප්‍රාණවධාදීන් කෙරෙන් විරමණය සම්‍යක් කර්මාන්ත නම්වේ. මහ නෙම කායික ක්‍රියාව කිසිකටයුත්තක් උපදවන බැවින් සමුත්ථාන ලක්ෂණකොට ඇත්තේය. මහාඛෝත් දුරුබිපනයක්මෙන් සම්ප්‍රයුක්තධර්මයන් නගන ලකුණු ඇත්තේය, මිථ්‍යාකර්මාන්තයන් වැළැක්ම කෘත්‍යයකොට ඇත්තේය. ප්‍රාණවධාදී මිථ්‍යාකර්මාන්තය ප්‍රහාණකිරීම වැටහීමකොට ඇත්තේය, **එසින් කිහ.**

තථාවිරමතො තං සම්පයුත්තා මිච්ඡාකම්මන්ත සමුච්ඡේදිකා පාණාතිපාතාදි විරති සම්මාකම්මන්තා නාම ඉසා සමුත්ථානලක්ඛණා විරමණ රසා මිච්ඡාකම්මන්ත පහානා පච්චුපඨානා-යි.

ඒ යෝගීහුගේ ඒ සම්‍යක්වාචා සම්‍යක්කර්මාන්ත දෙදෙනාහට විශුද්ධිභූතවූ ඒ සම්‍යක් වාචාදීන් හා සම්ප්‍රයුක්තවූ කුශල ලපනාදීන් උපවෙජ්ජකරණුවූ සම්මාඅජීවයෙන් විරතියෙක්ඇද්ද මහ සම්‍යක් ආජීව නම්වේ, ඒ සම්‍යක් ආජීවය තෙමේ පිරිසිදුබව ලක්ෂණකොට ඇත්තේය සම්‍යගාජීවයෙන් ජීවමාන සත්වයන්ගේ මහා සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ මහා ජීවිතේන්ද්‍රිය ප්‍රවෘත්තිසංඛ්‍යාත ආජීවයාගේ හෝ ද්‍රුඩිය වේදනා නමැයි දතයුතුයි. මහා ආජීවය තේ ප්‍රවෘත්තිය කෘත්‍යයෙකොට ඇත්තේය, සම්‍යගාජීවයාගේ ප්‍රවෘත්තියෙහි පටන් මිච්ඡාජීවයා නොපවත්නා බැවින් බුඩ නිහිත නොවූ සම්‍යක්ජීවිතාවිතේන්ද්‍රිය ප්‍රවෘත්තිය ඝදයංජීවප්‍රවෘත්තිනමැයි දතයුතුයි මයත්. මිථ්‍යාජීවය ප්‍රහීණකිරීම වැටහීමකොට ඇත්තේහ, **එසින් කිහ.**

යා පනස්ස තෙසං සම්මාවාචා සම්මාකම්මන්තානං විසුඩ්හත්තා සම්පයුත්තා ච කුසලානං උපවෙඨිකා ඕවඡාජීවවිරති සම්මා ආජීවෝ නාම සෝ වොදානලක්ඛණෝ සඳ්දයාජීවපපවත්තී රසෝ මිච්ඡාජීවපහාන පච්චුපඨානෝ-ති.

ඉක්බිත්තෙන් සම්මාවාචාය සම්මාකම්මන්තය සම්මාආජීවයයි කියනලද සීලඛන්ධයයි පිහිටි ඔහුගේ සීලඛන්ධයට සුදසු ඒ සම්මා වාදීන් හා සම්ප්‍රයුක්තවූ කොසජ්ජසම්භෙදකවූ සම්මාකුසල විඩවං ගකදවූ යම් සම්‍යක් ව්‍යායාමයෙක් වීර්‍යාරම්භයෙක් ඇද්ද මේතෙමේ සම්‍යක් ව්‍යායාම නම්වෙයි, හෙතෙම නොපසුබැස්ම ලක්ෂණකොට ඇත්තේය. නොවුපන් අකුසලධර්මයන් නොවුපදවීමය උපන් අකු සලධර්මයන් නැසීමය නොවුපන් කුසලධර්මයන් ඉපදවීමය උපන් කුසලධර්මයන් වැඩිමය යන මොවුන් කෘත්‍යයකොට ඇත්තේය, මිථ්‍යාව්‍යායාමය නැසීම ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තේය, **එසින් කිහ.**

අථස්ස යෝ තස්සා සම්මාවාචා කම්මන්තාජීවසංඛාතෝ සීලඛන්ධෝ පනිධිතස්ස තදනුරූපෝ තංසම්පයුත්තෝච කොසජ්ජසම්භෙදකෝ විරියාරම්භෝ එස සම්මාවායාමෝ නාම සෝ පණිහ ලක්ඛණෝ අනු ප්පන්නාකුසලානුප්පාදනාදි රසෝ මිච්ඡාවායාමපහානපච්චුපඨා නෝ-ති.

මෙසේ සම්‍යක් ව්‍යායාම කරණ ඒ යොගීහට කායාදියෙහි ශුභා දීආකාරයන් ග්‍රහණවශයෙන් ප්‍රවෘත්තවූ ශුභසංඥව පුඵිඵමකොට ඇති අකුසල සඤ්ඤායෝම මිථ්‍යාසහි නම් වනබැවින් ඒ මිථ්‍යා සඤ්ඤා නිය නසන්නාවූ සිත්හුගේ අරමුණු සිහිනැතිනොවන බවක්ඇද්ද ඒ සම්‍යක් සතිනම් වන්නිය ඒ සම්‍යක්සති තොමෝ අරමුණු නොවි හිද වැටහෙන බැවින් අරමුණට එළඹ සිටිනා ලකුණු ඇත්තිය. අරමුණු සිහිනැති නොවන කෘත්‍යය ඇත්තය, මිථ්‍යා සඤ්ඤාවගේ ප්‍රහාණකිරීම ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තිය, **එසින් කිහ.**

තස්සෙවං වායමතෝ නං සම්පයුත්තෝච මිච්ඡාසති විනිඝ්ඨනකෝ චෙතසෝ අසමෙමාසෝ සම්මාසති නාම සා උපඨානලක්ඛණා අසම්මුස්සන රසා මිච්ඡාසතිපපහානපච්චුපඨානා-යී.

මෙසේ අනුත්තරසතියෙන් සංරක්ෂිතවූ විත්තයාගේ ඒ යථෝක්ත සම්ප්‍රයුක්තවූ මිථ්‍යාසමාධිය නසන්නාවූ විත්තෙකග්ග තාතොමෝ සම්‍යක්සමාධි නම්වේ, හෙතෙම අවික්ඛෙපලක්ඛණ ඇත් තේය මනාව පිහිටන බව කෘත්‍යයකොට ඇත්තේය. මිථ්‍යාසමා ධිය ප්‍රහාණය කිරීම වැලැක්වීමකොට ඇත්තාහුය, **එසින් කිහ.**

එවං අනුත්තරාය සනියා සංරක්ඛියමාන චිත්තස්ස හං සම්ප යුත්තාව විවිච්චසමාධි විඛංසිකා විතෙතකඝතා සම්මාසමාධි නාම ඉසා අවිතක්කපලක්ඛණා සමාධානරසා මිච්ඡාසමාධිප්පහානා පච්චුපට්ඨානෝ-යි.

මේ මෙහි ජාතිආදීන්ගේ විනිශ්චය වශයෙන් විනිශ්චය වෙදිතව්‍යයි. ඤාණකිච්චවසෙනා යනුයෙහි සත්‍යයන් අරහයා පවත්නා ඤාණයාගේ කෘත්‍යය වශයෙන් විනිශ්චය දතයුතුය යන අර්ථයි. ඒ එසේමය සත්‍යඥානය තෙමේ අනුබොධඥානය පටිබොධඥානයයි කියා විවිධ වෙයි. එහි අනුබොධ ඥානය නම් ප්‍රත්‍යක්ෂඥානාට නොදනුතුදු අනුශ්‍රවය අනුවදන්නා ඥාවණ අනුබොධඥාන නම් වෙයි. නොඉහත් නැවත නැවත උපදනා බැවින් පළමු පළමු උපන් ඥාවණ අනුවදන්නා ඥාවණය ප්‍රතිවෙධකරණ ඥාවණ පටිබොධඥාන නම්වෙයි. "චතුසච්චාභිසම්බුද්ධෝ සච්චානං අනුබුද්ධා අපපටිවිද්ධා,,යන තන්හි අනුබොධනම විදර්ශනාඤාණයෙහි ප්‍රතිවෙධඥානය මාර්ගඤාණයෙහි වනබැවින් මෙහිදා සත්‍යඥාන මිච්ඡාකොටකිහයි යෙත්, ඒ අනුබොධය පටිබොධය යන යුගළදෙක්හි අනුබොධඥානය ලෞකිකවූවක් අනුසාව ආකාර පරිවිතක් දිගි නිජ්ඣානබන්ති විසින් නිරෝධයෙහිදු මාර්ගයෙහිදු පවතී, ප්‍රතිවේධ ඥානය ලෝකොත්තරවූයේ නිවන් අරමුණුකොට පරිජානනාදී කෘත්‍යයවශයන් චතුසත්‍යයන් ප්‍රතිවේධ කෙරෙයි, **එසින් කිහ.**

ඤාණකිච්චවසෙනාති සච්චඤාණස්ස කිච්චවසෙනාපි විනිච්ඡයෝ වෙදිතබ්බොති අත්ථෝ දට්ඨබ්බෝ යථාසුඤං අනුබොධඤාණව පටිවේධ ඤාණඤ්ච තත්‍ථ අනුබොධඤාණං ලෝකියං අනුසාවාදිවසෙන නිරෝධෙ මග්ගෙව පවත්තති පටිවේධඤාණං ලෝකුත්තරං නිරෝධමාරම්මණං කත්වා කිච්චවසෙනා වත්තාරිපි සච්චානි පරිවිජ්ඣතීති-යි.

ඒ පරිජානනාදී කෘත්‍යය කිරීමෙන් පරිඥෙය්‍යාදීන් මෙන් සත්‍යයෝද ඒ ප්‍රතිවේධ ඥානයට ප්‍රකටවෙත්, මිථ්‍යාඥානප්‍රහාණාවෙන් සංස්කාරයන් කෙරෙන් පහිලියමාන මනස් ඇත්තානුව උපදනා මහානුභාව විසංඝාරවූ දුක්ඛනිරෝධය අරමුණුකොට දුක්ඛයද පිරිසිඳින්ය දුක්ඛඝන තාඥණාව පහවන්නේය නිරෝධයද සාක්ෂාත් කරන්නේය සභාවයෙන් ප්‍රකටවන ආදිත්‍යඝාමෙන් සම්මාසංකප්පාදීන් යම්ග පවත්නේය. මාර්ගයද වඩන්නේය. මෙසේ ඉහසින් ඉම් කෘත්‍යයන් කරණ ඥාවණ දෘඩාදියෙහි සම්මොහනිවාරිනයෙන් එක ප්‍රතිවේධනයෙන් චතුසත්‍යායන්ම ප්‍රතිවේධ කෙරෙයි දතයුතු,

එසින් වදලහ.

යෝ භික්ඛවේ දුක්ඛං පස්සති දුක්ඛසමුදයම්පි සෝ පස්සති දුක්ඛ නිරෝධම්පි පස්සති දුක්ඛනිරෝධගාමිනිපටිපදම්පි පස්සතීති-යි.

ඒ ප්‍රතිවේධ ඥානයාගේ පරිජානනාදී කෘත්‍යය ඇති සැණය විශුද්ධිමාර්ගයෙහි සැණදස්සනා විසුද්ධිකථාවෙහි කී ක්‍රමයෙන් ගත් මන්ය. යම් ලෞකිකවූ අනුලෝමඥාන කෙණෙක් ඇද්ද ඒ සුව මෙහි දුඃඛඥානය උත්පත්තියම විසින් පවත්නේ සංස්කාර පුඤ්ජාත්‍රවූ දර්ශනයෙන් සක්කායදිට්ඨිපරිග්‍රහනය වලක්නේය. සමුදයඥාණය හෙතුඵලසම්බන්ධයන්ගේ අවිච්ඡේදය දක්නාබැවින් ප්‍රතිඝනාභිනිවේ විසින් පවත්නා උච්ඡෙදදෘෂ්ටිය වලක්නේය, නිරෝධ ඥාණය හෙතු නිරෝධයෙන් ඵලනිරෝධය දක්නාබැවින් ශාශ්වත දෘෂ්ටිය වලක්නේය මාර්ගඥානය නත්ථිඅත්ථිකාරෙ නත්ථිපරෙකාරෙ නත්ථි පුරිසකාරෙ යනාදීන් අක්‍රියදෘෂ්ටිය වලක්නේය දුඃඛඥානය හෝ ධ්‍රුව සුභ සුඛානුභාව රහිතවූ සංඛාරයන් කෙරෙහිදු ධ්‍රුව සුභ සුඛානුභාව සංඛ්‍ය සංඛ්‍යාතවූ සමුදය ඵලවූ දුක්ඛයෙහි විපල්ලාසය වලක්නේය. "ඉස්සරො ලොකං පවත්තෙති සඤ්ඤි නිවත්තෙති සංහරතියි,, යනුවෙන් ඊශ්වර කාරණ වාදීහු කියති. "පධාන තො ලොකො ආවිභවති තමෝවව පලීයති,, යනුවෙන් ප්‍රධාන කාරණවාදීහු කියති.

කාලො කරොති භූතානි කාලො සංහරති පජා
කාලෙසුත්තෙසු ජාගර ති කාලෝහි දුරතික්කමොයි.

යනුවෙන් කාලවාදීහු කියත්, කණ්ඩගන්ගේ කපිඤ්ඤලාදීන් ගේ පරිමඬලභාවය මෙන් මෘගපක්ෂි ආදීන්ගේ විචිත්‍රභාවයමෙන් සවභාවයෙන් මේ ලෝකය වන්නේයයි සවභාවවාදීහු කියති, ආදි ග්‍රහණයෙන් අද්‍යතනලෝකය පවත්නාසේ යනාදී ගත්හු, මෙසේ අකාරණයෙහි කාරණාභිමානා වශයෙන් පවත්නා හේතුයෙහි විපල්ලාසය සමුදයඥාණය වලක්නේය. උද්දක ආලාරාදීන් මෙන් අරූප ලෝකයෙහිදු නිගණ්ඨයන් ලෝකාවපිකාවෙහිදු මොඝයයිගනනා නිරෝධ විපල්ලාසය නිරෝධඥාණය වලක්නේය. ඉඤ්ජිත තපීඝ ප්‍රහ්ලාදිබ දර්ශනාදී මිය අපවර්ගීනැතැයි නෙණ තථා ප්‍රවෘත්තිසංඛ්‍යාත කාමසුඛල්ලිකානුයොගය කෙසඤ්ඤවනාදී තපවයාවෙඳ ශෛලි කුක්කුටසීලාදිඳ ආනම පරිනාපනයෙන් මොඝයාගේ ඉඬිත්‍රවෙයි. කරණ කාමසුඛල්ලිකානුයොගය අත්තකිලමථානුශෝගය යන ප්‍රහෙදය ඇති අවිශුද්ධිමාර්ගය විශුද්ධිමාර්ගයයි ග්‍රහණවශයෙන් ප්‍රවෘත්තවූ උපායෙහි විපල්ලාසය මාර්ගඥානය වලක්නේය දක්වනලදමැයි.

විශුද්ධිමාර්ගය

යං පනෙතං ලොකියං තණ්ඩුකඛඥණං පරිග්‍රහානාභිභවපසෙන පවත්තමානං සක්කායදිට්ඨිං නිවත්තෙති, සමුදයඥණං උච්ඡෙද දිට්ඨිං, නිරොධඥණං සස්සතදිට්ඨිං මිච්ඡාඥණං අකිරියදිට්ඨිං, දුක්ඛ

ඤ්ඤං වා ධුව සුභ සුඛත්තභාව රහිතෙසු ඛන්ධේසු ධුවසුභසුඛත්ත භාවසඤ්ඤා සංඛානං එලෙ විපල්ලාසත්තං; සමුදයසඤ්ඤං ඉස්සර පධාන කාලයභාවාදිහි ලෝකෙ පවත්තතීති අකාරණෙ කාරණාභි මානපවත්තං හෙතුම්හි විපල්ලාසත්තං; නිරොධසඤ්ඤං අරූපලෝකෙ ලෝකාදිපිකාදිසු අපවග්ගභූත නිරොධම්හි පටිපත්තිං මග්ග සඤ්ඤං කාමසුඛල්ලිකඅත්තකිලමථානුයොගපපහෙදෙ අවිසුද්ධි මග්ගෙ විසුද්ධිමග්ගභාවෙන පවත්තං උපායෙ විපල්ලාසත්තං නිවත්තෙත්ති-යි.

අපිච ලෝකයයි කියනලද පස්කඳ කෙරෙහිදු ලෝකප භවයයි කියනලද ඒ පස්කඳුන් උපදන්නහු කෙරෙහිදු ලෝකසමුදයයි කියනලද ඒ පස්කඳුන්ගේ අපගමවූ නිවන්හිද තදුපායයි කියන ලද ඒ පස්කඳුන්ගේ අපගමයට උපායවූ මාර්ගයහිදු සත්ත්වතෙම් යම්තාක්කල් සත්‍යයන් නොදනිද ඒතාක්කල් මුලාවන්නෙය.

එසිංග් කිහ.

ලෝකෙ ලෝකපභවෙ ලෝකසමුදයෙ සිවෙ ච තදුපායෙ
සම්මුය්හති තාව නරෝ න විජානාති යාව සඩ්වානි-යි.

මේ ගාථාවෙහි "ලෝකෙ" යන්නෙන් දුක්ඛසත්‍යයද, "ලෝකපභවෙ,, යන්නෙන් සමුදයසත්‍යයද, "ලෝකසමුදයෙසිවෙ" යන්නෙන් නිරොධසත්‍යයද, 'තදුපායෙ' යන්නෙන් මාර්ගසත්‍යයද, සඞ්ග්‍රහවූ පරිදි සප්‍රාඥයන් විසින් සත්‍යක්‍රමයෙන් පිරික්සියයුත්ත, මේසේ චතුරාර්‍යසත්‍යයන් නොදැනීම ඤාණ කෘත්‍යයෙහුදු විනිශ්චය දතයුත්ත. **අඤාණාභිනිවෙසෙද** යනුවෙහි දුක්ඛසත්‍යයෙහි වනාහි තෘෂ්ණාව්‍ද අනාශ්‍රවධර්මයනුදු නම්බා සෙසු එකාසූ ලෞකික ධර්මයෝ ඇතුලත් වෙත්. සමුදය සත්‍යයෙහි අධ්‍යාත්මික බාහිරවූ චාදසායතන යන් කෙරෙහි කාම භව විභව තෘෂ්ණාවිසින් සහිත්වැදෑරුම්වූ තෘෂ්ණාවිචරිතයෝ ඇතුලත් වෙත්. නිරොධසත්‍යය එකක්ම බැවින් කිසිවක්හු නොදනුවැව අනාත්මයන් නැතිවෙ මාර්ගසත්‍යයෙහි සම්‍යක් දෘෂ්ටිවාරයෙන් විදර්ශනාප්‍රඥාව පැහැදුණු ප්‍රඥාබල ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෝ සංඛ්‍යාත වෙත්. විදර්ශනාප්‍රඥාදි බොධ්‍යාඞ්ගික ධර්මයන්ගේ කෘත්‍යය නොනැවිත් ඇතද ධර්මහේතුවෙන් එකක් බැවින් කිසිවක්හු සම්‍යක්දෘෂ්ටියෙහි සංග්‍රහවෙයි සම්‍යක්දෘෂ්ටි මුඛයෙන් තදනන්තරීයභාවය කියනලදුයි දතයුත්තුවෙත්. සම්‍යක්කල්ප ප්‍රදෙශයෙන් නෛෂ්ක්‍රම්‍ය චිතක්‍රිය අව්‍යාපාද චිතක්‍රිය අවිහිංසා චිතක්‍රිය යන ත්‍රිවිධ චිතක්‍රියෝ සංඛ්‍යාත වෙත්.

ලෝකියකුශලෙණ ආලොභ මෙත්තා කරුණාඋපෙඛ යාභවසෙන
නිත්තනා මඟහකුවිණ ලොභ ව්‍යාපාද විහිංසා සමුච්ඡේද වසෙනත
ඉයා එකොව වුත්තොා එසනයඝා සම්මාවාචාදිසු, යන්‍ත මෙයට

විශුද්ධිමාගී ථිකායි.

කාමවිතකියෙහි දෝස දැක ඒ නසන පිණිස ප්‍රතිපන්නායහට උපන් මාගීයෙහි විතකිය නෙකඛම්මවිතකිය නම්වෙයි සෙසු දෙවිතකියෝද එසේවැයි අශුභඛ්‍යාන පාදකකොට ඉපදවූ මාගීයෙහි එපකිය නෛෂ්ක්‍රම්‍ය විතකි නම්වෙයි, මෛත්‍රීඛ්‍යානපාදකකොට ඉපදවූ මගෙහි විතකිය අව්‍යාපාද විතකිනම්වෙයි, කරුණාඛ්‍යාන පාදකකොට් ඉපදවූ මගෙහි විතකිය අවිහිංසාවිතකි නම්වෙයි, ඕඝහ අ වාවෙහි කීහයි යෙත්, සම්‍යක්වාචා ප්‍රදේශයෙන් කථනයෙන් චතුර්විධ වාක්සුචරිතයෝ සංග්‍රහවත්, මුසාවාදදී චතුර්විධවාක් දුශ්චරිතයෙන්වන සතර විරතිහුම චතුර්විධ වාක්සුචරිත නම්වෙහි දන්නේ කායසුචරිතයෙහිදු මෙම නියාමි යෙත්, සම්‍යක්කම්මාන්ත ප්‍රදේශයෙන් ත්‍රිවිධ කායසුචරිතයෝ සංග්‍රහ වෙත්, සම්‍යඇජීව මුඛ යෙන් අපිස් සතොස් ගුණ ඇත්තාහට සම්‍යඇජීවය වන බැවින් අපපිවිජතා යනතුන්තාවෝද සංග්‍රහවෙත්, සියලු ඒ සම්මාවාචා කම්මනාජීවයන් භාවානන්තරයෙහිදු ජීවිතහේතුවෙනුදු ආයස්සයන් විසින් අනතික්‍රමණීයවූ ආයස්කාභාන සීලනම්වන බැවින් සීලයද ශ්‍රද්ධාභාජනයකින් ගතයුතු බැවින් සඞ්ඉන්‍රිය සඞ්බල ඡඞ්ඉන්‍රිපාද යන්ගේ අස්තිබාවයන් සීලයාගේ අස්තිබාව වන බැවින් සඞ්ඉන්‍රිය සඞ්බල ඡඞ්ඉන්‍රිපාදයෝ සංගෘහිත වෙත්, සම්මාවාචාදී සීලයන්ගේ ග්‍රහණයෙන් යම් ශ්‍රද්ධාභාජනයකින් ඒ සීලයෝ ගන්නාලෘබද්ද ඒ ශ්‍රද්ධාභාජනයද ගෘහි නම වේහුයි, ඒ ශ්‍රද්ධාවෙන් අනාන්‍යවූ සඞඉන්‍රිය සඞ්බලයෝ සංගෘහිත වෙත්, ඡඞ්ඉන්‍රිපාදය වනාහි ශ්‍රද්ධාගුණභෙයින් ඡඞ්ඉන්‍රිපාදයද තදනන්තගීතාවෙහියි දතයුතුයි, යෙන් සම්‍යක් ව්‍යායාම ප්‍රදේශයෙන් චතුර්විධ සම්‍යක් ප්‍රධානය හෙ විරිඉන්‍රිය වීර්‍යබල වීර්‍යඡඹෝඛ්‍යභය යන මොහු සංග්‍රහවෙත්. සම්‍යක්සතිය කීමෙන් චතුර්විධ,සතිපඨානය සතිඉන්‍රිය සතිබලය සතිසඹෝඛ්‍යඞඛය යන මොහු ඇතුලත් වෙත්, සම්‍යක්සමාධියගේ කීමෙන් සවිතක් සවිචාරාදි ත්‍රිවිධසමාධිය විතක්කිපාදය සමාධිඉන්‍රිය සමාධිබලය ප්‍රීති ප්‍රශ්‍රබ්ධි උපෙඤා සඹෝඛ්‍යභයෝ ඇතුළත්වෙත්, මෙසේ අනන්තගීත යන්ගේ ප්‍රභෙද විසිනුදු විනිශ්චය දතයුතුයි,

මේද දක්වන ලදමැයි විශුද්ධිමාගීයෙහි

අනෙකාගධාගං පභෙදා'නි දුතකසවවත්‍ථම් හි ඨපෙතා තණහා වෙව අනාදව ඩිඹම්ව සෙසා ඨබ්බධම්මා අනෙකාගතා සමුදය සච්

වෙ ඡත්තිංසතණ්හා විවරිතානි නිරොධසච්චමසම්මිස්සං මිගාදවූ
ච සම්මාදිට්ඨි මූළබන්ධ වීමංසිඩ්ඩාදි පඤ්ඤින්ද්‍රිය පඤ්ඤාබල ධම්ම
විචයසම්බොජ්ඣඞ්ගානි සම්මාසංකප්පාපදේසන තථා මනඤ්ඤම්ම
විඤ්ඤාණදේසා, සම්මාවාචාපදේසන චත්තාරි වචීසුචරිතානි, සම්මා
කම්මන්තාපදේසෙනතීනි කායසුචරිතානි. සම්මාඡීවමූළෙන අපපිච්ඡ
තා සන්තුට්ඨිතාච සබ්බසඞ්ඛතේසුවචා එතඤ්ච සම්මාවාචා කම්මන්තා
ජීවානං අරියකන්ත සීලත්තා සීලඤ්ච සඞ්ඛාතෙන පරිග්ගහෙන
තණ්හත්තා තෙසං අත්ථිතාය අත්ථිභාවතෝ සද්ධින්ද්‍රිය සද්ධාබල ඡන්දිඞ්
පාදා; සම්මාවායාමාපදේසෙන චතුබ්බිධ සම්මප්පධාන විරියින්ද්‍රිය විරි
යබල විරියසම්බොජ්ඣඞ්ගානි, සම්මාසති අපදේසෙන චතුබ්බිධ සති
පට්ඨාන සතින්ද්‍රිය සතිබල සතිසම්බොජ්ඣඞ්ගානි, සම්මාසමාධි අපදේ
සෙන සවිතක්ක සවිචාරාදයෝ තයෝ සමාධි, චිත්තසමාධි සමාධි
න්ද්‍රිය සමාධිබල පීතිපස්සද්ධිසමාධි උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගානි, අනන්තා
ඔධානි'ත්‍රි එව මෙත්ථ අනන්තාඔධානං පහඳපි චතින්ඛයෝ පෙදි
තම්බා-යි.

උපමාදෙසනා යන්නෙහි මේම චතුරාර්‍යසත්‍ය ධර්‍මයන් උපමා විසි
නුදු දත්‍යුතුය යන අර්‍ථයි, හේ කෙසේදයත්? දුක්ඛසත්‍යය තෙමේ
සංසාදන වසයෙන් පෙළෙන බැවින් භාරයක්මෙන් දත්‍යුතුය, සමු
දයසත්‍යය ඉතමේ ඒ ඒ භවඅයගි උපදනා දුක්ඛයට හෙතුවන බැ
වින් භාරයාගේ ගැන්මක්මෙන් දත්‍යුතුය, නිරොධසත්‍යය ප්‍රවෘත්ත
දුක්ඛයාගේ වූපශමනයක් බැවින් භාරය බහාතිබීමක් සෙයින්
දත්‍යුතුය. මාර්ගසත්‍යය ප්‍රවෘත්තදුක්ඛ වූපශමයට හෙතු බැවින්
භාරය බහාතබන්ට කරණ උපායක් සෙයින් දත්‍යුතුය, **අපිච**, පිඩා
කරණ අර්‍ථයෙන් දුක්ඛසත්‍යය රොගයක් සෙයින් දත්‍යුතුය, ප්‍රභව
ලක්ඛණ බැවින් සමුදයසත්‍යය රොගයාගේ උත්පත්තියට කාරණ
යක් නිදානයක් බඳුය, නිරොධසත්‍යය ශාන්ත ලක්ඛණ බැවින් සුව
බවක් රොගවූපශමයක් සන්සිඳීමක් දුක්ඛහෙතුවගිදුනාබැවින්
රොගයාගේ අපගමයක් බඳුය උපසමනයට උපාය බැවින් මෙනයීා
ණිකලක්ඛණ මාර්ගසත්‍යය බෙහෙදක් බඳුය. **අපිච** බාධක බැවින් දු
කඛසත්‍යය දුබ්බිඤ්ඤයක් බඳුය ප්‍රභව සභාව බැවින් සමුදයසත්‍යය
වෑළියක් විසම වඤ්චකයක් බඳුය, නිරොධසත්‍යය ශාන්තාලක්ඛණ
හෙයින් සුබබැවින් සුභිඤ්ඤයක්බඳුය, දුක්ඛඅහතුව සිදුනාබව හෙයි
නුදු ඔහුගේ අපගමයට උපාය බැවිනුදු නියාීණලක්ඛණ මාර්‍යසත්‍යය
සුවඤ්ඤියක් බඳුය.

මේද දක්වනලදමැයි.

උපමානෝ'ති භාරෝ විය ඉි දුක්ඛසච්චං දුක්ඛං භාරාදුනම්ව
සමුදය සච්චං, භාර නික්ඛිපනං විය නිරොධසච්චං, භාරනික්ඛි

පහූපායෝ විය මඟසච්චං රොගොවිය දුක්ඛසච්චං රොගනිදානම්ව සමුදය සච්චං රොගවූපසමෝ විය නිරෝධසච්චං හෙසජ්ජම්ව මඟ සච්චං දුබ්භික්ඛම්ව වා දුක්ඛසච්චං දුබ්බිධිවිය සමුදයසච්චං සුභික්ඛ ම්ව නිරොධ සච්චං සුවුට්ඨිවිය මඟසච්චං අසිමි.

වෙරිවෙරමූලවෙරසමුග්ඝාතවෙරසමුග්ඝාතූපායෙති විසරුක්ඛ රුක්ඛමූල මූලූපච්ඡේද තදුපච්ඡේදූපායෙති හය හයමූල නිඛාය තදති ගමූපායෙති ඔරිමතීර මහොඝ පාරිමතීර තං ඇළපාපකවායාමෙති ව යොජේත්වා පෙතානි උපමාතො වේදිතබ්බානි'යි.

දක්වනලද උපමා වශයෙන්ද මෙසේ එතුරායෑ සත්‍යයන්ගේ විනිශ්චය දතයුත්තේය, දෙවෙනි පාඨපඬිපත්තියෙන් දැන්වූ උපමා වන් අතුරෙහි වෛරනම්, ව්‍යාපාදයයි ප්‍රතිපක්ෂබවහෝයි වෛරමූල නම් ආඝාතය වසතුයි වෛර. සමුග්ඝාතනනම් වෛර සන්නිදීමස මෛත්‍රියහෝයි. වෛරසමුග්ඝාතූපාය නම් සංග්‍රහ වසතුයි. **චතුඝාත හෝ** යන්නෙහිද **සුඝාතඝාතෝ** යන්නෙහිද විනිශ්චය තිඝණ්ඩිවාඹී යෙහි ආඝාතයෙන් දතයුතු. **එකන්ධාදිනි** යන්නෙහි විනිශ්චය කෙසේදයත්? මෝඨුන්කෙරෙහි සියලුම දුක්ඛස්කන්ධ ප්‍රවෘත්ති බැවින් එකවිධංවෙයි, නාමරූපවශයින් ද්විවිධංවෙයි, කාමූපපත්ති භවය රූපූපපත්තිභවය අරූපූපපත්තිභවය යන ප්‍රභේද වශයින් ත්‍රිවිධ වෙයි, මෙයින් විඤ්ඤාණස්කන්ධයන්ම දුක්ඛසත්‍යය බවකිව්, සතරආහාර ප්‍රත්‍යය වශයින් චතුර්විධංවෙයි, මෙයින් කබලිංකාරාදි සතර ආහාර විහාර විශෙෂයන්ද අන්‍යාවහරණීය වසතුය සවඩායතනය අවිද්‍යායෙ අභිසංඛාරයයි කියනලද නත්ථිප්‍රත්‍යයවූ ධම් විශෙෂ යන්ද ඔජාෂ්ටමක රූපය වෙදනාය ප්‍රතිසන්ධිස්කන්ධය නාමරූපය යන තනතිවාතත ධම් විශෙෂයන්ද යංග්‍රහකලේ ප්‍රවෘත්තිද දුක්ඛයට ප්‍රවෘත්තික බැවිනැයි දතයුතු පඤ්චොපාදානස්කන්ධභෙද යෙන් පංචවිධංවේ.

එයින් කිම.

සබ්බමෙවවෙච්ඡ **දුක්ඛං** එකවිධං පවත්තිභාවතො, ද්විධං නාම රූපතො, තිවිධං කාමරූපාරූපූපපත්තිභාව භෙදතෝ චතුබ්බිධං චතු ආහාරභෙදතෝ පවවිධං පඤ්චූපාදානක්ඛන්ධභෙදතෝ-ඔ.

සමුදය සත්‍යය දුක්ඛය පවත්වන බැවින් එකවිධංවෙයි, දෘෂ්ටිය හා සම්ප්‍රයුක්තය අසම්ප්‍රයුක්තය යන ප්‍රභේදයෙන් ද්විවිධංවෙයි, කාම තෘෂ්ණාවය භවතෘෂ්ණාවය විභවතෘෂ්ණාවය යන භේදයෙන් ත්‍රිවිධ වෙයි. සතරමාගීයෙන් ප්‍රහාතව්‍ය බැවින් සතරමාගීයන්ගේ භෙද යෙන් චතුර්විධ වෙයි. රූපාදිපඤ්චස්කන්ධයෙහි අභිනන්දන වශයෙන් හෝ රූපාලම්බනාදි වශයෙන් හෝ පඤ්චවිධංවෙයි, ඡවිතෘෂ්ණා කාය භෙදයෙන් ඡවිධ වෙයි. මෙහි රූපතෘෂ්ණාදිග්‍රහ ප්‍රත්‍යෙකයෙන් අනෙක භෙද භින්න හෙයින් තෘෂ්ණාකාය නම්වෙත් ඔවුන්ගේ භෙදයෙනැයි සේසි,

එසින් කිහ.

සමුදයොපි එකවිධො පවත්තකභාවතො, දුවිධො දිට්ඨසම්පයුත්තා සම්පයුත්තතො, තිවිධො කාම භව විභව තණ්හා භෙදතො, චතුබ්බිධා චතුමග්ගපහෙතබ්බතො, පඤ්චධො රූපාභිනන්දනාදි භෙදතො, ඡබ්බිධො ඡතණ්හා කායභෙදතො-යි.

නිරොධය තෙමේ අසංඛත ධාතුභාවයෙන් එකවිධවෙයි. පයිරුදාසයයි කියනලද ව්‍යවහාර වශයෙන් වනාහි සොපාදි ශෙෂ අනුපාදි ශෙෂ වශයෙන් ද්විවිධවෙයි. මෙහි "උපාදෙතීති උපාදියතීති උපාදි,, උපාදනයන් විසින් ගන්නාලැබෙනුයි (උපාදනස්කන්ධපඤ්චකය) උපාදි නම වෙයි. තන්නිස්සරණවූ නිර්‍වාණය උපාදනස්කන්ධපඤ්චකය ව්‍යුපශමනය කෙරේනුයි ඔහුගේ පශ්චිමචිත්තය දක්වා ශෙෂතාවද එයින් මතුනැති අනවශෙෂතාවද නිසා සොපාදිශෙෂ නිර්‍වාණධාතුය නිරුපාදිශෙෂ නිර්‍වාණධාතුයයි ද්විවිධයයි ව්‍යවහාර කරණු ලැබෙයි. සම්සේ මේ භෙදය ව්‍යවහාර වශයෙන් වේද එසේම සෙසු භෙද යෝත් වෙතියි දක්වන පිණිස **නිර්‍විධො** යනාදින් කියනලදැයි යෙන්, භවත්‍රය ව්‍යුපශමනය කරණ හෙයින් ත්‍රිවිධවේ සතරමාර්ගයෙන් පැමිණියයුතු බැවින් චතුර්විධ වෙයි, රූපාභිනන්දනාදී පඤ්චාභිනන්දනයන් සන්තිවූවන බැවින් පඤ්චවිධවෙයි, තණ්හාකායක්ෂය භෙදයෙන් ෂට්විධ වෙයි,

එසින් කිහ.

නිරොධොපි එකවිධො අසංඛත ධාතුභාවමතා පරියායෙන ද්විවිධො සඋපාදිශෙෂ අනුපාදිශෙෂතතා, තිවිධො භවත්තය වූපසමතො චතුබ්බිධා චතුමග්ගාදි ගමනීයතතා, පඤ්චධො පඤ්චාභිනන්දන වූපසමතො ඡබ්බිධා ඡතණ්හා කායක්ඛය භෙදතො-යි.

මාර්ගසත්‍යයද භාවිතව්‍ය බැවින් එකවිධවෙයි, සමථවිදර්ශනාදි බැවින් ද්විවිධවෙයි, මෙහි සම්මාදිට්ඨි සම්මාසංකප්ප දෙදෙන ප්‍රඥස්කන්ධය හ ඉතරයෝ සමථස්කන්ධය සීලයද සමථයට උපකාර බැවින් සමථ ග්‍රහණයෙන් ගත්නා ලැබෙයි ඔවුන්ගේ අභිප්‍රායයි යන වය වශයෙන් ලබ්ධවූ මාර්ගය සමථ විදර්ශනායයි ආගමන වශයෙන් භෙදකියනලදැයි දතයුතු විදර්ශනාමාර්ගය භාවනාමාර්ගය යන භෙදයෙන් හෝ ද්විවිධවෙයි. ශීලස්කන්ධය සමාධිස්කන්ධය ප්‍රඥස්කන්ධය යන ස්කන්ධත්‍රය් භෙදයෙන් ත්‍රිවිධ වෙයි. ශ්‍රොතාපත්තාදී මාර්ග වශයෙන් චතුර්විධවෙයි.

එසින් කිහ.

මග්ගොපි එකවිධො භාවෙතබ්බතතා, දුවිධො සමථවිපස්සනා භෙදතො දස්සනභාවනා භෙදතොවා, තිවිධො ඛන්ධත්තය භෙදතො චතුබ්බිධා සොතාපත්තාදී මග්ගවසෙන-යි.

අනිකුදු, සියලුම සත්‍යයෝ අවිතථබැවින් නිබාරුබැවින් එක විධවෙයි, අභිමුඛකොට ප්‍රත්‍යක්ෂවශයෙන් දතයුතු බැවින් හෝ විශි ෂ්ටඥනයෙන් දතයුතු බැවින් හෝ එකවිධවේ. දුක්ඛසමුදය දෙදෙ නා ලෞකික වශයෙන්ද නිරෝධමාර්ග දෙදෙනා ලෝකොත්තර වසයෙන්ද හැඟෙන බැවින් ලෞකික ලෝකොත්තර විසින් හෝ ද්විවිධවෙයි. නිරෝධය අසංඛතය සෙස්ස සංඛතයයි කියා හෝ ද්විවිධ වෙයි, දර්ශනාදී විසින් ත්‍රිවිධවෙයි. පරිඥේඥය්‍ය පහාතබ්බ සච්ඡි කා තබ්බ භාවෙතබ්බ භෙදයෙන් චතුර්විධවෙයි,

එසින් කිහ.

අපිව සබ්බානෙව සච්චානි එකවිධානි අවිතථතතා අභිඤ්ඤෙය්‍ය ත්‍යා වා. දුවිධානි ලෞකිය ලෝකුත්තරතෝ සංඛතාසංඛතතෝ වා තිවිධානි දස්සනභාවනාහි පහාතබ්බතා අපපහාතබ්බතා ව චතු බ්බිධානි පරිඤ්ඤෙයනාදි භෙදතෝ-යි.

මෙසේ එකවිධාදි භෙදයෙන් විනිශ්චය දතයුතුයි.. **සභාග විසභාගතෝ** යන්තෙහි සියලු සත්‍යයෝම අවිතථ බැවින්ද ආනවිඤ්ඤත්‍ය බැවින්ද දුෂ්කරවූ ප්‍රතිවෙධ ඇතිබැවින්ද සදෘශයෝය. ඒ එසේමය යමෙක් දුරුතෙනකසිට කෙසි සිදුරෙන් ශරය විදිද භෙද පළමුයන ශරපොංඛයහි හෙවත් දැත්තෙහි පසුපසුව විදි ශර යෙහි ශරතුඩ නොවරදවා විදිද යමෙක් හෝ සියක්වරක් ඉරන ලද අස්ලොමෙහි කෙලිවරින් වැදී අනික් කෙළවරින් නික්මෙන ලෙසට ප්‍රතිමුඛභාවයෙන් විදුනේද මෙයටත් වඩා චතුස්සත්‍යය ඇති ලෙස දැනගැන්ම දුෂ්කර වන්නේය,

වදුලේ මැනෝ.

තං කිම්මඤ්ඤසි ආනන්ද කතමන්නුඛෝ දුක්කරතරංවා දුරභි සම්භවතරං වා යොවා දූරතොව සුඛුමෙන තාලවණ්ඨලෙන අසනං අනිපාතෙත්‍ය පොංඛානුපොඛං අවිරාධිතං යොවා සතධාභින්නස්ස වාලස්ස කොටියා කොටිං පටිවිජ්ඣෙය්‍යානි එතදෙවභන්තෙ දුක්කර තරඤෙව දුරභිසම්භවතරඤ්ච යෝ සතධාභින්නස්ස වාලස්ස කොටියා කොටිං පටිවිජ්ඣෙය්‍යානි තතොඛෝ තෙ ආනන්ද දුප්පටිවිජ්ඣතරං පටිවිජ්ඣන්නි යෙ ඉදං දුක්ඛන්නි යථාභූතං පටිවිජ්ඣන්නි අයං දුක්ඛ සමුදයොනි යථාභූතං පටිවිජ්ඣන්නි අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පටි විජ්ඣන්නි-යි.

බාධකප්‍රභවාදි තමන්ගේ සභාවය නියමවිසින් විසභාගයෝයි පළමු දුක්ඛ සමුදය දෙදෙන ඕදරිකයෝනුයි තිර්‍යඤ්ඤතයන්ටද ආහාරාදියෙහි තෘෂ්ණාව ප්‍රකටමය පිඛනායූහනාදි වශයෙන්

වනාහි මේ දුකඛය මෙයට කාරණයයි නත්වූපරිද්දෙන් අවගාහන යට නොපිළිවන් බැවින් ගැඹුරු බැවිනුදු ලෞකික බැවිනුදු සාසව බැවිනුදු සභාගයහ ඵලය හෙතුඝ යන මොවුන්ගේ භෙදයෙන්ද පරිඤ්ඤෙය්‍යය ප්‍රහාතව්‍යය යන ඵමාවුන්ගේ භෙදයෙන්ද විසභාග යඟ පශ්චිමඝත්‍යවයද ගැඹුරු බැවින්ද දුරවඝාහබැවින්ද ලෞකොත්තර බැවින්ද අනාසව බැවින්ද සභාගයහ, විෂය විෂයී බැවින් අරමුණු අරමුණු බැවින්ද සච්ඡිකාතබ්බභාවෙනබව වඝයෙන්ද විසභාගවෙත්, ප්‍රථම තෘතීයවූ දුකඛනිරොධ දෙදෙන ඵලයයි කියනු ලබන බැවින් සභාගයහ දුකඛය සංඛත බැවින් නිරොධය අසංඛත බැවින් විසභාගයහ. දෙවෙන් සතරවැනිවූ සමුදය මාර්ගසත්‍ය දෙ දෙන හෙතුඝයි කියනලබන බැවින් සභාගයහ, සමුදය එකාන්ත අකුසල් බැවින්ද මාර්ගය එකාන්තකුසල බැවින්ද විසභාගයහ,ප්‍රථම චතුර්වූ දුකඛමාර්ග දෙදෙන සංඛත හෙයින් අභාගයහ. දුකඛය ලෞකික හෙයින්ද මාර්ගය ලොකොත්තර හෙයින්ද විසභාගයහ. දෙවෙනි තුන්වෙනිවූ සමුදය නිරොධ දෙදෙන්ද නෙවසෙඛ නාසෙඛ වඝයන් විසභාගයහ, සාරම්මණ අනාරම්මණ වඝයෙන් විසභාග යහ. මේ ක්‍රමයේ මෙබඳු ප්‍රකාර ඇතිනයින් නුවනැත්තේ ආර්‍ය්‍ය සත්‍යයන්ගේ සභාගවිසභාගභාව දන්නේයි. දක්වනලදමැයි.

විශුද්ධිමාර්ගෙ,

පුබ්බානිවෙ සභාගානි දුරවගාහතත්තාගම්භීරත්තා ලෝකියත්තා සාසවත්තාච විසභාගානි ඵලහෙතු හෙදතො පරිඤ්ඤෙය්‍යපහාතබ්බතොච. පඨමානිපි වේ සභාගානි ගම්භීරත්තා දුරවගාහත්තා ලොකුත්තරත්තා අනාසවත්තා ච. විසභාගානි වීසයී විසයී භෙදතො සච්ඡිකාතබ්බ භාවෙතබ්බතොච පඨම තතියානි චාපි සභාගානි ඵලාපදෙසතො විසභාගානි සංඛතාසංඛතතොත දුතියචතුත්‍ථානිචාපි සභාගානි නෙව සෙඛ නාසෙඛභාවතො විසභාගානි සාරම්මණානාර ම්මණතො.

ඉති එවංපකාරෙහි නයෙහිච විවකඛණෝ
විජඤ්ඤු අරියසච්චානං සභාගවිසභාගතං–යි.

මේ මේසේ **විභාගතො නිබ්බචනං** යනාදියෙහි පවත් අරිය සච්චානං සභාග විසභාගතං ඒත මෙතන දක්වා අනෙකප්‍රකාර යෙන් විභාග කරණලද හෙවත්

විභාගතො නිබ්බචන ලකඛණාදිපප භෙදතො
අත්ථුද්ධාරතොවෙව අනුනාධි කතොතථා
කමතො ඡාති ආදීනං නිච්ඡයාඤාණ කිච්චතො
අනෙකානධානං පඤඤ උපමාතො චතුකඛතො.

සුඤ්ඤතෙක විධාදිහි සහාග විසභාගතා
විනිවිජ්ඣයෝ වෙදිතබ්බා විඤ්ඤූනා සාසනකෘමා–යි.

යන මාතෘකාවෙන් දක්වනලද විභාග නිර්වනාදි විසින් වර්ණිනාකර වදරන්නාවූ බුඩඝෝෂ මහා ස්ථවිරයන් වහන්සේ ලොකානන්දකරවූ බුදුරජානන් වහන්සේ විසින් වදලි චතුරාර්‍ය්‍ය සත්‍යය ගෙණ වර්ණිනාකර වදලිසේක අඤ්ඤාකොණ්ඩඤ්ඤදින්ට දම්සක් පැවතුම් සූත්‍රාදියෙහි බුදුන් විසින් අවබොධ කරවූසේත් මේ චතුරාර්‍ය්‍ය සත්‍යමය එසේ අවබොධකර වදරණසේකුත් තමන් වහන්සේ අභිඤ්ඤෙය්‍යාදි වශයෙන් චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන් බොධිදුමමූල සම්පයෙහිදි දත්හෙයින්මය එසේ හෙයින් සඩ්ගීතාරූඪ දය කවූ සඩ්ගීතිකාචාර්‍යවූ සමන්තභද්‍රවූ සකලලොක විනතාමාණික්‍යවූ ලෝකසවාමිවූ බුදුරජානන් වහන්සේ බුඩනම් වනසේක.

එසින් වදළහ.

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤතං–භාවෙතබ්බංව භාවිතං
පහාතබ්බං පහීණමෙ[1]තසමා බුඩොඝම්හි බ්‍රාහ්මණයි.

මෙනෙකින්

මේ සාරාර්‍ථ සංග්‍රහයෙහි

විශුඩ්ධිමාර්ගයෙන් සංග්‍රහකළ

චතුරාර්‍ය්‍ය සත්‍යකථා නම්වූ

සවෙනි පරිච්ඡේදය

නිමි.

මහාකාශ්‍යප සථවිරාබොධ කථා නම්වූ 7 වෙනි පරිවෙජදය.

තවද මේ සාරාදීඝව්‍යූහයෙහි මහාකාශ්‍යප සථවිරාවබොධ කථා නම් කවරහයත්?

චතුවේසාරාද්‍යඥනයෙන් විසාරදවූ කායබල දසයක් හා ඥණබල දසයක්ද දරණහෙයින් දසබලධාරිවූ සුමි සම්බුදුරජාණන් පිණිවියාවූ සථානයෙහි පිහිටීහෙයින් ආසභණථානථායිවූ නිබ්භිත නාද පවත්වා ඉහයින් සිංහනාදපවත්වන්නාවූ සියලු සත්වයන්ට උතුම්වූහෙයින් සම්සම්බෝතතමවූ ධම්මයට ඉසුරු බැවින් ධම්මේශ්වර වූ ධම්මයෙන් සියලු සත්වජනයා රජ්ජනයකරණහෙයින් ධම්මරාජන්වූ ධම්මයට නායක බැවින් ධම්මාධිපතිවූ ධම්මලොකය දක්වන හෙයින් ධම්මදීපවූ ධම්මයට ප්‍රතිඡථාහෙයින් ධම්මසරණවූ ධම්මයෙන් ආඥාවක්‍ර යපවත්වනහෙයින් සඬම්මවර චක්‍රවතීනිවූ සම්ධම්මයන් සම්මාකාරයෙන් පරාපදෙශරහිතව සවයම්භූඥනයෙන් දන්හෙයින් සම්මක්සම්බුඬවූ යම් බුදුරජානඤණකුන්වහන්සේ නමක් ඇද්ද ඒ සම්ඥයන්වහන්සේ වාත්‍රිංශත් වරමහාපුරුෂලක්ෂණයෙන්හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් හෙබිසේක් නිල්පිත ලොහිතාවදාත මාඤෙජඨා ප්‍රභාස්වර යෙන් විසිතුරුවූ සොභා ඇති බ්‍යාමප්‍රභාමණ්ඩලයෙන් පරික්ෂිපතවූ රූපවිලාසයෙන් යුක්තසේක්සුපිච්ඡිතවූ පදෙමාතපලපුණ්ඩරීකයෙන් හෙබියාවූ ජලතලයක් මෙන්ද තාරකාඇමුහයාගේ රශ්මිජාලා සොභාවෙන් බබලන්නාවූ ආකාසතලයක් මෙන්ද සදවලාගෙන් හා දෙවුදන්නෙන් වටකරණලද සණ්ඨපිතකුටයක් මෙන්ද තමන්වහන්සේගේ ශ්‍රීසමෘධීන්, සියලු ලොකය එකාලොක කරණසේක්, චතුසසත්‍යාවබොධයට නිසිවූ පුද්ගලයන් දැක මහාකාශ්‍යප සථවිරාදීන් පිණිස තුන්ගවියක් පමණ තැන්හිද, ආලවකාදීන් සඳහා තිස්යොදනක් පමණ තැන්හිද මහාකපිනසථවිරාදීන් සඳහා එක්සිය විසියොදනක් පමණ තැන්හිද වැඩ චතුසසත්‍යාවබොධය කරවදුළසේක,

එහි මහාකාශ්‍යපසථවිරාදීන් සඳහා තුන්ගවුවක් පමණ තැන්හි වැඩ චතුසසත්‍යාවබොධයකරවදුළ පරිදි කෙසේදයත්? ඒ මහාකාශ්‍යපසථවිරයන් වහන්සේ නම් මේ මහාභද්දකල්පයට ලක්ෂයක් වන කපින් මත්තෙහි ප්‍රාදුර්භූතවූ පියුමතුරා නම් සම්ඥයන්වහන්

සේ සමයෙහි හංසවතී නම් නුවර නොයෙක් කෙළිනළුන් වසනු ඇති වෙදෙහ නම් කෙළෙඹි පුත්‍රයක්ව ඉපද බුදුන් කරා එළඹ බණඅසා බුදුපාමොක්මහාසඞ්ඝයාට මහදන් සරහා නොයෙක් ඵලසින් විසිතුරුකොට සරහනලද තමන්ගේ ගෘහයෙහිදී දන් දෙන දිනයෙහි ධ්‍යානඛධරයන් කෙරෙහි අගතැන්පත්වූ වසභ නම් තෙරකෙණෙහුන් වහන්සේ ගෙපිළිවෙළින් සිඟමින් එතනට සම්ප්‍රාප්තවූවා දැක තුදුස්බෑනෙහි ඇතුලිත්කොට නොකියා සපදන චාරිකයන්ගේ පාත්‍රය ගණු හෝ සිහා සිටි තැනට ගොස් හෝ ඡිඤ්ඣාවනයෙන් පිළිගන්වන ක්‍රමය නොදන යම්හිනි බුදුපාමොක් මහාසංඝයා මාගේ නෙයිදී වලඳ වදුරණසේක, නුඹවහන්සේත් මට අනුග්‍රහකොට වැලඳීමට වැඩිය මැනවැයි ආරාධනාතලගෙයින් තමන්වහන්සේ ඒනායිවහා වැඩියකල්හි බුදුන්කරා එළඹ සවා මිනි! තුන්ලොවෙහි සියලුගුණයන් බුදුන්ට වැඩිකෙණෙක් ඇද්දැයි විචාලිකල්හි,

පාලෙන්ති නිමන්ලං කත්‍වා පාතිමොක්ඛාදි සංවරං
සමාදිහන්ධනඛහා ව අප්පිච්ඡා මුනිසුතවෝ.
නිච්චමප්‍පතක සුඛමිහි නඩ සොධාව තපතිතා
පුඤ්ඤඛානං වත්ථුභූතා තෙ දෙවමානුසකාදිනං.
ධාරෙමහං වණ්ණවන්තං සීවෙය්‍යමපි ච චීවරං,
බුඩපුත්තාමහානාගා න ධාරෙන්ති තථාවිධං.
ධාරෙන්ති තෙ පංසුකූලං සංසාරෙත්වා පිලොතිකෙ,
වණචිඡාදන චොලංව ඉච්ඡාලොභ විවජ්ජිතා.
සාදියාමි සදා හමෙහා උපාසක නිමන්තණං,
නෙව සාදෙන්ති සඞ්ඝබුඩ පුතෙතා පාසකයාවනං.
සපදානෙන යං ලඩං ඵලං වාපි පණීතකං,
තෙන තුස්සන්ති මෙ පුත්තා රසගෙධ විවජ්ජිතා-යි.

යනාදීන් එබිළ කෙලිඹ්පුත්‍රය චිවර පිණඩපාත සෙනාසන ගිලාන ප්‍රත්‍යය යන මේ සිවුපසලාභයෙහි ඉතා අල්පෙච්ඡවූ මාගේ සඟුවනාහි දාන්මොක්ෂසංවරශීලය ඉන්ද්‍රිය සංවරශීලය ඇජීව පාරිශුඛිශීලය ප්‍රත්‍යය සනනිශ්‍රිත ශීලය යන මේ සතර සංවරශීලය අත්‍යන්තනිර්මලකොට තමන් ජීවිතය පරිද්දෙන් නිරන්තරඅයන් රක්ෂාකරන්නාහ එසේම පාංශුකූලිකාඞ්ගය තෙචීවරිකඞ්ගය පිණඩ පාතිකඞ්ගය සපදානචාරිකඞ්ගය එකාසනිකඞ්ගය පත්තපිණ්ඩි කඞ්ගය යනාදී නාමව්‍යවහාර වශයෙන් තෙරස ප්‍රකාරයක් ඇත් නාවූ උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් එකුන්සාළිස් ප්‍රකාරය

කින් යුක්තවූ මේ සියලුම ධූනාඹ ගුණයන් නොපිරිහෙලා සමාදන්ව අධිෂ්ඨානකොට රැකගෙන්නාහුය. නිරන්තයෙන් මාරයුද්ධය පිණිස හෙවත් **"කාමා තෙ පඨමා සෙනා"** යනාදීන් දක්නා හෙයින් මරහුගේ සේනාවයයි කියනලද කාම ක්‍රෝධාදිවූ කෙලෙස් යතුරන්ගේ එඩිමඩිනා පිණිස සන්නාහ සනනඹව සැරහී දප්වත්ව සිටියාවූ සවන්හි අසිපුසු නොලන එඩිතර යෝධභටයන් වැනියාහ සියලු දෙව් මිනිසුන් විසින් කරණලද්දාවූ කුසල් නැමැති බිජ්ජනිඝ්‍යාවට ක්ෂෙත්‍රව සිටියාහ. **එඹුල කෙළඹිපුත්‍රය!** මම වනාහි මනහරවණ්ණසම්පත්තීන් යුක්තවූ සිවෙය්‍ය වස්ත්‍රයෙන් කරණලද්දාවූ මාහැඟි සිවුරු ද ප්‍රයෝජනවිදිමමය මණිකචව සන්නඹ ගඬගසනි රාජයන් හා සමාන සම්ඵපුත්‍රවූ මහඝහු වනාහි රහිජනකවූ **එබඳුවණ්ණසම්පත්තින්** යුක්ත මහානඞ්ග විවරයන් නොඉවසන්නා හුමය විවරප්‍රත්‍යයෙහි ඉතා අල්පෙච්ඡවූහෙයින් ලොහතාෂණාවෙන් පහවූ හිතමිත්‍රවූ චාරිත්‍ර වාරිත්‍ර හා නිමිලවූ චිත්තසන්තාන ඇති ප්‍රතිපත්තිසාරවූ මාගේ සඟහු වනාහි ගඳපිළිකුල් වණ වසන්ට ලන හෙල් පියලි සෙයින් කඩරෙදි ගොනා කරණලද ඉතා රුක්ෂවූ පාංශුකූල චීවරයන් දරන්නාහ. තවද මම වනාහි ඇමකල්හිම උපාසක ආරාධනා කිවිස නොසෙක් සුපව්‍යඤ්ජනයෙන් යුක්තවූ දිව බොජුන් හා සමානවූ මිහිරි ආහාරය අනුභවකෙරෙම්මය සම්‍යක් සම්බුඩයන්ගේ පුත්‍රවූ මේ සුපිළිපන් මහඝහු වනාහි එපරිද්දෙන් උපාසක අරාධනා නොඉවිස්නාහ, යලි කෙසේ ජීවත්වෙද්ද යන හොත්? නිරන්තරයෙන් වෙඟෙරකලිමනා වත් සපයා සියල්ලවුන් කෙරෙහි මෙත්පතුරුවා ධාතුකම්ඨාන මෙනෙහිකරමින් සිවිරැ ගැවිගනුවා පාත්‍රය අතින්ගෙණ ගමට වැද හිණමඩ්‍යමෝනකාඡය යන හැමඋස්සයන් කෙරෙහි එකාකාරයෙන් පවත්නා සොම්සිතිල් සොම්සඳ පහණක්සේ සපදතවහිතියෙන් යෙදී ගෙඩිලිවෙළින් සිහා රැකෙවූ හෝ ප්‍රණීතවූ හෝ යම් කිස් ආහාරයක් ලද්දාහු විනම් රසයෙන් නිස්ප්‍රබවක් නැත්තාවූ මාගේ සඟහු එයින්ම සන්තුෂ්ට වන්නාහ. තවද කෙලඹිපුත්‍රය! මම වනාහි චතුර්ඩ ඊයඃපථය පරිවර්තනය කෙරෙමි, මාගේ සඟහු සිංහව්‍යාඝ්‍රාදි චණඩ සත්වියන් සෙරෙහි හයින් තිදිවරිජිතව වසන ඉරියාපථින්මෙන් ප්‍රතිභය සහිතවූ අසාරවූ සංසාරයෙහි ආදීනව දැක සසර හයින් භයපත්වූවාහු එපරිද්දෙන් නොසතපෙන්නාහුයෙ චිත්තානුකූලවූ කම්ඵස්ථානයක් නොණ ගිදිම් සිටීම සැතෑ සක්මන්කිරීම යන මෙතුන්වැදෑරුම්වූ ඊයඃපථ පරිවර්තනයෙන් දවස් යවන්නාහ. තවද මම වනාහි එක් මහල් දෙමහල් තුන්මහල් සතරමහල් පස්මහල් සත්මහල් ආදීවූ ප්‍රභේද ඇති දිව්‍ය විමාන හා සමාන උතුම් ප්‍රාසාදමයනිදු වාසය

සහෝදරයනි එකඟවූ සිතින් භාවනායොගයෙහිලෙදී උදනලාව වාසය කරන්නාහ-මෙබඳු මේ සියලු ගුණගණාඟයෙන් සැරසී සිටියාවූ ඒ මාගේ ශ්‍රාවක සමූහයා කෙරෙහි ඇතුලත්වූ මම වඝඝ නම් මහතෙරහු වනාහි තඝනලද සියලු ඤාණබල කෞශල්‍යයන් ඇතිව බුද්ධාඟ ධරයන්කෙරෙහි අග්‍රවූ සාරිපුත්‍රස්ථවිර ලදින් මාගේ ශාසන නැමැති ආකාශයෙහි තිර සඳසේ ප්‍රසිද්ධවූ උත්තමයාන කෙණෙක්වේද යනාදීන් මෙසේ ඒ භාග්‍යවන්වූ බුදුරජානන්වහන්සේ අන ඔසවා සඳ මඬල පානාසේ තෙරුන්වහන්සේගේ අප්‍රමේය්‍යවූ ගුණසමූහයන් ප්‍රකාශකොට වදාළහෙයින් තමන්ටද ඒවනතුරු කැමතිව මම්ද මේ තෙරුන්වහන්සේ පරිද්දෙන් එනදවස එක්තරා බුදුකෙණෙකුන්ගේ ශාසනයෙහි බුද්ධාඟධරයන් කෙරෙහි අග්‍රස්ථානය බොමැයි ප්‍රාර්ථනාකොට ලබනලද විවරණ ඇතුව සසරසැරිසරා අවුත් මිට එකානුවන කප බුදුවූ මහාවිපස්සි නම බුදුන් සමයෙහි දඹදිව එකයා වක නම් බ්‍රාහ්මණව ඉපද මහදන්දී ඒ බුදුන්කෙරෙහුන් මේ තානාතුරට විවරණ ලැබ දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳිමින් අවුත් දඹදිව කෙළෙඹිපුත්‍රයෙක්ව ඉපද පසේබුදුකෙණෙකුන්ගේ සිවිරකට නුවණ පිණුස උතුරුයළුවක් පුදා ඒ පිණින් තවනිසා දෙවලොව ඉපද එහි සැපවිඳ නැවත දඹදිව තුන්යොදුන් පමණ තන්හි එක්තරා නියම ගමෙක එක්තරා කුලගෙයක නන්දික යන නමින්යුක්තව ඉපද"රස වාහිනියෙහි,, කියනලද ක්‍රමයෙන් නොස් බරනැස් නුවර නඳිය නම් රජව බිසවුන්ගේ යාඥුවෙන් පත්මාවනි බිසවුන්ගේ පුත්‍රවූ පන් සියයක් පසේබුදුවරයන්වහන්සේව මහදන්දී ඔවුන්වහන්සේලා පිරිනිවිකල්හි අනිත්‍ය මෙනෙහිකොට දෙවුපුත්හට රාජ්‍යයදී බිසවුන් තමනුත් මහණව උයනෙහි දෙතැනක හිඳ තපස්කොට පංච අභිඥ අෂ්ටසමාපත්ති උපදවා අපරිහීණධ්‍යානයෙන් දෙදෙනම බඹලොව ඉපදධ්‍යාන සැපවිඳ අප බුදුන් සමයෙහි එයින් චුතව දඹදිව එක්තරා ගමෙක කාශ්‍යපගොත්‍රවූ බමුණු මහසල්කුලයෙක්හි දෙව් ලොවින් බට දිව්‍යකුමාරයෙකුසේ රූපශ්‍රීන් යුක්තව ඉපද පිප්ඵලි කුමාර යන නමින් ලෝකප්‍රසිද්ධ වූහ, පෙර නඳියරජකාලයෙහි බිසව් තමන් හා බ්‍රහ්මලෝකයෙහි උපන්නී එයින් චුතව එම බමුණු ගම බ්‍රාහ්මණකුලයෙහි දිව්‍යකුමාරිකාවක්සේ රූරුසින් යුක්තව භද්‍ර කපිලානිය යනනමින් දසඳිව ඉපද වැඩිවිඳිනවුවා පුළුජාතියෙහි හේතුබලයෙන් පිප්ඵලිකුමාරයන්කෙරෙහි වැසකල්යාමකින් දෙදෙනම ගිහිගෙයි කලකිරිලෝකෝත්තරගුණ උත්තමයානකෙණෙකුන් වහන්සේගේ නමට මහණවම්හයි කියා වාසයකරණකල්හි දවසක ලෝකයෙහි ලොවුතුරා සඳිඹුයන්වහන්සේ පාදුර්භූතව, අමෘතමහා මේඝයක් විහිදෙන්නාසේ සඬ්ධර්මදේශනා කෙරෙමින් සකලසත්ව

යන්ට නිවන්පුර සිරිමගණහැරදෙනසේකැයි යනුඅසා අපිද ඒ උත්තමයානන් වහන්සේ උදෙසාම මහණවම්හයි කියා කාශාවස්ත්‍රයන් මගණ හැඳපෙරව මහණවෙස් මගණ බුදුන් දක්නා පිණිසසැකිය සථානයෙන් නික්මුණාහ එදවස් අළුයම්වේලෙහි බුදුහුඉෂකලිලෂයක් සමාපත්තියට සමවැද අදදවස කවරක්හුසඉරින් ගොඩලා නිවන්පුරසිරි ගෙණහැර දෙම්දෙනෝයිසිතා කරුණාවෙන් ලොව බලනසේක් ඔම්දෙදෙනා දිවසින් දුක ඔවුන්කෙරෙහි ජනිතවූ මෛත්‍රියෙන් තුන්ගව්වක් පමණතැන් ඉදිරියටවැඩ මඟින්ඉවත්ව එක්තරා වෘෂමූලයෙක්හි වැඩසිටිසේක, එදවස් නික්මළන්නාවූ මේ පිප්ඵලි කුමාරයන් හා භද්දකපිලානි යනදෙදෙන උනුන්හා ක ථා කරන්නාහු අපි දැන් අභිනව යෞවනඅවස්ථාවෙහි සිට මහණව එකමඟ යන කල්හි දුටු දුටු කෙණෙක් නිතුකරන්නානුයයි අතු රෙහි ඕංදෙකක් බබුනුතැනක් දුක දකුණත්මග පිප්ඵලිකුමාර යෝ නික්මුණාහ. වමත භද්දකපිලානිතොමෝ නික්මුණාය. මෙසේ වෙන්ව නික්මුණාවූ ඒ දෙදෙනාගෙන් පිප්ඵලි කුමාරයෝ අවුත් ඒ පෙරමඟ සමීපයෙහි වෘෂමූල සරහා වැඩසිටි සම්බුදරාජෝත්තම යානන්වහන්සේ දැක මහත්වූ ප්‍රීතීන් ප්‍රමුදිතව පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව තමන් පෙර නොදිටු විරූ රූපශ්‍රියක් සෙයින් විද විද බල බලා සිටියහ-එකල්හි කරුණා නිධානවූ දිපදෙත්තමයා නන්වහන්සේ ඔවුන් වහන්සේට ගොත්‍රනාමයෙන් කාශ්‍යපයිනි! යි ඇමන්ත්‍රණයකොට ධම්දෙශනා කරණසේක් ත්‍රිවිධ අවවාදයෙන් උපසම්පදා කොට ඔහු උගන්වා බණ වදාළසේක මේ කවරසිත් සැනසීමෙක්දැයි සඩම්ප්‍රීතීන්ප්‍රමුදිතව සඩම්මාතරසාඝ්‍රාදයකෙරෙමින් රහත්ව වැඩසිටිසේක් තමන්වහන්සේගේ කරතුබූ පටපිලොතිකාසංඝාටිකා විවරය සතරපටින් ඒවෘෂමූලඉයහි පණවා භාග්‍ය වතුන්වහන්සේ මට බොහෝ කලක් වන්නාවූ ඝිත සැප පිණිස සංඝාටිය මසකයෙහි වැඩහිඳිනේ යහපතැයි ආරාධනා කළහෙයින් බුදුහු සංඝාටිය මසකයෙහි වැඩහිඳ රක්තපද්මයක් වැනිවූ තමන්වහන්සේගේ මෘදුකොමල ශ්‍රීහස්තයෙන් වැඩඋන්හඟළ සිවිරපිරිමැද වදරණසේක් කාශ්‍යපයෙනි! නොපමණ මේපටකඩ සඟළ සිවුර ඉතා මෘදුයයි වදළසේක-එසඳ මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ බුදුන් සිවිරෙහි ගුණ වදළහයින් නැවත ඒසිවුර තමන්වහන්සේ හැර ගෙණ වැළඳගැන්මසුදුසුනොවෙයිසිතා මහතුන්විසින් කියම් වසතු වෙක ගුණකිවමහොත් ඒවයතුව ඒමහත්මයන්ට පැමිණීම වාරිත්‍රධර්මයක් හෙයිනුත්-බුදුන් වදුළ වචනය අසා දන්වනසේක් ධම්ස්වාමින්වහන්ස! මාතකරෙහි අනුකම්පා කොට පට කඩසිවුර පිළිගතමැනවැයි කීසේක-එසඳ සම්බුදුන්වහන්සේද තමන්වහන්සේ වැළඳි

ධූතාංගකූලවිවරය මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේමූත් මේලෝක යෙහි වැලඳගන්ට කිසිවක් ඔවුන් නොපිළිවන් හෙයින් කාශ්‍යප යෙනි! මාවිසින් කලක්වැලැන්දවූ සඟලසිවුර ධරන්ට නොපට පුළුවන්දැයි වදළසේක-එපවත් මුදුනෙන් පිළිගෙණ ස්වාමිනි පාංශුකූලවිවරය ධරන්ට මට පිළිවනැයි දන්වූසේක බුදුහු උන්වහන්සේ ඇතුන් පස්දෙනකුගේ බලදරණබව දැන මේ සිවුර ධරන්ට පිළිවන්දැයි වදළේ නම් මතුපන්දහසෙහි තෙළෙස්ධූතාඟයම් උත්තෘෂ්ට වඟයෙන් පුරමින් මාගේ ප්‍රතිපත්තිශාසනය බබළුවන්ට හැක්කේදැයි විවාළනියාය උන්වහන්සේද එසේම ප්‍රතිපත්තිශාසනය බබළුවන්ට සමර්ථභෙයින් මේ සුගත්විවරය පිළිපදනෙම්මම්මයයිසිතා ධම්මරාජෝත්තමයානන්වහන්ස! පාංශුකූලවිවරය දරමියි කීසේක-එකල්හි බුදුහු විවරය පරිවර්ත්‍යානයකරණසේක් උන්වහන්සේගේ සිවුර තමන්වහන්සේ වැලඳගත්සේක, සඝීඥයන්වහන්සේ වැලඳි විවරය මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ පෙරවගත්සේක එසඳ දෙලක්ෂයතලිස්දහසක් යොදුන් ඝනකඩබොල්මහපොළොව ජල පොළොවදක්වා මහත්පවන්පහළි පලුලවයක්ගේ කම්පිතව ගතස හස්‍රරාවයෙන් ගර්ජනාකෙළේය. මෙසේ බුදුහු මේ පාංශුකූලවිවරය පුණ්ණ නම් දුසියක් කාලත්‍රියාකලි පසු අනඤ්ඤවුවඥායෙකින්වසා අමුසොහොනකට ගෙණගොස් දුමුකල්හි ඉදිමී නිල්ව කෘමිකුලයන් විසින් ආකුලව වැසූ වසත්‍රය බරවනිබූ තිඹක් පමණ කෘමි සමූහයා සලා මහත්වූ ආයුර්වංශයෙහි සිටි ඇරගත්කාවූ විවරයහෙයිනුත් ඒ සිවුරඇරගත් දවස් දසදහසක් සක්වළ දසදහසක් මහාපෘථිවිහු විවරවන්නාක්හුමෙන් ගර්ජනාකලහ අහසද එසේම මහත්කොට ගර්ජනාකෙළේය-දසදහසක්සක්වළ හැම දෙවි බඹහු සාධුකාර දුන්හ, එසේහෙයින් ලොවුතුරා බුදුන් හැර මේ සිවුර දරන්නාවූ අන්හිඤ්ඤුවක් ඇත්නම් ඔහුවිසින් තෙළෙස්ධූතාඟයම උත්තෘෂ්ට වඟයෙන් පිරියයුත්තේය සඝීඥයන්වහන්සේවද උන්වහන්සේගේ සිවුර කුමක් පිණිස පරිභෝගය කිරීමට අභිප්‍රාවුවක්දයත්? ඒ සිවුරහෙණ තමන්වහන්සේගේ අනුශාස්තෘ මහත්වූ පාංශුකූල විවරය දෙමින් මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේද තමන්වහන්සේට සමවූ ස්ථානාන්තරයෙහි තබන පිණිස විවරය පරිවර්තනය කරණු කැමි නිවූසේක, කිමෙක්ද එකාසංඛ්‍යකප්ලක්ෂයක් පාරමිතා පුරා අග්‍රශ්‍රාවකස්ථානාන්තරය ප්‍රාර්ථනාකොට ආවාවූ සැරියුත් මුගලන් ද දෙනා වහන්සේ වැඩසිටියදී කුමක්පිණිස මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ තමන්වහන්සේට සමවූ ස්ථානාන්තරයෙහි තුබූසේක්දයත්? ඒඅසඟවිදෙදෙනාවහන්ස නම් බුදුන් ජීවමාන කාලයෙහිම පිරිනිවන්පාන්සේක මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ වනාහි එක්

සිය විසි අවුරුද්දක් සම්පූර්ණවූ ආශ්‍රු ඇතිසේක, එසේහෙයින් බුදුන් පිරිනිවියන් උන්වහන්සේ බුදුන් වැඩසිටියාසේම සපයඹිජ්තික නවලොකොත්තර සඞ්ඝිය පාළිකොට තබාහෙණ නාථාභා සාසනාශාසනය නිමිලකොට බබුළුවා බුදුන්වදලාවූ ධර්ම පන්දහසක් අවුරුදු පවත්නාලෙස සංගායනාකරණසේකැයි කියා බුදුහු තමන් වහන්සේට සමවූ සථානාන්තරයෙහි පිහිටුවූකල භික්ෂූන්වහන්සේ උන්වහන්සේට ආදරබහුමානකිරීමට සිතාසේකැයි යහා මෙහැම බුදුහු අනාවරණඥානයෙන්ම දක සන්නිඛානය කොට විවරය පරිවර්තනය කළසේකැයි දතයුතුමි. එසඳ චක්‍රවර්ත්ති රජ්ක්හු සවකිය රාජවංශය කලක් පවත්වන්නාවූ පුත්‍රරත්නයකට තමාගේ ශරීරයෙහි බහනලද්දවූ කවචයක්දී ඔහු ප්‍රසාධනයකරවා මත්තට ලෝවැඩ පිණිස පිහිටුවාක්මෙන් තමන්වහන්සේ වැලදී මෙබදු විවරය දෙමින් මත්තෙහි ශාසන ආරක්ෂාකරවන ලෙස කාශ්‍යප සථවිරයන්වහන්සේට භාරකළේ ඉතාම යහපත ලොකාභිභූවූ බුදුරජාණන්වහන්සේගේ කරුණාමහිමයකැයි ළඳුතුන්ලොව දිව්‍ය බ්‍රහ්මාදිහු එකපැහැර සාධුකාරදුන්හ,-මෙසේ එතැන්ඉ වැඩඋන් කල්හි බුදුන්ගේ අධිෂ්ඨාන බලයෙන් හඳුකපිලානිද එතැන්හි පැමිණ ජනිතවූ අප්‍රමාණ සන්තොෂයෙන් යුක්තව පසඟ පිහිටුවා වැඳ සම්ඡුයන්වහන්සේ විසින් වදරණලද්දවූ සඞ්ඝීමාන පානය කොට මාගිඵලප්‍රාප්තව අමෘතමහා නිර්වාණය සාක්ෂාත් කලාහමෙසේ ඒ කාශ්‍යප සථවිරයන්වහන්සේ මිට යට ලක්ෂයක්වන කල්ප යෙකිදී පියුමතුරා නම් බුදුන් දක ලත් විවරණයට සුදුසුලෙස ප්‍රාර්ථනා නෙරෙමින් අවුත් මෙකල බුදුසසුන්වැද මහණව බණඅසා රහත්ව ප්‍රාර්ථනාකලිලෙසම අප බුදුන්ගේ ශාසනයෙහි තෙලෙස් ධුතාඟධර ප්‍රතිඳත්තිසාර මහාසංඝයාවහන්සේට අග්‍රප්‍රාප්තව ධුතාඟධරයන් කෙරෙහි මහාකාශ්‍යප සථවිරයෝ අග්‍රප්‍රාප්තයෝයයි බුදුන් අතින් සථානාන්තර ලැබ තෙලෙස් ධුතාඟයන් උපාඞ්ඟව එගයෙන් පිරුසේක-

තෙලෙස් ධුතාඟ නම් කවරේදැයි ඝනහාත්?

පසුකුලිකඞ්ග තෙවිවරිකඞ්ග පිණ්ඩපාතිකඞ්ග සපදානචාරිකඞ්ග එකාසනිකඞ්ග පත්තපිණ්ඩිකඞ්ග ඛලුපච්ඡාභත්තිකඞ්ග ආරඤ්ඤඞ්ග රුක්ඛමූලිකඞ්ග අබ්භොකාසිකඞ්ග සොසානිකඞ්ග යථාසන්තතිකඞ්ග නෙසජ්ජිකඞ්ගයි යනමේ තෙලෙස් ධුතාඞ්ග නම්වෙත්. මෙබදු තෙලෙස් ධුතාඞ්ග උත්තෘෂ්ටවශයෙන්ම පුරමින් ප්‍රතිපන්නි ශාසන නැමැති පද්මරාශිය ප්‍රබෝධකළසේක. ඒ තෙලෙස් ධුතාඞ්ග යන්ගේවණ්ණනාව මේ මතුකිය න ක්‍රමයෙන් දතයුතු. කෙසේදයත්? තෘෂ්ණාවෙන් පිරිමැන්ද බැවින්ද ඵලාභපයාපන්න බැවින්ද ලාභ

සත්කාරාදීහු ලෝකාමිස නම්වෙති එලෝකාමිසය දුරුකළාවූ කයෙහිදු ජීවිතයෙහිදු නිරපෙක්ෂවූ නිර්වාණාධිගමයට අනුලොම් පිළිවෙත් සිඛාකරණකැමති කුලපුත්‍රයන්ට සම්‍යක් නිනොපකාර විශුඛගුණ රත්න පූරිතනිධිනිකෙතවූ ගාම්භීර්‍යවත් සම්බුරාජෝත්තමයානන් වහන්සේ විසින් අනුදන්නාලද ධුතාංගයෝ තෙලේස් දෙනෙකි- ඔහු කවරහුදයත්?- පාංශුකූලිකාංගාදිතෙලසයි—

එසින්කිහ විශුඛිමාගිශෙකි—

භගවන්පරිවත්තලෝකාමිසානං කායෙව ජීවිතෙව අනපෙකඛානං අනුලොම පටිපදායෙව ආරාධෙතුකාමානං කුලපුත්තානං තෙරසධුතඞගානි අනුඤඤතානි සෙය්‍යථිදං? පංසුකූලිකඞගං, තෙචීවරිකඞගං පිණ්ඩපාතිකඞගං සපදානචාරිකඞගං එකාසනිකඞගං පත්තපිණ්ඩිකඞගං ඛලුපච්ඡාභත්තිකඞගං ආරඤඤකඞගං රුක්ඛමූලිකඞගං අබ්භොකාසිකඞගං සොසානිකඞගං යථාසන්ථතිකඞගං නෙසජ්ජිකඞගං-යි. මෙහි පංසුකූලිකාදි ඒ ඒ ශබ්දයන්ගේ අත්‍ථවිසින්ද ලක්ඛණරසාදිවිසින්ද සමාදාන විධාන විසින්ද ප්‍රභෙදවිසින්ද භෙද විසින්ද ඒ ඒ ධුතාඞගයාගේ අනුසස් විසින්ද කුසලත්තිකවිසින්ද ධුතය ධුතවාදය ධුතධම්ම ධුතාඞග යන මොවුන්ගේ විභාගවසයෙනද සංඛෙපවිසිනද විත්‍ථාරවිසිනද විනිශ්චයදතයුතු—

එසින්කිහ-

අත්‍ථතොලක්ඛණාදිහි සමාදානවිධානතො
පභෙදතො භෙදතොච තස්ස තස්සානිසංසතො,,
කුසලත්තිකතො චෙව ධුතාඞ්ගානං විභාගතො
සමාස ව්‍යාසතො චාපි විඤ්ඤුතබ්බා විනිච්ඡයොං-යි,,

ඒ ධුතාඞ්ගයන් කෙරෙහි

අත්‍ථතො තාව රජිකා සුඛානසංකාරකුඨාදීනං යත්‍ථ කත්‍ථචි පංසුනං උපරිගිතත්තා අබහුගතත්තෙන තෙසු පංසූසූකූලම්වාති පංසුකූලං,-අථවා පංසුංවිය කුච්ඡිත භාවංලුලතීති පංසුකූලං, කුච්ඡිතභාවං ගච්ඡන්තීති වුත්තං හොති එවං ලඞ්ගිබ්බචනස්ස පංසුකූලස්ස ධාරණං පංසුකූලං පංසුකූලං සීලමස්සාති පංසුකූලිකො පංසුකූලිකස්ස අඞගං පංසුකූලිකඞගං අඞගන්ති කාරණං වුච්චති තස්මා යෙන සමාදානෙන සො පංසුකූලිකො භොති තස්සෙතං අධිවචනංති වෙදිතබ්බං-යි.

යතුහෙයින් පළමුකොට වචනාර්‍ථහෙයින් විවිය සුසානය කඥ ලහොඬය යනාදින්කෙරෙන් යම්කිසි තැනෙක්හි පංසුව මස්සන්න යෙහි සිවිනාහෙයින් උස්වසිවිනා අර්‍ථයෙන් ඒපංසුවෙයි ඉවුරු බදුනුයි පංසුකූලනම්මවිද. නොහොත් කුඝබදය කුතශිතාර්‍ථයෙහි අල්

පාඨීයෙහි වැටෙන බැවින්ද උල ශබ්දය ගත්‍යර්ථයෙහි වැටෙන බැවින්ද කුත්සිතබවට්‍යයනුයි මෙසේලස ලබනලද නිර්වචනයයි කිය නලද අඤ්ජරාර්ථඇති පංසුකූල විවරයාගේ දැරීම උත්තරපදලෝප සමාස වසයෙන් පංසුකූලනම්වේ, ධාරණ ශබ්දය"පූපඛාදනම්පූපං තත්ශීලමස්‍යෙත්‍ය ප්‍රුපිකඃ,, යනුවෙහි මෙන්ලොප්කොට පංසුකූල යනුවෙහි පංසුකූලදරීම ප්‍රකෘතිවූයේ සවභාවවූයේමෝහටනුයි පං සුකූලිකනම්වෙයි. පංසුකූලිකයාගේ සමාදානචෙතනායයි කියන ලද ධර්ම්ය පංසුකූලිකඞ්ග නම්වෙයි අඞ්ගයයිකියාකාරණයකියනු ලැබෙයි එහෙයින් සමාදානයක් හෙතුකොටගෙණ ඒ පාංසුකූලය දරණ භික්ෂුතෙම පංසුකූලිකයයි කියනුලැබෙ යිද ඒ සමාදාන චෙත නාලක්ෂණයට මේඅඞ්ගයයි කියානමකැයි දතයුතුයි. මෙමක්‍රමයෙන් සංඝාටිඋත්තරාසඞ්ග අන්තරවාසකයයි කියනලද සඟලසිවුරය පොරොනාසිවුරය හඳනාසිවුරය යනතුන්සිවුර ප්‍රකෘතිවූයේ මෝහට නුයි තෙචීවරික නම් වෙයි තෙචීවරිකයාගේ අඞ්ගය තෙචීවරික ඞ්ගනම් වෙයි.

එසින්කිහ.

එතෙනෙවනමයන සංඝාටි උත්තරාසංග අන්තරවාසක සංඛා තං තී විවරං සිලමස්සාති තෙචීවරිකොං තෙචීවරිකස්ස අඞ්ගං තෙචී වරිකඞ්ගං-යි.

භික්ෂායයි කියනලද ආමිස පිණ්ඩයන්ගේ හීම පිණ්ඩපාත නම් වේ හෙවත් පරයා විසින් දෙනලද පිණ්ඩයන්ගේ පාත්‍රයෙහි හීමයයි කියනු ලැබෙයි. ඒ අනුන් විසින් දෙනලද පිණ්ඩපාතය පාත්‍රයෙහි නිපාතනය හවුලා ඒ ඒ කුලයට එලඹෙන්නේ සොයානුයි පිණ්ඩ පාතික නම්වේ පිඬු පිණිස හෝ ඇවිදීමට වුතයවූයේ මොහටනුයි පිණ්ඩපාත්ක නම්වෙයි පතිතුං යනුවචිතුං යන අර්ථයි. පිණ්ඩපාතිම පිණ්ඩපාතිකවෙයි. පිණ්ඩපාතිකයාගේ අංගය පිණ්ඩපාතිකඞ්ග නම් වෙයි.

එසින්කිහ.

භික්ඛාසංඛාතානං පත ආමිස පිණ්ඩානං පාතෝ පිණ්ඩපාතෝ පරෙහිදින්නානං පිණ්ඩානං පත්තෙහානිපතන්ති වුත්තං හොති තංපි ණ්ඩපාතං උඤ්ඡති තං තංකුලං උපසංකමනතා ගවෙසන්තීති පිණ්ඩ පාතිකෝ පිණ්ඩායවා පතිතුංවත මෙතස්සාති පිණ්ඩපාති පතිතු නති චරිතුනති චරිතුං පිණ්ඩපාති එව පිණ්ඩපාතිකෝ පිණ්ඩපාති කස්ස අඞ්ගං පිණ්ඩපාතිකංගං-යි.

දූනයයි කියා විශේදය කඩකිරීම කියනු ලැබෙයි විශෙදයයි කියනලද දූනයා කෙරෙන් අපේතවූයේ අප දූන නම්වෙයි නො

කඩකිරීමය යන අර්ථයි කඩනොකිරීම හා සමග පවතිනුයි සප දුනකම්වෙයි අවඛණ්ඩරහිතව ගෙපිළිවෙලින් සිහිමයයි කියන ලද්දේවෙයි ගෙපිළිවෙළින් හැසිරෙනුයි මේ සපදුනවරණය මොහට ප්‍රකාශිනුයි ‘සපදුනවාරි නම් වේ සපදුනවාරීම සපදුනවාරිකනම් වෙයි ඔහුගේ අංගය සපදුනවාරිකඩග නම්වෙයි.

එසිත්කිහ.

දුනං වුඩ්ඪති අවඛණ්ඩනං අපතං දුනතෝ අපදුනං අනව ඛණ්ඩනන්ති අත්‍ථෝ සහ අපදුනෙන සපදුනං අවඛණ්ඩනවිරහිතං අනුසරනන්ති වුත්තං හොති. සපදුනං චරති ඉදමස්‍ස සීලන්ති සප දුනචාරි සපදුනවාරි එව සපදුනචාරිකෝ තස්‍ස අඩ්ගං සපදුනවාරි කංගං-යි.

එක අස්නේ හිඳ කරණ භොජනය උත්තරපදලෝපයෙන් එකාසන නම්වෙයි. එම එකාසන භොජනයම එකාසනික නම් වෙයි. ඔහුගේ එක අස්නේ හිඳ වැළඳීම ප්‍රකෘතිවිමට කාරණය හෙවත් එකාසනිකවීමට කාරණය එකාසනිකඩගනම්වේ.

එසිත්කිහ.

එකාසනෙ භොජනං එකාසනං තං සීලමස්‍සාති එකාසනිකෝ තස්‍ස අඩ්ගං එකාසනිකඩ්ගං-යි.

භිත්‍ය භාජනය ප්‍රතිශේප කලබැවින් හුදෙක් එකම පාත්‍රයෙහි පිණ්ඩය පත්තා පිණ්ඩ නම් වෙයි. දැන් පාත්‍රය පිණ්ඩග්‍රහණයෙහි පත්ත පිණ්ඩය යන සංඥාකාට එකම්පාත්‍රයෙහි පිණ්ඩග්‍රහණය සීලවූයෙ මෝහටනුයි යියා “පත්තපිණ්ඩං කවිා” යන උත්තර පදලෝපයෙන් පත්තපිණ්ඩික නම්වේ. ඔහුගේ අඩ්ගය (එකපාත්‍රයෙහි පිණ්ඩග්‍රහණ ප්‍රකෘතිවීමට කාරණය) පත්තපිණ්ඩිකඩ්ග නම්වෙයි.

එසිත්කිහ.

දුතියක භාජනස්‍ස පටික්ඛිත්තත්තා කෙවලං එකස්මිංයෙව පත්තෙ පිණ්ඩා පත්තපිණ්ඩා ඉදානි පත්තපිණ්ඩඟහණ පත්තපිණ්ඩසං ඤාකතා පත්තපිණ්ඩා සීලමස්‍සාති පත්තපිණ්ඩිකෝ තස්‍ස අඩ්ගං පත්තපිණ්ඩිකඩ්ගං-යි.

ඛලුපච්ඡාභත්තිකඟයෙහි ඛලුයයි ප්‍රතිසෙධාඛ්‍යයෙහි නිපාතය පැවරී අවනහනු විසින් පසුව ලබනබත පශ්චාත්භක්ත නම්වේ. ඒ පශ්චාත්භක්තයාගේ භොජනය පශ්චාත්භක්ත භොජන නම්වේ ඒ පශ්චාත්භක්තභොජනයෙහි පශ්චාත්භක්තසංඥකොට ඒ පශ්චාත්භ ක්තය ප්‍රකෘතිවූයේ මෝහටනුයි පශ්චාත්භක්තික නම්වේ. පශ්චාත් භොජනය නොකරණ සුළුවූයේ ඛලුපච්ඡාභත්තික නම්වේ සමාදන

වසයෙන් ප්‍රතික්ෂිපනකළ හෝජනයට පච්ඡාභක්තිකය යනමේන මෙයි. අවුවා කථාවෙහි වනාහි බලුනම් එක්සකුණියක හෙතෙම මුඛයෙන් ඵලයක්ගෙණ ඒ ඵලය වැටුනකල්හි නැවත අනිකක් නොකන්නේය මෙතෙම මෙබඳුහුයි බලුපච්ඡාභත්තික නම්වෙයි කියනලදි ඔහුගේ අංගය බලුපච්ඡාභත්තිකඞගනම්වේ.

එසින්කිහ.

ඵලූනිපටිසෙධනේ නිපාසෝ පවාරිතෙන සතා පච්ඡාලඛං භත්තං පච්ඡාභත්තං නාම තස්ස පච්ඡාභත්තස්ස හෝජනං පච්ඡා භත්තභෝජනං තස්මිං පච්ඡාභත්ත භෝජනෙ පච්ඡාභත්ත සඤ්ඤං කත්වා පච්ඡාභත්ත සීලමස්සාති පච්ඡාභත්තිකෝ න පච්ඡාභත්තිකෝ බලුපච්ඡාභත්තිකෝ සමාදානවසෙන පටික්ඛිත්තානිරිත්ත භෝජන සෙසතං නාමං අඨකථායං පන වුත්තං බලුනි එකොසකුණිකා සෝ මුඛෙන ඵලං ගහෙත්වා තස්මිං පතිතෙ පුන අඤ්ඤංනාබාදති තාදි සෝ අයන්ති බලුපච්ඡාභත්තිකෝ තස්සඅඞගං බලුපච්ඡාභත්තික ඞගං-යි.

ආරණ්‍යකඞගයෙහි වල්ගිවිසීම ප්‍රකාශවූයේ මෝහටනුයි ආර ණ්‍යක නම්වේ ඔහුගේ අඞගය ආරණ්‍යකඞගනම්වේ.

එසින්කිහ.

අරඤ්ඤනිවාසෝ අස්සාති ආරඤ්ඤකෝ තස්ස අඞගං ආර ඤ්ඤකඞගං-යි.

වෘක්ෂමූලයෙහි විසීම වෘක්ෂමූලනම්වේ. ඒ වෘක්ෂමූලයෙහි විසීම සිලවූයේ මෝහටනුයි වෘක්ෂමූලික නම්වෙයි වෘක්ෂමූලිකයාගේ අඞගය වෘක්ෂමූලිකඞග නම්වේ.

එසින්කිහ,

රුක්ඛමූලෙ නිවාසෝ රුක්ඛමූලං තං සිලමස්සාති රුක්ඛමූලිකෝ රුක්ඛමූලිකස්ස අඞගං රුක්ඛමූලිකඞගං-යි.

අඞ්ගාකාසික අංගයෙහිද සොසානිකඞගයෙහිද මෙමන්යායි.

එසින්කිහ,

අඞ්ගාකාසිකසොසානිකඞෙගසුපි එසෙව නයෝ-යි.

යථාසන්ථතිකඞගයෙහි යම්සෙනස්නක් පණවනලදද හෙතෙම යථා සන්ථති නම්වේ, "මේ ඔබවහන්සේට පැමිණෙන්නේයයි මෙසේ පැමිණි පලමුකොට උදෙසනලද සෙනාසනයට යථාසන්ථතියයි කතු නමෙකි. ඒ යථාසන්ථතියෙහි විසීම ප්‍රකාශවූයේ මෝහටනුයි යථාසන් ථතික නම්වේ. ඔහුගේ අඞගය යථාසන්ථතිකඞග නම්වේ.

එසින්කිහ,

යදෙවසඤ්ඤතං යථාසඤ්ඤතං යථා තං ඉදං තුයහං පාපුණාතීති. එවං පඨමංඋද්දිඨ සෙඛාසනසසතං අධිවචනං තස්මිං යථාසඤ්ඤතෙ විහරිතුං සිලමසසාති යථාසඤ්ඤතිකො. තසස අඞගං යථාසඤ්ඤතිකඞගං-යි.

නෙසජ්ජිකඞගයෙහිද බැසගෙවීම ප්‍රතික්ෂෙපකොට නිසද්‍යා වෙන්විසිම ප්‍රකෘතිවූයේ මෝහවනුයි නෙසජ්ජිකනම්වේ, ඔහුගේ අංගය නෙසජ්ජිකඞගනම්වේ.

එසින්කිහ,

සයනං පටික්ඛිපිත්වා නිසජ්ජාය විහරිතුං සිලමසසාති නෙසජ්ජිකො තසස අඞගං නෙසජ්ජිකඞගං-යි.

මේ සියලු ධුතාඟයෝ වනාහි ඒ ඒ පංසුකූලාදි අඞගයන්ගේ සමාදානයෙන් හාසනලද කෙලෙසයන්ඇති බැවින් ධුතාඞග වශයෙන් ප්‍රකීර්ණ තෘෂ්ණාපාදදි පාපධර්මයන් ඇතිබැවින් ධුතඛිඤ්ඣුහුගේ අඞගයෝ නුයි කොලෙසුන් නසන හෙයින් හෝ ධුතාඞගයයි ලද ව්‍යවහාර ඇති නුවණ අඞගවූයේ මේ සමාදානයවනුයි ඒ සමාදානයෝ ධුතාඟ නම්වෙත්. නොහොත් ධුතාඟවූවාහුත් ඔහුමය ප්‍රතිපක්ෂයන් නසන හෙයින් ශීලාදි සමූහක් ප්‍රතිපත්තියට අඟයෝත් ඔහුම නුයි ධුතාඟයෝ නම්වෙත් මෙසේ පලමුකොට මේ ධුතාඟයෙහි අර්ථවිනිශ්චය දතයුතුයි.

එසින් කිහ.

සබ්බානෙව පනෙතානි තෙන තෙනසමාදානෙන ධුතකිලෙසතතා ධුත සඞඛිතතා භික්ඛුනො අඟානි කිලෙස ධුනනතො වා ධුතපතති ලඞඛොහාරං ඝඩණං අඞං එතෙසනති ධුතඟානි අථවා ධුතානිවතානි පටිපක්ඛනිඛුනනතො අඟානිව පටිපත්තියානිපි ධුතඟානි එවතතා වෙත් අත්ථතො විඤ්ඤුතබ්බා විනිච්ඡයො-යි.

මේ සියලු ධුතාඟයෝ සමාදාන චෙතනාව ලක්ෂණකොට ඇත්තාහුයි.

එසින් කිහ.

සබ්බානෙව චෙතානි සමාදානචෙතනාලක්ඛණානි-යි.

සියලුම ධුතාඟයෝ තෘෂ්ණාචාරසංඛ්‍යාත ලොලුප්පවිඛංසනාකාරයකොට ඇත්තාහුයි.

එසින් කිහ.

සබ්බානෙව ලොලුප්පවිඛංසනාරසානි-යි.

මීකායෙහිදු මෙම කිහ.

ඛුසලභණ්ඩස්ස භූසං විඵමපනඤෙන ලොලුපපං තණ්හාවාරෝ තස්ස විඛංසනතඤා ලොලුපප විඛංසන රසානි-යි.

තෘෂ්ණාවාර සංඛ්‍යාත ලොලුපපභාවයක් නැති බව ප්‍රත්‍යුප සථාන සංඛ්‍යාත වැටහීම්කොට ඇත්තාහුයි.

එසින් කිහ.

නිලෙලාලුපපභාව පච්චුපඨානා-යි. අල්පෙච්ඡතාදීවූ පරිසුඛශීලා දි ධර්මයන් පදසථාන සංඛ්‍යාත ආසන්නකාරණකොට ඇත්තාහුයි

එසින් කිහ.

අපපිච්ඡතාදි අරියධම්මා පදඨානානි-යි. මෙසේලඤණරස ප්‍රත්‍යු පසථාන පදසථානය යන මොවුන්ගේ වශයෙන් විනිශ්චය දත යුතුයි. සමාදානවිධානාදියෙහි වතානි මේ සියලුම බුතාඟයෝ ඝන තර අවිද්‍යානිමිර නිකර විධ්වංසනකර ප්‍රඥාප්‍රදීපවූ භගවත් සම්‍යක් සම්බුඛ සර්ඥයන්වහන්සේ ජීවමානකාලයෙහි බුදුන් සමීපයෙහිම සමාදන්විය යුතුය බුදුන් පිරිනිවිකල්හි මහා ශ්‍රාවකයන්හු සමීප යෙහි සමාදන්විය යුතුය මහසවවන්හු නැතිකල්හි රහත්නමක් සමීපයෙහි සමාදන් වියයුතුය. එසේනැතිකල්හි අනාගාමී නමක් සමීපයෙහි සමාදන්වියයුතුය එසේ නැතිකල්හි සකෘදාගාමී නමක් සමීපයෙහි සමාදන්විය යුතුය. එසේ නැතිකල්හි සෝවාන් නමක් සමීපයෙහි සමාදන්විය යුතුය. එසේ නැතිකල්හි පිටකත්‍රයධාරී න මක්සමීපයෙහි සමාදන්විය යුතුය. එසේ නැතිකල්හි විපිටකධර න මක් සමීපයෙහි සමාදන්වියයුතුය. එසේ නැතිකල්හි එකපිටකධර නමක් සමීපයෙහි සමාදන්විය යුතුය. එසේ නැතිකල්හි සඞ්ඝයක් හෝ ධරණතමක් සමීපයෙහි සමාදන්විය යුතුය. එසේ නැති කල්හි අවුවාචාරිනමක් සමීපයෙහි සමාදන්විය යුතුය. එසේ නැති කල්හි බුතාඟධාරී නමක් සමීපයෙහි සමාදන්විය යුතුය. බුතාඟධර නමක් නැතිකල්හි චෛත්‍යගහනයක් හැමද උක්කුවුතයෙන් හිද ජීවමාන බුදුන් සමීපයෙහි කියන්නක්හුමෙන් සමාදන්විය යුතුය. අනිකෙකුදු ඇත හේ කවරේද? තමන් විසිනුදු යමාදන්වන්ට වුවනේමැයි. **එසින් වදලේය.**

බුඛසොස මහතෙරහු විශුඛිමාගියෙහි

සමාදානවිධානතොනි ආදිසු පන පඤසු සබබානෙව බුතඟානි ධරමානෙ භගවති භගවතොව සන්තිකෙ සමාදානබබානි පරිනිබබු තෙ මහාසාවකසස සන්තිකෙ තසමිං අසති ඛීණාසවසස අනාගාමිසස

සකදාගාමිස්ස සොතාපන්නස්ස තිපිටකස්ස ද්විපිටකස්ස එකපිටකස්ස එකසංගීතිකස්ස අඞ්ගකථාවරියස්ස තස්මිං අසති ධුතඞ්ගධරස්ස තස්මිම්පි අසති චෙතියඞ්ගණං සම්මජ්ජිත්වා උක්කුටිකං නිසීදිත්වා සම්මා සම්බුද්ධසාසනන්තිකෙ වදන්තෙන විය සමාදුතබ්බානි අපිච සයම්පි සමාදුතුං වට්ටති-යි.

මේ සියලු ධුතාඞ්ගයන්ම, රක්ෂාකරන්නවුන් විසින් ධනනිධාන කොට සියල්ලට නොඅඟවා රක්නා ධනලෝභී පුරුෂයක්හු සෙයින් තමා ධුතාඞ්ගධර බව කිසිවක් හට නොඅඟවා රක්ෂාකළයුතු. ඒ එසේමය, තමා සමාදන්වීමෙහි චෙතියපර්වතයෙහි විසූ දෙබෑ තෙරුන් කෙරෙන් වැඩිමහලු තෙරුන්ගේ ධුතාඞ්ග අල්පෙච්ඡතාව මෙහි කිය යුතුයි. ඒ කෙසේදයත්? එක් දෙබෑතෙර දෙනමක් සෑහි රිය වෙසෙනි ඒදෙනමින් වැඩිමහලු තෙරහු නෛෂජ්‍යිකඞ්ගය දරණ බව කිසිවෙක් නොදන්නේය එක් දවසෙක මධ්‍යම රාත්‍රියෙහි ශයන්හි පලඟ බැඳ වැඩහුන් කල්හි මල් මහතෙරහු විදුලි ආලෝ කයෙන් වැඩහුන්නවුන් දැක සාමිනි නෛෂජ්‍යිකඞ්ගය රක්නා සේක්දැයි විවාලෝය තෙරහු තමන්ධුතාඞ්ග අල්පෙච්ඡතාවෙන් ශ්‍රේෂ්ඨ බැවින් එමවිදම විදුලිය ආලෝකයත් බොහෝ වේලාවක් නොපවතින බැවින් බැය හෙවීමෙන් ධුතාඞ්ගධර බව නොඅඟවා පසුව නැඟි වැඩවුන්හ මේ වන්හි සියලු ධුතාඞ්ගයන්ටම සාධාරණ කථාවෙකි. මෙම කථා කීහ.

විශුද්ධිමාර්ගයෙහි

එත්ථ චෙතිය පබ්බතෙ මෙහානික ථෙරා නං ජෙට්ඨභාතු ධුතඞ්ග පරිභෝජනාය වත්ථුකථෙතබ්බං අයං තාව සාධාරණකථා-යි.

දැන් එකඑක ධුතාඞ්ගයක්හුගේ ඒඒ ධුතාඞ්ගය සමාදන්වන ක්‍රම හා ධුතාඞ්ගයෙහි පිළිපදින්නා විධි හා ඝන මධ්‍යමොත්තරාඞ්ග වශයෙන් ප්‍රභේද හා ධුතාඞ්ගයන්ගේ බිඳීම හා ධුතාඞ්ගය පූරණයෙහි අනුසස් හා යන මේ පස වණ්ණනාකෙරෙන්, ඒකෙසේදයත්?

පංසුකූලිකඞ්ගං නාම "ගහපති දුනුවිවරං පටික්ඛිපාමි පංසුකූලි කඞ්ගං සමාදියාමි" යනුවෙන් ගිහින්දුන් සිවුරු ප්‍රතික්ෂේපකෙරෙමි පංසුකූලිකඞ්ගය සමාදන්වෙමියි යනමේ දෙකින් එක්තරා වචනය කින් සමාදන්විය යුතුය, මෙහි ගෘහපතීන් විසින් දුන් සිවුරු නොගනිතහොත් එයින් පිටත්වූයේ පාංසුකූලිකමය එහෙයින්, "ගහ පති දුනුවිවරං පටික්ඛිපාමි,, කීවද පංසුකූලිකඞ්ගය සමාදන්වීමියි කීවානම් වෙයි. "පංසුකූලිකංගං සමාදියාමි,, කිවද පංසුකූලිකඞ්ගය සමාදන්වූවහොත් ගෘහපති විවර නොපිළිගතහැකි බැවින් ගෘහපති විවරය ප්‍රතික්ෂේපකළානම් වෙයි, එහෙයින් "ගහපතිදුන විවර•

පටික්ඛිපාමි පංසුකූලිකඞ්ගසමාදියාමි,,යි යන මේවචනයන් දෙදෙනා කෙරෙන් එක්තරා වචනයකින් සමාදන්විය යුතුයයි යනු කිහු. මේ පංසුකූලිකඞ්ගයෙහි සමාදන්වන ක්‍රමයයි.

මෙහි පිළිපදින ක්‍රමය කෙසේදයන්?

එවං සමාදිඤ්ඤා ධුතඞ්ගන පහ තෙන සොසානිකං පාපණිකං රථිය වොළං සංකාර වොළං සොණ්ඩි යං නහානවොළං නිත්‍යවොළං ගතපච්චාගතං අග්ගදඞ්ඩං ගොඛායිතං උපචිකඛායිතං උන්දුර ඛායිතං අනන්තජ්ඣානං දසඝජ්ඣානං ධඤ්ඤකටං ථූපවිවරං සමණවිවරං ආභිසෙකිකං ඉඞ්ඝිමයං පඨවිකං වාතාහතං දෙවදත්තියං සාමුද්‍රී යනහි එතෙසු අඤ්ඤතරං විවරංගනෙත්වා එලෙත්වා දුබ්බලංඛ්‍යානං පහාය පිරණ්හානි ධොවිත්වා විවරංකත්වා පොරාණගහපති විවරං අපනෙත්වා පරිභුඤ්ජිතබ්බං-යි.

දක්වනලද බැවින් මෙසේ සමාදන්වනලද ධුතාඞ්ග ඇති එම මහණහු විසින් සොසානිකයයි කියනලද සොහොනෙහි කිසිවක්හු විසින් දමූ පිළිය පාපණිකයයි කියනලද බඩු වික්‍රණන අවුණුදෙර දමූ පිළිය. රථිය වොළයයි කියනලද පින්කැමැත්තවුන් විසින් කවුළුදොරින් ඇලලූ විථියෙහි දමූ පිළිය, සංකාර වොළියයි කියන ලද කසලගොඩ දමූ පිළිය, සොණ්ඩියයි කියනලද ගර්හමල පිසදමූ පිළිය, නහානවොළයයි කියනලද යකදුරන්විසින්*ඉසින් නහවන ලද නිශ්‍රික කඩයයි කියා දමාගන පිළිය, නිත්‍යවොළයයි කියනලද නහනතොට දමූ පිළිය ගත පච්චාගතයයි කියනලද සොහොනට ගොස් නැවත ආවාහු නහා දමා යන පිළිය අග්ගදඞ්ඩයයි කියන ලද ගින්නෙන් දැකල දෙස් ඇතැයි මිනිසුන් විසින් දමූ පිළිය ගොඛායිතයයි කියනලද ගවයන් කැවෙන් දෙස් ඇතැයි මිනිසුන් විසින් දමූ පිළිය, වෙයන් මියන් කැ පිළිය, අන්තයෙන් දහයෙන් සුන් පිළිය,ධජාහටයයි කියනලද නැවට නැගෙන්නාවුන් විසින් ධජ බැඳ නැවිනැගී ගියකල ඔවුන්ගේ දශිනාති ක්‍රමයෙන් ගත යුතුවූවිළි හා සුඩ භූමියෙහි ධජ බැඳ දෙසෙනග ගියකල ගතයුතු පිළිය ථූපවිවරයයි කියනලද තුඹස සිසාරා බලිකම්කොට දමූ පිළිය, සමණ විවරයයි කියනලද ශ්‍රමණ සංතක විවරය ආභිසෙකිකයයි කියනලද රජහුගේ අභිසෙකසථානයෙහි දමූ පිළිය, සෘඞ්මයයි කියනලද එහි භික්ෂුභාවයෙන් ලද සිවුරය, පන්ථිකයයි කියනලද අතුරුමඟ යම්කෙණෙකුන්ගේ සිහිමදවීමෙන් වැටුනේ ඇතම් ආචාරිකෙණෙක් මදක් කල් රැකසිටගත යුතුයයි කියාද

---

* යකුන් හුණුවන්

ඇතම් ආචාරිකෙණෙක් දෙතුන් දවසක් රැකසිඳෙන්න යුතුයයි කියා කියනලද පිළිය, වාතාහතයයි කියනලද වාතවෙගයෙන් දුර හෙලන ලද්දේ ඊට හිමියක්හු නොපෙණෙනකල්හි ගතුයුතු පිළිය. දෙවදන්නියයි කියනලද අනුරුත් මහතෙරුන්ට දෙවියන් දුන් වස්ත්‍රය මෙන් දෙවියන් දුන් පිළිය, සාමුද්දියයි කියනලද මුහුදු රළින් ගොඩලනලද පිළිය යන මොවුන් කෙරෙහි එක්තරා සිවුරක්ගෙණ පලා දුම්ලසථානයන් හැර තරතැන්දෙවගෙණ සිවුරු කොට පුරාණ ශාඛපභිවිවරයහැරපසුල්සිවුර වැළඳගතයුතුයි. තවද යම් සිවුරෙක්වනාහි සඟහට දෙමිහයි දෙනලදද කඛසියිම් පිණිස ඇවිදිනවුන් විසින් හෝ ලද්දේද හේ පංසුකූල නම් නොවේ භික්ෂූ නිසිය විවරයද යමෙක් සඟනටහෝ ගණයටහෝ දෙන්නවුන් විසින් වඤ්ඤාග්‍රයෙන් පමුණුවාදෙනු ලැබේද සෙනසුන්කෙරෙවවන් විසින් සෙනස්නෙහි වසන්නුවන්ම වැලඳගත මැනවැයි දෙනලද සෙනසුන් සිවුරෙක් හෝ වේද හේද පසුල් සිවුරුනම් නොවේ වචන සංඥාවෙන් නොපමුණුවාදෙනලද්දේම පංසුකූලනම්වේ. ඒ වාක්සංඥාවෙන් නොපමුණුවාදෙනලද සිවුරෙහිදු යම් යම් සිවුරෙක් දායක යන් විසින් භික්ෂූහුගේ පාමුල්හි තබනලදද, ඒමහණහු විසින් වනාහි පංසුකූලිකයහට අතෙහි තබා දෙනලදද, ඒ චීවරය දායකයා විසින් පාමුල්හි තබා දුන් බැවින් එකතොසුඛි නම්වේ. යම් සිවුරෙක් භික්ෂූහුගේ අතෙහි තබා දෙනලදද, ඒ භික්ෂූහු විසින් වනාහි පංසුකූලිකයාගේ පාමුල්හි තබා දෙනලදද, ඒ සිවුරද භික්ෂූහු විසින් පාමුල්හි තබා දුන් බැවින් එකතොසුඛිකනම්වේ. යම් සිවුරෙක් භික්ෂූහුගේ පාමුල්හි තබා දෙනලදද, ඒ භික්ෂූහු විසිනුදු එසේම පාමුල තබා දෙනලදද, ඒ සිවුරුලාභයෙහිද දායෙහිද පාමුල්හි තැබූ බැවින් උභතොසුඛිකනම්වේ, යම් සිවුරෙක් අත්හි තබා දෙනලදද, දෙනකලත් අත්හි තබා දෙනලද්දේවීනම් ඉ අනුත්කෘෂ්ටවිවරනම්වේ. මෙසේ මේ පංසුකූලිකභෙදය දැන පංසුකූලිකයා විසින් සිවුරු වැලඳගන්නේයයි මේ මෙහි පිලිපදිනාවිධියයි, මේ වනාහි එහි ප්‍රභෙදයි පංසුකූලිකයෝ තුන්දෙනෙකි, ඔහු කවුරුද යත්? උත්කෘෂ්ට පංසුකූලිකය මධ්‍යම පංසුකූලිකය මෘදුක පංසුකූලිකය යනමේ තුන්දෙනායි, ඒ තුන්දෙනා කෙරෙහි යමෙක් සොඟොනෙහි පියු කඩම ගත්තේද හේ උත්කෘෂ්ට පංසුකූලික නම්වේ, ප්‍රව්‍රජිතයෝ ගනිත්වයි තබනලදදෑ ගන්නේ මධ්‍යමපංසුකූලිකනම් වෙයි, පාදමූලයෙහි තැබූවාහන්නේමෘදුකපංසුකූලිකනම්වෙයි. ඔවුන් කෙරෙහි යම්කිසිවක්හට තමහට කැමතිවීමෙන් ගිහින් දුන්සිවුරු ඉවසූකණෙහි දුවඟබිඳේ මේ මෙහි හෙදයයි "පබ්බජිතානඤ්ඤස්ස නත්ථි ඨපිතකංගණඤ්ඤතෙත්තා මඤ්ඤිමෝ"යි කීබැවින්සොඟොනෙන් පිටත් සෙසුතැන්හිදු නොඋදෙසා නිවුවාගන්නේ උකටමවේ යනු

සිඩය. "සොඝානිකං යෙව ගණ්හනෙකා"යන මේවනාහි අතිඋක්කණ්ඨිතයින් කියනලදයෙන් මේ මතු දක්වන්නේ එහි අනුඝසයි. කෙසේ දයත්? පංසුකූලය නිසා පැවිදියයි වදළ බැවින්ද මහණමළුවෙහි විචාරණලදුව පංසුකූලය නිසා පැවිදිවෙමියි තමාම ප්‍රතිඥකළ බැවින්ද වචන නිශ්‍රයට සුදුසුවූ පිළිවෙත් බවය පලමුවන ඉතරිතර ආඝ්‍යිවංශයෙහි පිහිටි බවය නොයෙක් තැනින් අවුලාගත් කඩ තබා මැසුබැවින් ලොභ නොකටයුතු බැවින්ද සිවුර රක්ෂාවෙහි දුක් නැති බවය යම්කිසිවක්හට පැවතසිට ලැබිය යුතු දෙයක් නොවන බැවින් අනුන් අයිති වෑතති නැති බවය සොරුන් විසින් ලොභකොට ගතයුතු අභාණ්ඩදෙයක් නොවන බැවින් සොරබියෙන් භයනැති බවය යම් අනර්ඝ සිවුරක් ඇත්නම් එපරිභොගකිරීමෙහි පෘථග්ජනයන්ට තෘෂ්ණාව උපදනේය මේ පසුල්සිවුරවනාහි විශෙෂයෙන්ම එබය එහෙයින් පරිභොග තෘෂ්ණා නැතිබවය ලොභාදී අකුසල් සින් මැඩපවත්වන්නට නිසිව සිටි බැවින් ශ්‍රමණ සාරූප්‍යපරිසකාර බවය මහත් අනර්ඝනොවන බැවින් අල්පයහ. එකතැනකින්ම සැපවියයුතු නොව නොයෙක් තැනින් සපයාගත හැකි බැවින් සුලභයහ සුලභවූවද එක්විසි අනෙස්සනන් නොඋපදවන බැවින්ද මට අයහපත් කඩදී තොපි යහපත් කඩයගතු යනාදී යම්කිසිලජ්ජා කටයුතු වචනයක්මෙහි නොඋපදනාබැවින්ද අඟනිගමනක් සම්ප නැති බැවින්ද යනාදින් නොයෙක් කාරණා යෙන් නිවරදි බවය සඩ්ඝගහ ප්‍රවාහවූ භගවත් සම්‍යක් සම්බුඩයන් විසින් වණ්ණනාකොට වදළ ප්‍රත්‍යයක් බවය ඇසු දුටු නොයෙක් දිව්‍ය මනුෂ්‍යයන්ට ප්‍රසාද ඵලවන බවය ලොභාදී අකුශල ධර්මයන් ගේ උපපත්තියට කාරණව සිටි මහවඡිතාවනසා අලොභාදී නොයෙක් කුශල ධර්මයන්ගේ උපපත්තියට කාරණව සිටි අල්පෙච්ඡතාදි ගුණසඝස්‍රයන්ගේ නිෂ්පත්තියට කාරණ බවය ධාතාභ පුරණ මනාවූ ප්‍රතිපත්ති උපයදා පිණිසයි. මතුයෙහි වන සම්‍යක් ප්‍රතිපත්තිය වඩන්නේය පශ්චිම ජනයාගේ මෙම දෘෂ්ටිය අනුවීමට පැමිණීමය යන මොහු අනුඝස් නම්වෙත්—අපිව—මරු හා මාරඝසනාවගේ ප්‍රභාණිය පිණිස පංසුකූල විවරය දැරූ තපස්විගෙක් ඇද්ද ඒ තපස්වීතෙම කෙසේ සොහමානව බබලාදයන්? බුඩහුම්ගෙහි යම් ක්ෂත්‍රිය රජෙක් බදනාලද සන්නාහ ඇතිව අවඝඡායුධගෙන් පිරිවරණලදුගේ සොහමානවෙද බබලාද ඒ ක්ෂත්‍රිය රජහු සෙයින් සොහමානව බබලන්නේය.

එයින් කිහ.

මාරසෙන වි ඝාතාය පංසුකූල ධරෝ යති
සඤාඩ කවචෝ යුඩෝ ඛත්තියෝ විය සොහති-ති.

කසීසළු ආදිවූ උතුම්වූ අනඝී වස්ත්‍රාභරණයන් ප්‍රතික්ෂේපකොට මෘතකලේබර හා සමග සොහොනෙහි දැමූ කඩ ගෙණ සිවුරුකොට නිලොහුරු බුදුන් විසින් යම් පසුල්සිවුරක් දරණලදද දැරීමෙන් ප්‍රභිපත්ති ගෞරවය කරණලදද ඒ කාරණයෙන් කවරෙක් නම් ඒ පංසුකූලචීවරය නොදරන්නේද දරන්නේමැයි.

එසින් කිහ.

පභාගයකාසිකාදිනි වරවත්‍ථානි ධාරිතං
යං ලොක ගරුනා කෝ තං පංකූලං න ධාරයෙ–යි.

එසේ ලොකාචාරිහු විසින් දුරු බැවින් මෙසස්නෙහි භික්ෂූ තෙම නමාගෙ ප්‍රථම මහණ මළුයෙහි කළ ප්‍රතිඥාව සිහිකරන්නේ යොගාවචරයන්ට අනුලොම්වූ පංසුකූල චීවරයෙහි ඇලෙන්නේය ඒ දුරීමෙහි උත්සාහ වඩන්නේය.

එසින් කිහ.

තසමාහි අත්තනෝ භික්ඛු පරිඤ්ඤං සම්පස්සරං
යොගාවචරාතු කූලම්හි පංකූලේ රතොසියා–යි.

මේ පංසුකූලිකඛගයෙහි සමාදානය විධානය ප්‍රභෙදය භෙදය ආනිසංසය යන මොවුන්ගේ වශයෙන්සංවණ්ණනායි–**තෙචීවරික කඛගෙහි** සමාදානාදිය කෙසේදයත්? "චතුත්‍ථක චීවරං පටික්ඛිපාමි තෙචීවරිකඛගං සමාදියාමි" යනුවෙන් සඟලසිවුරය පොරොණසිවුරය අදනාසිවුරයයන තුනටවැඩිසතරවන සිවුරප්‍රතික්ෂේපකෙරෙමි තෙචීවරකඛගය සමාදන්වෙමි. යන මේ වචනවලයෙන් එක්තරා වචනයක්කියා සමාදන්වියයුතු ඒතෙචීවරිකඛගය සමාදන්වූවාහුවිසින් සිවුරුපිළිලදින් යම්තාක් අඵාසු බැවින්. හෝ කරන්නට නොපොහොසත්වේද යම්තාක් සිවුරුකරන්නට දන්නක්හු හෝ නොලැබේද හිඳිකටු ආදියෙහි කිසිවෙක් හෝ සම්භනොවේද ඒතාක් කල් නිබ්ය යුතු සිවුරු කරණතැන් දක්වා වස්ත්‍ර තිබූ කරුණෙන් සනනිධිදොසද නොවෙයි ධුතාඟ භෙදය නොවෙයි සිවුරුකොට රුදුතැන්පටන් නොවැලඳ තබන්ට කොවටනේය පරණසිවුරු හැර මේ සිවුරු වැලඳගනිමියි තබන්නහුට ධුතාඟ භෙදනොවෙයි ධුතාඟසමාදානයහයි කියත්. මේ උක්තප්‍රකාරවූ විධිය තෙචීවරිකඛගයාගේ විධියයි. ප්‍රභෙදභෙයින් චතාඟි මෙ තෙචීවරිකඛගද තුන් වැදෑරුම්වේ එහි උත්තාඟතෙචීවරිකඛගයා විසින් සිවුරු රදන කල්හි පලමුකොට හදනා සිවුර හෝ පොරොණා සිවුර හෝ රදු ඒහැඳ පෙරව නැවත සඟලසිවුරු රැඳිය යුතුය සඟල සිවුර චතාඟි හදනට නොවටනේය. මේ ඔහු ගාමන්තසෙනාසනයෙහි වසනකල

කථාවස්තුවතය ආරණ්‍යයෙහි වසන තෙවිවරිකයා විසින් වනාහී දෙසිවුර එක්කොට සෝදා රදන්ට වටනෙය යම්සේ කිසිවක්හු දූක සිවුරු හැඳ මතුයෙහි කරන්ට පොහොසත්වේද එසේවූඅයන්නසථා නෟයෙහි හිඳුවූතුය. මධ්‍යම තෙවිවරිකයාහට සිවුරු රදනකල රඤ්ඤාසයාලාවෙහි සිවුරු රදනතුරා හඳනට තබනලද රදන සිවුරු ඇතහොත් ඒ හැඳ පෙරව තමාගේ සිවුර රදන්නට වටනේය. මෘදුක තෙවිවරිකයාහට සහාගසදඝ භික්ෂූන්ගේ සිවුරු හැඳ පෙරව සිවුර රදන්ට වටනේය. අට්ටාවෙහි තමාසතු හඳනා පොරොනා පිණිස නොඉවා සෙනස්නෙහි පසතරණකොට ඉවනලද සිවුරද මෘදුකයහට වටනේය රදනකලටම අනුදත් බැවින් නිත්‍ය පරිභොගය වසයෙන් පරිහරණයකරන්ට නොවටිනියෙත්. සහාග භික්ෂූන්ගේ සිවුරු රදනකලටම වටනෙය තෙවිවරිකයාහට වනාහී සතරවන සිවුර වවමන අංසකාසාවම වටනේය හෙද වනාහී පලලින් වියතෙක්ම දිගින් තුන්රියනෙක්ම වූයෙ වටනේය මෙ තුන්දෙනහටම තුන් සිවුරෙන් පිටත් පෙරහන්කඩ ආදිවූ බාහිර පිරිකරන් මේ සිවුරු ලැබ සෙස්සන්ට දෙමි නොවලඳම්යි සිතා ලබන සිවුරුන් හැර නමා පිණිස තුන් සිවුරෙන් වැඩිකොටහඳනා පොරොණා පිණිස සතරක් ඉවසුකෙනෙහි ධුතාඟ භෙදයවන්නේය. උක්තප්‍රකාරක්‍රමය මේතෙවිවරිකඟයෙහි භෙදයි. මේමතුදක් වන්නේ මෙහි අනුසසිතෙවිවරිකඟය රක්නා භික්ෂුතෙමේ කාඝපරිභරන කරන සිවුරෙන් සතුටුවන්නෙ එහිත් ආකාසයෙහි නහර රහිත බැවින් සැපසේයන පක්ෂියක්හුසේ යාමය මදවූ කෘත්‍යය ඇතිබැවින් අල්පසමාරම්භාත බවය වස්ත්‍රසනනිධියයි කියනලද වස්ත්‍ර සඟවා තබා රක්ෂාකිරීමෙන් දුරුවීමය බොහෝ පරිසකාර නැති බැවින් ලඝුවූ ප්‍රවෘත්තී ඇති බවය තුන්සිවුරෙන් වැඩි විවරයෙක්හි උපදනා ලොභය දුරුවීමය නිසිදනාදි අනුදත් බොහෝ සිවුරු ඇද්ද කැපයෙහිදු පමණ දන්නා බවය සල්ලෙඛ වුත්තිතාය අල්පෙච්ඡභාවාදීන්ගෙ ඵල නිෂ්පත්තියයි යන මේ ආදි ගුණයෝ නිෂ්පන්නාවෙත්. අපිච අතිරෙක වස්ත්‍රතෘෂ්ණාඝඛ්‍යාත තුන්සිවිරෙන් වැඩි සිවුරෙහි තෘෂ්ණාවහාරවස්ත්‍රසනනිධීන් වර්ජිතවූ ධීරවූ යොගිතෙමෙ යන්නාස සැපයෙහි රසය දන්නෙ තුන්සිවුරුධර වන්නාය එහයින් සප්තුවරණවූ සපඤ්ඤවූ පක්ෂියෙකු මෙන් තුන්සිවුරු ධරයොගිතෙමෙ සුවසෙ ඇවිදිනා කැමැත්තෙ තුන්සිවුරු නියමෙහි වඩවඩා ඇළුම්කරන්නේය ගාථාවෙත්‍රු දක්වනලදමැයි.

අතිරෙක වත්ථතණ්හං පහාය සනනිධි විවජ්ජිතො
ධීරො සන්නාස සුඛරසඤ්ඤති චිවරධරො භවති යොගි
තසමා ස පත්තවරණො පකඛිව ස චීවරොව යොගි වරො
සුඛමනු විවරති කාමො චීවර නියමෙ රතිං කයිරා-යි.

මෙසේ යථොක්ත ප්‍රකාරයෙන් දක්වනලද්දේ තෙවිවරිකඞ්ග යෙහි සමාදාන විධාන ප්‍රභේද භෙදනිසංසය යන මොවුන්ගේ ව ණ්ණනාවයි.

පිණ්ඩපාතිකඞ්ග යෙහි සමාදානාදිය කෙසේදයත්? "අහි රෙකලාභං පටික්ඛිපාමි පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමි." යනුවෙන් පිණ්ඩපාතයෙහි ලාභොපභොජනයෙන් අධිකවූ සංඝභත්තාදි අතිරෙක ලාභය ප්‍රතික්ෂේපනයෙරෙමියි පිණ්ඩපාතිකඞ්ගය සමාදන්වෙමියි යන වචනය යෙන් එක්තරා වචනයක් කියා සමාදන්වියයුතු මේ සමාදන්වන අඞ්ග දැනි පිණ්ඩපාතිකයා විසින් වනාහි-

නෙන පන පිණ්ඩපාතිකෙන සංඝභත්තං උද්දෙසභත්තං නිමන්තණං සලාකභත්තං පක්ඛිකං උපොසථිකං පාටිපදිකං ආගන්තුකභත්තං ගමිකභත්තං ගිලානභත්තං ගිලානුපට්ඨාකභත්තං විහාරභත්තං ධුරභත්තං වාරභත්තන්ති එතානි චුද්දසභත්තානි නසාදිතබ්බානි-යි.

දක්වනලද සංඝභත්තයයි කියනලද සියලු සඟනට දියයුතු ඛතය උද්දෙසිකභත්තයයි කියනලද භික්ෂූන් කිපනමක් උදෙසා දියයුතු ඛතය එසේම නිමන්ත්‍රණයයි කියනලද සඟනවවත් පුඟුලවත් නිමන්ත්‍රණයකොට දෙන ඛතය සලාකභත්තයයි කියනලද ලඟතය පක්ඛිකයයි කියනලද එක්පක්ෂයක එක්දවසක් දියයුතු ඛතය උපොසථිකයයි කියනලද උපොසථදවසදියයුතුඛතය පාටිපදිකයයි කියනලද පැලිවියදවස දියයුතු ඛතය ආගන්තුකභත්තයයි කියනලද ආගන්තුකව වැඩි සඟනට ආගන්තුක ඛතක් දෙම්හයි කියා මිනිසුන් විසින් දියයුතු ඛතය එසේම ගම්කඛත්දෙම්හයි, දියයුතුය ඛතය ගිලානභත්තයයි කියනලද ගිලනුන්ට දියයුතු ඛතය ගිලානු පඨාක භත්තයයි කියනලද ගිලනුන්ට උපස්ථාන කරණුවන්ට දෙන ඛතය විහාර භත්තයයි කියනලද තමාකරවූ සඟයතු ආවාසයෙහි වසන සඟනට දෙන ඛුවික ඛත හෝ වෙහෙර උදෙසා දෙන ඛතය ධුරභත්තයයි කියනලද සඟනවවත් පුඟුලවත් ධුරබත්දෙම්හි නිත්‍යයෙන් දෙන භොජනය දනවාකලි ඉගහිතබා සඟනටදෙන බත් හෝ **මිකාවෙහි** "ධුරඉෙහෙ එව ඨපෙත්වා දාතබ්බං භත්තං ධුර භත්තං" යයි දක්වනලද ඛත හෝ ය වාරභත්තයයි කියනලද ගම්වැසි ආදීන් විසින් වාරයෙන් දෙන ඛතයයි යන මේ තුදුස් බත්හු නොඉවසිය යුතුවෙත්.

සචෙ පන සංඝභත්තං ගණ්හාථාති ආදිනා නයෙන අවත්වා අඤ්ඤං භෙහෙ සංඝෝ භික්ඛං ගණ්හාති තුම්හෙපි භික්ඛං ගණ්හථාති චත්වා දින්නානි හොන්ති තානි සාදිතුං වට්ටති සංඝතොනිරාමිසලාභාපි විහාරෙ පක්ඛභත්තම්පි වට්ටති යෙඛානි ඉදමස්ස විධානං-යි.

දක්වනලද හෙයින් යම් කිසි ත්‍රුවණැති දැයකයක්හු විසින් වනාහි සඟබත් ගන්නේයයි යනාදී විසින් තුදුස් බෙහෙත් ඇතුලත් කොට නොගියා අපගේ ගෙයි සංඝයා වහන්සෙ භික්ෂාව ගෙණ වදරණසේක ඔබවහන්සේද භික්ෂාව ගෙණ වදලමැනවැයි කියා භික්ෂා නාමයෙන් දෙනලද බතෙක් ඇඳු ඒ බත්හු භික්ෂානාමයෙන් කිහෙයින් ඉවසන්නට වටින් යථොක්ත ප්‍රකාරයෙන් දක්වන ලද්දේ මෙහි පිණ්ඩපාතිකඞ්ගයෙහි පිළිපදිනා විධියයි. මේ පිණ්ඩ පාතිකඞ්ගයෙහි ප්‍රභෙද කෙසේදයත්? ප්‍රභෙදයෙහි වනාහි මේ පිණ්ඩපාතිකඞ්ගයද ත්‍රිවිධවෙයි ඔවුන් අතුරෙහි උත්කෘෂ්ට පිණ්ඩ පාතිකතෙමේ පෙරවිඳ පසුයෙන්ද හෙණ භික්ෂාව ගන්නේය හෙවත් යම් තැනක වලඳන්ට හුන්නේ සිහාසොඝිය වීථියෙන් හෙණ පෙරටුවන්හා සිහාඝිය වීථියෙන් හෙණ පසු බතහ, යන මේ බත්දෙකත් ලබන්නේය. සම්ප්‍රාපන චාරයෙහිදී පාත්‍රය ගහනාවුන්ටද දෙන්නේය පරිභෝජනයයි කියනලද හොජන ශාලාවට පාත්‍රය හෙණහොත් දෙන බත්ද ගන්නේය වහන්සේ පිඬුපිණිස නොවැඩිය මැනව වෙහෙරටම ආහර ගෙණෙඝයි කියන උපාසකයන්ගේ බස් ඉවසා එදවස් ගිදහොගන්නේය. මධ්‍යම පිණ්ඩපාතිකතෙමේ එසේකියා දෙනබත එදවස් ගිදු ලබන්නේය සෙටදවස පිණිසවනාහි එසේකිවද නොඉවසන්නේය. මෘදුක පිණ්ඩ පාතිකතෙමේ සෙට දවස පිණිසද අනිද්දවස පිණිසද භික්ෂාව ඉව සන්නේය මෙසේ සෙටදවස පිණිසද අනිද් දවස පිණිසද ඉවසන ඒ දෙදෙනෙම අනුන් අසන්නොව වසන සෙරි විහාර සුඛය නොල බත්. උත්කෘෂ්ටතෙමේ ලබන්නේය ඒ එසේමය එක් ගමෙකු වනාහි ආඝ්‍යිංශප්‍රාප්‍ත ප්‍රතිසංයුක්ත ධම් කථාවෙක්වේ එකල්හි ඒ උත්කෘෂ්ට පිණ්ඩපාතික භික්ෂුතෙමේ සෙසු මධ්‍යම මෘදුක දෙදෙනාගට මෙසේ කිවුය එකසේදයත්? පින්වත්නි;බණ අසන්ට යම්හයි කිවුය ඒ අසා මධ්‍යමමෘදුක දෙදෙනා අතුරෙන් එක් නාමක්වහන්ස එක් මිනිසෙකු විසින් අද දවස ආරාධනාකොට මා හිඳුවන ලදුයි කිසේක. අනික් මෘදුකවනාහි වහන්ස! මා විසින් සෙට පිණිස එක් උපාසකයක් හුගේ ආරාධනාවක් ඉවසනලදුයි කිසේක මෙසේ ඒ දෙදෙනාම මහාජන රසය නිසා ධම්රසයෙන් පිරිහුනාහුය උත්කෘෂ්ට පිණ්ඩපා තික තම උදුසන්හිම පිඬුපිණිස ගොස් සිහාවලඳ නැවත බණඅසන පිණිස ගොස්හොජන රසයටලා ලොභනොකෙළේ ධම්රසයට ලොභ හොට ධම් නැමැති රසය අනුභව කළසේක මෙද දක්වනලදමැයි.

එකස්මිං කිර ගාමෙ අරියවංසා හොනි උක්කණ්ඨා ඉතරෙ ආහ ආයාමාවුසො ධම්මසවණායානි තෙසු එකො එතෙ නමහි හනෙන්ත මනුසෙන නිසීදාපිතොනි ආහ. අපරො මයා හනෙන්ත සාතනාය

එකසඝ්ගිකඛා අධිවාසිතානි එවංතෙ උභොපි පරිහිණා ඉතරෙ පාතොව පිණ්ඩාය චරිත්වා ගන්ත්වා ධම්මරසං පවිසංවෙදෙසි-යි.

මෙසේ දක්වනලද තුන්දෙන හවම සංඝභත්තාදි අනිරෙක ලාභය ඉවසු කෙණෙහිම ධුතාඟ හෙදවේ. මෙසේ උකතප්‍රකාරයෙන් දන්වනා ලද්දේ පිණ්ඩපාතිකඞ්ගයාගේ හෙදයයි

ඒ පිණ්ඩපාතිකඞ්ග යෙහි අනුසස් කීමයත්? පිණ්ඩි යාලොප හොජනය නිසා පැවිදියයි වදාළ බැවින් නිශ්‍රයානු රූපවූ පිළිවෙත් ඇතිබවය දෙවනුවූ ආයාසීවංශ යෙහි පිහිටීමය අනුන් අත්තනොවන ප්‍රවෘත්ති ඇතිබවය අල්පයග සුලභයග ඔහුදු නිවරදයහයි බුදුන් විසින් සංවණ්ණිත ප්‍රත්‍යය බවය ජංඝාබලය නිසා පිඬු සිඟහබැවින් ඛුසීතභාවයාගේ මැඩීම ඇති බවය පිරිසුදුවූ ආජීව ඇතිබවය අනන්තර ඝරයට වදනා හෙයින් සෙඛියා ප්‍රතිපත් පිරෙන බවය පමණදන පිළිගැන්මෙන්ද අනුන් හා හැනි නොවසන බැවින්ද පරපොෂණයක් නැතිබවය ගෙන් ගෙන් මදින් මදින් පිලිගැන්මෙන් පරානුග්‍රහ කරණබවය, "අන්න ම්දං භික්ඛවේ ජීවිකානං යදිදං පිණ්ඩොල්‍යං"යි වදාළබැවින් අන්තිම ජීවිකාව කරණකොටගෙණ මානයාගේ ප්‍රහාණිවීමය මනායෙක් ඉග යින් ලද මුසු අහරින් යැපෙන බැවින් රස තෘෂ්ණාවගේ වැලකීමය නිමන්ත්‍රණය නො ඉවසන බැවින් ගණ හොජන සිකපදය පරම්පරා හොජන සිකපදය යන මෙයින් ඇවැත් නැතිබවය අල්පෙච්ඡතා දින්ට අනුලොම් පැවතුම් ඇතිබවය මනා පිළිවෙත් වැඩීමය ධනාදියෙන් හීණවූ සච්චයෝද තමන් හෙදෙරට සම්ප්‍රාප්ත කල තමන්ලද දෙයකින් අනුරුත් මහතෙරුන්ව ඉසුක දුබ්‍යාමේ මුග ලන් මහතෙරුන්ට කාකවලිය දුගිහු සෙයින් පින්රැස්කොට ගෙණ සුගතියට යන බැවින් පච්ඡිම ජනයාව අනුකම්පා ඇතිබවය යන මෙයි. අපිව පිඬු සිඟීමෙන් ආලොපයෙන් සතුටුවූ උපාසකයාගේ ආරාධනා නො ඉවසන බැවින් හා එක්විසි අනෙස්සනින් ජීවිකාව නොකරණ බැවින් අනුන් අයත්නොවන ජීවිකා ඇති රසමසවුලෙන් නොයෙක් ලෙසින් සරහා දෙනලද තුදුන් බත් ප්‍රතික්ඛෙපකොට සිහාලද ආහාර වලදන බැවින් පහතරණලද ලොල්බව ඇති මහණ තෙමේ නොපැකිලෙනලද පැවතුම් ඇති බැවින් සතරදිගමම නිසි වූයේ සතරදිගින් අනිප්‍රානුකූලවූ දිගකට යන්නට සමර්ථවන්නේය වැසි අවු සුලන් සෙල් කදු ආදී නොසලකා භික්ෂාවට එලඹියයුතු බැවින් කුසීතබව දුරුකරන්නේ එහෙයින්ම ආජීවය පිරිසිදුවන් නේය මේ ආදී නොයෙක් ගුණ සඟසුයන්ගේ උත්පත්තියට කාර ණාව සිටි බැවින් භික්ෂාචාරය නො ඉක්මවන්නේය මෙබදු ගුණ යෙන් සමන්විත තමාම රක්කාවූ එසින්ම අපරපොෂිත පිණ්ඩ පාතික භික්ෂුතෙමේ ඉදින් ලාභය යසය යන මොවුන් ඇසුරු කෙන

කළේ වීනම් හෙවත් මෙබඳු ගුණයෙ දුටු ලොකවාසීන් විසින් කරණ ආදර බහුමානයෙහි ලොභ මෙම ඉපදවීමෙන් අනිත්‍යාදිය නොස ලකා ලාභ කැමත්වීමෙන් බොහෝ පිරිවර කැමති වීමෙන් යුකත නොව මනාපයක් දිහින් වදනා චිතයෙන් කමපාකොට ගතතනො හැකි පව්තයක්සේ ලාභාදියෙහි ලොභාදිය නොකොට අපිස්ස තොස් ගුණයෙන්ම සමන්විත වීනම් ශක්‍රාදි දෙවියෝ පවා පතත් ඔහුගේ සිල් ආදිගුණෙහි බුහුමන් කරන්නාහු ආදරකෙරෙත්.

එසිත්කිහ.

පිණ්ඩියාලොප සන්තුට්ඨා අපරායනත ජීවිකා
පගිණ්ණාගාර ලොලුප්පා හොති චාතුද්දිසා යති.

විනොදයතිකොසජ්ජං ආජීවසස විසුජ්ඣති
තසමානි නාහි මෙඛුද්දස්ස භික්ඛාචරියං සුමෙධසො.

එවරූපසසහි පිණ්ඩ පානිකසස භික්ඛුනො
අත්තහරසස අනුද්ධසුපොසිනො
දෙවාපිහයන්ති තාදිනො
නොවෙ ලාභසිලොක නියසිතො-යි.

යථොක්ත ප්‍රකාරයෙන් දක්වනලද්දේ මේ පිණ්ඩපානිකඞ්ගයෙහි සමාදානය විධානය ප්‍රභෙදය ඉතදය ආනිසංසය යනමොවුන්ගේ සංවණ්ණනායි.

සපදානචාරිකඞ්ගයෙහි සමාදානාදිය කෙසේදයත්? "ලොලුපප චාරං පටික්ඛිපාමි සපදානචාරිකඞ්ගං සමාදියාමි. යනුහෙයින් ලොලුභාව යෙන් ගෙපිළිවෙළ ඉක්ම හැසිරීම ප්‍රතිසෙධ කෙරෙමි සපදානචාරිකඞ්ගය සමාදන්වෙමියි යන මෙයින් එක්තරා වචනයක්කියා සමාදන්වියයුතුවේ. මෙසේ සමාදන්වනලද අංගඅැති ඒ සපදානචාරිකයාවිසින් භික්ෂාපිණ්ඩය ගමට පැමිණිකලහි ගම්දොර සිටි ඇත් අස් ගවමහිෂාදිදෘශ්‍යම් කිසිවක්හු කෙරෙන් උපද්‍රව නැතිබව සැලකියයුතුයි එසේ සැලකුකල්හි යම් විපියකහෝ ගමක හෝ යම්කිසි උපද්‍රවයක් පෙණෙනම් ඒ විපිය හෝ ගම හෝ තැර උවදුරු නැති තන්හි සිඟන්ට වටනේය උපද්‍රවයෙන්මිදෙන පිණිස ම යිය බැවින්ලොලභාවයෙන් ගෙපිළිවෙළ නොඉක්ම්බැවින් දුහහ හෙදනොපෙණෙයි. යම්ගෙදරක හෝ විපියක හෝ ගමෙක හෝ තුන්දවසක් සිහුකල්හි කිසිවත් නොලැබී නම් ඒ ගමෙන් ගමක් නොවෙයි යන සංඥාවෙන් හැරයාමට වටනේය යම්තැනක තුන්දව සින් එක්දවසක් යම්කිසි කරුණකින් නොලැබුණද දෙවෙනි තුන්වෙනි දවස හෝ ලැබේද සැම දවස්හිම හෝ පලාබවූ පූජා පූජ කෑ බන් ආදියෙන් කිසිවත් ලැබුනම් ඒ තැර අන්තැනක සිඟ

නව් නොවටනේය මේ සපදුනවාරික භික්‍ෂුහු විසින් උදුසන්හිම භික්‍ෂාව පිණිස පැමිණිය යුතුය එසේකල්හි අපායුක සථානයන් හැර සෙසුතන්හි සිහන්නට කල්ඇතිසෙයින් හැකිවන්නේය ඉදින්වනාහි වෙහෙර දන්දෙන උපාසකවරු හෝ අතුරු මග එන මිනිසුන් හෝ හෙවත් අතුරුමඟදී දුටු යම්කිසි කෙණෙක් ස්වාමිනි! මම ඔබවහන්සේට දනක්දෙනු කැමැත්තෙමි එබැවින් මාකෙරෙහි කරුණාවෙන් පාත්‍රය දෙවා වදුරන්නේයයි මේ සපදුන වාරික ස්ථවිරයාගේ පාත්‍රය ගෙණ ආහාර සම්පාදනයකොට දෙන්නම් ඒ පිළිගන්නට වටනේය මාණවයෙහි යනා මේ සපදුන වාරිකයා විසින් වනාහි පිඬුසිහිමට සුදුසුකලට සම්ප්‍රාප්ත නම් නොඉක්මම සිහිය යුතුවෙයි එහි සිහානොලදින් හෝ මදක් ලදින් හෝ ගමෙහි පලමු වන ගෙහි පටන් පිළිවෙලින්ම සිහියයුතුයයි මෙස්දක්නලද සියල්ල සපදුන වාරිකභාවයයි පිළිපදිනා එධියයි මෙහි ප්‍රභෙද කෙසේදයත්? උත්කෘෂ්ට සපදුන වාරිකතෙම සිහානොහිය විථියෙන් විලදන්ට උන්තැනට ගෙණා පෙරටුබවද එසේම උන්තැනට සිහා පසුඋනු විථියෙන් ගෙණා පසුබවද පිණ්ඩපාතිකයා සෙයින් නොපිළිගන්නේය එසේම පිණ්ඩපාතිකයහට සෙයින් බොජුන්හලට පය ගෙණ දෙන බවද නොපිළිගන්නේය පත්තවාර සංඛ්‍යාත සම්ප්‍රාප්ත වාර යෙහිදී යම්කිසිවක්හු විසින් යාචිඤ්ඤකොට ඉල්වන ලදුව පාත්‍රය දෙන්නේයයි ඒඑසේමය සපදුන වාරිකභාවයෙහි තෘතියශ්‍රාවකවූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ හා සදෘශයෝ මේ බුදුසස්නෙහි නැත එසේ සපදුනවාරිකයන් කෙරෙහි අගතැන්පත් මොවුන් වහන්සේ පවා පෙහෙරවෙස්ගෙණ පෙහෙර විථියෙහි දුගිලෙසින්සිට තමන් සක්දෙවඹව නොහඟවා පාත්‍රයඉල්වූ සක්දෙවිරජහු ගෙදොරදී දිවස් ඇතද නිකරුණේ පතුරුවා නොබලන බැවින් මෙබදු දුගියන්ට අනුකම්පාකෙරෙමි යන කරුණාවෙන් පාත්‍රයදෙවා වදළතැන් දම්පියා අටුවාවෙහි ප්‍රකාශව පෙණෙන්නේය එහෙයින් සම්ප්‍රාප්ත වාරයෙහිදී පාත්‍රය ඉල්වන උපාසකයන්ට පාත්‍රය දීමෙහි සැකනො කට යුතු මෙම කිහ විශුද්ධිමාගියෙහි.

ඉමස්ස්ඤ්චාසිඩ්ඨිතාඛෙඛ මහාකස්සපථේරෙන සදිසො නාමනත්ථි තස්සපි පත්තං විස්සජ්ජනා මෙව පඤ්ඤායති-යි.

මධ්‍යම සපදුන වාරික තෙමේ පිඬපාතිකයා සෙයින් පෙරවින් ගෙණා බතද බොජුන්හලට පය ගෙණදෙන බතද පිළිගන්නේය උත්කෘෂ්ට සපදුනවාරිකයා පවා සම්ප්‍රාප්තවාර යෙහි පා විසඳන බැවින් හමුදෙර පයවිස්දන්නේය හෙවත් පැමිණි දොරදී පාත්‍රය ගන්නවුන්ට දෙන්නේය මහන්සේ සිහානොවැඩිය මැනව වෙහෙරටම අහර ගෙණදෙම්හයි කී උපාසකයන්ගේ වචනය

අසා බත්‌තෙණෙනතුරු බලාහොන්‌නේය ඒ‌මඩ්‌යම් සපදානචාරිකතෙමේ ගෙපිළිවෙළ නොඉක්‌ම සිගමෙන්‌ම විශෙෂ බවමුත් උත්‌කෘෂ්‌ට පිණ්‌ඩපාතිකයහට අනුලොම්‌වේ මේ මෘදුකසපදාන චාරිකතෙමේ මධ්‍යම පිණ්‌ඩපාතිකයා යෙයින් උපාසකයන් වෙහෙර ඉගෙණෙම්‌හයි කියා ගණා අහර පිළිගන්‌නේය මේ මෙහි ප්‍රහෙදය.

හෙදය කෙසේදයත්?

මෙතුන්‌දෙන හටම එනාගි ලොල් බැවින් ගෙපිළිවෙළ ඉක්‌ම හැසිරීම් උපන්‌මාත්‍රයෙහි දුහග බිඳෙන්‌නේය. මේසපදානචාරිකඛඟ යෙහි හෙදයයි.

මෙහි අනුශස්‌ කිමශයත්?

කුලෙසු නිච්චකදානා වඤ්‍ඤ පමතා කුලමඞ්‌ගෙරපපහාණං සමානුකම්‌පිතා කුලූපකාදීනවාභාවො අවහානානභිඤ්‌ඤා අභිභාරෙන අනාහිකතා අපපිච්‌ඡතාදීනා අනුලොම වුත්‌තිතා-යි.

දක්‌වනලද බැවින් කිසි කුලයෙක්‌හි නිබඳයෙන් නො ඵලඹෙන බැවින් ඇමදවස්‌හිම අවන්‌වයය හැමතන්‌හි අලඟාමනස්‌ ඇති බැවි නුදු සෙමය බැවිනුදු සඳහුට බදු උපමා ඇති බවය පරිග්‍රහ චිත්‌ත භාවයෙන් දන්‌දෙන උපාසක කුලයෙහි මසුරුබව දුරුවීමය අවිභා ගයෙන් ඛිතපසස්‌නෙන් සම්‌වූ අනුග්‍රහ ඇතිබවය කුලූපකාදීන්‌ගේ දුරුවීමය නිමන්‌ත්‍රණාශයන් නොතුස්‌ බවය භික්‍ෂාව හැර ඵලවිමෙන් අඤ්‌ඤ නොවෙන අල්පෙච්‌ඡතාදීනට අනුලොම්‌වෘත්‌ති ඇතිබවය යන මොහු අනුශස්‌ නම්‌වෙත්. සඞ්‌ගීතිපවතී සමපත් යාධකවූ මේ සඞ්‌ඝ ශාසනයෙහි සපදානචාරික පිළිවෙත් පුරණ මහණ්‌තෙමේ සියලු කුල යෙහි වඤ්‌ඤාව බදු උපමා ඇතිවූයේ හැම දවසෙහිම අලුත්‌වූයේ කුලයෙහි මසුරුබවක් නැත්‌තේ සම්‌පජානාහු කම්‌පා ඇත්‌තේ කුලූප ගාදීනවයන්‌හෙත් විප්‍රමුක්‌තවූයේ වන්‌නේය ඒ හෙබදු අනුශස්‌ ඇති බැවින් ලොල්‌බැවින් ගෙපිළිවෙළ ඉක්‌ම සිගිමිහැර යටහෙළු ඇස් ඇතිව එහෙයින්‌ම වියදඬු පමණ්‌ක්‌ම බලන්‌නේය පෘථිවියෙහි සෙව රි විහාර කැමැත්‌තේ ධීරවූයේ සපදානචාරික දුහගපුරන්‌නේය:

දක්‌වන ලදමැයි.

වඤ්‌ඤපමොතිච්ච නවොකුලෙසු අමච්ඡරී සබ්බ සමානුකම්‌පා
කුලූපකා දීනව විපපමුත්‌තතා හොතිධ භික්‍ඛු සපදානචාරී

ලොලූපචාරච පහාය තසමා ඔකඛිත්‌ත චක්‍ඛු යුගමත්‌තදසසී
ආකඞ්‌ඛමානා භුවිසසරී චාරං වරෙයයධීරා සපදානචාරං-යි.

තවද මෙහි දැක්‌වූ අනුශසුන් අතුරෙහි නිබඳයෙන් නොඵලී ඕමෙන් හැමදවස්‌හිම අලුත් බවයයි කියනලද අනුශස්‌ කවර අර්‌ථ යකින් සැපවීදයත්? යම් යම් උපාසක කුලයකට නිරන්‌තරයෙන්

එළඹුනහොත් එහි බොහෝ ආදීනව ඇත්තේය. ඒ කවර ආදීනව යෙක්දයත්? ප්‍රථමයෙන් මහත් ගෞරවයෙක් ඇතිව දන් දුන උපාස කයන්ගේ කාටයුත්තහි අලසවීමෙන් හෝ සමාපත් ඉණවීමෙන්හෝ නිරන්තරයෙන් බණ නැසීමෙන් හෝ මෙසේ හැමදවසම එළඹින භික්ෂූන් කෙරෙහි යම්කිසි කරුණකින් ශ්‍රද්ධාව පිරිහීම හෝ වන්නේය නිත්‍යයෙන් පුරුදුවීම හේතුකොටගෙණ සවාමිනි අපගේ අසවලාට මෙනවි අපාසුවක්විය රිට කිසි බෙහෙදක් හෝ දෙවා වදුල මැනව. වෙදකමක් හෝ කර වදුල මැනව. වහන්සේ හැර අපට ඉහලොක පරලොක දෙකින්ම උපකාරවීමට අන්කිසි කෙණෙක්ක් නැතැයි යනාදීන් කිවහොත් ඒ අසා තමාගේ විත්තයද මැදුව මිට උපකාරවෙමියි සිතා යම්කිසි බෙහෙත් ආදියක් දෙමින් මට සංග්‍රහකරණ උපාසකවරු නොවිදුයි සිතා උපකාරයක් කල හොත් එක්විසි අන්වෙසනයට ඇතුළත්ව ආජීව පාරිසුඛිසීලය කිලුටුව මහත් අනර්ථ උපදනේය මේ ආදීවූ අනෙකාදීනව එළවීමට කාරණාවන බැවින් කුලයට නිරන්තරයෙන් එළඹීම දුක්වන්නේය යම්කිසි කුලයකට නිරන්තරයෙන් එළඹ පුරුදුවීමක්නැති භික්ෂූන්ට මෙකී ආදීනව සියල්ල නැත්තේය එසේහෙයින් නිරන්තරයෙන් කුලයට නොඑළඹීමෙන් අලුත්ව වසනබව සැපකොට දක්වුහයි දත යුතු. තවද ඒ අනුසැපුත් ඇත උපාසකයන් කෙරෙහි කුලූපගවීමෙන් දුරුවීම කවර අපිය කින් අනුසස් විදයත්? උපාසකයන්හා කුලූපගව පෙරසේම නිරන්තරයෙන් ඔවුන් ගෙට එළඹ වැලඳීම් ආදියට යන කල්හි ඔවුන්ගේ යම්කිසි ධන ධාන්‍යාදියකට හානියක්වුවහොත් මුස්ඵහන්සේ නිසා එන් හානියක්වනැයි සිතාන් සැකකොට මනාසෙයක් ලෙසින් උවදුරට කාරණා වන්නේය. ඒ එසේමය මේ කුලූපගාදිනවය දක්වන පිණිස මණිකාර කුලූපග තෙරුන්වහන්සේගේ කථාවසතුව මෙහි සංග්‍රහකරණුලැබේ. කෙසේදයත්? ඒ තෙරුන් වහන්සේ එක මැණික් සැටවර කෙණෙකුගේ ගෙයිදී දෙලොස් හවුරුදුදක් විවර වැලඳුසේක. මැණික් සැටවර දෙමාල් ලෝ දෙමව්පියෝ තරමේ සිටා තෙරුන් වහන්සේට උපස්ථාන කලෝය එක්දවසක් මැණික් සැටවරානෝ තෙරුන් වහන්සේ ලග හිද දඹමසක්කපති එවෙලාවට කොසොල් රජ්ජුරුවෝ අසවල්ලෙස මැණිකගා විදලා එවාලවයි එක් මැණිකක් යැවූය මැණික් සැට වරානෝද ලේවැකි අතින් මැණික හැරගෙණ පෙට්ටියක්පිට තබාලා අනාසෝදන්ට ඇතුළගෙට වන්හ ඒ ගෙයි වැඩඹන කොස්වාලිහිණි යෙක් ඇත එතෙමේ ලෙහෙණදින් මස්කැපියකැයි සිතා තෙරුන් වහන්සේ බලබලා ඉඳදීම මැණික ගිලිමය මැණිකගල නියාව ඔබන් දුටුසේක මැණික් සැටවරා අවුත් මැණික නොදැක මැණික ගතුදැයි අඹුවන් අතිනුත් දරුවන් අතිනුත් පිළිවෙළින් විවාරා උන් දෙපස

යම හැරනොගතුම්හයි කිකළඹි තෙරුන් වහන්සේ හැරගත් නියායි සිතාගෙන ඇඹුනියන්ට කිවුය ඇළි අසා එසේ නොකිය මැනව මදලොස් හවුරුදුදක් මුළුලෙලඹි එබසෙක් ඇත්නම් හැඟි නොසේද ඔබ එබඳුන් නොකරණ සේකැයි ඔබගේතරම් දැනම කිවුය. එසේ උන්කිවත් මැණික්ඤාවරා මැණික්වල තරම්දනි නමුත් ඔබ ගේතරම් නොදන්න ස්වාමිනි මෙතන හිඳ්ව මැණික ගත්තේ ඇද්දයි විචාලෝය උපාසකයෙනි අපි නොගතුම්හයි වදලසේක ස්වාමිනි නුඹවහන්සේ විනා අනික් කෙණෙක්නැත ගණිතත් නුඹවහන් සේමය මැණික වහා දුනමැනවයි කිවුය තෙරුන් වහන්සේ හැර නොගත්ම හෙයින් තරව නොගනිමියි කිසේක ඇඹුනියන්ට තුවත් කියන්නෝ සොරා හැරගත් දෙයක් හැරගතුම්හයි කියනසොඬා ඇද්ද නිකම් නොකියන බැවින් හඟවයක්කොට විචාරමෝදැයි කිවුය උපා සිකාවෝ තමන් සැදැඇති හෙයිනුත් ඔබගේ එබදු තරමක් නැති නියා ඉදුරා දනනහෙයිනුත් අප නොනැසුව මැනව මැණිකනිසා අපි ගැනිම්හිවමෙම නුමුත් සඳමඩල ගොම ගානාසේ මුන්වහන්සේට තෙලලෙයකිම නපුරැයි කිවුය අපි හැමදෙනම මිලකලත් මැණික නොඅගුඹහයි කියාලා ලනුවක් හැරගෙණ තෙරුන් වහන්සේගේ හිස වෙළිමෙන් කම්යා වෙළාගෙණ දඹකින් මිරිකාලිය තෙරුන් වහන්සේගේ හිසින්ද කණින්ද නාසයෙන්ද ප්‍රවෘත්ති විපාකවශයෙන් සෙසව සිපි අකුසල විපාකයත් බාහ්‍ය වනනාසේ ලේවැකිරෙන්ට වන ඇස්දෙකත් පිටත්වනනාසේ විය වෙදනා බලවත්ව බිමවැටී හුණුස්ස්ක කොස්වා ලිහිණියාත් ලෙහෙනදින් අවුත් ලේබොයි මැණික් ඤාවරාත් තෙරුන් වහන්සේ කෙරෙහි උරණින් තොප කරන්නේ කිමදැයි කියා පයින් කොස්වා ලිහිණියා ගසාදැමිය උයින් තෙරුන් වහන්සේව බිලිවූ පෙයින් මළේය තෙරුන් වහන්සේත් පැරකා හුණුවාවූ ලිහිණියාදැක උපාසකයෙනි මා නිසවෙළුම ලිහිල්කාවලා තුළු මල නොමල නියාව බලවයි වදලසේක. ඌ වනසා මෙවකට මළේයයි උන්නබා ඔබත් මැණික නොදී මියනදැවේදැයි කිවුය උපාසකයෙනි ලේවැකි මැණිකදැක ගිලුයේ තෙලේය මැණික ගල නියාව මම දිවිමි තුළු මලහෙයින් මුත් නොමලනම් කමිනුරුපව මම මියයන නමුත් නොකියමියි වදලසේක. ඔහුත් ලිහිණියාගේ බඩ පලාපියා කයලගොඩක සඟවාලූ මැණිකක් මෙන් මැණිකදැක තමා කලවරද්කාරිය බලවත් හෙයින් වෙවුලා තෙරුන් වහන්සේ වැද ඉඟණ වැදහෙව ස්වාමිනි නොදැනකළි දෙයට ඉඹමා කලමැනවයි කිවුය උපාසකයෙනි තොපගේ වරදකුත් නොවෙයි සසර සිටිනා කල එක්වූ වැරැදෙක අඹමාවක් නැතිහෙයින් ඉඹමා කෙළෙමි

වදුළුසේක. යඩාමිනි සුමාවිනම් ආදිලෙසින්ම අප ගෙයිදි නිර
න්තරයෙන්ම වලඳන්ට වුවමැනවයි කිවුය තෙරුන් වහන්සේත්-

පඤ්ච මුනිනොහත්තං ථොක ථොකං කුලේ කුලේ
පිණ්ඩිකාය චරිස්සාමි අත්ථි ජංඝාබලං මම.

යනුහෙයින් උපාසකයෙනි මෙවක් පටන් මෙරමාගෙයක සෙවින්
නක් ඇතුළතට නොවදිමි මෙවුයේ ගෙවලයිද වැලදිමෙහි දෙසය
පයබල ඇත්නම් සිඟාගොසින් පත් දෙරසිටලන් දෙයක් සරූප තෙ
නෙකයිද වලඳමියි කියාලා තෙරුන්වහන්සේ ඒ පිඩාව මුල්කොට
නොබෝ කලයින් සඝරදුක්නිවා පිරිනිවියේක. කොස්වාලිගිණියාත්
මැණික්සැට්ටරාගන්ගේ අඹුවන් බඩ පිළිසිඳගත මැණික්සැට්ටරා
අරහන්ත ඝාතක කම් සිඹවූ හෙයින් අවීචියෙහි උපන මැණික්සැට්
ටරාගන්ගේ අඹුවෝ තෙරුන්වහන්සේ කෙරෙහි පහන් සිතින් මිය
දෙවිලොව උපනියි එකතැන රඳ නිදලා ඒ ඒ කටයුත්තෙහි වෙතු
වෙන කඩාගියාසේ ඒ ඒ තෙන උපන්හ. වහන්ද බුදුන් අනින් උන්
හැම උපන්තැන් විවාලසේක බුදුහු එබා මහණෙනි මල ඝතරපෂ
යෙන් කොස්වාලිගිණියා මවුකුස උපන මැණික් සැට්ටරා නරක
යෙහි උපන ඔහුගේ අඹු රහත්සඟුන් කෙරෙහි කලාවූ චිත්තප්‍රඝාද
යෙන් දෙමලාස් හවුරුඳුක් ඕතරකල උපස්ථානයෙහි විපාකයෙන්
දෙවිලොව උපන්හ ජානි කාරණාවූ හව නැසුහෙයින් උන්හෙන්
උපස්ථානත් විද ගහටත්වූ රහත් සඟුන් පිරිනිවිහයි වදුළුසේක.
සපදානචාරිකයා හැම දවසම හෙපිළිවෙළින් සිහාලද අහරින්
ජීවත්ව කිසි කුලයක ඝාලූපගවීමක්නැති හෙයින් මෙබදු ආදීන
වයට නොපැමිණෙන බැවින් කුලූපඝ ආදිනවයෙන් දුරුවීම අනු
සස්කොට දැක්වූහයි දතයුතු.

තවද ඒ සපදානචාරිකාඞ්ගයෙහි දැක්වූ අනුසසුන් අතුරෙහි
කුලමසුරු බවෙන් දුරුවීම කුමක් හෙයින් අනුසස් කොට දැක්වූද
යත්? යම් භික්ෂුකෙණෙහුන්ට දන්දෙන උපාසක ඝුලයන් කෙ
රෙහිම මසුරුව මේ උපාසකවරු මටම උපකාර කරණ බවමුත්
සෙස්සන්ට මෙලෙස උපකාර නොකෙරෙත්වයි යන මසුරු සිතක්
උපදාහොත් මසුරු බව හේතුකොට ගෙණ ලොහකඝ්ඨවිරයන්
වහන්සේට හා ජඞ්ඝිකාජීවක සථවිරාදීන්ට මෙන් නොයෙක් අකු
සල් රැස්ව ප්‍රමාණාතික්‍රාන්තවූ දුකට බත්වන්නේය ඒ කාරණයෙනි-
ඒකාසනිකඞ්ගයෙහි සමාදානාදිය කෙසේදයත්? "නානාසනභෝ
ජනං පටික්ඛිපාමි ඒකාසනිකඞ්ගං සමාදියාමි,, යනුවෙන් වෙන
වෙන හස්නේ ගිඳ කරණ ආහාර පරිභොග ප්‍රතික්ෂෙප කරම් ඒකා
සනිකාඞ්ගය සමාදන්වෙමියි යන මෙයින් එක්හරා වචනයකින්

සමාදන් වියයුතු මෙසේ සමාදන්වනලද ධුතාඞ්ග ඇති එකාසනි කඞ්ගයා විසින් වනාහි ආසන ශාලාවෙහි නිදිනාකල ථෙරාසන යෙහි නොහිඳ මේ අස්න මට පැමිණෙන්නේයයි නැන් නොසිටිය යුතු අස්නක් සලකාගිදිය යුතුය ඉදින් ඔහුගේ හොජනය අඩාලවූ කල්හි ආචාර්‍ය්‍ය තෙරහු හෝ උපාධ්‍යාය තෙරහු හෝ වැඩිය හොත් නැගිසිට වත්කරන්ට වටනේය සත්, මෙසේ දක්වන ලද්දේ එකාසනිකඞ්ග යෙහි පිළිපදිනා විධියි-ප්‍රභෙද තෙයින් වනාහි මේ ධුතාංගය ත්‍රිවිධ වෙයි එහි උත්තමාර්ථ එකාසනිකඞ්ග තෙමේ මද්‍ය වූවහෝ වේවයි බොහෝවූ හෝ වේවයි යම් හොජනයක් වලඳන්නට අන එරෙවුව හොත් එයින් මත්තෙහි අනිකක් ගන්නට නොල බන්නේය ඉදින් මනුෂ්‍යයෝ තෙරුන්වහන්සේ විසින් කිසිවක් නොවලඳන ලදැයි සපථාදින් එලවත්නම් භෙද වලඳන වේලෙහි බෙහෙත් පිණිසම වටිනේය ආහාර පිණිස නොවටිනේය මධ්‍යම එකාසනික තෙමේ යම්තාක්කල් පාත්‍රයතුබූ බත් වලඳ, එතෙක් නොවේද එතෙක්කල් පිළිගැන්වූ අනිකක් ගන්නට ලැබෙන් නේය. මේ මධ්‍යම ඒකාසනික තෙමේ පාත්‍රයෙහි බොජුන් නිමන තෙක් අතරෙහි දූන්යමක් වලඳන බැවින් හෝජන පර්‍යන්තික නම්වේ. මෘදුක ඒකාසනික තෙමේ යම්තාක්කල් වලඳන්ට උන් අස්නෙන් නොනැගේද. ඒ තාක්කල් අතුරෙහි පිළිගැන්වූ යම් ආහරයක් වලඳන්නට ලැබෙන්නේය හෙතෙමේ පාත්‍රය සේදු තැනින් මත්තෙහි නොගන්නා බැවින්. උදක පර්‍යන්තික නමුදු වෙයි. යම්තාක් ආසනයෙන් නොනැගේද ඒ තාක් වලඳන බැවින් ආසන පර්‍යන්තික නමුදුවෙයි. මේ තුන්දෙන හටම වනාහි නොයෙක් අස්නේහිද වැලඳූ කෙණෙහි දුගඳ බිදේ මේ මෙහි භෙදයි. මේ ඒකාසනිකඞ්ගයෙහි අනුශංස කිමයත්? අල්පා බාධතාය සිරුරුදුක් නැති බැවින් අල්පාතඞ්කබවය ලඝුවෘත්තබවය සිරුරු බලය ඵාසුවිහාර බවය කැපනොකළ බොජුන් පරයෙන් නත් අස් නෙහිවලඳනුවහට වනඇවත් ඒකාසනිකඞ්ගයට නොවනබැවින් අන තිරික්ත ප්‍රත්‍යයෙන් අනාපත්ති බවය රසතෘෂ්ණාවගේ නැසීමය අල්පෙච්ඡතාදීන්ට. අනුලෝම් පැවතුම් ඇතිබවය යන මොහු අනු සන්නම් වෙත්-අපිච-ඒකාසන හොජනයෙහි ඇලුනාවූ මහණහු ආහාර ප්‍රත්‍යයෙන් වන රෝගයෝ නොමඩිනි රසයෙහි ලොල්නොවූයේ තමාගේ සමථ විදර්ශනා කර්මය බොජුන් පිරිය නස්නාපියොමනා බැවිනුදු නිමරාහවහා බැවිනුදු නොවේ හෙලන්නේ මෙසේ ඵාසුවිහාර කාරණාවූ පිරිසිදුවූ සල්ලෙබ ගුණයෙහි ඇලුනන් විසින් සෙවුනාලද එකාසන හොජනයෙහි පිරිසිදුවූ සිත් ඇත්තේ හැම කල්හිම ඇලුම් කරන්නේය.

එහෙඬින්කිහ.

එකාසන හොජනෙ රතං
නයතිං හොජන පච්චයා රුජා
විඝහන්ති රසෙ අලොලුපෝ
පරිහාපෙති න කම්මත්තනෝ
ඉති ඵාසුවිහාර කාරණෙ
සුවිසලෙලබ රතූපසෙවිනෙ
ජනයෙථ විසුඛමානසෝ
රතිමෙකාසන හොජනෙසදා-ඩි.

මේ එකාසනිකඛයෙහි සමාදානාදියයි. මෙසේ මේ එකාසනි කාඛගය විශුඛිමාර්ගානුකූල කොට දක්වා උපාසකයන් විසින් රක්නාසේ උපාසක ජනාලංකාරයෙහි දැක්වූ පරිදි මෙහි සංග්‍රහකෙරෙමි.

තත්ථ එකාසනිකඛං තාව සමාදියනෙන්න නානාසනභොජනං පටිපක්ඛිපාමිනිවා එකාසනිකඛගං සමාදියාමිනිවා සමාදානඛං නානාසන හොජනෙ පටික්ඛිත්තෙන එවං අත්ථතෝ එකාසන හොජනං අනුඤ්ඤාතං හවතිං ව අධිඝිනෙ නානාසන හොජනං පටික්ඛිත්තං හොනි. තස්මා ඡිණ්ණමඤ්ඤාතරෙන ඡිඛිපිවාපටිඤෙඛපං අධිඨාන මුඛෙන සමාදානඛබ්බං එවං සමාදිනන ඛ්‍රුතඟෙන පන හොජනකාලෙ පහිරුපඨානං සල්ලකෙඛ්වා නිසීදිනඛබ්බං. යත්ථ නං කොවි ගරු ඨානියෙ‍්‍යා යාවභොජන පරියොසානා න උපසංකමති යදිවා පන කොවි තාදිසෙපි ඨානෙ අතිවිසත්ථා භාවෙන උපසංකමෙය්‍ය යාව භුඤ්ජිතුං නාගරති තාව වුඨාතඛබ්බං අයංපන විපකත භොජනෙ පතිරූපමස්ස ආසනං පඤ්ඤපෙත්වා ඔකාසං කාරෙත්වා භුඤ්ජිතබ්බං සවෙබලවසඨාය ගරුඨානිගං දිසවා සඝ යාවුඨහති නපුන භුඤ්ජිත බ්බං කසමා ආඝනාවුඨිතත්තානි-ඉදමසස විධානං-අයං පහෙදෙන යෙ එකාසනිකා උක්කට්ඨා මජ්ඣිමෙ මුදුකොනි-තත්ථ උක්කට්ඨෙ අපපං වා හොතු බහුංවා යම්හි හොජනෙ භුජිතුකාමෙ හත්ථං ඔතා රෙති තතෙ අඤ්ඤං නගණ්හාති කිං තතෙ අඤ්ඤං නානාසන හොජනං හොනි'නි? න හොනි යදිසියා මුදු මජ්ඣිමානං ඛ්‍රුතඛගහෙ දෙසියා නව හොනි අයං පන පර මපපිවජ්ජනාය ආහතා හතඝාඝහ ණං නාම නානාසන හොජනං වියානි මඤ්ඤමානෙ තතෙ අඤ්ඤං අගහෙත්වා නෙනෙව යාපෙති යදිපනඝ ගෙහෙපරිවාරකා නඛිවිඳු නතං අරියඉකනානි යපපිආදිනි ආහරනති හෙසජ්ජ ඛ්මෙව වඩවති න ආහාරත්ථං-මජ්ඣිමෙ යාව පාතියා හත්ථං නඛියති තාවඅඤ්ඤං භුඤ්ඡිතුං ලභති අයංහි හොජන පරියනතිකො නාම හොනි. යාව

පානීයා හත්තං පරියෙයාහානං කාවගණ්ඨනෝ-මුදුකොයාව ආසනා න වූඤාති කාවහුඤුජිතුං ලභති යොගි ආසනපරියහි කෝ නාම ඉමෙසංපන තිණ්ණම්පි නානාසන හොජනං භුත්තකඛණෙ ධුතඞ්ගං භිජ්ජති අයමෙත්ථහෙදු.

මේ එහි ආඤ්ඡිෂයි-

පත්තපිණ්ඩිකාඞ්ගයෙහි සමාදානාදිය කෙසේදයත්?

"දුනියක භාජනං පටික්ඛිපාමි පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමි,, යනුවෙන් දුනියක භාජනය ප්‍රතික්ෂෙප කෙරෙමි පත්තපිණ්ඩිකා ඞ්ගය සමාදන් වෙමියි යනමෙයින් එක්තරා වචනයකින් සමාදන් වියයුතු මෙසේ සමාදන්වනලද ධුතාඞ්ග ඇති පත්තපිණ්ඩිකයා විසින් කැඳවලදන කල්හි භාජනාදිය හා සමගත් අවුළුආදිය දැය කයන් විසින් පිළිගැන්වීම් ඇති බැවින් භාජනයෙහි තබා අවුළුලද කල කැඳ නොපිළිගෙණ පළමුකොට අවුළු හෝ වැලදිය යුතුය අවුළු ඔත්බජුන් නොපිළිගෙණ පළමුකොට කැඳ හෝ වැලදිය යුතුය ඉදින් අවුළු කැදෙහිම බහාලන්නම් පූහිමාංසාදි අවුළුබහා ලූකල්හි. කැඳ පිළිකුල්වෙනම් පිළිකුල් නොවනයේ කොට වල දන්ට වටනේය. කුමක්නියාදයත්? පිළිකුල්දේ වැලදු කල්හි බඩ පෙරළීම් උද්ගාරණයවීම් ආදිය වන්නේය එහෙයින් පිළිකුල් නොව නසේ වෙන. වෙනම වැලදිය යුතුය එහෙයින් එබදුවූ ව්‍යඤ්ජනය සඳහා මෙය කියනලදි කෙසේදයත්? මධ්‍යඤ්කිරාදි යම් අවුළෙක් කැදෙහි බහාලූකල පිළිකුල් නොවෙද එබදු දෙය කැදෙහිම බහා ලිය යුතුය. පිළිගන්නහු විසිනුදු එක භාජනයෙහිම පිළිගන්නෙම් නොවෙදැයි සිතා බොහෝ කොට පිළිගෙණ නොදැම්මෙන් පමණදන පිළිගතයුතුය මිරිස්අතුආදි අමුඅතු අනින්ගෙණ කඩකඩ වල දන්ට වටනේය. ඒ වනාහි රසවිදිම පිණිසම කරණ දෙයක් බැවින් එසේ නොකොට අතද දෙවන පාත්‍රයක් වනබැවින් සරුප් පිණිස පාත්‍රයෙහි බහාවැලදිය යුතුය. දෙවන භාජනය ප්‍රතික්ෂෙප කළ බැවින් අනික් සල්මිලිල ආදී රුක් පතඤුදු නොවටනේයයි. මේ මෙහි පිළිපදිනා විධියි.

මෙහි ප්‍රභෙද කෙසේදයත්?

ප්‍රභෙද හෙයින් වනාහි මේ පත්තපිණ්ඩිකාඞ්ගයද තුන්වැදෑරුම් වෙයි. එහි උත්ක්‍රෂ්ටයාට සපදුම්මියයුතු බැවින් උක්දඹු කනකව ථරයෙන් පිටත අනික් කසලක් සංහරණට නොවටනේය. ඔත් පිඩු මත්ස්‍යමාංස පූපය යනමේදෙය බිඳවලදන්නට නොවටනේය මධ්‍යම පත්තපිණ්ඩිකයහට එක අතකින් බිඳවලදන්ට වටනේය. එහෙයින් මේ මධ්‍යමතෙම ගත්තයොගිනම් වෙයි. මෘදුක පත්තපි

ණ්ඩිකයා වනාහි පත්තයොගිනම්වේ. ඒ පත්තයෝහට යම්කිසි දෙයක් පාත්‍රයෙහි බහාලන්නට පිළිවන්වීනම් ඒ සියල්ල අතින් හෝ දනින් හෝ බිඳවලදන්නට වටනේය. මේ මෙහි ප්‍රභේදයි.

භෙදයවනාහි "ඉමෙසං පන තිණ්ණම්පි දුතියකභාජනං යාධිත කකණෙ ඛුතඛගංභිජ්ජති අයමෙව භෙදේ‍යයි. දක්වනලද බැවින් මේ තුන්දෙන හටම භෙවෙනි භාජනය ඉවසූ කෙණෙහි දුහඟ බිඳේ.

මෙහි අනුසස් කිමෙක්ද?

නොයෙක්රස වැලඳිමෙන්වන රසතෘෂ්ණා දුරුකිරීමය නානා භාජනගත රසෙහි ඉවහා දුරුකිරීමය ආහාරයෙහි ප්‍රයොජන මාත්‍ර දැන්මය හෙවත් නුමුසුරසෙහි ගිජුනොව එක්කොට වලඳන බැවින් ආහාරයෙහි බුදුන් විසින් අනුදත් ජීවිතෙන්ද්‍රිය පවත්වන මතු ප්‍රයෝජන දක්නාබවය තලුතැවි ආදීන්ගේ පරිහරණයෙහි වේදනා නැතිබවය නානානාභාජන ගතවූ ව්‍යඤ්ජනයෙහිඑක භාජනගත සඟු ඇති බැවින් අවිඤ්ඤත්තිවූ හොජන ඇතිබවය අල්පෙච්ඡතාදින්ට අනුලොම් පැවතුම් ඇතිබවය යන මොහු අනුසස් නම්වෙත්. අපිව නානාභාජනගත විඤ්ඤපය හැර පාත්‍රය සංඥවෙන්යට ගෙඑ ඇස්ඇතිව බොහෝ අකුසල් රුස්වන්නට කාරණාව සිවි රසතෘෂ්ණාවෙහි මුල්කණින්නක්හු මෙන් සුඳුරවූ වුතඇති සිරුරු ඇති තුෂ්ටිය දරන්නාක්හු මෙන් නොහොත් මෑතිමත් තුෂ්ටිය දරන්නක්හු මෙන් සුඳුරවූ මනස් ඇතිව පත්තපිණ්ඩිකයා මිස අන්කවරෙක් අහර වලඳන්නට සමර්ථවන්නේද. නානාභාජන යෙහි විඤ්ඤප දුරුකොට පාත්‍රයෙහි හුණුඇස් ඇතිව රසතෘෂ්ණාව මුළින් උදුරන්නක්හු මෙන් සුඳුරවූ වුතඇතිව සිරුරුගත් සන් තුෂ්ටිය දරන්නක්හු මෙන් සුඳුරවූ මනස්ඇතිව පත්තපිණ්ඩිකයා මනාකොට ආහර වලඳන්ට සමර්ථවේ.

දක්වන ලදමැයි,

නානාභාජන විකෙඛපං හිත්වා ඔකඛිත්ත ලොචනා
ඛණ්ඩෙත්තා විය මූලානි රස තණ්හාය සුබ්බතො
සරූපංවිය සංතුට්ඨිං ධාරයන්තෙනා සුමානසෙ
පරිභුඤ්ජෙය්‍ය ආහාරං කො අඤ්ඤෙ, පත්තපිණ්ඩිකා-යි.

මෙසේ දක්වනලද අනුසසුන් අතුරෙහි රසතෘෂ්ණාව දුරුකිරීම කවර ඇසීයකින් අනුසස් කොට දක්වන ලදයත්?

යම් ශ්‍රමණ බ්‍රාහ්මණකෙණක් රසතෘෂ්ණා වෙන් මඬනාලද් දුනු වූනම් ඔවුන්ට වුල්ල පිණ්ඩපාතික නිසස ස්ථවිරාදින්ට මෙන්

මහත් අනර්ඝවන ගෙයිනි. චුල්ලපිණ්ඩපාතික නිස්ස සථවිරාදින්ට රසතෘෂ්ණා වෙත්.

අනර්ඝවුත්තයිදි කෙසේදයන්?

සකලගුණ කුසුම මඤ්ජරි සමලංකෘත නවලෝකොත්තර ධම්ම ධුර ඵලභරිත කල්පදුමවූ සම්බුදයන් වහන්සේ නානාවිධ කුසුම ඵලපල්ලවාලංකෘත නෛකජන චිත්තනන්දනය කරවන වෙලු වනාරාමයෙහි වැඩවදරණ සමයෙහි නිස්ස කුමාර නම්වූ මහත් සම්පත්ඇති සිටුකුලයක පුත්‍රයෙක් ඇත්තේය. ඒ සිටුපුත්‍ර තෙමේ එක් දවසක් වෙලුවනාරාමයට ගොස් සම්බුදයන්වහන්සේගේ ධම්ම දෙශනාවඅසා පැහිදිවහු කැමතිව පැහිදි වීමට යාවිඤා කොට දෙවෙපියන් විසින් අනුදන්නා නොලද්ද හෙයින් ප්‍රතික්ෂෙප කරණ ලද්දේ. සත්දවසක් නිරාහාරවහිඳ රඤපාල සථවිරයන් මෙන් මවිපියන් දෙදෙන අනුදන්වා සම්බුදයන් වහන්සේගේ සම්පයේදී පැහිදිවූයේක. සම්බුදයන්වහන්සේ ඔහු පැහිදි කරවා අඩ මසක්කල් වෙලුවනාරාම යෙහි වාසය කොට ජෙතවනා රාමයට වැඩිසේක. එතැන්හිදී මේ කුලපුත්‍රයන් වහන්සේ තෙලෙස් ධුතාංගය සමාදන්ව යාවැත්තුවර හෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙමින් කල්යවනසේක. චුල්ල පිණ්ඩපාතික නිස්ස සථවිරයන් වහන්සේයයි කිකල්හි අකාශයෙහි වළඟුයා මෙන් සම්බුදශාසනයෙහි ප්‍රකාශව ප්‍රසිඩ වූසේක, එසමයෙහි රජගහ නුවර නැකත් කෙළි පවත්නා කල්හි සථවිරයන් වහන්සේගේ මවපිය දෙදෙන උන්ව හන්සේ ගිහිකල්හි යම් ආභරණ භාණ්ඩයෙක් ඇද්ද ඒ ආභරණ බඩු රිදිකරඬුයෙන් බහා අඟිමුඹ යෙහි තබාගෙණ අනිඤත් නැකත් කෙළිවල අපගේ පුත්‍ර මෙනම් මෙනම් අලංකාර යෙන් සැරහි නැකත් කෙළි කෙළිනේය අපගේ ඒ එක පුත්‍රයා ගෙණ ශ්‍රමණ භවත් ගෞතමයානන් වහන්සේ යැවැත් නුවරට වැඩිසේක. අපගේ පුත්‍ර දැන් කොතැන්හි හුන්සේක්ද කොතැන්හි සිටිසේක්දැයි කියා භඩන්නාහුය ඉක්බිත්තෙන් එක් වණිණ දැසියක් ඒ සිටුකුලයට ගොස් භඩන්නාවූ සිටු භාර්‍යාව දැක ආර්‍යාවෙනි කවර හෙයකින් භඩන්නෙහිදැයි විවාළිය සිටුභාර්‍යාවෝ ඒ කාරණාව දන්වූවාය ආර්‍යා වෙනි සඞ්ඝපුත්‍රයානෝ කවර ඳයකට කැමති වෙනවාදැයි කිවුය අසවල් අසවල් දෙයයි කිවුවාය ඉදින් නුඹවහන්සේ මේ හෙයි සියලු ඵෙශ්‍යවස්ත්‍රය මට දෙවත් හොත් මම තොපගේ පුත්‍රයා ගෙණ එන්නෙමියි කීවාය සිටුභාර්‍යාව ඒ වචනය ශ්‍රවණය කියා පිළිගෙණ වැටුප්දී මහත්වූ පිරිවරින් ඒ වණිණාදැසිය යවන්නී යව තීගේ බලයෙන් මාගේ පුත්‍රයා ගෙණෙවයි කියා යැවිවාය ඒ වෙශ්‍යා ගනාව පිළිසං යානාවෙක්හි හිඳ යැවැත් නුවරට ගොස් තෙරුන්

වහන්සේ භික්‍ෂාව පිණිස හැසිරෙන පිළිවෙලින් නවාතැන් ගෙණ, සිවුකුලයෙන් ආ මනුෂ්‍යයන් තෙරුන්වහන්සේව නොදක්වා තමාගේ පිරිවරින්ම පිරිවරණ ලද්දේ. පිඩුපිණිස හැසිරෙන්නාවූ තෙරුන්වහන්සේද පලමුකොට බත්සැන්දක් පිළිගන්වා ක්‍රමයෙන් බත්මලාවක් පිළිගන්වා රසතෘෂ්ණාවෙහි බඳවා අනුක්‍රමයෙන් ගෙයි වැඩ ඉඳිනට සලස්වා ආහරය දෙනු ලබන්නී තමාගේ වසඟ කියට පැමිණි බැවිදින ශීලන් ආකාර දක්වා ඇතුළු ගබඩා වෙහි, සඝනය කලාය තෙරුන්වහන්සේද භික්‍ෂාචාර වේලාවෙහි ගෙපිළි වෙළින් හැසිරෙන සේක් ගෙයි දොර පැමිණියේක, පිරිවර ජනයෝ තෙරුන්වහන්සේගේ පාත්‍රය ගෙණ තෙරුන්වහන්සේ ගෙයි වැඩසිටිනට සැලැස්වූවාය තෙරුන්වහන්සේ හිඳගෙණම උපාසිකාවෝ කොයිදැයි විවාළසේක, යාමින්වහන්ස ගිලන්වූවාය නුඹවහන්සේ දක්නට කැමතියයි කිවූය උන්වහන්සේ රසතෘෂ්ණා වෙහි බැඳුනුසේක් තමාගේ වුත සමාදානයබිඳ වෙහෘඛහනාව හොත් තැනට වන්සේක, ඒ යන්නී තමා ආ කාරණාව කියා උන්වහන්සේ පොලඹා රසතෘෂ්ණාවෙන් බැඳ සිවුරු හරවා තමාගේ වසඟවී සෙහි තබා ගානාවෙහි හිඳිනට සලස්වා මහත්වූ පිරිවරින් රජගහ නුවරවම යියාය, ඒ ප්‍රවෘත්තිය හැමතැන්හිම ප්‍රකාශවූයේය භික්‍ෂූන් වහන්සේලා දම්සභාමණ්ඩප යෙහි වටින් රැස්ව උන්නාහු ඇවැත්නි චුල්ලපිණ්ඩපාතික තිස්ස සථවිරයන් වහන්සේ වනාහි එක් වණිණ දුසියක් රසතෘෂ්ණාවෙන් බැඳගෙණ ගියායයි කියා කථාවක් පහල කලාහුය සර්‍වඥයන්වහන්සේ දම්සභා මණ්ඩපයට එළඹ එපවත් අසා වදාරා මහණෙනි මේ චුල්ලපිණ්ඩපාතික තිස්ස සථවිරයෝ රසතෘෂ්ණාවෙහි බැඳි විහාසයට ගියේ දැන් මතුනොවෙයි. පෙරත් මේ සත්‍රීය විසින් රසතෘෂ්ණාවෙන් බැඳගත්තෝම වේදූයිකියා වාත මෘගජාතකය වදාළසේක, එක පාත්‍රයෙනිලා මුසු ආහර වලඳන පත්තපිණ්ඩිකයහට මෙබදු රසතෘෂ්ණාවක් උපදවන්නට කාරණා නැත මේ ආදීවසයෙන් එහි අනුසස් සැලකියයුතු. මේ පත්තපිණ්ඩිකාඛයෙහි සමාදානාදිය විහුබිවාතීයෙහි ආ ක්‍රමයෙන් දක්වා අන්තයෙහි තදනුරූප කථාවතුදු එහි සංග්‍රහ කොට උපාසක ජනාලංකාර යෙහි උපාසකයන් විසින් රක්නට මේ පත්තපිණ්ඩිඛය දක්වූ පරිදිද මෙහි සංග්‍රහ කෙරෙම්.

තේ කෙසේදයන්?

පත්තපිණ්ඩිකඛගමපි දුතියක භාජනං පටික්ඛිපාමිනිවා පත්තපිණ්ඩිකඛහං සමාදියාමිනිවා පුරිමනයෙනෙව සමාදාතබබං. තෙන පන පත්තපිණ්ඩිකෙන භොජනකාලෙ එකසමිං යෙව භාජනෙ භුඤ්ජිතබබං සමන්තතෝ භාජනා නික්ඛිපිත්වා තතිං තතිං හත්ථං ඔතා

ලියනම් වන්නේය, කල්ප කෝලාහලයන් වනුවනියි කෝලාහල යන් බුඩ කෝලාහලියන් දෙවි බඹුන් කියා ඇවිදිනා හෙයින් කෝලාහල වන්නාවය, මංගලකථාව කෝලාහලවූයේ කෙසේදයත්? අන ගැම් බඹුම දෙවි මිනිසුන්ගේ අදහස් දැනගෙණ මිනිස්ලොවට බැස දෙලොස් අවුරුද්දක් ගියකලට බුදුහු මහුල් වදුරණ්සේකැයි කියා ඇවිදිනි ඒ තමාත් උපදනේ බුදුන් උපන් සමයෙකය එහෙයින් ඒ මංගල කෝලාහලියනම් වන්නේය, තවත් අනගැම් බඹුම මිනිස් ලොවට බැසපියා සත් අවුරුද්දක් ගියකලට බුදුන්කරා එළඹ එක් කෙණෙකුන් වහන්සේ මුනිහාවය කරන්නාවූ පිළිවෙත් විචාරණ සේකැයි කියා ඇවිදිනි මේ මොනෙයය කෝලාහලියනම් වන්නේය, මෙසේ මේ කෝලාහල පසින් මංගල කෝලාහලිය ලොව පහලව මහුල් දැනගත නොගිමෙන්ම දෙලොස් හවුරුද්දක් ගියකලට තව තිනාවැසි දෙවියන්ට උන්ට උන්ගේ ඳනවසයෙන් සත්පෑ දෙලොස් විනාඩි ගාවක් විතර ගියකලට තවනිසා වැසි දෙවියෝ එකතැන් වලා නිදුකානෙනි යම්සේ ගෙහිමියෙක් ගෙයි මිනිසුන්ට මුදලිද ගම් මුදලියෙක් ගම්වැසසන්ට මුදලිද රජ්ජුරු කෙණෙක් රටවැස් සන්ට නායකයෝද එරිදෙදන්ම සක්දෙවිඳුහුත් අප දෙදෙවිලොව දෙවියන්ට නායකසේක, උන්වහන්සේට මෙපවත් කිවමනාවිදෑයි ශත්‍රයිනුත් ඒ ඇසිල්ලට නිසිවූ සළුහැඳ ආභරණලා අඳුනුන්කෙ ලක් දෙවඟණන් පිරිවරාගෙණ පරසතු රුක්මුල පඬු ඇඹුල් සල ඇසනෙහි විජම් දෙඝනාවට පෙරාතු හෙයින් හුන්නවුන් කරා ඇසින් වැදලා එකත්පස්ව සිට සවාමිනි දැන් වනදෙඝක මඬහල කථාවෙක් ලොව ඉපද දැන් මහා කෝලාහලය, සමහරකෙණෙක් ඇසින් දුටුදෙය මහුලැයිකියනි සමහරකෙණෙක් පියවි කනින් ඇසූදෙය මහුලැයිකියති සමහරකෙණෙක් ගඹිරස ප්‍රඥවෘය මහු ලැයිකියති එක්තරා සනිටුහනක් නොවූහෙයින් මින් කවරෙක් මහුල් බවක් නොදනෙයි ඉන් යමෙක් මහුල්විනම් අපට ඒ වදුල යඟපතැයි කිවිය සක්දෙවිඳු තමන් මහ නුවණැති හෙයින් මේ මඬහලකථාව තොපිම සිතාගතුද යමෙකුගෙන් ඇසුදුයි විචාලෝය, ඌ තමන් සවි මහරජඇති දෙවියන්ගෙන් ඇසූ නියාව කිවිය, උන්ගෙන්වා විචාළතෙන ඌ අකාශස්ථ දෙවියන්ගෙන් ඇසූ නියාව කිවුය, උන් ගෙන්වා විචාලිතෙන ඌ බුම්ටුදෙවියන්ගෙන් තමන් ඇසූ නියාව කිවුය, උන්ගෙන්වා විචාලිතැන මිනිසුන්ට රුකවලසිටි දෙවියන්ගෙන් තමන් ඇසූ නියාව කිවිය, උන් විචාලි තෙන ඌ මිනිස්ලොව පහළවූ නියාව කිවිය, ඉක්බිත්තෙන් සක් දෙවිඳු නරාදිය තිබැදි අතින් කිරන්නාසේ ආයාසගන්නේ කිම්ද බුදුහු දැන් කොයි වසනසේක්ද මිනිස්ලොව වසනසේකැයි කී

කල්හි ඔබකරා ගොසින් ඔබගෙන්ද විවාලයොණෙක් ඇද්දයි කිවිය එසේ විවාලකෙණක් නැතැයිකී කල්හි කුමක්දතොපිහැම ගිනි තිබියදී ගිනියයිසිතා කණමැදරියන් තබාලා පිඹිනා නියාද මහුල් වදරන්ට නිසිවූ නැවත දැකීම් වැදීම් පිදීම් ආදිය තබා තමන්ව හන්සේගේ ගුණ සදහන්කළ පමණකින් සදහන්කළවුන්ට ලොව් ලොවුතුරා සැපත් සාදදීලන හෙයින් තමන්වහන්සේත් මහුල්වූ බුදුන් අනින් නොවිවාරා මා කුමක් දක්නාහෙයින් මා විවාරන්ට නබාගතුද මහුල් දැනගන්ට උවමනාවිනම් තොපත් අපින් බුදුන් කරා නොසින් ඔබගෙන් විවාරා මහුල් මේයයි දැනගනුම්හ, අප හැමදෙනා එකවිට විවාරන්ට බැරිවේද තොපි විවාරවයි එක් දෙවතාවෙකුට විධානකලහ, ඒ දෙවිපුත්ද ඒ වෙලාවට නිසිවූ ආභරණලා සැරගිනණ විදුලියක්මෙන් බබලමින් දසදහසක් සක්වල දෙවි බඹුන් හා සමග මධ්‍යම රාත්‍රියක්හි වඳු සුඃඛ්‍යන්මෙන් සියලු ජේතවනය ආලෝක පතුරුවා යම්තැනෙක්හි භාග්‍යවන්වූ බුදුරජාණන්වහන්සේ වැඩවසා වදරණසේක්ද එතැන්හි එලඹි සේය, නොහොත් නානාප්‍රකාරවූගුණවිශෙෂාධි ගමාභිප්‍රාය සංඛ්‍යාතවූ යම් කාරණයකින් සපිඳුනතම දිව්‍ය මනුෂ්‍යයන් විසින් උපසංක්‍රම්තව්‍යද එලඹියයුතුද ඒ කාරණයන් බුදුන්කරා එලඹීමය එසේ එලඹ -

බහුදෙවා මනුස්සාව මඞ්ගලානි අචින්තයුං
ආකංඛමානා සොත්ථානං බ්‍රූහිමඞ්ගල මුත්තමං-යි.

යනුවෙන් සමසත සත්වයන් කෙරෙහි පතල මහත් කරුණාවක් ඇත්තාවූ සර්ව්ඥයන් වහන්ස දසදහසක් සක්වල දෙවි බඹහු මහුල් විවාරණු නිසා මේ එක සක්වලට රුස්ව හිසෙක් අත්ක් ඔබා ලනතැනා දෙවිබඹු දහයකුත් විසිසකුත් තිසකුත් සතළිසකුත් පණසකුත් සැටකුත් සැත්තෑවෙකුත් අසූවෙකුත් සියුම් අත්බැවි මවා ගෙණ රුස්වූ දෙවියන්ට වඩා දෙවතාවූ බ්‍රහ්මයන්ට වඩා බ්‍රහ්මවූ නුඹවහන්සේට ආරාධනා කෙරෙමි සියලු දෙවි බඹුන්ගේ ආරාධනාවෙනුත් මිනිසුන්ගේ අනුමැනිසයනුත් මහුල්නම මේයයි වදල යහපතැයි කියා යාචඤ්ඤකෙළ්ය. බුදුහු අසා වදරා හෙම්බල දෙවතාව උත්තුන්පඤ්ඤ නෙලලෙස කියත් නමුත් මහුල්නම් කවරේදැයි විවාලාව වැනිව කියාලූ බවමුත් කාරණයකාහෙලා නොකිබැහින් ඒමගුල් නොවෙයි මහුල්නම් මේලොවින් වුවත් පරලොවින් වුවත් යමෙක් වැඩට කාරණාවේ නම් ඒය එකමගුලක් විවාලාවූ නොපව මහුල් අවතිසක් කියමියි වදරා මං විවාලවුන්ද යම්සේ මං දැන කියාලන කෙණෙක් නොයායුතු මං පල්ලුව් කියාලා යා

සුතුං වං පසුව කියන්ද එපරිද්දෙන් නොකලමනාදෙය නොක රන්ට පලමුව වදුරා පසුව කලමනාදෙය වදුරණසේක්.

අසෙවනාව බාලානං පණ්ඩිතානඤ්ච සෙවනා
පූජාච පූජනීයානං එතං මඞ්ගල මුත්තමං-යි.

මෙසේ එක මංගල්‍යයක් වදුලි මැනවැයිඅාරාධිතවූ සම්බුදුයන් වහන්සේ මදක් ඉල්වන ලදුව බොහෝ සම්පත්දෙන උදුරාඛ්‍යාය ඇති උත්තම පුරුෂයෙකුගෙන්ද බොහෝ අවැඩට කාරණාවූ අඥාන ජනයන්ගේ සේවනය නොකිරීම එක් මහඵලක, බොහෝ වැඩට කාරණාවූ පණ්ඩිත ජනයන්ගේ සේවනය කිරීම එක් මහඵලක පිදියයුතුවූ බුදු පසේබුදු සවිවන්ට කරන්නාවූ පූජාත් අවනැලි යක් විතර දැසමන්මල් අවමිටක් කොට පූජාකල සුමන නම් මාලා කාරයාකන් අටපැයක් නොව අටදවසක් නොව අටවසක් නොව අට අවුරුද්දක් නොව අටසියක් අවුරුදු නොව අටදහ සක් අවුදුරුදු නොව කප් ලක්ෂයක් මුළුල්ලෙහි නරකාදිවූ සතර අපායට නොගොසින් දෙවිලොව දෙවි සැපත් වලඳ මිනිස්ලොව මිනිස් සැපත් වලඳ කෙලිවර සුමන නම් පසේබුදුවන හෙයිනුත් සංඝ සම් බුමුණුව උපන් මහඛෝඝතුන් සුසීමනම් පසේබුදුන්ගේ දුගැබටකළ යම්නම් විතර පූජාවක් නිසා බුදුවූ අවස්ථාවෙහි නා ලොව පටන් අකණිට්ඨ බඹලොව දක්වා සක්වළ ඇතුළත පැවති පූජාසත්කාර ඝංඝාරොහණවෙනින් පෙණෙන හෙයිනුත් ලොව් ලොව් තුරා වැඩට කාරණා හෙයින් එක් මහඵලකැයි කියා එක ගාථා වෙන් මහුල් තුණක් වදුරා එයින් මන්තෙයිදු දෙවතාවන්ගේ අසනු කැමතිබව හෙයින්ද තවත් මංගල්‍යාභිධාන් ඇතබව හෙයින්ද "පතිරූපදෙස වාසොව" යනාදී ගාථාවෙන් වදුරන්ට පටන්ගෙණ වදුළසේකි.

පතිරූප දෙසවාසොව පුඛෙව කතපුඤ්ඤතා
අත්තසම්මා පණිධිච එතං මඞ්ගලමුත්තමං-යි.

එහි අර්ථ කෙසේදයන්? පදගතාභිධාන වනාහි මඞ්ගලසූත්‍ර ව්‍යා ඛ්‍යානයෙහි ප්‍රකාශවූ හෙයින් මේයින් මතුදු අවුවාකථාඛාලූ අර්ථ දක්වනුලැබේ, "පතිරූපදෙසවාසොව" යන්නෙහි ප්‍රතිරූපදෙ ශයනාම ඛ්‍ය දෙශාදිවූ යම් යම් දෙශයක බුඛ ධම් සංඝ සංඛ්‍යාත ත්‍රිවිධ රත්නය පවතීනම් තවද මඛ්‍යදෙශාදිවූ යම් දෙශයක සිව්ව ණක් පිරිස් වෙසෙත්නම් දානාදිවූ දසපින් කිරියවන පවතීනම් තෙවලා බුදුවදුන් පවතිනම් එසේවූ නිසිතෙන විසීවත් ලොව් ලොවිතුරා වැඩට කාරණා හෙයින් මහුල් වන්නේය,

"අකතඤ්ඤුතාඤ්ච" යන්නෙහි යම් කෙණෙක් පන්සිල් පමණැහුන් සිල්නොරැකීමෙහි ආදීනව සලකා සරණශීලය පංචශීලය අෂ්ටාඞ්ග ශීලය යන්නාදි ප්‍රභෙද ඇති ශීලය රකින්නම් මනුෂ්‍යයන් යටින්දු උඩින් කළුනොවනතුරු රණෂාකල පංචශීලය පමණත් අතහැර දිවසැපත් සාදුදෙන බැවින් දුසීලවූ තමා එයින් මුදු ශීල යෙහි පිහිටුවීමද එසේම ගලතලපිට හොසඹ හටගන්නාසේ බුඩිාදි රත්නත්‍රයෙහි සැදුහැනැති කල්හි කුසල් නැමති බිජුවෙන් ලොවී ලොවිතුරා සැපත් නැමැති සස්‍යඵල නොලැබියහැකි බැවින් තමාගේ ශ්‍රද්ධාව මදවූකල්හි අශ්‍රද්ධාවෙහි ආදීනවසලකා අශ්‍රද්ධාවෙන් මිදී ශ්‍රද්ධාවෙහි පිහිටිකල ඒ නිසා අනාථපිණ්ඩිකවිසාඛාදින්වමෙන් කුසල සිඹිය වන බැවින් සැදුහැයෙහි පිහිටන්නම් එසේම අදිනා පුබබක මිවිශිරිය කෝසියාදින්ව මෙන් හද මසුරුසිත් ඇතිවීනම් ඒ මසුරුබව නිසා මහත් අවැඩ එළවන බැවින් දානමය කුසලයන් මසුරුසිත් ඇති කලව සිවනොවෙන බැවින්මසුරුකමින් දුරුව නාගි වෙත්නම් ලෞකික ලොකොත්තර සම්පත් සාදුදෙන බැවින් උතුම් මඟුල් වන්නේයයි. මෙසේ ප්‍රතිරූප දෙශයෙහි වසීම එක් මඟුලෙක පෙර බුබාදින් තෙරහි රැස්කරණලද පින් ඇති බව් එක්මඟුලෙකා දුසීල අශ්‍රඩා මාත්සර්‍යවූ තමා ශීලශ්‍රැත ශ්‍රඩා ත්‍යාග සම්පත්හියෙහි මනාකොට පිහිටුවීම එක් මඟුලෙකැයි කියා "පතිරූපදෙස වාසෝච" යනාදි ගාථාවෙන් මඟුල් තුණක් වදුරා මත්තෙහිත් මඟුල් වදුරන්නාවූ බුදුරජානන්වහන්සේ-

බාහුසච්චඤ්ච සිපපඤ්ච විනයොච සුසික්ඛිතො
සුභාසිතාව යා වාචා එතං මඞ්ගලමුත්තමං-යි.

යනගය වදුලසේක, "**එකි බාහුසච්චං**"යන්නෙහි "බාහුසච්ච නති බහුස්සුත භාවෙ"යි මඞ්ගල සූත්‍ර අට්ඨාවෙහි ආ හෙයින් බොහෝ ඇසූ පිරුනැන්ඇතිබවබහුශ්‍රැත බවනම්වෙයි, හෙද විදර්ශි බුදුන් ආදිවූ බුදුවරුන් සමයෙහි ආගමාහි යොගයකලී **කොණ්ඩඤ්ඤ** මහ තෙරුන් වහන්සේට අප බුදුන් සමයෙහි අඩිාමය නිරාසාව යෙන් සිඹිවූ හෙයින් උතුම් මඟුලෙක, "**සිපපඤ්ච**" යන්නෙහි "යං කිඤ්චිහත්ථකොසල්ලං,,යි. අට්ඨා කථාවෙහි ආඛ්‍යාවෙන් මණිකාරාදි යම් ශිල්පයක් ඉගැන්ම නිසා මෙලෝ පරලෝ දෙකින්ම අවැඩින් තොවෙනම් එසේ උගන්නා නකුත් ආදිවූ අගාරිකයන්ට නිසි අගාරික ශිල්ප ඉගැන්ම අනගාරික නැනට නිසිවූ සිවුරු හෙත්තම් ආදිවූ ශිල්ප ඉගැන්මත් තමන්වත් අනුන්වත් මෙලොව පරලොව වැඩ සාදන හෙයින් මඟුලෙක, "**විනයොච සුසික්ඛිතො**,, යන්නෙහි "විනයොති කායවාචා චිත්තවිනයො සුසික්ඛිතොති සුට්ඨු

සික්ඛිතොා''යි ආහෙයින් ගිහි වූවෝත් පණ්ඩිතා ආදීන් දුරුව ඇත මානනාදියෙහි හැසිරීමත් හැවිදි වූවෝත් පිරිසිදුකොට සතරසංවර ශීලය රක්ෂාකිරීමත් මඟුල හෙවත් දශඅකුශල කර්මපථ වර්ජිතව මනාකොට ගික්මෙනලද දශකුශල කර්මපථ සංඛ්‍යාත අනාරිය විනයය අඛණ්ඩ අවිද්‍රාදි වශයෙන් මනාකොට ගික්මෙනලද චතුපාරිසුද්ධි ශීලසඞ්ඛ්‍යාත අනගාරිය විනයඃ යන ස්ත්‍රීකාරවූ විනය ඇතිබවද ලොව් ලොවිතුරා සැපනට පිහිට බැවින් උතුම් මඟුලෙක, **සුභාසිතාව සා වාචා**,, යන්නෙහි සුභාසිත වචනය නම් චතුර්විධ වාක් දුශ්චරිතයෙන් දුරුව නිර්වාණ සම්ප්‍රාප්තිකවූ කර්ණේරසායන වූ වචනය සුභාසිත වචනයනම්වෙයි හෙද ලෞකික ලොකොත්තර සම්පත්තියට කාරණා හෙයින් මඟුලෙක, මෙසේ මේ ''බාහුසච්චංච,, යනාදි ගාථාවෙන් බහුශ්‍රැත බවද නිවරද්‍ය ශිල්ප දන්නා බවද ශාසනට ප්‍රව්‍රජිතයන්ට වැදැල ක්‍රමයෙන් ගික්මෙන බවද සුභාසිතවූ වචනඇති බවදැයි යන මඟුල් සතරක් වදරා මත්තෙහි මඟුල් වදරන්නාවූ බුදුරජාණන්වහන්සේ-

මාතා පිතු උපට්ඨානං පුත්තදාරස්ස සඞ්ගහෝ
අනාකුලාච කම්මන්තා එතං මඞ්ගලමුත්තමං-යි.

යන ගාථාව වදාළසේක, එහි **''මාතාපිතූ උපට්ඨානං,,** යන්නෙහි මව්පිය දෙදෙනාම මාතා පිතෘ නම්වෙති ඔවුන්ට වඳින මානනාදින් කරණ මෙහෙ උපස්ථාන නම්වෙයි මේ මෙසේ දතයුතුයි. දෙමව්පියන්ට උපස්ථාන කරනුවන් හිමින් තමා කටයුතු මෙහෙ දැසාදින් ඇතද ඔවුනට නොඇණවා උදයනැගී සීතඇත් නම් දරයිනි එළවා මහළු උවද පෙම්සොවූ මලමූත්‍රයෙන් වැකිකිස ශරීර ඇතද වැදැමස් ලේකුණු ආදියෙන් ගැවසීඇත් තමා ලදරු කාලයෙහි කැතනොමකොට අපමණ සෙනහයෙන් වැඩූ දෙමව්පියන්ගේ ගුණ සිහිකොට පසින් පහකලමනාදෙය අතින් පහකොට අතින් පහකලමනාදෙය ඉසින් පහකොට සිය අතින් අතපය ආදිය උලා නහවා තමාලදරුකාලයෙහි මනාපිළියෙන්සැරහූ දෙවිපියන් සිහිකොට යෙහෙන පමණින් උතුම්පිළිගඳවා ඒ ඒ කලට ශරීරයට පැමිණි ව්‍යාධියට නිසිපිළියම්කොට තමාලදරුකාලයෙහි මනාරස කැවූ දෙමව්පියන්ගේ ගුණසිහිකොට කැදකැමතිවූව කැදපිළියෙල කොට බත්කැමතිවූව බත්පිළියෙලකොට කැඳබත්දෙකම කැමතිවූව කැදබත්දෙකම පිළියෙලකොට තමාලදරුකාලයෙහි තෙල් ඛීරිගාවැඩූ දෙමව්පියන්ගේ ගුණසිහිකොට සුවද තෙල්ආදිය ඔස්නපාදදියෙහි ගල්වා සියතින්මැඩ සකස්කරණලද ගෘහයක උතුම්

හැඳකහොඃ වා දිවාරාත්‍රිදෙකම් වෙසෙසින් අප්‍රමාදව උපස්ථානකට යුතු, එසේ කරණලද්දවූ උපස්ථානයනම් ලොවතුරාබුදුන් විසිනුදු යහපතැයිකියාවණිණාකොටවදරණලද්දවූදුතුම්වූසුභලක්‍රියාවක් වන්නේය, ඒ එසේමය ජාතිකාන්නාරාදීන් තරණයකොට සම්‍යක් නිර්වාණමහෂම භූමියට පමුණුවනහෙයින් ශාස්තෘනම්වූ අපගේ ලොගුරු බුදුරජාණන්වහන්සේ පුෂ්පඵල පල්ලවාලංකෘත තරුවරනි කාරකිණිණප්‍රවරෝදුර තපොධනාධාරවූ ජේතවනාරාමයෙහි වැඩ වසා වදරණ සමයෙහි දුප්පත් දෙමව්පියන් ඇති එක් භික්ෂුෂක ණෙකුන්වහන්සේ චීවරපිණ්ඩ ලදවස්තුයෙනුත් දෙමව්පියන්ට සංග්‍රහකරණසේක, එසේම ආහාර මෙහෙත්ආදියත් දෙහැමෙන් පයමෙන් ලදදෙය දෙමව්පියන්ටදී මහන්වූ ප්‍රමෂයත් දුක්පත් මුව්පියඳදෙනා රක්‍ෂාකරණසේක, එපවත්දුටු ෂසුභික්ෂූන්වහන්සේ ඔවුන්වහන්සේට මහණ මතෝ ෂනයුෂ්ණික බුබ්ධශාසනයෙහි මහණව සැදුහැයෙන් දෙනලද සිව්පසයන්ගෙණ හිතින් පොෂ්‍යයක රන්ට කාරණාකිත්දැයි?දදඩා නොකමැත්තේදෙන් බුදුන් සමීපයට කැඳවා ගෙණගොස් දක්වාස්වාමිනිමේ මහණ හිතින් පොෂ්‍යයකරෙමින් වෙසයි දැන්වූසේක, ඒ අසා ෂසීඳුයන්වහන්සේ මහණෙනි භික්ෂුහට නොදෙවඩ පුරාතනයෙහි නුවණැත්තෝ මුළුදඹදිව පැමිණියාවූ රාජ්‍යශ්‍රීහැර මව්පියන් පොෂ්‍යයකරෙමින් වාසයකලාහුවෙත්දැයි වදරා ඒ භික්ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ නිලොගුරු සම්බුදුයන්වහන්සේ අතීතකාලයෙහි පැවති කථානතරය පැහැදුනි විඥාන ජෝතිරඬහ ණිකායක්ගෙණහැර දක්වන්නාක්පරිදෙදන් වදරණසේක් මහණෙනි යටගියදවස බාරාණසීනුවරෙහි බ්‍රහ්මවඩන නම් නුවරෙක්වියඑහි මඝනාම රජ්ජුරුකෙණෙක් දැනප්‍රියවචන අපිවරියා සමානාත් මතාසයන චතුසංග්‍රහ වසතුවෙන් ජනරඤ්ජනය කෙරෙමින් රාජ්‍යයකරන්නාහුය යනාදින් ෂසානනඳජාතකය දක්වාවදාළසේක, මෙසේ බුදුරජාණන්වහන්සේ විසින් ශාසනයෙහි පැවිදිවූ ශ්‍රාවකයන් විසිනුදු දෙමව්පියන්ට කරණලද උපකාරයෙහි අනුෂත් ප්‍රකාශකොට දක්වා වදාළබැවින් ගෘහස්ථවූජීත ඳදපක්‍ෂයෙහි වූවන්විසින්ම දෙමව්පියන්ට කරණ උපස්ථානයෙහි අප්‍රමාද වියයුතුමැයි, මෙහි වනාහි ගෘහස්ථයන් විසින් මව්පියන්ට උපස්ථානකෙරෙමියි කියා ප්‍රාණවධකොට ෂසාරකම්කොට වසතු උපදවා රහමෙරපයාදි අධර්මයෙන් උපස්ථාන කළහොත් තමනුත් ඔහුනුත් අපායගාත්වන බැවින් හේ උපස්ථානනම් නොවෙයි, ඒවි කරුණුකිමයත්?

"මිනහාඟංභිංඛඛවෙන ප්‍රපපනිකාරංවදුම්මාතුඛ්ව පිතුඛ්වඑකෙ
නහිකඛවෙ අංසෙනමාතරංපරිහරෙය්‍ය එකෙන අංසෙනපිතරං පරි
හරෙය්‍ය වස්සසතායුකොවස්සසත ජීවී සොව තෙසංඋච්ඡාදනපරි
මද්දන නහාපන සම්බාහනෙන තෙවතස්ෂේව මුත්තකරීසං ච ජෙ
ය්‍යුං නතෙවභිංඛඛවෙ මාතාපිතූනාං කතංවා හොති පතිකතං
වා-යි.

යනුවෙන් මහණෙනි යමෙක් මව්පියන් තමහට උපකාරබැව්
දැන ප්‍රත්‍යුපකාරකෙරෙම්යි උත්සාහ පරවශව එක්දවරුයෙක
මවහිදුවා එක්දවරුයෙක පියාහිදුවාගෙණ හවුරුදු සියයක් පරිහර
ණය කෙරේද නෙනෙම ඔවුන් උද්වර්තනයෙනුදු හස්තපාද පරිමර්දනයෙ
නුදු ශිතොදක උෂ්ණොදක ස්නානපානයෙනුදු අඟසම්බාහනයෙනුදු
උපස්ථානකෙරේද මව්පියො ඔහු අංසකූටයෙහිමහිද මූත්‍රපුරීෂයිගී
කෙරෙද්ද ගේ සේසේදවූ මව්පියන්ට උපකාරනම් නොවෙයි වදල
හෙයින්ද,

ඉමිස්සාපි භික්ඛවෙ ! මහාපඨවියා පහූතඝනතරතහාය මාතා
පිතරෝ ඉස්සරියාධිපච්චෙ රජ්ජෙ පතිට්ඨාපෙය්‍ය නත්වෙව භික්ඛවෙ
මාතාපිතූනනා කතංවා හොති පතිකතං වා-යි.

යනුවෙන් මහණෙනි යමෙක් සියලු දඹදිව්තලය හෙරිතල
යක් සෙයින් සමකොට කිතිපමණ සත්රුවනින්පුරා මව්පියන්
එහිනායකකොරි සක්විති රාජ්‍යයෙහි පිහිටුවාද හේ එසේකළේද
විනම් මව්පියන්ට උපකාරකලාකම් නොවෙයි වදලබැවිනි ද
මන්ජීවිතයට වඩා පෙනහෙයින් වැඩූ දෙමව්පියන්ට දෙලොවින්ම
ඔඩ්ඩාඟ කෙරෙම්යි සිතාපූජාකිරීම ක්‍රමයෙන් ආදරඇතිව මව්පියන්
රක්නේය ශ්‍රද්ධානැතිමව්පියන් ශ්‍රද්ධාවෙහිද දුසීලවූ මව්පියන් සුසීල
භාවයෙහිද මසුරුවූවන් ත්‍යාගශීලවෙහිද අඥානවූ මව්පියන් ප්‍රඥ
වෙහිද පිහිටුවා. ප්‍රාණඝාත අදත්තාදානාදියෙන් දුරුව නොවිනැන්
ආදියෙන් දහඇමෙන් සෙමෙන් ලදදෙයකින් ආදරඇතිවමඋපස්ථාන
කටයුතු, ප්‍රව්‍රජිතයන්විසිනුදු මව්පියන්ට උපස්ථානකෙරෙම්යි
කියා දශ ශීලයෙහිදීම මහපත් වුල්ලශීලයෙහිදීම ප්‍රතිරූපකල
රන්රිදී මසුකහවණු පිළිගැන්මෙන්ද දුසිදුවගන් පිළිගැන්මෙනු
ගවමහිෂාදීන් පිළිගැන්මෙන්ද ග්‍රාමක්ෂෙත්‍ර පිළිගැන්මෙන්ද මුකතා
මාණික්‍යාදියපිළිගැන්මෙනු භික්ෂූන්විසින් මවුපියන්ටකළ උපකා
රයක් ශ්‍රීමූඛපාලියෙක හෝ අට්ඨාකථාවෙක හෝ නොපෙණෙන
බැවින් එසේකලහොත් බුඩඇතුව ඉක්ම අපායභාග වන බව මුන්
වැඩව කාරණා නොවනබැවින් එසේ නොකොට තමන්ලද ආහාර

වස්ත්‍ර ඖෂධ සෙනසුන්* යනමේ සිවිපසයෙහි ඇතුලින් දෙයකින් දිවුරුකිමටත් එපමණම බැවින් සංග්‍රහකොට පරලොවින් සඩ්ග්‍රහ පිණිස පවසීලාදියෙහි පිහිටුවා උපස්ථානකටයුතු, මෙසේ ගෘහ සථ්‍රවුජිතයන් විසින් කටයුතුවූ මව්පියන්ට කළමනා උපස්ථානය තබා වරදවා යමෙක්පිළිපන්නේ වීනම් ඔහට වනඅවැඩ දක්වනපිණිස මුගලන් මහතෙරුන්වහන්සේගේ කථාව දක්වනුලැබේ කෙසේදයත්? එකා සංඛ්‍යකප් සුවහසක් වමත්අග ඔව තනතුරට පතා ආ මහමුගලන් මහතෙරහු එක්ජන්මයක අනිවූ දෙමව්පියන් රක්ෂාකරණසේක් නිබන්ධකයට බැඳුනමහත් සැපසේ මව්පියන් රක්ෂාකොට ගතනොහෙම්යි සිතා නිත්‍යයෙන් අන්කිසිවක් නොකොට මව්පියන්ටම උපස්ථානකරණසේක් එක් දවසක් දෙමව්පියන්විසින් පුතනුවනි මේලෙස කොපට සුදුසුනොවෙයි නිසිකුලයකින් සරණයක් කොටගෙණ වසවයි කියෙන් එසේකෙළමිනම් ඔබට උපස්ථානකිරීම තබා අනදරකොට අපා ගතත්වෙමියි ඒ කාරණයෙන් එසේනොකැමැත්තෙම්යි කියාත් නැවත නැවත දෙමව්පියන් කියන වචනයට කිකරුව කුමාරිකා කෙණෙහුන් ගෙණවුත් වසන සමයෙහි කුමාරිකාද තමා පය ඔබා ගන්නාතෙක් දවස්ගණනක් නැදිමයිලන්ට කළමනා උපස්ථාන අඩුවක් නැතිව කොටලා පසුව නැදිමයිලන්ගේ දැකීම්පමණකුත් නොකමැතිව මුඛටගන්නා දිගමුත් මුඛගේ දෙමව්පියන්ට මෙහෙ මවබැරියයි කියා උන් තමන් කුමක්කිවන් නොහිවිස්නාහෙයින් සමුනන් පිටතටගියකලට නරකෙස් නියාවක් හඟවන්ට නියඳ කිදිත් සොටු සෙම් මාරුවට කැඳපෙණත් හැරගෙණ ඒ ඒ තැන බාපියා සමුනන් අවුත් මේ කිම්දයි විවාල කල්හි මේ මුඛගේ ඇස් කන් නැති දෙමව්පියන්ගේ කටයුතුය, ගිහයේ පිරනකල කඩා ලති සෙම්කාරා ඒ ඒ තැනලති සුරා සොටු දමති කසලකල කලි සේද මා කිව්ටෙකැයි කියා ගෙදොර පිසීම්ද මුනුහා මාහා එක්ව රඳුලන්ට නොපිළිවනැයි එක්වන් කියයි මෙසේ උන්කියනකලට ඒකාසංඛ්‍ය කප්ලක්ෂයක් වමත්සව්වන්ට පතා ආ මහපුරුෂයාතෝ දෙමව්පියන්කෙරෙහි බිදිගත්හ බිඳිලා ඊට නිස්සාදනිම්යි කියලා දෙමව්පියන්කවා පොවාලා දෙමව්පියනි මුඛගේ අසවල්තෙනකිදිනා නැයෝ මුඛ දක්නා කැමැත්තෝය ඔබයම්හයි කියාලා ගැලකට නංවාගෙණ යනතැනැත්තෝ අඩවිමහමලට ගියකලට මුඛදැ හැමිමේරුණ අල්වාගෙණ පයින්හත්කොටලන්නාහා නොන්යෙති මෙතන සොරුඇත මව බැසලා සොරුන්ගේ සැඟවුරයදැන දුන

* වස්ත්‍රාභාරසේනාසනෞෂධ

යෙමියි කියාලා දෙමව්පියන් අතට රිණදීලා බැසපියා මදක්තෑ ශ්‍රී ඡනයින් තබාලා කටඟඩක් පෙරලා කෙමලස් සොරුන් එනා අන් සොරකෙණෙකු එනන නැතත් සොරුන් අවුත් වන් සැටියක් කලහ, දෙමව්පියෝත් අරගලඅයාලා සොරුදෙගෙයි සිතාලා පුත ණඩ අපිමාළුවයිසම්භ අපමලා මළේය නැලවුණුගමන් මුඛඇලවෙ න්නේයයි කිවිය උත්තුමුදෙමව්පියන් එලෙසකිකල සොරුන් පලවා පියා ආලෙසක්ෂස් අවුත්ලා මොලොක්සිත් ඇති දෙමව්පියන් කැඳ වාගෙණ පෙරලා ගෙටයනලෙඝකුත් නොකොට–

බලවන්තා දුබ්බලා හොන්ති ඵාමවණ්ණාපි හායරේ,
වඤ්ඣා ඇඩිතා හොති මාතුගාම වසංගතෝ–යි,

යන්නෙහි පිහිටා ඥතඟකාරිය නැතිවීමෙන් දුම්ලව නුවණැස නැතිවීමෙන් අඩ දෙමව්පියන්ට වඩා අඩව රක්‍ෂාකලි ඇඟඩනි යන්ගේ අදහසම රුකිපමණක්මූත් පරලොවනසා සොරුන් ලෙ සට අරගලකෙරෙමින් අවුත්ලා මරා තලාපියා වලදමා ගෙට ගොස්ඇලේසිත්ගෙණ එයින්වුතව නොයෙක් හවුරුදු ලක්‍ෂඟණන් නරකයෙහි පැසිපියා නවත් අඤ්ඤලය නොගෙවුණුහෙ න් අත්බැවි සියයෙක තැලුම් කා මරණයට පැමිණ ක්‍රමයෙන් අවුත් මහපින්ඇති හෙයින් අපබුදුන්ගේ සස්නෙහි යාඛ්මතුන් කෙරෙහි අඟතැන්පත්ව වසනසේක් එක්සමයෙක තීර්‍ථීනයෝ එක්තැන්වපියා ඔවුනොවුන් හා කථාකරන්නාහු මහණගොයුම්හට ලාභසත්කාර බලවත්වන්ට කාරණා දනුදැයි විවාලෝය අපිනොදනුම්හ තෙලෙසව්වාලෝ තොපහැම දන්නානියාදැයි කිවිය එසේය අපිදනුම්හ එකමුගලන් මහතෙරුන්නියා උපදනා ලාභසත්කාරය උන්නියා උපදනේ කෙ සේදයත්? උත්තුමු දෙව්ලොවට ගොසින් මිනිස්ලොව සිටිනාකල ඉදවහා වන්ට නිසිව කළ පින් විවාරාගෙණ උත්සාහ වඩනානියා මේ මේ පින්කම්කළාහු දෙව්ලොවඉපිද දෙවසැපත් ලැබෙතියි මිනි සුන්වයියනි කාලෙක නරකයට ගොසින් හැසිලලකට නරකගිනි නිවාලා නිරාදුකට කාරණාවූ පවිකම් විවාරාගෙණ අවුත් මේ මේ පවිකම්කලෝ නරකවල ඉපදුමේ මේ දුක් විඳිනියි කියනි, මිනිස්සු ඒ අයා පවින් දුරුව පින්කමෙහි හැසිරෙන්නාහු බොහෝවූ ලාභ සත්කාර ලබනවනි මිනිසුන් දෙවසැපත්හි ආලයකරවන්ට ඒ විස්තර කොට කියන්නෝත් ගොසින් බලා ආගෙයින් උමය ඒ උපදේශය යහපතැයි හැමදනා පවෙහි ආලය හරවන්ට එයින්බලා ආගෙයින් නරකදුක්කියන්නෝත් උමය දෙලෙසින්ම ලාභයට මං කලහ ඉදින් උන්මරාපිමෝනම් ඒ ලාභසත්කාරය යටගංබලායන දිය වඩ දිය වේලාවිට උඩුගංබලාගන්නාසේ තවත් එබදු කෙණෙකුත් පෙ

ණෙනතෙක් අපකරා එයිකිවුය, ඒ උපදෙශය යහපතැයි හැමනෙද එක්සිත්ව ගෙණ මරණ උපදෙස් සිතන්නාහු තමන්ගේ උපාසක වරුන් සමාදන්කරවාගෙණ මසුදහසක් ලදින් මිනිමරා ඇවිදිනා සොරුන්කැඳවා ගෙන්වාගෙණ මහමුගලන්තෙරහු කළුගලවෙත්‍රෙනි එතනට ගොසින් උන්මරාපියවයි කියාලා අත්ලසට මසුදහසක් දුන්හ, සොරුත් වස්තුලොභයෙන් නොගිවිසමනාදෙය ගිවිසගෙණ මහතෙරුන්වහන්සේ මරනුනිසා ගොසින් ඔබවැඩහිඳිනා තැන්වට කොටගත්හ, මහතෙරුන්වහන්සේත් උන්වටකළු නියාවදුන කෙසිසිදුරෙන් නික්මලා කැමතිතෙනකට වැඩිසේක, සොරුත් එදවස තෙරුන්වහන්සේ නොදුක අනික් දවසෙකත් අවුත් ගල් ලෙන රැකගත්හ, මහතෙරුන්වහන්සේ දුනලා ආදි දවස් ගියමග රැකගත්හයි අනික් මගකයන කෙණෙක්මෙන් කැණීමඩලපලා ගෙණ අහසටනැගිසේක මෙලෙසින් දෙමසක් විකරම මහතෙරුන් වහන්සේට කුමකුත්කවනුහුනාහුය තුන්වනමසදි මහතෙරුන් වහන්සේ සොරුන්ට වැලහෙන්ට පිළිවන්ඵවත් තමන්වගන්සේ කළ අකුශලකම්සට වැලහෙන්ට තමන්වහන්සේට තබා බුදුන්ටත් බැරිබැවින් එදවස් නොගොසින් වැඩහුන්සේක, සොරුත්හඬාඅල්වා ගෙණ සියල්ලිරුරෙහි ඇටතලා පයියක පුරාලූ සාල්මෙන් බිඳපුණු කොවපියා මලයිසිනා එක්කැලයකටදම්පියා ගියහ, මහතෙරුන් වහන්සේ බුදුන්දැකම පිරිනිවන් පාම්යි තමන්වහන්සේගේ අත්බැව බුන්වලදක් වැලිත්වෙලා තරකරන්නාසේ ධ්‍යානයෙන් වෙලා තර කොටගෙණ අහසින් බුදුන්ලඟට ගොසින් බුදුන්වැඳලා සාමිනි පිරිනිවන්පාම්යි කීසේක, පිරිනිවන් පවිදුයි බුදුහුත් වීවාරා එසේය සාමිනියි කීකල්හි කොයිදිදුයි විවාලිසේක, සාමිනි කළුලේලෙහැදී යයි කීකල්හි ඒසේවීනම් අපට බණක් කියාලායව මෙවක්පවත් නොපවැති සවිතෙණෙකුන්දක්නටත් නැත්තේවේදුයි වදලසේක, යහපත සාමිනි එලෙසකරම්යිකියාලා බුදුන්වැඳගෙණ අහසට නැගී සැරියුත් මහතෙරුන්වහන්සේ පිරිනිවන්පාහා දවස්පෙලිහැර දක් වූවාමෙන් පෙලිහැර දැක්වීමට තමන්වහන්සේ බුදුන්ට ඉක්බිති හෙයින් විශෙෂකොට පෙලිහැරත් දක්වා බුදුන්ගේ ආරාධනාවෙන් බණත්වදුරා අහසින් බැස කළුගල්ලෙනට වැඩ පිරිනිවිසේක, සොරු කෙණෙක් මුගලන් මහතෙරුන්වහන්සේ මැරුයයි යන කථා ඔබත් ප්‍රසිද්ධවසිටිනහෙයින් සියලුදඹදිව විසිනිණ්ණවිය අජාසත් රජ්ජුරු වෝත් සොරුන් හසුකරන්ට මිනිසුන්ට විධානකලහ ඒ සොරුනුත් රා බිකුණන තෙනින් රා හැරගෙණ බොණකලට එකෙක් එකොකු ගේ රා ඔවුම ගසාගෙලාපිය ඒ ඔහට කිපි ගොසින් හැයි කොලමාගේ රා ඔඩම ගසාගුමකට හෙලීද මුගලන් මහතෙරුන්

වහන්සේට පළමුකොට ගැසූයේනෝද මාත් ගැසුවයි කියා මේලෙ සින් ඔබ මැරීමට එක්වූ හැමදෙනම තමතමන්ගේ බසින්ම පෙළූ නාහූය අසුකරන්ට සිටියෝත් උත්තමන්ම කියාසිටිහෙයින් සොරුන්හැමගෙයා අල්වාගෙණ රජ්ජුරුවන්ට පැවුය රජ්ජුරුවෝද මහතෙරුන්වහන්සේ මැරුවෝ නොපිදූයි ඔවාරා එසේයයි කීකල්හි තොපිමසිතාගෙණ මැරුද ඔබ්බේවිධානයකින් මැරුදූයි විවාලෝය නිවවුන්ගේ විධානයෙනැයි කීකල්හි රජ්ජුරුවෝ පන්සියයක් නිවවුන්ගෙන්ගෙණ පන්සියයක් සොරුනුත් උනුත්දහස සෙන්ඛුළු වෙහි පෙකිනි පමණවලගස්වාලා ඊසිටුවා පස්තලවාලාපිදුරෙන් වස්වාලා උදේනිරජ්ජුරුවන් මාගන්දිනම් බැමිණියගේ නැයන්වලා කැරවූ ලෙසටම ගිනිගැස්සූහ ගිනිගස්වා දුගන්නියාව දැන යනාතුල් බාලා සාවා කිරි හිරිකොට පැළුහැ,දම්සෙබෙයි රුස්වහුන්වහන්දෝත් ඇවැත්නි මුගලන් මහතෙරුන්වහන්සේ පිරිනිවිලෙය ඔබවතරම් නොවෙයි කිංසක, බුදුහුළුඅසාවදුරා මහණෙනි මෙවක මෙලෙස මියයාම උන්වතරම් නොවණ පමණක්මුත් සකෙලගිවසිවියෝනම් පෙරඋන්කලලෙසට තරම්මයයි වදුරා පෙරකල අකුශල කම්ය යට කිපරිදෙදන් විසකාරකොට වදුලසේක, මෙබදු මහපැරුම් ඇති මහෝත්තමයන්ව පවා සසරවසනකල මවිපියන්කෙරෙහි කරණලද අනදරශයයි විපාකය සසරත් නොයෙක් ජාතියෙක්හි විඳුවා අන සව්බවට පැමිණ නිවන් දක්නා ජාතියදක්වා ලූහුබදවා ආකල සෙසුසත්වයන්ට එයින්වන අවැඩ කවරකණෙක්තම් වණ්ණනාකොට දක්වත්ට සමර්ථවෙත්ද අසමර්ථමැයි, තවද මවුපියන් කෙරෙහි අනදරකළහොත් දෙවිපිරිසන්මරා යම්සුද්ඛලයෙක් ඒ අකුශලකම්ය මගවා නරකයට නොයනපිණිස සියලු සක්වලහැබසානැනරුවන් මස වෛන්‍යයෙන්පුරා තදනුරූපවූ පූජාකොටහෝ සියලුසක්වල ගැබපුරාවැඩුන් මහරහතුන්ට සිවිපසයෙන් මහදන්දී හෝ බුදුන්ගේ සිවුරුකොණ අල්වා අතනොහැර ඇවිදිමෙන් හෝ උත්සාහ කළේවීනමුත් ඒ කාන්තාරයන්ම ඒ අත්බැවින්වුතව නරකයගිම උපදී දක්වනලදමැයි සාරසංග්‍රහය ආනන්තරියකම් විභාවනාවේ කථාවෙහි-

මනුස්සභූතං මාතරංවා පිතරංවා අපරිවත්තිතලිඛ්ගජීවිතාවොරොපෙත්‍යස්ස කම්මං අනන්තරියං හොති තස්සවිපාකං පටිබාහිස්සාමීති සකාලවක්කවාලං මහාවෙතියපබ්මාණෙහි කඤ්ඤනථූපෙහි පූරෙත්වාපි සකල චක්කවාලං පූරෙත්වා නිසිනනස්ස භික්ඛුසඞ්ඝස්ස මහාදානං දත්වාපි බුඩස්ස භගවතොං සංඝාටිකණ්ණං අමුඤ්චිත්වා වරනෙතාපිකායස්ස මහදුනිරයයෙයව උපපැඳුනති—යි

තවිද මේ ශාසනයෙහි ශ්‍රාවකපාරමීඥාන ශ්‍රද්ධාවන්තයන් කෙරෙහි අග්‍රතැන්පත් ශ්‍රද්ධාවඇතිභෙයින් බුදුන් පිරිනිවිසේකැයි යනු අසා තුන්විවෙක මුළුහිඟුලාබවට පැමිණියාවූ අපමණවූ පූජා සත්කාරයෙන් ධාතූවඩා නිධන්කොට තබා මහාකාශ්‍යප ස්ථවිර ශ්‍රාවකයන්වහන්සේ ප්‍රධානකොටඇති පන්සියයක් මහරහතන්ලවා වෙ භාරපමිත ප්‍රාණ්තයෙනිදී පිටකත්‍රය සංගායනාකරවා පස්වැදහ සක් මුළුල්ලෙහි පවත්වනපරිදෙදුන් ධර්මය තැන්පත්කොට තුබූ අජාසත් මහරජහුවැනියෝද පිතෘඝාතක කර්මයෙන් ඒ අත් බැවින් චුතව නරකයෙහිම උපන් බැවින් තමහට වැඩකැමති කෙණෙක් මැවිපියන් කෙනෙක් නුගුණ ඇතද ඒ නොසලකා අප්‍රමාදව උප ස්ථාන කළහොත් ප්‍රමාණාතික්‍රාන්ත ජාති කොටි ඇතුවයෙහි සම්පත්ති ලබන්නට කාරණා බැවින් උතුම්මහලෙක් නම්වන්නේය, "පුත්තදාරස්ස සඞ්ගහෝ,,යන්නෙහි පුත්‍රයන් හා දරුවන්ට සංග්‍රහ කරණ පරිදි කෙසේදයත්? දරුවන්ට ප්‍රිය මනාප වස්තුාභරණාදිය සපයාදීමෙන්ද පරදරයෙහි පරපුරුෂසේවන යෙහි හැසිර විදුනා අපාදුකට අවකාශනොදී පුත්‍රයන්ට සුදුසුවයසට කැමති ලෙස සරණදීමෙන්ද දීමෙන්ද දියනියන් යහපත් කුමරුවන්ට සරණ පාවාදීමෙන්ද එසේම භාය්‍යාවන්ට පළඳනාදිය සපයාදීමෙන්ද ප්‍රියවූ වචනාදිය කීමෙන්ද ඉහලොකයෙනුත් සංග්‍රහ කොට පරලොව්න් ඔවුන්ට වැඩ පිණිස ප්‍රාණඝාතාදි පස්පවින් වලක්වා පොහොය පෙහෙවස් සමාදන් කරවා අශ්‍රද්ධාදියෙන් දුරුකොට ශ්‍රද්ධාදි ගුණධර්මයෙහි පිහිටුවා ධාර්මික සංග්‍රහ කරන්නාවූ යම්පුද්ගලයෙක් ඇත්නම් ඕහට ශක්‍රාදිදෙවියෝද පවා සතුටුවෙත්—ඒ එසේමය—එක්සමයෙක්හි මාතලි දිව්‍යපුත්‍රතෙම සක්දෙවිරජහු කෙරෙන් විචාරනුයේ දෙදෙවි ලොවට අධිපති හෙයින් දිව්‍යලොකයෙහි ශ්‍රේෂ්ඨභාවයට පැමිණි ඔබ වැනිවූ මහත් සෘද්ධානුභාව ඇති ශක්‍රදිව්‍ය රාජයෙක් ගවි උස මිණිඔටුනු පලන් ගිහිගෙනමා කවරකෙරෙණ කුන්ට නමස්කාර කරන්නෙහි දැයි විචාරමින් මෙසේ කියා-

සෙඨඤ්හදෙවලෝකස්මිං එවමිපි දෙවෝ මඝිඞ්ඝකා
අඩ්ඨාසිසං කරිත්වාන කිංසු සංකනමස්සසි-ඉි-

එසේ විචාරණ ලද මාතලි දිව්‍ය පුත්‍රයාහට මාතලිය මේලොකයෙහි යම් ගෘහස්ථයෙක් දානාදි දසපින් කිරියවත් පුරාද සරණ සීල පඤ්චකාදි වශයෙන් ශීලසංරක්ෂණය කෙරේද බුද්ධාදි රත්නත්‍රය හජනය පඤ්චුපාශනය කිරීමෙන් උපාසක ධර්මයෙහි පිහිටියේද දානසීල භාවනාදිය ප්‍රියවචන වස්ත්‍රාභරණදානාදීන් ධාර්මික සංග්‍රහ කොට දැහැමෙන් සෙමෙන් පුත්‍රදරාවන් පොෂනය කෙරේද ඔහු

විසින් රුස්කරණලද කුසලය අනුමොදන්වන පිණිස ඔහුවදිමිසි යනු දක්වනුවෝ කිහ—

යෙ ගෙඩා පුඤ්ඤකරා සීලවන්තා උපාසකා
ධම්මෙන දූරං පොසෙන්ති තං නමස්සාමි මාතලි-සි

මේ ආදි ගුණයෙන් යුක්ත හෙයින්ද අඹුවන්ට හා දරුවන්ට උන් කෙරෙහි හරසර ඇතිවීමෙන හෙලා නොදැක්මෙන උන් හික්ම නොපැවැත් මෙන සුරවුන්ට අත්හැරීමෙන ආහරණ කර වාදී මෙනැයි මෙලෙස සංග්‍රහ කිරීමෙන් අඹුවෝවුවත් නෙයදඹු ඉදුරා විචාරති දරුවෝවුවත් ඉතා පක්‍ෂවෙති නෙයි ඇතිකෙලි කොලඳන්ට හිතපක්‍ෂවති සඛාමිහු ඉක්ම පවත්නෝත් නොවෙයිඋපයා රුස්කලදෙය නොනසා රුකත්ලති සියල්ලෙහිම අහලඅත්වෙති අප්‍රමාදත්වෙති ඒ කාරණයෙන් පුත්‍රදූරාවන්ට සංග්‍රහකිරීම මෙලෝ පරලෝ දෙකට කාරණාහෙයින් මහල් වන්නේය,

"අනාකුලාචකම්මනතා" යන තන්හි නිරවුල් කම්කාන්ත හම් අකුශල කම්පථ විරහිතව කරණ කම්කාන්තනොකිරීමෙඳ කරතත් කල්ගක්මවා කිරීමෙන්ද කලවකරතත් නපුරු කොට මැලිව කිරීමෙන්ද යන මෙයින් දුරුව කල්දන නිසිලෙසින් නොමැලිව කොවිහන්හා සිවප් ආදිවූ කම්කාන්ත ඇතිබව අනාකුල කම්කාන්තභාවයි හෙද ධන ධාන්‍ය සම්පත් ඇතිවීමට කාරණා හෙයින් මහල්භාව වන්නේය, මෙසේ මාතා පිතු උපස්ථානං යනාදි ගාථාවෙන් මවුන්ට උපස්ථාන කිරීමය පියන්ට උපස්ථාන කිරීමය පුත්‍රදූරාවන්ට සංග්‍රහකිරීමය නිරවුල්වූ කාශිවණිජ්‍යාදි කම්කාන්ත ඇති බවයයි කියා මහල් ඝතරක් වදරණ ලදි—පුත්‍රයන්ට දූරුවන්ට සංග්‍රහ කිරීම දෙකක් කොටමහල් පසක්හෝවෙයි මවිපියන්ට උපස්ථාන කිරීම එකෙක පුත්‍රදූරාවන්ට සංග්‍රහ කිරීම එකෙක නිරවුල් කර්මාන්ත ඇතිබව එකෙකැයි කියා මහල් තුණෙක්හෝවෙයි, මෙමකිහ **මහලසුත්‍ර අවුවාවෙහි**—

ඉමිස්සාපි ගාථාය මාතුපඨානං පිතුපඨානං පුත්තදූරස්ස සඞ්ගහො අනාකුලාච කම්මන්තාති එත්තාවමඩගලානි වුත්තානි පුත්තදූරස්සසඞ්ගහෙ වා ච්ධාකත්වා පඤ්ච මාතුපිතුපඨානංවා එකමෙව කත්වානිණ්ණි—සි.

එයට අනතුරුව මන්තෙහින් මගුල් වදරන්නාවූ බුදුරජාණන් වහන්සේ—

දුතඤ්ඤු ධම්මවරියාව සුතකාතඤ්ඤු සඞ්ඝහෝ
අනවජ්ජානි කම්මානි එතං මඞ්ගලමුත්තමං—යි.

යනගය වදුලසේක -එහි"දුතඤ්ඤු" යනතන්හි ආමිස දුනය ධම්දුනයයි කියා දුනයවිප්‍රකාරවේ—ඒවිප්‍රකාරවූ දුනයන් අතු රෙහි ආමිසදුනය නමි චතුර්විධ ප්‍රත්‍යයදුනය හා දසවිධ දුනවස්තු ආදිය දන්දීම වන්නේය—ඒඑසේමය. මේ ලෝකයෙහි යම්කිසි ශ්‍රද්ධා සම්පන්නවූ සත්‍රියෙක් හෝ පුරුෂයෙක් හෝ සම්තපාපිවූ ශ්‍රමණයෙකුට හෝ බාහිතපාපි බ්‍රාහ්මණයෙකුට හෝ බාද්‍ය භොද්‍ය ලෙය්‍ය පෙය්‍ය වශයෙන් චතුර්විධවූ ආහාරයද-

මධුමුදුක සාළුක චොව මොවමඛ ජම්බුජං
චාරුසංනාගාස් සන්තත්තං පානකං යාමකාලිකං-යි.

දක්වන ලද අෂ්ටවිධපාන වශියද කාසිකොසලාදිවූ වස්ත්‍රාභරණ තියද රිදෙළි කුනම් ඇත්අස් ආදිවූ යානවාහනයද ගෙතු නොගෙතු සිනිඳු බොලිඳු දැසමන් සපු දුතුකේ ආදිවූ පුෂ්පජාති යද කස්තුරු කපුරු ජඹාදු සාන්දු පිනිදිය ආදිවූ සුගන්ධ ද්‍රව්‍යයද කසා සඳුන් ආදිවූ ඡවිරාගකරණයද බිසිබිමෙබාගනාදි පෙය්‍යාවද ආවාසයද හෙවත් ලැගුම්ගෙයද ප්‍රදීපයට කිතවූ පහන්තෙල් පහන් කඳු පහන්මලා පහන්වැටි ආදියද යනමේ දසවිධ දුනවස්තූන් දුන් නේවීනම් ඒසත්වතෙම ඒ කුශලඛමීය හේතුකොට ගෙණ කරජකා යයාගේ භෙදයෙන් නොහොත් මරණින් මත්තෙහි සුගති (සවර්ග) සංඛ්‍යාතවූ දිව්‍යලොකයෙහි උපදනන්ය හෙවත් ඒතුම්හාරාජිකනම් දිව්‍යලොකයෙහි ඉපද මනුෂ්‍යගණනාවෙන් අනූලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් වීද එයින්නැගී තව්තිසාදිව්‍ය භවනයෙහි ඉපද තුන් කෙළි සැට්ලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් වීද එයින්නැගී යාමනම් දිව්‍යලොකයෙහි ඉපද තුදුස් කෙළි සැටලක්ෂයක් හවුරුදු දිව්‍යසම් පත් වීද එයින්නැගී තුසිත භවනයෙහි ඉපද එහිසත් පණස්කෙළි සැටලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත්වීද-එයින්නැගී නිම්මාණරතිනම් දිව්‍යලොකයෙහි ඉපද එහිදෙයිය තිස්කෙළි සතළිස් ලක්ෂයක් හවු රුදු දිව්‍යසම්පත්වීද—එයින්නැගී පරනිර්මිත වසවර්ති නම් දිව්‍ය ලොකයෙහි ඉපද එහි නවසිය එක්විසිකෙළි සැටලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් වීද—යදිව්‍යලොකයෙහි මෙසේ එක්දහස් දෙසිය අව විසිකෙළි පණස් ලක්ෂයක් හවුරුදු මුළුල්ලෙහි විඳිනා දිව්‍ය සම්පත් තියද ඔහුකැමති වීනම් යාදදෙන්නේය, "දුනංහි ලොකෙ බ්‍රහ්ම සම්පත්තිංදෙති"යි වදුල බැවින් එයින්නැගී බ්‍රහ්මපාරිසද්‍ය නම් බඹ ලොව ඉපද අසංඛ්‍ය කල්පයක්හුගේ තුන්වනභාගයක් සුවවිඳ—

එයින්නැගී බ්‍රහ්මපුරෝහිතනම් බඹලොව ඉපද එහිඅඹි කල්පයක් සුවවිද, එයින්නැගී මහාබ්‍රහ්මනාම් බඹලොව ඉපද කපක්සුවවිද එයින්නැගී පරිත්තාභ නම් බඹලොම ඉපද එහි මහා කල්පදෙකක් සුවවිද එයින්නැගී අප්‍රමාණාභ නම් බඹලොව ඉපද එහියතරකපක් සුවවිද එයින්නැගී ආභස්සර නම් බඹලොව ඉපද එහි අට කපක් සුවවිද එයින්නැගී පරිත්තසුභ නම් බඹලොව ඉපද එහිසොළොස් කපක් සුවවිද එයින්නැගී අප්‍රමාණසුභ නම් බඹලොව ඉපද එහිදෙනිස් කපක් සුවවිද—එයින්නැගී සුභකිණ්ණක නම් බඹලොව ඉපද එහිසුසැටකපක් සුවවිද—එයින්නැගී වෙහප්ඵලනම් බඹලොව ඉපද පන්සියයක් කප්සුවවිද එහිදී අනාගාම්ව එයින් සුඛාවාස යෙහි අවිහනම්බඹලොව ඉපද දහසක්කප් සුවවිද එයින්නැගී අත පපනම් බඹලොව ඉපද එහි දෙදහසක් කප්සුවවිද එයින්නැගී සුදස්ස නම් බඹලොව ඉපද එහි සාරදහසක් කප් සුවවිද එයින් නැගී සුදස්සී නම් බඹලොව ඉපද එහි අටදහසක් කප් සුවවිද එයින්නැගී අකණිට්ඨක නම් බඹලොව ඉපද එහි සොළොස් දහසක් කප් ඛ්‍යා නසුවවිද මෙසේ එක්තිස් දහස්සසිය විසිකපක් මුළුල්ලෙහි විඳිනා සම්පත්තියද ඔහු කැමතිවිනම් සාදුදෙන්නේය, ඉදින්එහි නොවු පන්නේ විනම් හෝ එහි සම්පත් විදහෝ යම් යම තැනෙක මිනිස් ලොව උපදනේද පූණ්ණවඩන පුණ්ණක කාකවලිය මෙණ්ඩක වෙ ලාම බ්‍රාහ්මණාදින්මෙන් ප්‍රමාණාතික්‍රාන්ත භොගසම්පත් ඇතිව උපදනේය, එසේ හෙයින් දුනයනම් මහත් භොගසම්පත් ඇතිබවට පමුණුවන්නේයි—**එසින්වදුලහ**

සුභමානවකකථාවට

ඉධපනමානව එකච්චෝ ඉත්ථිං වා පුරිසෝ වා දුනාහොති සම ණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙ පනං සෙය්‍යාවසථපදීපෙය්‍යං ඉස්සා තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදිනෙනන කායස්ස හෙදා. පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නොවෙ කායස්ස හෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චා ජායති මහාභොගොහොති මහාභෙගසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං දුනාහොති සමණස්ස වා බ්‍රාහ්මණස්සවා අන්නං පානං වත්ථං යානංමාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං-යි.

තවදමේ දුනයනම්

දුනං සිලඤ්ච නෙක්ඛම්මං පඤ්ඤා, විරියෙන පඤ්චිමං
ඛනති සච්චමධිට්ඨානං මෙත්තුපෙක්ඛාඤි තෙදස-යි.

වදුරණුලද දානාදී දසපාරමිතාවන් කෙරෙහි පළමුවෙනි පාර මිතාව වන්නේය.

දානං සීලඤ්ච භාවනා පත්තිපත්තානුඤ්ච මෙත්තා
මෙය්‍යාවච්චාපචායඤ්ච දෙසනාඤ්චුතිදිසිපුල්-යි,

වදුරණුලද දශවිධ පුණ්‍යක්‍රියාවස්තූන් කෙරෙහි පළමුවෙනි පුණ්‍යක්‍රියාවඤ්ච වන්නේය.

දානංසීලං පරිචිත්තාගං අජ්ජවං මද්දවං තපං
අක්කොධෝ අවිහිංසාව ඛන්තීව අවිරෝධනා-යි.

වදුරණුලද දසරාජ ධර්මයන් කෙරෙහි පළමුවන රාජධර්මය වන්නේය, දාන ප්‍රියවචන අර්ථචරියාසමානාත්මතාය යන සතරස ඞ්‍රහවස්තූන්කෙරෙහි පළමුවන සංග්‍රහවඤ්ච වන්නේය, දාන සීල භාවනා සංඛ්‍යාත ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තූන් කෙරෙහි පළමුවන පුණ්‍යක්‍රියාවඤ්ච වන්නේය, එසේහෙයින් මේ දානයතෙමේ ලොව තුරා බුදුබවකෙලවරකොට ඇති සියලුසම්පත් සාදාදෙන්නේය, **එසින්වදුලහ,**

දානංහි ලොකෙ සක්කසම්පත්තිං දෙති මාරසම්පත්තිං දෙති බ්‍රහ්මසම්පත්තිං දෙති චක්කවත්ති සම්පත්තිං දෙති සාවකපාරමිඤ්ඤාණං දෙති පවෙචක බොධිඤ්ඤාණං දෙති අභිසම්බොධිඤ්ඤාණං දෙති,යි

යනාදීන් අනෙක ප්‍රකාරයෙන් වර්ණනාකර වදුරණුලද්දුවූ අනුසෂ් ඇති දානය ආමිසදානය නම්වන්නේය, ධර්මදානය නම් ත්‍රිවිධපර්‍යාප්තීන්ගේ ප්‍රභෙද දැන දෙන්නාවූ ධර්මදානයයි, ත්‍රිවිධ පර්‍යාප්තිනම් කිමයත්? අලගර්ද පර්‍යාප්තිය නිස්සරණපර්‍යාප්තිය භාණ්ඩාගාරිකපර්‍යාප්තියයි කියා පර්‍යාප්තිහු තුන්දෙනෙක් වන්නාහුය, එකිවරදවාගන්නාලද නිදැසුවෙන් ඛගමකොට පුත්‍රාණුකරණ ලද පර්‍යාප්තිධර්මය අලගර්ද පර්‍යාප්තිනම්වෙයි, ඒ කෙබඳුදයත්? යම්සේ නයින් අල්ලනු කැමති පුරුෂයෙක් මහත්වූ සර්පයකු දැක ඔහුගේ දරණවැල හෝ නඟුට හෝ අල්වාද එසඳ ඒ සර්පයා පෙරළී සිව ඒඇල්වූ පුරුෂයාගේ අතමහෝ උරයහෝ අන්කිසි අවයවයක් හෝ දෂ්ටකෙරේද ඒපුරුෂයා ඒනාරණයෙන් මරණට හෝ මරණ සමාන දුකට හෝ පැමිණේද ඊටකාරණා කවරේද සර්පයා වරදවාඇල්වූහෙයින් එපරිද්දෙන්ම මේ ශාසනයෙහි තුෂ්ණීපුරුෂ කෙණෙක් සූත්‍රගෙය්‍යාදි නවාඞ්ගශාස්තෘශාසනසංඛ්‍යාත සර්ව්ඥ පුහුණුකෙරෙද ඔහු ඒ ධර්ම පුහුණුකොට ඒ ඒ ධර්මයන්ගේ අර්ථ ප්‍රභෙදවෙන් පරීක්ෂා නොකෙරෙද්ද දෘෂ්ටවෙන් අර්ථ පරීක්ෂානොකරන්නාවූ ඔවු

න්ට ඒ ධම්යෝ ත්‍රුවණට නොවැටහෙනි ඔහු උපාරම්භය කාරණා කොට හෝ විවාද කාරණා කොටහෝ ප්‍රහුණුකෙරෙද්ද යම්කිසිත ධම්ය ප්‍රගුණකෙරෙත්නම් ඊට ඒ අර්ථය ප්‍රයෝජනහෝ වන්නේය ඒ ලාමකසත්වයන්ට වරදවා ගත්නාලද ඒධම්ය බොහෝ කලක් අවැඩපිණිස දුක්පිණිස පවත්නේය ඊටකාරණා කවරේද ධම්ය ඔවුන්විසින් වරදවා ගත්හෙයිනි—යම් පර්‍යාපතියෙක් මොනවට උගන්නාලදද ගිලැසකාණ්ඩාදීන්ගේ පරිපූරණය කැමැත්තවුන් විසින් උපාරම්භාදියක් කාරණා නොකොට ප්‍රහුණු කරණ ලදද මේ නිසා රණ පර්‍යාපත්ති නම්වෙයි—මනාකොට උගන්නාලද ඒධම්ය ප්‍රගුණ කල සත්වයන්ට මෙලෝ පරලෝ වැඩ සිඩකොට හිතසැප පිණිස පවත්නේය—කුමක්හෙයින්ද යත්? ධම්ය මනාකොට සීලපූරණා දිය උදෙසා උගත්හෙයිනි—විශෙෂයෙන් පිරිසිඳ දන්නා ලද පඤ්ච ස්කන්ධයන් ඇති ද්‍රඟිණ කරණලද සකල ක්ලෙශයන් ඇති වඩනලද මෘගීඵල ,ඇති ප්‍රතිවෙධ කරණලද අර්හත්ඵල ඇති සාක්ෂාත් කරණලද නිර්වාණධම් ඇති ක්ෂීණාශ්‍රවයන් වහන්ස ත්‍රුදක් ප්‍රවෙනි පාලනය පිණිස වංශානුරක්ෂණය පිණිස ධම්යක් ප්‍රහුණු කරණ සේක්ද ඒ්හාඃඞ්ඛාරික පර්‍යාප්තිනම් වන්නේය, ඒතයෙහි මනාව පිළිපන් භික්ෂුනෙමේ සීලසමාඛ්ය නිසා ත්‍රිවිද්‍යාවට පැමිණෙන්නේය කුමක්හෙයින්ද යත් ඒ විද්‍යාවන්ගේම ප්‍රභෙදය එහි කියන හෙයිනි, සූත්‍රයෙහි මනාව පිළිපන්නේ සමාධි සම්ඛ්ය නිසා ෂට් අභිඥාවට පැමිණෙන්නේය එහිදු ඔවුන්ගේ ප්‍රභෙදය කියන හෙයිනි, අභිධම්යෙහි මනාව පිළිපන්නේ ප්‍රඥාසමාඛ්ය නිසා චතුප්‍රතිසම්භිදාවට පැමිණෙන්නේය. එහිදු ඔවුන්ගේ ප්‍රභෙදය කියනහෙයින, මෙසේ මේ ත්‍රිවිධ පර්‍යාප්තිය ප්‍රභෙදහෙයින් දැන ඒ කාන්තයෙන්ම බුදුන් විසින් සාරාසංඛ්‍ය කප්පුවහසක් මුළුල්ලෙහි මහපෙරුම් පුරා බුදුව පරකරුණාවෙන් බඹ බ්‍රහ්මාදීන් සඳහා බ්‍රහ්මලෝකය වද මිනිස්දිව්‍ය ප්‍රත්‍රාදීන්සඳහා දිව්‍යලෝකයවද වූලොදර මහොදරාදීන් සඳහා අන්‍යදිපාන්තරයවද වැඩ අපමණවූ ප්‍රාණිහාර්‍ය දක්වා, සත්වගීයා යපරින් නහා නිවන්පුර පමුණුවනු පිණිස දෙසූ ධම්ය ලාභසත්කාර කීර්ත්‍යප්‍රශංසා පිණිසය කියා ලාභයක් වටනා වැඳන සාරය කුණුමොර පිණිස දෙන අඥානයන්සේ ධම්යෙන් ලබන සුඛ ශ්‍රීමොක්ෂ සම්පත් ලබන්නා තබා කුමක් පිණිස අපායොත්පත්තියට පැමිණෙම්ද එසේ හෙයින් බුදුන්විසින් නිවන් පිණිස දෙසූ ධම්ය මාවිසිනුත් සත්වානුග්‍රහයෙන් දෙසා මේ සත්වයන්ගේ ප්‍රාණඝාතාදී පාපධම්යන් මැඩපවත්වම්යි ශීලාදී ගුණධම්යෙහි පිහිටුවා නිවන් සම්පත් අත්පත් කොට දෙම්යි මමත් මේධම්ය ඉගෙණ අනු

න්ට දෙසීමෙන් අනුන්ගේ ගෙරින් රුකදී එදවසට යැපෙනඅාහාර මාත්‍රයක් ලැබ කිරිතෙලින් ප්‍රයොජනයක් නොලබන ගවපාලයා ෆස් නොව ධර්ම්‍ය පුහුණුකොට නොකවයුතුනාක් දෙය හැර කව යුතුනාක් දෙය කෙරෙමියි ධර්ම්යවූ පරිදෙන්ම පිළිපදිමියි අනුන් ටත් දෙසා ඔවුනුත් ධර්ම්යෙහි පිහිටුවමියි බුඛාදී මහාභාතමයන් විසින් නින්දුකොට ගල ලාභ සත්කාර කීර්ත්‍යප්‍රශංසාදියෙන් මට ප්‍රයොජන කවරේදුයි සිතා කරුණා පූර්ව්ඞගමවූ අදහසින් යෙදි ධර්ම්ධර ආචාරිවරයන් කරා එළඹ ගෞරව ඇතිව සකස්කොට බණ ඉගෙණ ධර්ම්දානය දුනගොත් ඒ ධර්ම්දානයට වඩා අන්කිසිදුනයෙක් නම්නැත්. එසියි වදුළහඤ්ඤදෙව්රජහට-

සබ්බදානං ධම්මදානං ජිනාති සබ්බං රසං ධම්මරසෝ ජිනාති
සබ්බංරතිං ධම්මරති ජිනාති තණ්හක්ඛයෝ සබ්බදුක්ඛංජිනාති-සි

යනාදි නොයෙක් අනුසස් ඇත්තාවූ ධර්ම්දානයද යනමෙයි, ආ මිසදාන ධර්ම්දාන වශයෙන් විප්‍රකාරවූ දානය දිමත් එහලොඉකික පාරලොඉකික සම්පත් සාදුදිමට කාරණා ගෙයින් උතුම් මඞ්ගල්‍ය යෙක් නම් වන්නේය. "ධම්මචරියාව" යන තන්හි ධම්චරියානම් කිමයත්? දන්දිමය සිල්රුකිමය භාවනාකිරිමය පින්දිමය පින්ගැණි මය වතාවත් කිරිමය මව්පිය ආදීන්ට වන්දන මානනාදිය කිරිමය බණ කිමය බණ ඇසිමය සම්‍යක් දෘෂ්ටි ගැන්මය යනමේ දශවිධවූ ධර්ම්චය්‍යාවෙහි හැසිරිම ධර්ම්චය්‍යානම්වෙයි, හෙද ප්‍රමාණා තික්‍රාන්තවූ සුවහිමොක්ෂ සම්පත් සාදුදිමට කාරණාවන බැවින් උතුම් මංග ල්‍යයෙක් නම්වන්නේය. "ඤාතකානඤ්චසංගහෝ" යනතන්හි නැ යෝ නම් කවිරුදයන්? මව්පිය දෙදෙනාගේ සන්වක ඛුල පරම්පරාව දක්වා අවිච්ඡින්නව පැවත ආ ඤාතීනු නැගෝනම්වෙතිඔවුන් අතුරෙන් යම්කිසි කරුණකින් දුක්ඛිතව ආ නැයන්ව ධනධාන්‍ය යෙන් කරුන්නාවූ සංග්‍රහවද දෘෂ්ටධාර්ම්ක සාම්පරායිකාර්ථයෙන් යුක්තබැවින් උතුම් මහල්‍යයෙක් නම් වන්නේය "අනවජ්ජානිකම්මානි" යන තන්හි අනවද්‍ය කම්මාන්ත නම් කිමයත්? සතවක් අව වක් තුදුස්වක් පසළොස්වක් සංඛ්‍යාත සතර පොහොයෙහි නොව රදවා පෙහෙවීම ඛුල දෙවුවන්ට මෙහෙකිරිම මල්වතු පැන්පො කුණු උයන් හොනටු අම්බලම් හේදඩු ආදිය පින්පිණිස කිරිම අනවද්‍ය කම්මාන්තනම්වෙයි, හෙද මෙලෝ පරලෝ දෙකට අහිවා ඩියට කාරණා ගෙයින් මහලෙක් නම් වන්නේය. මෙසේ "දානඤ්ච ධම්මචරියාව" යනාදි ගාථාවෙන් දන්දිම එක්මඟුලෙක දසකුසල කම්පථ සංඛ්‍යාත ධර්ම්චය්‍යාව එක්මඟුලෙක ඤාතීන්ට සංග්‍රහකිරිම

එක්මඟුලක සීල සමාදානාදි නිරවද්‍ය කර්මාන්ත ඇතිබව එක් මඟුලෙකැයි කියා මඟුල් සතරක් වදාරා මත්තෙහිත් මඟුළුවදාරන්නාවූ බුදුරජතෙම—

ආරති විරති පාපා මජ්ජපානාව සඤ්ඤමෝ
අප්පමාදෙව ධම්මේසු එතං මඞ්ගලමුත්තමං—යි

යනාදිය වදාළසේක එහි "ආරතිවිරති පාපා" යන්නෙහි ආරති විරති පාපා නම් පාපයෙහි ආදීනව දක්නා සුළුලනුගේ මනසින් අනභිරතියද ප්‍රාණඝාතාදි අකුසල කර්මයෙන් කායවාක් දෙකින් වැලැක්මද වන්නේය, හෙද ඉහලොක පරලොක දෙකින්ම වැඩවහාරණාහයින් මඟුල්නම්වන්නේය "මජ්ජපානාවිරතිසඤ්ඤමෝ" යන්නෙහි මද්‍යපාන නම් රහමේරපිමය රහමේර පි සවිතෙම මඛ පියන් නොහඳුනන්නෙය කුලදෙටුවන් නොහඳුනන්නේය දෙවියන් රජුන් නොහඳුනන්නේය බුදුන් සඟබුදුන් මහරහතුන් නොහඳුනන්නේය කුසඟහි මහාන්තත් නැයන් නොහඳුනන්නේය සුරාමදයෙන් මත්ව පමණනොදැන සම්පත් නැසීම් වසයෙන් දුගී වන්නාක් නොයෙක් අකුසල් රැස්කොට සතර අපායෙහි මහත් ව්‍යසනයට පැමිණෙන්නේය, එසේ හෙයින් ඨානීයමානුෂයට බාධකවූ උන්මත්තකාදි අනෙකප්‍රකාර අනර්ථ එළවන්නාවූ මද්‍යපානයෙන් වැලැක්මද ලෞකික ලෝකොත්තර සම්පත්තියට කාරණා හෙයින් උතුම්මඟුල් නම් වන්නේය "අප්පමාදෙව ධම්මේසු" යන්නෙහි අප්‍රමාදයනම් කුසල කර්මයෙහි නොපමා බවය හේ කුසලධර්මයට මහත්ප්‍රතිඥා ධාරවෙයි—ඒ එසේමය සුයාම දිව්‍යරාජයාගේ උදය වීමට පළමුමකොට නැගෙනහිරුවූ යම් මේ අරුණු සංඛ්‍යාත රශ්මියක් ඇද්ද හේ සුයාමදිව්‍යරාජයාගේ උදයවීමට පූර්වනිමිති වෙයි එසේගෙන්නම ආර්‍යඅෂ්ටාඞ්ගික මාර්ග උපදවන භික්ෂූහට අප්‍රමාදය පූර්වනිමිනිවෙයි ප්‍රධානවෙයි—**එසින්වදලහ සංයුත් සහිගෙහි,**

"සුරියස්සුග්ගමනපුබ්බඞ්ගමෙව භික්ඛවේ උදයමතා එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං එවමෙවඛෝ භික්ඛවේ භික්ඛුනෝ අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදාය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අප්පමාදසම්පදා"

යනාදි අපිව යම්තාක් අපාද දිපාද චතුප්පාදාදි සත්වකෙණක් ඇත්නම් ඒ සියලු සතුන් කෙරෙහි බුදුහු අග්‍රවෙති එසෙයින්ම යම් කිසි කුසලධර්ම කෙණක් ඇත්ද ඒසියලුලාම අප්‍රමාදයම මුල්කොට ඇත්තාහුවේ සියලු කුසලධර්මයන් කෙරෙහි අප්‍රමාදයම අග්‍රවේ,

එසින්වදුලහ—එමසංයුත්තකගිය අප්‍රමාදවර්ගයෙහි යාවතා භික්ඛවෙ සත්තා අපදවා දිපදවා චතුප්පදවා බහුප්පදවා රූපිනොවා අරූපිනොවා සඤ්ඤිනොවා අසඤ්ඤිනොවා නෙවසඤ්ඤිනාසඤ්ඤිනොවා නාසඤ්ඤිනොවා තථාගතො තෙසං අග්ගමක්ඛායති දරහං සම්මා සම්බුඩෙ; එවමෙවඛා භික්ඛවෙ යෙකෙචි කුසලා ධම්මා සබ්බ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා අප්පමාදෙ තෙසං ධම්මානං අග්ගමක්ඛායති අප්පමත්තස්ස එතං භික්ඛවෙ භික්ඛුනො පාටිකංඛං අරියං අට්ඨඞ්ගිකං මගඟං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මගඟං බහුලි කරිස්සති කථඤ්ච භික්ඛවෙ භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මගඟං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මගඟං බහුලිකරොති ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධ නිස්සිතං වොස්සඟපරිනාමිං—පෙ—සම්මාසමාධිං භාවෙති විවෙක නිස්සිතං විරාගනිස්සිතං නිරොධ නිස්සිතං වොස්සඟපරිනාමිං එව මෙවඛා භික්ඛවෙ භික්ඛු අප්පමත්තො අරියං අඞ්ගිකං මඟං භා වෙති අරියං අට්ඨඞ්ගිකං මඟං බහුලිකරොති—යි.

අපිච ලෝකසෙති යම්කිසි රජදරු කෙතුණක් ඇද්ද ඒසියලුදරජ දරුවන් කෙරෙහි සක්විතිමහරජ්ජ ශ්‍රෙෂ්ඨවෙන්ද එපරිදෙදන්ම යම්කිසි කුශලධර්මකෙණෙක් ඇත්නම් ඒ සියලු කුශලධර්මයන් කෙ රෙහි අප්‍රමාදයම උතුම්වෙයි; ප්‍රධානවෙයි; ශ්‍රෙෂ්ඨවෙයි—

එසින්වදුලහ

සෙය්‍යථාපි භික්ඛවෙ යෙකෙචි කුඤ්ජරාජාසනා සබ්බතෙ රඤ්ඤුවිකකාවන්තිස්ස අනුයුත්තා භවන්ති රාජා තෙසං වකක වන්ති අඟමක්ඛායති එවමෙවඛො භික්ඛවෙ යෙකෙචි කුසලාධම්මා සබ්බෙතෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා අප්පමාදෙ තෙසං අඟ මක්ඛායති—පෙ—අරියංඅට්ඨඞ්ගිකං මඟං බහුලිකරොති—යි.

අපිච---යම්තාක් තාරකා ප්‍රභාකෙණෙක් ඇද්ද ඒ සියලුම චන්ද්‍රප්‍රභාවට සොළොස්වන කලාවටිද නොඅගිත් චන්ද්‍රප්‍රභාවම අග්‍ර වෙයි එපරිදෙන් යම්තාක් කුශල ධම් කෙණෙක් ඇත්නම් ඒසියල් ලෙහි ඒ මේ අප්‍රමාදයම අග්‍රවේ—**එසින්වදුලහ**

සෙය්‍යථාපි භික්ඛවෙ යාකාචි තාරකරූපානං පභා සබ්බා තා චන්දියා පභාය කලං නාග්ඝන්ති සොළසිං—එසිදිපභා තාසං අඟ මක්ඛායති එවමෙවඛො භික්ඛවෙ යෙ කෙචි කුසලාධම්මා—පෙ—අප්පමාදමූලකා-යි.

මේආදි නොයෙත් ලෙසින් වර්ණනාකොට වදරුනලද්දවූ අප්‍රමාදයෙහි ගුණසලකා පෙරවරු මවලලහි කෙරෙමිගියිහු කුශල

ධම්ම පස්වරුවෙලෙහි කෙරෙම්යි සිතුනහොත්—

පවාතදිපතුල්‍යාය යායුඝනතනියාඛ්‍යය,
පරූපමාය සම්පස්සං භාවෙය මරණස්සතිං,,

මහාසම්පතති සම්පත්තා යථා සත්තා මනා ඉධ,
තථා අහං මරිස්සාමි මරණං මම හෙස්සති,,

උප්පත්තියා සහෙවේදං මරණං ආගතං සදා,
මරණස්සාය ඔකාසං වධකොවිය එසති,,

ඊසකං අනිවත්තනතං සතතං ගමනුස්සුකං,
ජීවිතංඋදයා හච්චං සූරියොවිය ධාවති,,

විජ්ජූ බුබ්බුල උස්සාව ජලරාජි පරික්ඛයං,
ඝාතෙකාව රිපුනස්ස සඛ්ඛාපි අවාරියෝ,,

සුඝසඤ්ඤාම ප්‍රඤ්ඤාඛි බුඛි වුඩෙ ජීනචයං,*
ඝාතෙසි මරණං ඛිපං කාතු මාදිසකෙ කථා,,

පච්චයානඤ්ච වෙකල්‍යා බාහිරජ්ඣත්තූ පදූවා,
මරාමොරං නිමෙසාපි මරමානා අනුක්ඛණං-යි,,

යනාදින් ජීවිතය ක්ෂීරනොවන පරිදි සිතිකොට පෙරවරු සිතූදෙය පෙරවරම පස්වරු සිතූදය පස්වරම කෙරෙමින් කුශලධර්ම යෙහි නොපමාව විසුවහොත් මහවත් සම්පත්තියගේ අවසාන ලෞකික ලොකොත්තර සම්පත්තියට හේම කාරණාවෙයි බැවින් උතුමෙනුදැක් නාමවත්තෙය; —

වෙසේ "ආරද්ධවිරිය" යනාදි ගාථාවෙන් පාපයෙන් වැලැක්ම එක්මඟුලෙක, මද්‍යපානයෙන් වැලැක්ම එක්මඟුලෙක, කුශලධර්ම යෙහි නොපරාබව එක්මඟුලකැයි මඟුල්තුණක්, එදරා මක්හෙ නිත් මඟුල්වදරණසේක්,

ගාරවොව නිවාතොව සන්තුට්ඨිව කතඤ්ඤුතා
කාලෙන ධම්මසවණං එතමංගලමුත්තමං-යි.

යනගාථාව වදාළසේක; එහි "ගාරවොව" යන්නෙහි ගෞරව නම් බුඩ ප්‍රත්‍යෙක බුඩ බුඩශ්‍රාවක ආචාර්‍යයීඋපාඩ්‍යාය මාතාපිතෘ ජ්‍යෙෂ්ඨභගිනි භ්‍රාතෘආදීන්ව කරණ ගෞරවය වන්නෙස්ය, එසේ කරණ ගෞරවනබා යමෙක් අනාදර කළහොත් හෙවත් ගරුකාර කවයුතුවූ බුඩාදීන්ට අභිමානවශයෙන් නොවඳීද නොපුදද දුක ග්‍රහස්ථතන් නොනතීදිගිදිනා අසුන් නොදේද මගහැරනොදේද සත්කාරනොකෙරේද ගරුකාර ආදාරකෙරේද ඒ සත්වයාතරකයෙහි ඉපද අනේවාසුවහස්තරකඩුක්විඳ නැවත මිනිස්පියට පැමිණියේ හීනඃ නීචකුලයෙහි ඉපද හැමදෙනා විසින් ගර්හිතවන්නේය;

* ජිනවයං.

එසිත්වදුලභ

ඉධ පන මානව එකච්චෝ ඉත්ථී වා පුරිසෝ වා එඩෙ හොති අතිමානි අභිවාදෙතබ්බං න අභිවාදෙති; පච්චුට්ඨෙතබ්බං නපච්චුට්ඨෙති ආසනාරහස්ස ආසනං නදෙති සක්කාතබ්බං නසක්කරොති ගරුකාතබ්බං නගරුකරොති මානෙතබ්බං නමානෙති පූජෙතබ්බං නපූජෙති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති; නොචෙ කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයංඋපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති නීචාකුලිනොහොති නීචාකුලිනස්ස චත්තනිකා එසාමානව පටිපදා යදිදං ඵඩෙහොති අතිමානි අභිවාදෙතබ්බං නඅභිවාදෙති පච්චුට්ඨෙතබ්බං නපච්චුට්ඨෙති ආසනාරහස්ස ආසනං නදෙති මග්ගාරහස්ස මග්ගං නදෙති සක්කාතබ්බං නසක්කරොති ගරුකාතබ්බං නගරුකරොති මානෙතබ්බං නමානෙති පූජෙතබ්බං නපූජෙති-යි.

එබදු ආදීනවදක යමෙක් බුඩාදීන් කෙරෙහි ගෞරවකෙළේ වීනම් හෙතෙම ඒ කුසලයෙන් දෙවිලොව ඉපද සුවවිඳමෙහි උපදනේ උතුම්කුලයෙහි ඉපද හැමදෙනාවිසින් ගරුකටයුතුවන්නේයි,

එසිත්වදුලභ

ඉධපන මානව එකච්චෝ ඉත්ථී වා පුරිසෝ වා අත්ථඩෙ හොති අන තිමානි අභිවාදෙතබ්බං අභිවාදෙති පච්චුට්ඨෙතබ්බං පච්චුට්ඨෙති ආසනාරහස්සආසනං දෙති මග්ගාරහස්ස මග්ගංදෙති සක්කාතබ්බං සක්කරොති ගරුකාතබ්බං ගරුකරොති මානෙතබ්බං මානෙති පූජෙතබ්බං පූජෙති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති; නොචෙකායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති සචෙමනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති උච්චාකුලිනොහොති; උච්චාකුලිනස්සවත්තනිකාඑසා මානව පටිපදා යදිදං අත්ථඩෙහොතිඅනතිමානි අභිවාදෙතබ්බං අභිවාදෙති පච්චුට්ඨෙතබ්බං පච්චුට්ඨෙති ආසනාරහස්ස ආසනං දෙති මග්ගාරහස්ස මග්ගංදෙති සක්කාතබ්බං සක්කරොති ගරුකාතබ්බං ගරුකරොති මානෙතබ්බං මානෙති පූජෙතබ්බං පූජෙති-යි.

යනාදීවිසින් වණ්ණනාකර වදුරණලද අනුසස් සලකා. බුඩාදීන්කෙරෙහි ගෞරවකරන්නාවූ සත්වයන්ට දෘෂ්ටධාර්මික

සාමිපරාධිකධම්මයෙන් අගිමතාවීසිඩියට කාරණා වනබැවින් හෙද උතුම්මඟුල්නම්වන්නේය, **"නිවාතතොව"** යන්නෙහි නිවාත නම් මාන ඔෂධිය වශයෙන් ආත්මමාද්කඛීණ යක් නැතිව ගුරුන්වතුන් කෙරෙහිද මව්පියන් ආදිවූ වැඩියන් කෙරෙහිද යටත්වූ පැවතුම් ඇතිබව පාපිස්තා බිසිකඛක් සෙයින් අහසුන් ගොණෙකුමෙන් තියදලසුන් දිවියෙකුමෙන් භීෂදලසුන් සපීයෙකුමෙන් නිහතමානිවීම නිවාතවෙයි; හෙද ඇසුරුවූ පණ්ඩිත ජනයින්ට සතුවූ ඵලවන බැවින්ද ලෞකික ලොකොත්තර සම්පත් සියට කාරණාබැවිනුදු උතුම් මඟුල් නමවන්නේය **"සනතුඨිව"**යන් නෙහි සන්තොසය ත්‍රිවිධවේ කිම්ස්වභාවයක්ද?—යථාලාභසන්තොසය යථාබලසන්තොසය; යථාසාරුප්පසන්තොසය; යනමේයි—හෙද සිව්පසයෙහි පැවතීම වශයෙන් වාදසවිධවේ—කෙසේදයන්?—මේ ශාසනයෙහි භික්ෂූන්තමේ සුන්දරවූවෝ අසුන්දරවූවෝ සිවුරුලබන්නේ එසින්ම සතුටුවන්නේය, අනිකක් නොපතන්නේය ලැබුනද නොපිළිගන්නේය, මේ චිවරයෙහි යථාලාභසන්තොසයනම්වේ,— එසේ ලදකල්හිද වනාහි සුභාවයෙන් දුර්ලකමකින්හෝ ශ්‍රුත්තද එක්තරා ආබාධයක් හෝ ඇත්තේවේද ජරාවෙන් හෝ පෙළෙන්නේවිද, එබැවින්දලුවූ ගරුකවූ භාරවූ සිවුරුදුරිමෙන්කලානතහෝ වේද ඒකාරණයෙන් අල්පෙච්ඡදවූ ඒ භික්ෂූන්තෙමේ සහාගවූ සදෘශවූ විඤ්ඤූඇති භික්ෂූන්හාසමඟ ඔවුන්ගේ සෑහැල්ලු සිවුරු තබාගෙණ තමාගේ ගරුකභාරවූ සිවුරු ඔවුන්ට දී චිවර පරිවර්තනයබොට සැහැල්ලුචිවරයෙන්යැපෙන්නේද සන්තුෂ්ටම වේ අසන්තුෂ්ටනම් නොවේ මේ චිවරයෙහි යථාබල සන්තොසයනම්වේ—යථාසාරුප්ප සන්තොසයනම් ඇතැම් භික්ෂුකෙණෙක් ප්‍රණීතවූ ප්‍රත්‍යලාභීවන්නේය හෙතෙම පටසිවුරුආදීවූ එක්තරා මහානඝිවූ සිවිරක්හෝ සිහින්මොලොක් බොහෝසිවුරුහෝ ලැබැ මේසිවුරු සුවිරහිභික්ෂූන්ට පලමු මහණවූවන්ට බහුශ්‍රුතවූ ධම්ධරයන්ට සුදුසුවන්නේය මේ සිවුරු ප්‍රත්‍යය නොලැබෙන අල්පලාභීන්ට සුදුසුවන්නේයයි සිතාළු සිවුරුදන්දී පලමුසිවුරුමහෝ කසලගොඩ ආදිතෙනින් අවුලාගත් පිළිගෙණ එයින් සංඝාටිසිවුරුකොටහෝ දරන්නේද හෙතෙම අසි ශයින් සන්තුෂ්ටනම්වේ,— මේ චිවරයෙහි යථාසාරුප්පසන්තොසය නම්වේ.—මෙනයින් චිවරයෙහි යථාලාභසන්තොසය යථාබල සන්තොසය යථාසාරුප්පසන්තොසයයන ත්‍රිවිධ සන්තොසය සැකෙවින් දක්වනලද්දේය,-කියේමැනෝ,

ශ්‍රාමාන්‍යඵලසූත්‍රවර්ණනායෙහි

සන්තුණ්හානි ඉතරීතරූපචිචයසප්පායානි සමුස්සාහයහා
සප්පායතාය සත්තානඤ්ච වාදසවිධාහාරානි; සෙය්‍යථිදං? විවරෙ යථා
ලාභසන්තෝසෝ යථාබලසන්තෝසෝ යථාසාරුප්පසන්තෝසෝ
ති තිවිධෝ; එවංපිණ්ඩපාතාදීසු; තස්සායං පභෙදසංවණ්ණනා: ඉධ
භික්ඛු විවරංලභති සුන්දරංවා අසුන්දරංවා සෝ තෙනෙව යාපෙති
අඤ්ඤං නපත්ථෙති ලභන්තාපි නගණ්හාති අයමස්ස විවරෙ යථාලාභ
සන්තෝසෝ; අථපනපකතිදුබ්බලතාවා හොති ආබාධජරාභිභූතතා
වා ගරුවිවරං පාරුපන්තෝ කිලමති; සෝ සභාගෙන භික්ඛුනා සද්ධිං
පරිවත්තෙත්වා ලහුකෙන යාපෙන්තොපි සන්තුට්ඨොවහොති; අයමස්ස
විවරෙ යථාබලසන්තෝසෝ,-අපරෝ පණීතපච්චයලාභීහොති සෝ
පත්තචීවරාදීනං අඤ්ඤතරමහග්ඝං විවරංවා ඛත්තියා වා පන විවරානි
ලභිත්වා ඉදංථෙරානං විරජක්ඛජාතිකානං ඉදං ඛත්තියසුකුමානං අනුරූ
පං ඉදං ගිලානානං ඉදං අප්පලාභීනං හොතූති දත්වා තෙසං පුරාණ
විවරංවා ගහෙත්වා සංකාරකූටාදිතො වාපන නන්තකානි උච්චිනිත්වා
හොති සංඝාටිංකන්ථාදාරෙනෙනාපි සන්තුට්ඨොවහොති අයමස්ස
විවරෙ යථාසාරුප්පසන්තෝසෝ;

පිණ්ඩපාතයෙහි ත්‍රිවිධසන්තොසය කෙසේදයත්?—මේ සස්
නෙහි සැදහැයෙන් පැවිදිවූ මහණතෙමේ මධුරවූ හෝ අම්බුරවූ
හෝ ආහාරය ලැබ එයින්ම සතුටුවන්නේය අනිකක් නොපතන්
නේය ලැබුණද නොපිළිගන්නේය මේ පිණ්ඩපාතයෙහි යථාලාභ
සන්තොසය නම්වේ; පිණ්ඩපාතයෙහි යථාබල සන්තොසය කෙසේ
දයත්? -යම්භික්ෂුකෙණෙක් තමහට ප්‍රකෘතීන් විරුද්ධවූහෝ ව්‍යා
ධියට විරුද්ධවූ හෝ යම් දෙයක් වැළිදුකල අමුතුව්‍යාධිහෝ
වඩිද මෙසේයමකින් අඩාසුවෙනම් ඒ භික්ෂුතෙමේ ඒ ආහා
රය ලැබුනුකල සභාගභික්ෂූන්ටදී ඔවුන් අතින් තමහට
අවිරුද්ධ හෙජනයක් ගෙණ වළඳ මහණදම් කෙරේ නම් මෙද
සන්තුට්ඨමැයි නිවරදිමැයි මේ පිණ්ඩපාතයෙහි යථාබලසන්තොසය
නම්වේ, පිණ්ඩපාතයෙහි යථාසාරුප්පසන්තොසය කෙසේදයත්? ඇ
තැම් භික්ෂුකෙණෙක් ප්‍රණීතවූ බොහෝ ආහාර ලැබ සිවුරුසෙයින්
විරප්‍රවෘත්ත බහුශ්‍රුත අල්පලාභී ගිලන භික්ෂූන්ට දන්දී එයින් ශෙ
ෂයකින් හෝ පිඬු පිණිස හැසිර මිශ්‍රකාහාරය හෝ වළඳන්නේද
සන්තුට්ඨමේවේ—මේ පිණ්ඩපාතයෙහි යථාසාරුප්ප සන්තොසයනම්
වේ, මෙතෙකින් පිණ්ඩපාතයෙහි යථාලාභ සන්තොසය යථාබල
සන්තොසයත් යථාසාරුප්ප සන්තොසය යන ත්‍රිවිධ සන්තොසයදත
යුතු. දක්වනලදමැයි එම ශ්‍රාමණ්‍ය ඵලසූත්‍ර වර්ණනායෙහි—

ඉධ පන භික්ඛු පිණ්ඩපාතං ලභති ලූඛං වා පණීතං වා සෝ
තෙනෙව යාපෙති අඤ්ඤං නපත්ථෙති ලභන්තොපි නගණ්හාති අයං

මස්ස පිණ්ඩපාතෙ යථාලාභ සන්තොසොති, ඒසනාපන අත්තනොපකති විරුඩ්ඨොව ව්‍යාධිවිරුඩ්ඨො වා පිණ්ඩපාතං ලභති සෙනාසපරිභොගස්ස භික්ඛුනො තං දත්වා තස්ස හත්ථතො පපාතං හොජනාභුඤ්ජිත්වා සමණධම්මකරොනෙන්තාපි සන්තුට්ඨොව හොති අයමස්ස පිණ්ඩපාතෙ යථාබලසන්තොසොති, අපරො බහුං පණීතං පිණ්ඩපාතං ලභති තථා තං විවරංවියණ්ඨෙර විරපඛ්ඛජිත බහුස්සුත අපපලාභි ගිලානානං දත්වා මත්තං වා භෙසජ්ජං පිණ්ඩායවා චරිත්වා මිස්සකාහාරං භුඤ්ජන්නොපි සන්තුට්ඨොව හොති අයමස්ස පිණ්ඩපාතෙ යථාසාරුප්ප සන්තොසොති—යි

සෙනාසනෙසු නිච්ච සන්තොසය කෙසේදයත්?—මෙහිවනාහි ඇතැම් භික්ෂුකෙණෙක් මනාපවූ හෝ අමනාපවූහෝ සෙනස් නක්ලැබුහේ එහි සතුටක් හෝ දෙම්නසක් හෝ නොවූපද වාද යටත්පිරිසෙයින් නාණසයනයකින් හෝ ලද යම් ලෙස කින් සතුටුවන්නේය අනිකක් නොපතන්නේය නැවත උතුම් සෙනෂ්නක් ලැබුනද නොපිළි ගන්නේය මේ ඔහුගේ සෙනා සනයෙහි යථාලාභ සන්තොසය නම්වෙයි, සෙනාසනයෙහි යථාබලසන්තොසය කෙසේදයත්? යම් භික්ෂුකෙණෙකුන්ට සවභාව යෙන් වීරුඩවූ හෝ ව්‍යාධියට විරුඩවූහෝ හෙවත් යම්සෙනස්නක වසන්නාහට ඒසෙනස්නෙහි විසීමෙන් වාතාදී යම් ව්‍යාධියක් කිපේ නම් යම් සෙනස්නක විසූකල ඒව්‍යාධිය මැඩපවතිනමේතමා ලත් අථාසුපසෙනෂ්න විහාරීවූ සහාග භික්ෂූන්වදී ඔවුන්ගේ සැපසෙන ස්න ශබ්ද වශමින් ශ්‍රමණ ධම්ම පුරන්නේද සන්තුෂ්ටනම්වේ මේ සෙනාසනයෙහි යථාබලසන්තොසය නම්වේ, සෙනාසනසයහි යථා සාරුප්පසන්තොසය කෙසේදයත්? මහන්වූ පින්ඇති ඇතැම් භික්ෂූ කෙණෙක් දෙරසෙදූ ගල්ලෙන් මණ්ඩපකුටාගාරාදිවූ: ප්‍රණීතවූ බොහෝ සෙනාසන ලබන්නේය, උතුම් සෙනස්නෙහි වසන්නාහට ප්‍රතිම්ඛිය වඩන්නේය; නිද්‍රාභිභූතව නැවත නැඟි සිටිකල්හි කාම විතර්කය උපදනේයයි කීසෙයින් ඒ සලකා ඔහු ඒ සෙනසුන් ඒවර සෙයින් පළමු පැවිදි කැනව හෝ බහුශ්‍රැත ධම්ධර කැනව හෝ ප්‍රත්‍ය නලාලැබෙන අල්පලාභී කැනවහෝ ගිලන්රෝගී කැනව හෝ දන් දී අඛ්‍යොකාශ වෘක්ෂමූල පන්සල් ආදී යම් කිසිතෙනක වසන්නේ අතිසයින් සන්තුෂ්ටනම්වේ, මේ සෙනාසනසයෙහි යථා සාරුප්පසන්තොසයනම්වේ; මෙතෙකින් සේනාසනසයෙහි යථා ලාභසන්තොසය යථාබලසන්තොසය යථාසරුපසන්තුට්ඨි ඨිත නිච්ච සන්තොසය දතයුතු. මෙදදක්වන ලද මැයි,

ඉධපන භික්ඛු සෙනාසනං ලභති මනාපංවා අමනාපංවාසෝ සෙනසෙනෙව මහාමන්සං නපවිසං උප්පාදෙති අනත්තමයොතිණ්ණ ඉති

රීතෙනාපි යථාලඛ්ධෙනෙව තුස්සති අයමස්සසෙනාසනෙ යථා ලාභ සන්තොසො මයාපන අත්තමනාපකති විරූඛංවා ව්‍යාධිවිරූ ඛංවා සෙනාසනං ලභති; යත්ථස්ස වසන්තා අථාපි හොති සොතං සහාගස්ස භික්ඛුනො දත්වා තස්සපත්තාගත සපපාය සෙනාසනෙ බහුවසන්තොපි සන්තුට්ඨොව හොති අයමස්සසෙනාසනෙ යථා බල ජිතසන්තොසො, අපරොමහා පුඤ්ඤ ලෙණමණ්ඩප කූටාගාරාදීනි නි පණීතසෙනාසනානි ලභති සො තානි විවරං ලයනවිරපඛ බහුස්සුත අපපලාභී ගිලානානං දත්වා යථාකථාවි වසන්තො සන්තු ට්ඨොව හොති අයමස්සසෙනාසනෙ යථාසාරුප්ප සන්තොසො යො පිඨත්තමසෙනාසනං නාම පමාදඨානං තත්ථ නිසින්නාසත්ථිනම්ඛං ඔක්කමනි නිද්දාභිභූතස්ස පුනපපි බුජ්ඣතො පාපවිතක්කා පාතුභ වන්තීති පරිසංවිකඛිවා තාදිසං සෙනාසනං පත්තාමපිනසමපරිවජ්ජති සොතං පරිකඛිපිත්වා අඛ්ඛොකාසරුක්ඛ මූලාදිසු වසන්තොපි සන්තු ට්ඨොව හොති අයම්පි සෙනාසනෙ යථාසාරුප්ප සන්තොසො-යි

ගිලාන ප්‍රත්‍යයෙහි ත්‍රිවිධ සන්තොසය කෙසේදයත්? මේශාස නයෙහි භික්ෂුතොමේ චතුමධුරාදි ප්‍රණීතවූ ඛෙහෙත් හෝ පූතිමූත්‍ර අරළුආදීවූ අමධුරඛෙහෙත් හෝ යමක් ලැබ හෙතෙම එයින්ම සතු ටුවේද අනිකක් නොපතාද ලැබුනත් නොපිළිගණීද මේ ඔහුගේ ගිලාන ප්‍රත්‍යයෙහි යථාලාභ සන්තොසය නම්වේ, ගිලාන ප්‍රත්‍යයෙහි යථාබල සන්තොසය කෙසේදයත්? යම්භික්ෂුකෙණෙක් තෙල්නැතිව සකුරු පැණ ලද්දේ නම්ලෙස් ප්‍රයොජිතා කැමතිවීනම් ථාණිතා සං ඛ්‍යාත උක්ඛකුරු සහාගතනාවදී ඔවුන් අතින් තෙල්ගෙණඟෙහෝ පරිභුඤ්ජනය කොට හෝ ඛෙහෙත් කරන්නේද සන්තුෂ්ටමවේ මේ ඔහුගේ ගිලානප්‍රත්‍යයෙහි යථාබලසන්තොසය නම්වේ, ගිලාන ප්‍රත්‍යයෙහි යථා සාරුප්ප සන්තොසය කෙසේදයත්? මහත් පින් ඇති ඇතැම්භික්ෂු කෙණෙක් ඵනෙල් මී උක්සකුරු ආදිවූ ප්‍රණීතවූ බොහෝ භෙෂජ්‍යලදින් විවරසෙයින් විරප්‍රවර්ජිත බහුශ්‍රුතඅල්ප ලාභී ගිලානාදීන්ට දී ඔවුන් විසින් එළවනලද යම්කිසිවකින් යැ පෙන්නේද සන්තුෂ්ටම වේ, අපිව—යම්භික්ෂුකෙණෙක්හට එක්බද නෙකනොමැ අරළුහා එකබදඅනෙක චතුමධුරය පුරා සඟමිනි මෙයින් කැමැත්තක් ගෙණ වළඳනු මැනව මේහැම ඔබට අයිතියයි කියාදෙනලද්දේද ඉදින් ඒදෙකොඩාගසම නමාගේව්‍යාධියට හිතු වීනම් එයින් කවරක් වැලඳුවද රොගය ව්‍යපගවමවීනම් එකල්හි ඔහු මූ අරළුනම් බුඩාදින්විසින් වණ්ණිතානාකර වදුරණ ලද්දේයයි සිතා චතුමධුරය හෝපිළිගෙණ ප්‍රණීතසූපඛකාට හෝ මූ අරළුපිළි

ගෙණ එයින් බෙහෙත් කරන්නේ එනම් පරමසප්පායභූතයි, මේ උහුගේ ගිලාන ප්‍රත්‍යයෙහි පරමවූ උතුම්වූ යථාලාභ සමන්නාගත නම්වේ. දක්වනලද මැයි.

ඉධපනභික්ඛු හෙසජ්ජං ලභති ලූඛංවා පණීතංවා සොයං ලභති තෙනෙව තුස්සති අඤ්ඤං නපත්ථේති ලභන්තාපිනගණ්හාති අයමස්ස ගිලානපච්චය යථාලාභ සමන්නාගතා—යොපන භික්ඛු තෙලං නත්ථිකෝ ඵාණිතං ලභති සෝ තං සහාගස්සභික්ඛූනං දත්වා තස්ස හත්ථතෝ තෙලං ගහෙත්වා වා අඤ්ඤංවා පරියෙසිත්වා හෙසජ්ජං කරොන්තොපි සන්තුට්ඨොව හොති අයමස්ස ගිලානපච්චය යථාලාභ සමන්නාගතා අපරොමහාපුඤ්ඤා බහුං තෙලමධුඵාණිතාදිපණීත හෙසජ්ජංලභති කාසාවචීවරංවියථෙරවිරපබ්බජිතබහුස්සුතා අප්පලාභී ගිලානානං දත්වාතස්ස ආහාහකන යෙනකෙනචි යාපෙන්තොපි සන්තුට්ඨොව හොති යොපනඑකඤ්ඡිංභාජනෙ මුත්තහරිතකං ඨපෙත්වා එකසම්බෙතුම්බූරං ගණ්හාථ භගෙන්ත යදිවස්සිති වුච්චමානොපි සවස්සාතෙපු අඤ්ඤං නරෙ ාාපි මරාගො උපසඞ්කමති; අථමුත්තහරීටකං තාම බුද්ධාදීහි වණ්ණිතංති චතුමධුරංපරිකප්පිත්වා මුත්තහරීටකෙනෙව හෙසජ්ජං කරොන්තෝ පරමසප්පායභූතොව හොති අය මස්සගිලානපච්චය යථාසාරුප්ප සමන්නාගතා—යි.

මේ වාදඝට්ඨවූ ඉතරිතර ප්‍රත්‍යය සන්නිස්සයෙන් සමන්විතවූ භික්ෂුහට තුන්සිවුරු පාත්‍රවාසි සූචිකායබන්ධන පරිස්සාවන සංඛ්‍යාත අෂ්ටපරිස්කාරයම වටහා බව දක්වන්නට කිහ,

ඉමිනා පන වෙදසච්චෙන ඉතරිතරපච්චයසන්තොසෙන සමන්නාගතස්ස භික්ඛුනො අට්ඨපරික්ඛාරා වට්ටන්ති තීණි චීවරානි පත්තො දන්තකට්ඨෙච්ඡදනවාසි; එකාසූචි කායබන්ධනං පරිස්සාවනං-යි

ඒසියලු පරිස්කාරයෝම කායපරිහාරයයි කියනලද කයට පොෂ්‍යවූද කුසපරිහාරයයි කියන ලද කුක්ෂිපොෂ්‍යයද ප්‍රයෝජනකොට දැන්නාහුයි, කොසේදයත්?—එයින් පලමුකොට දක්වන ලද තුන්සිවුරුහැඳපෙරව හැවිඳින කලයෙහි කායපරිහාරය [පොෂ්‍යය] කරන්නේනුයි කායපරිහාරය කයට පොෂ්‍යය ප්‍රයෝජනකොට ඇත්තේය, පෙරහන්කඩ නැති විට සිවුරුකණින් පැන් පෙරහා වළඳන කලද බාදිතව්‍ය ඵලාඵලගන්නා කලද කුක්ෂිපරිහාරය පොෂ්‍යයකරන්නේනුයි කුක්ෂිපරිහාර කුක්ෂිපොෂ්‍යයනම් වෙයි, යනුදක්වන්නට කිහ=

නෙ සබ්බෙ කායපරිහාරියාපි හොන්ති කුච්ඡිපරිහාරියාපි;කථං? නිවිවරංතාව නිවාසෙත්වා පාරුපිත්වා චීවරණකාලෙකායං පරිහරති

පොසෝතිනි කායපරිහාරියං හොති විවරකණ්ණන උදකං පරියා වෙත්වා පිවනකාලෙ බාදිතබ්බට්ලාඵලං ගහණකාලෙව කුච්ඡිපරි හරති පානභූතින කුච්ඡිපරිහාරියං හොනි

පාත්‍රයද එයින් ලිං ආදියෙන් පැන්නහාගන්නා කලද කුටි පරි භණ්ඩකරණකලද කායපරිහාරික නම්වේ ආහාරගෙණ වලද නකල කුක්ෂිපොෂ්‍යය නම්වෙනියි යනු දක්වන්නට කිහ,

පත්තෙනාපිනෙන උදකං උබරිවා නහාන කාලෙ කුටිපරිහණ්ඩ කරණකාලෙ ව කායපරිහාරිකා හොනි ආහාරංඅලභිත්වා භුඤ්ජන කාලෙ කුච්ඡිපරිහාරිකා—යි,

වාසිසංඛ්‍යානකරය දැහැවි කපාගන්නා කලද මඤ්චපීඨයන්ට ප්‍රයෝජනවූ වේපත්ආදියක් කපනකලද සිවුරුකැපන කලද පන් සලකරණ වීට යම්ක්කපන කලද දඬුකපා අබවස සිවුරුකුටියක් සාදාගන්නාකලද කායපොෂ්‍යය නම් වෙයි, උක්දඬුකපන කලද නෙරළුපක් කපන කලද කුක්ෂිපරිහාරය කුක්ෂිපොෂ්‍යය නම් වෙනියි, යනු දක්වන්ට කිහ,

වාසිහි තායදන්තකඨවේජ්දනකාලෙ මඤ්චපීඨානං අඟපාද චිවරකුටිදණ්ඩකසජ්ඣනකාලෙව කායපරිහාරිකා හොනි උවිත්‍ර වේජ්දන නාලිකෙරාදි තවජ්ජනකාලෙ කුච්ඡිපරිහාරිකා—යි

සුවිසංඛ්‍යාත ඉදිකටුවද සිවුරුවිදිනාකල කායපරිහාරිය නම් වේයි පූපයක්හෝ ඵලයක්හෝ විද අනුභව කරණ කලකුක්ෂිපො ෂ්‍යවෙනියි යනුදක්වන්නට කිහ,

සුවිපිවිවර සිබ්බනකාලෙ කායපරිහාරිකා හොනි පූපංවා ඵලං වා විඛ්ඛිබාබාදන කාලෙ කුච්ඡිපරිහාරිකා—යි.

